සැ. යු. - මෙම *ගැසට් පත්‍රයෙහි* දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වෙන වෙනම පළවේ.

සැ. යු. - 2018.12.21 දින පළ වූ අංක 2,103 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,104 - 2018 දෙසැම්බර් මස 28 වැනි සිකුරාදා - 2018.12.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

IV(අ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව
තනතුරු- ඇබෑර්තු	5440
විභාග, විභාග ප්‍රතිඵල ආදිය	—
බඩුබාහිරාදිය විකිණීම්	—
පළාත් පාලන නිවේදන	5496
අතුරු ව්‍යවස්ථා	5534

	පිටුව
පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ..	—
ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන	5547
අයවැය ලේඛන	5550
දේපළ විකිණීම්	—
විවිධ දැන්වීම්	5551

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ජනවාරි මස 18 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජනවාරි මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

5439 - B 81481— 5,403 (2018/12)

තනතුරු - ඇබෑර්තු

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

මීරිගම ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මීරිගම ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණකර අධ්‍යාපන සහතිකවල වෘත්තීය සුදුසුකම් සහතිකවල, පදිංචිය සනාථ කිරීමේ සහතිකවල, උප්පැන්න සහතිකවල පිටපත් සමග "ලේකම්, මීරිගම ප්‍රාදේශීය සභාව, මීරිගම" යන ලිපිනයට 2019.01.25 දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ".....(අදළ).....තනතුර සඳහා ඉල්ලුම්පත යනුවෙන් සඳහන් කර එවිය යුතුය. අසම්පූර්ණ මෙන්ම නියමිත දිනයට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඒ සම්බන්ධයෙන් නැවත දැනුම් දීමක් සිදු නොකෙරේ.

දැනටමත් රජයේ/පළාත් පාලන ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් දෙපර්තමේන්තුවේ ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

අනු. අංකය	තනතුර	සංඛ්‍යාව	වැටුප් ක්‍රමය	අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්
01	රියැදුරු (ප්‍රාථමික ශිල්පීය) III ශ්‍රේණිය)	03	PL-03-2016 රු. 25,790- 10 x 270- 10 x 300 - 10 x 330 - 12 x 350- රු. 38,990 03 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.	සටහන අංක 01 බලන්න
02	වැඩ ක්ෂේත්‍ර කම්කරු (ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය)	06	PL-1-2016 රු. 24,250 -10 x 250- 10 x 270- 10 x 300 - 12 x 330 - රු. 36,410 03 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.	අවම වශයෙන් 8 ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම.
03	සෞඛ්‍ය කම්කරු (ප්‍රාථමික ශිල්පීය) නොවන III ශ්‍රේණිය)	05	PL-1-2016 රු. 24,250 - 10 x 250 - 10 x 270- 10 x 300 - 10 x 330 - රු. 36,410 03 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.	අවම වශයෙන් 8 ශ්‍රේණිය (9වසර) සමත්ව තිබීම.
04	විදුලි කාර්මික (ප්‍රාථමික - අර්ධ ශිල්පීය III ශ්‍රේණිය)	01	PL-2-2016 රු. 25,250- 10 x 270- 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 සීමිත බඳවා ගැනීමකි. 03 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.	අ.පො.ස. සා. පෙළ දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන 02 ක් සහිතව විෂයන් 06 ක් සමත් වී තිබීම. (මින් විෂයන් 05 ක් එකවර සමත් විය යුතුය) (අදාළ තනතුරට නියමිත පරිදි තෘතික හා වෘත්තිමය ජාතික වෘත්තිය කුසලතාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටම් නිපුණතාවයක් ලබා ගෙන තිබීම හෝ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06 ට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය.) පළාත් පාලන ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක සේවය ස්ථීර කර ඇති සේවා කාලය වසර 05 සපුරා ඇති හා අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් පසුරා ඇති සේවකයෙකු විය යුතුය.)

අනු. අංකය	තනතුර	සංඛ්‍යාව	වැටුප් ක්‍රමය	අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්
05	පෙර පාසල් ගුරු (පාලිකා) කළමනාකරණ/සහ තාක්ෂණ නොවන ඛණ්ඩ -2 III ශ්‍රේණිය	02	MN-1-2016 රු. 27,140-10 x 300 - 11 x 350- 10 x 495- 10- x 660- රු. 45,540 සීමිත බඳවා ගැනීමකි. 03 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.	අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාවට සහ ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් වී තිබිය යුතුයි.) පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජය පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙර පාසල් ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපන හා ළමා සංවර්ධනය පිළිබඳ මාස 06 කට නොඅඩු කාලයක් පාඨමාලාවක් හදාරා සහතිකයන් ලබා තිබිය යුතුය. අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රාථමික සේවා ගණයක වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, මෙම කාලය තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබිය යුතුය. ලිඛිත තරග විභාගය සඳහා පෙනී සිටිය යුතුය. *(සටහන අංක 02)*

සටහන අංක 01 :

01. රියැදුරු තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

(i) අ.පො.ස. සා/පෙළ විභාගයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුලුව සම්මාන සාමාර්ථ දෙකක් (02)සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (එක් වරකදී විෂයයන් පහක් (05) අවම වශයෙන් සමත් ව තිබිය යුතුය)

(ii) පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර් 24 ට අඩු ස්ටේෂන්/වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිතුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03 කට පෙර අවම වශයෙන් සී සහ සී 1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)

(iii) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

(iv) බලපත්‍රය ලබා ගැනීමෙන් පසු වාහන රියැදුරෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය)

(v) අවම උස අඩි 5ක් විය යුතුය.

(vi) දිවා කාලයේදී හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බව සනාථ කළ යුතුය.

පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය මගින් බඳවා ගැනීම සිදු කෙරේ.

සටහන අංක 02 :

01. විභාගය/වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර - පෙර පාසල් ගුරු (පාලිකා)

ප්‍රශ්න පත්‍රය/විෂයය ක්ෂේත්‍රය	*කාලය*	*මුළු ලකුණු*	*අවම සමත් ලකුණු*
අභියෝග්‍යතාවය හා බුද්ධි පරීක්ෂණය	පැය 01	100	40%
සාමාන්‍ය දැනීම	පැය 01	100	40%

02. *විභාගය සඳහා වන විෂයය නිර්දේශය :*

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂයය නිර්දේශය*
අභියෝග්‍යතාවය හා බුද්ධි පරීක්ෂණය	තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව, භාෂා හැකියාව, මැන බැලීම
සාමාන්‍ය දැනීම	මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික, සමාජයීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන් ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්නවලින් යුක්ත වේ.

පොදු කොන්දේසි :

අ. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

ආ. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

ඇ. තෝරා ගනු ලබන්නන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළ දී පැමිණීම, වැඩ හා හැසිරීම සතුටුදායක නම් පරිවාස කාලය අවසානයේදී සේවය ස්ථිර කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කල තැනැත්තන් වසර 01 ක වැඩ බැලීමේ කාලයකට යටත් කර බඳවා ගනු ලැබේ.

ඈ. අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න) (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත)

ඉ. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.

ඊ. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුලත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

උ. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

ඌ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට පූර්වාසන්න වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය අමුණන්න.)

ඔ. රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

ඕ. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමය :

අ. මෙම තනතුරු සඳහා ලැබෙන අයදුම්පත් පරීක්ෂා කර බලා සුදුසුකම් ලබන අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/95 ට අනුකූලව සම්මුඛ පරීක්ෂණයට කැඳවීමෙන් තෝරාගනු ලැබේ.

ආ. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණු මත පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

ඇ. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවා ගැනීමේ පරිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ද ආදී සියලු බලතල මීරිගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වන්නේය.

කේ. ජයතිලක,
ලේකම්,
මීරිගම ප්‍රාදේශීය සභාව.

2018 ක් වූ දෙසැම්බර් මස 07 වැනි දින,
මීරිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මීරිගම ප්‍රාදේශීය සභාව

..... තනතුරට බඳවාගැනීම සඳහා අයදුම්පත්‍රය

01. මුලකුරු සමග නම :——————————————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම:——————————————————.
03. උපන් දිනය:—————— 2019.01.25 වැනි දිනට වයස : අවු :——————————————————.
04. ස්ථිර පදිංචි ලිපිනය :——————————————————
05. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————————————
06. ජාතික හැඳුනුම්පත් අංකය :—————————— දුරකථන අංකය:——————————————————
07. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————————————
08. වෙනත් සුදුසුකම් (ඡායා පිටපත් අමුණන්න):——————————————————
    (i) අධ්‍යාපන සුදුසුකම්:——————————————————
    (ii) වෘත්තීය සුදුසුකම්:——————————————————
    (iii) පළපුරුද්ද:——————————————————
09. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ /වෙනත් ආයතනයක සේවය කරන්නේ නම් :
    (i) දැනට දරන තනතුර:——————————————————
    (ii) එම තනතුරට පත් වූ දිනය:——————————————————
    (iii) එම පත්වීමේ ස්වභාවය:——————————————————
    (ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්)
10. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු වී තිබේද යන වග:——————————————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවාගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමට, බඳවාගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් මා සේවයෙන් පහකිරීමටත් යටත් වන බව හොඳාකාරව දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය (සීමිත බඳවා ගැනීම සඳහා පමණි.)

.....මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ..... වශයෙන් සේවයේ නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර කිසිදු දඬුවමකට භාජනය වී නොමැති බව සහතික කරන අතර, ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි.

—————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————.

දකුණු පළාත් රාජ්‍ය සේවයේ කොටපොල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු පිරවීම

කොටපොල ප්‍රාදේශීය සභාව තුළ දැනට පුරප්පාඩුව පවතින පහත තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අනු. අංකය	*තනතුරු නාමය*	*පුරප්පාඩු සංඛ්‍යාව*	*වැටුප් පරිමාණය මාසිකව*	*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්*
01	රියදුරු III ශ්‍රේණිය	02	රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350- රු. 38,990 (රා.ප.ව. 03/2016 හි PL 3 - 2016) (රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 3/2016 හි උපලේඛන II අනුව වැටුප් තලයේ පිහිටුවනු ලැබේ.)	(i) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී ඕනෑම විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතුය. (ii) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කෙරෙන මෝටර් රථ රියදුරු බලපත්‍රයක් ලබා තිබිය යුතුය. (මෝටර් කෝච් බර වාහන රියදුරු බලපත්‍රය) (iii) පළාත් පාලන දෙපාර්තමේන්තුවේ (ආයතනයේ) පුරප්පාඩු රියදුරු තනතුරේ ප්‍රවාහන කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාමට හැකිවන පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ 4 මට්ටමේ) සහතිකයක් ලබා තිබිය යුතුය. (iv) රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද ලබා තිබිය යුතුය. *කායික සුදුසුකම් :* අවම උස අඩි 5ක් විය යුතුය. දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික හා මානසික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතුය. මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් කායික යෝග්‍යතාව සනාථ කළ යුතුය.
02	බර උපකරණ ක්‍රියාකරු III ශ්‍රේණිය	01	රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 (රා.ප.ව. 03/2016 හි PL 3- 2016) (රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 3/2016 හි උපලේඛන II අනුව වැටුප් තලයේ පිහිටුවනු ලැබේ.)	(i) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී ඕනෑම විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතුය. (ii) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කෙරෙන මෝටර් රථ රියදුරු බලපත්‍රයක් ලබා තිබිය යුතුය. (මෝටර් කෝච් බර වාහන රියදුරු බලපත්‍රය) (iii) පළාත් පාලන දෙපාර්තමේන්තුවේ (ආයතනයේ) පුරප්පාඩු බර උපකරණ ක්‍රියාකරු තනතුරේ කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාමට හැකිවන පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ 4 මට්ටමේ) සහතිකයක් ලබා තිබිය යුතුය.

අනු. අංකය	*තනතුරු නාමය*	*පුරප්පාඩු සංඛ්‍යාව*	*වැටුප් පරිමාණය මාසිකව*	*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්*
				(iv) රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද ලබා තිබිය යුතුය. (v) බැකෝ යන්ත්‍ර ක්‍රියාකරවීම, මාර්ග තලන ක්‍රියාකරවීම, කම්පැක්ටර් රථ ක්‍රියාකරවීම යන සේවා පළපුරුද්ද විශේෂ සුදුසුකමකි. *කායික සුදුසුකම් :* අවම උස අඩි 05 ක් විය යුතුය. දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ සේවයේ යෙදීම පිණිස ශාරීරික හා මානසික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතුය. මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් කායික යෝග්‍යතාව සනාථ කළ යුතුය.

බඳවා ගැනීම සඳහා පොදු නොරතුරු :

i. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.
ii. අයදුම්පත් කැඳවන අවස ාන දිනට දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ අඛණ්ඩ වසර 05 ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුයි.
iii. විශිෂ්ට යහපත් චරිතයකින් හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
iv. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
v. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ දඬුවම් ලැබූවෙකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.
vi. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
vii. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම කොටපොල ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

02. අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව එක් එක් තනතුරට අදාළව විධිමත් ලිඛිත පරීක්ෂණ/වාචික පරීක්ෂණ/ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ/වෘහගත සම්මුඛ පරීක්ෂණ/වෘත්තීය සම්මුඛ පරීක්ෂණ යන පරීක්ෂණවලින් එකකට හෝ කිහිපයකට හෝ සියල්ලටම අයදුම්කරුවන් යොමු කරනු ලබන අතර එහි දී ලබා ගන්නා සියලුම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ. (කිසියම් අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු සමාන ලකුණු සංඛ්‍යාවක් ලබා ගෙන ඇති විට ඒ අතුරින් බඳවා ගනු ලබන තැනැත්තා කවුරුන්ද යන්න කොටපොල ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් තීරණය කරනු ලබන ආකාරයට වේ.)

03. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන පමණින් හෝ එම පරීක්ෂණවලට භාජනය කළ පමණින් එම අයදුම්කරු බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස සලකනු නොලැබේ.

04. කොටපොල ප්‍රාදේශීය සභාවේ දූනටමත් ව්‍යාපෘති/කොන්ත්‍රාත්/ලියාපදිංචි පදනම මත සේවය කරන්නන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

05. කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

06. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය.

ii. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වන අතර, වසර 03 ක් අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයක තිබෙන සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ. එමෙන්ම පරිවාස කාලය අවසන් වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

iii. දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආයතනගත රියදුරන් සඳහා වන රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අමතරව ආයතන සංග්‍රහයේ විධි විධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දකුණු පළාත් සභාව හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වරින්වර පනවනු ලබන කොන්දේසිවලට ද, පළාත් පාලන ආයතන වලට අදාළ අණපනත්/පනත්වල විධිවිධානවලට ද කොටපොල ප්‍රාදේශීය සභාව මගින් වරින් වර ගනු ලබන සභා සම්මුතිවලට ද අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතුයි.

07. *බඳවා ගැනීම් ක්‍රමය හා අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

i. සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

ii. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක තමන් විසින් සකස් කරගත් අයදුම්පත්‍රයක් මගින් ඉල්ලුම් කළ යුතුය.

iii. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කර අයදුම්පත් එවිය යුතුය.

iv. තනතුරු දෙක සඳහාම ඉල්ලුම් කරන්නේ නම් වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුය.

v. අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය.

a. උප්පැන්න සහතිකය,

b. ජාතික හැඳුනුම්පත,

c. අධ්‍යාපන සහතිකය,

d. වෘත්තීය හා වෙනත් සුදුසුකම්,

e. පදිංචිය සහතික කිරීමේ සහතිකය,

f. මෑතකදී ලබාගත් චරිත සහතික 03 ක් (එක් චරිත සහතිකයත් ග්‍රාම නිලධාරිවරයාගෙන් ලබාගත යුතුය.)

vi. සියලුම අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර 2019.01.14 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් සභාපති, කොටපොල ප්‍රාදේශීය සභාව, දෙනියාය යන ලිපිනයට එවිය යුතුය.

vii. නියමිත දිනට පසු ලැබෙන සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් යථා කාලයේ දී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් වෙත කිසිදු දැනුම් දීමක් කරනු නොලැබේ.

අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සහ සහතික පත්‍ර අසත්‍ය බව හෝ සාවද්‍ය බව පෙනී ගියහොත් හෝ අයදුම්කරු හිතාමතාම යම්කිසි වැදගත් කරුණක් යටපත් කර ඇති බව පෙනී ගියහොත් තෝරා ගැනීමට පෙර අයදුම්කරු නුසුදුස්සෙකු බවට පත්වන අතර තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් හෝ නොගෙවා සේවයේ යෙදී සිටින කවර අවස්ථාවක දී වුව ද සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වනු ඇත.

ඒ. පී. දයානන්ද,
සභාපති,
කොටපොල ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 15 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය සභාව.

කොටපොල ප්‍රාදේශීය සභාව

ආදර්ශ අයදුම්පත්‍රය

කොටපොල ප්‍රාදේශීය සභාවේ..... තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම් පත්‍රය

(1) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————————————————

(2) මුලකුරු සමග නම :————————————————

(3) මුලකුරුවලින් හැඳින්වෙන නම :————————————————

(4) ස්ථිර ලිපිනය :————————————————

(5) ස්ත්‍රී/පුරුෂ භාවය :————————————————

(6) උපන් දිනය : අවුරුද්ද:———————— මාසය:———————— දිනය:————————

(7) 2019.01.14 දිනට වයස : අවුරුදු :———————— මාස:———————— දින:————————

(8) ජාතික හැඳුනුම්පත් අංකය :————————————————

(9) ශ්‍රී ලංකා පුරුවසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :————————

(10) විවාහක/අවිවාහක බව:————————————————

(11) කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි කාලය :————————

(12) අධ්‍යාපන සුදුසුකම්:————————————————

(13) වෘත්තීය සුදුසුකම් :————————————————

(14) සේවා පළපුරුද්ද :————————————————

(15) වෙනත් විශේෂ කුසලතා :————————————————

මෙහි සඳහන් තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව මම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————

12-939

බේරුවල නගර සභාව

බේරුවල නගර සභාවේ පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු වෙනුවෙන් මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (බේරුවල නගර සභා බල ප්‍රදේශය තුළ පූර්වාසන්න වසර තුනක ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනට මෙම සභාවේ ආදේශක, කොන්ත්‍රාත් හෝ ව්‍යාපෘති පදනම මත සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

01.	සේවා ගණය හා තනතුරු නාමය	:	ප්‍රාථමික ශිල්පීය රියදුරු III ශ්‍රේණිය
02.	පුරප්පාඩු ගණන	:	01
03.	වැටුප් පරිමාණය හා වැටුප්	:	PL3-2006A (රා : ප : ච : 06/2006 IV අනුව)
	කේත අංකය		රු. 12,470-10×130-10×145-10×160-12×170- රු. 18,860
			PL3-2006A (රා : ප : ච : 03/2016 අනුව)
			රු. 25,790-10×270-10×300-10×330-12×350- රු. 38,990

04. බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කෙරේ. වෘත්තීය පරීක්ෂණයේ දී පහත කරුණු පිළිබඳ සලකා බැලේ.

- රිය පැදවීමේ නිපුණත්වය
- මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම
- මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම

4.1 බඳවා ගැනීම : විවෘත
සීමිත බඳවා ගැනීම අදාළ නොවේ.

4.1.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

4.1.2 සුදුසුකම් :

4.1.2.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුලුව සම්මාන සාමාර්ථ දෙකක් (02) ක් සහිතව විෂයයන් හයක් (06) ක් සමත් වී තිබීම. (එක් වරකදී විෂයයන් පහක් (05) ක් අවම වශයෙන් සමත් ව තිබිය යුතුය.)

4.1.2.2 වෘත්තීය සුදුසුකම් : (අ) පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් "සී" සහ "සී1" වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "බී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය)

(ආ) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුය.

සංලක්ෂය :

ආයතනයේ අවශ්‍යතාවය අනුව පවතින පුරප්පාඩු බර වාහන පැදවීමේ නිපුණතාව සහිත රියදුරන්ගෙන් පිරවීමට ඇති අවස්ථා වල දී බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොන්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම්, "ඒ1" සහ "සී1" පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "බී" සහ "සී1" පන්තියේ බලපත්‍රයක් නැතහොත් තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහනයක් සහ බර ට්ලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් හෝ "ඒ" පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "සී" පන්තියේ බලපත්‍රයක්) මූලික සුදුසුකම වශයෙන් නියම කිරීමට පත්වීම් බලධරයා කටයුතු කරනු ඇත.

4.1.2.3 පළපුරුද්ද : බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය)

4.1.2.4 කායික සුදුසුකම් : අවම වශයෙන් උස අඩි (05') පහක් වත් තිබිය යුතුය.
දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයක් තිබිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බව සනාථ කළ යුතුය.

4.1.3. බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින්

4.1.3.1 ලිඛිත විභාග : අදාළ නොවේ

4.1.3.2. වෘත්තීය පරීක්ෂණ :

	විෂයයන්	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
1.	රිය පැදවීමේ නිපුණත්වය	40	20
2.	මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම	40	20
3.	මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම	20	10
	මුළු ලකුණ	100	50

4.1.3.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු - බඳවා ගැනීමේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පැවැත්වේ. ලකුණු ලබා දීමක් සිදු නොවේ.

4.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - අදාළ නොවේ

4.3 කුසලතා මත බඳවා ගැනීම - අදාළ නොවේ

02. *බඳවා ගැනීමේ කොන්දේසි* :

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

iii. බේරුවල නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

iv. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු විය යුතුය හා අවු: 45 ට නොවැඩි විය යුතුය. (තනතුරට අදළ වන පරිදි දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව සීමිත බඳවා ගැනීම සඳහා බලපානු නොලැබේ)

v. අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

vi. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබුවකු නොවිය යුතුය.

vii. රජයේ හෝ පළාත් පාලන ආයතනයක සේවයෙන් පහ කරනු නොලැබූ අයකු විය යුතු ය.

viii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබුවෙකු නොවිය යුතුය.

ix. බඳවා ගැනීම් පරිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට, ප්‍රායෝගික පරීක්ෂණයකට, වෘත්තීය පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.

x. එක් එක් තනතුරකට බඳවා ගැනීමට අවශ්‍ය සියලු අවම සුදුසුකම් *ගැසට් පත්‍රයේ* සඳහන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

xi. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදළ නව බඳවා ගැනීමේ පටිපාටි ව්‍යවස්ථා සංශෝධන වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවා ගැනීමේ ප්‍රමාද කිරීම්, වෙනස් කිරීම් සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම බේරුවල නගර සභාවේ ලේකම් සතුය.

03. *සේවයේ නියුක්ත කිරීමේ පොදු කොන්දේසි* :

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වේ.
2. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතු ය.
3. තනතුරුවලට අදාළ වැටුප් පරිමාණයන් සඳහා 2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි II වන උපලේඛනය අනුවවේ. එම වැටුප් පරිමාණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වනුයේ 2020.01.01 දින සිටය.

4. මීට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහටය ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි *නොහොත්* නියෝග වලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි *නොහොත්* නියෝගවලට ද, අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝගවලට ද, ආයතන ප්‍රධානීන් විසින් නිකුත් කරනු ලබන නියෝග වලට ද අනුව කටයුතු කළ යුතු ය.

04. *අයදුම් කළ යුතු ආකාරය* :

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (ඒ4 ප්‍රමාණයේ අයදුම්පතක් සකස් කර, අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2019.01.18 දිනට පෙර "ලේකම්, බේරුවල නගර සභාව, බේරුවල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දූනටමත් රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලි වල පිටපත් එවිය යුතුය.

i. උප්පැන්න සහතිකය
ii. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්
iii. අධ්‍යාපන සහතික/ පාසල හැර යාමේ සහතිකය
iv. ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචිය සනාථ කිරීමේ සහතිකය.
v. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික
vi. සේවා පළපුරුද්ද පිලිබඳ සහතික
vii. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්
viii. පොලිස් වාර්තාව

පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරීක්ෂණයට/ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලබන අතර, එම කැඳවීම ලද පමණින් ඔබ පත්වීමක් ලැබීමට සුදුස්සෙකු ලෙස නොසැලකිය යුතුය.

* මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම පූර්ණ බලතල මා සතු වන අතර මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය බේරුවල නගර සභාවේ ලේකම් සතු වන්නේ ය.

* මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලත්වයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය නිරවද්‍ය ලෙස බල පැවැත්වෙන්නේ ය.

ඩබ්ලිව්. ඒ. අජිත් කිත්සිරි,
ලේකම්,
බේරුවල නගර සභාව.

2018 දෙසැම්බර් මස 18 වැනි දින,
බේරුවල නගර සභා කාර්යාලයේ දීය.

ආදර්ශ අයදුම් පත්‍රය

බේරුවල නගර සභාව

..... තනතුර සඳහා ආදර්ශ අයදුම්පත්‍රය.

01. (අ) මුලකුරු සමඟ නම :——————————————————

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————————

02. ස්ථිර ලිපිනය :——————————————————

03. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :——————————————————

04. දිස්ත්‍රික්කය :——————————

05. උපන්දිනය : අවුරුද්ද :—————— මාසය :—————— දිනය :——————
අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2019.01.18) වයස :
අවුරුදු :—————— මාස :—————— දින :——————

06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————

07. ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග:——————————

08. ජාතික හැඳුනුම්පත් අංකය:——————————

09. දුරකථන අංකය :——————————

10. විවාහක/අවිවාහක බව :——————————

11. පළමු පත්වීම් දිනය (සීමිත අයදුම්කරුවන් සඳහා) :——————————

12. අධ්‍යාපන සුදුසුකම් :

12.1 අයදුම්කරු අවසන්වරට සමත් වූ පන්තිය:——————————

12.2 අ.පොෂ. (සා.පෙළ) විභාගය :

I. වර්ෂය :—————— මාසය :——————

II. විභාග අංකය :——————

III. ප්‍රතිඵල :

විෂයය	*සාමාර්ථය*	*විෂයය*	*සාමාර්ථය*
1.		5.	
2.		6.	
3.		7.	
4.		8.	

12.3 අ.පොෂ. (උ.පෙළ) විභාගය :

I. වර්ෂය :—————— මාසය :——————

II. විභාග අංකය :——————

III. ප්‍රතිඵල :

විෂයය	*සාමාර්ථය*
1.	
2.	
3.	
4.	

13. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————————

14. වෙනත් සුදුසුකම් :——————————

15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද?/නැතිද? යන වග :——————

16. ඔබ දැනටමත් මෙම නගර සභාවේ ස්ථීර, ආදේශක, අනියම්, තාවකාලික, ව්‍යාපෘති පදනම යටතේ සේවය කරන්නේ ද?
එසේනම් එම සේවා කාලය හා විස්තර :——————————

17. තනතුර :——————————

18. සේවා කාලය : අවුරුදු :———— මාස :———— දින :————

19. ගතවූ වසර 05 තුළ විනයානුකූල දඬුවමකට භාජනය වී තිබේද ?

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වන බව ද මම දනිමි.

.....
අයදුම්කරුගේ අත්සන

දිනය :————

ආයතන ප්‍රධානියාගේ සහතිකය

01. මෙම අයදුම්කරු/අයදුම්කාරිය ..... මයා/ මිය මෙම නගර සභාවේ සේවයේ නියුතු අයෙකු බව ද,
02. ඔහු/ ඇය ස්ථිර තනතුරක් දරමින් සිටින බව ද,
03. ස්ථිර තනතුරක සේවයේ ස්ථිර කරමින් ලිපියක් ඔහුට/ඇයට නිකුත් කර ඇති බව ද,
04. ඔහු/ඇය ගැසට් නිවේදනයේ දිනට හෝ ඊට පෙර යටත් පිරිසෙයින් අවුරුදු 05 ක් තුළ සක්‍රීය හා සතුටුදායක ලෙස සේවය සම්පූර්ණ කර ඇති බවද,
05. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම ගැසට් නිවේදනයේ දිනට පූර්වාසන්න අවුරුදු 05 ඇතුළත සතුටුදායක පැවති බවද,
06. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බව ද,
07. මෙම විභාගයට අදාළ විභාග නිවේදනයේ දක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බව ද මම සහතික කරමි.

.....
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :————.

12 - 956/1

බේරුවල නගර සභාව

01. සේවා ගණනය හා තනතුරු නාමය : ප්‍රාථමික අර්ධ ශිල්පීය වඩු කාර්මික III ශ්‍රේණිය
02. පුරප්පාඩු ගණන : 01
03. සුදුසුකම්

03.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) ක් සහිතව විෂයයන් හයක් (06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහක් (05) එකවර සමත් විය යුතුය.)

03.2. වෘත්තීය සුදුසුකම් : තනතුරට අදාළව නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම.

සහ

අවම වශයෙන් සහ අදාල ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතික මගින් සනාථ කල යුතුය)

04. පළපුරුද්ද :

04.1 බාහිර අයදුම්කරුවන් සඳහා : අදාළ නොවේ.

04.1 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා : අදාළ පළාත් පාලන ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක සේවය ස්ථිර කර ඇති සේවා කාලය වසර 05 ක සපුරා ඇති හා අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වසර 05 ක සතුටුදායක සේවා කාලය සපුරා ඇති සේවකයෙකු විය යුතු ය.

05. වැටුප් :

05.1 වැටුප් කේත අංකය : PL2-2016 (රා . ප . ච . 03/2016 අනුව)

05.1 වැටුප් පරිමාණය රු. 25,250-10×270-10×300-10×330-12×350- රු.38,450/-

06. බඳවා ගැනීමේ ක්‍රමය :

06.1. විවෘත බඳවා ගැනීම :

06.1.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

06.1.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

06.1.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : මූලික සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කෙරේ.

06.1.4.ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*	*තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය*
බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්	20	50%
සාමාන්‍ය දැනීම	75	
පෞරුෂත්වය	05	
මුළු ලකුණු	100	

සටහන : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

06.2. සීමිත බඳවා ගැනීම :

06.2.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

06.2.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

06.2.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : මූලික සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කෙරේ.

06.2.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*	*තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය*
බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්	20	50%
සාමාන්‍ය දැනීම	75	
පෞරුෂත්වය	05	
මුළු ලකුණු	100	

සටහන : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

06.3. කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ.

* සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකිවන අවස්ථාවලදී විවෘතව අයදුම්පත් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි* :

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පූර්වාසන්න වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

iii. බේරුවල නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

iv. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු විය යුතුය හා අවු: 45 ට නොවැඩි විය යුතුය. (තනතුරට අදාළ වන පරිදි දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව සීමිත බඳවා ගැනීම සඳහා බලපානු නොලැබේ)

v. අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

vi. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

vii. රජයේ හෝ පළාත් පාලන ආයතනයක සේවයෙන් පහ කරනු නොලැබූ අයකු විය යුතු ය.

viii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබුවෙකු නොවිය යුතුය.

ix. බඳවා ගැනීම් පරිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට, ප්‍රායෝගික පරීක්ෂණයකට, වෘත්තීය පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.

x. එක් එක් තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය සියලු අවම සුදුසුකම් ගැසට් පත්‍රයේ සඳහන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

xi. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවා ගැනීමේ පටිපාටි ව්‍යවස්ථා සංශෝධන වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවා ගැනීමේ ප්‍රමාද කිරීම්, වෙනස් කිරීම් සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම බේරුවල නගර සභාවේ ලේකම් සතුය.

03. *සේවයේ නියුක්ත කිරීමේ පොදු කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වේ.

2. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතු ය.

3. තනතුරුවලට අදාළ වැටුප් පරිමාණයන් සඳහා 2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි II වන උපලේඛනය අනුවවේ. එම වැටුප් පරිමාණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වනුයේ 2020.01.01 දින සිටය.

4. මීට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කළ බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි *නොහොත්* නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කළ පනවනු ලබන රෙගුලාසි *නොහොත්* නියෝගවලට ද, අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝගවලට ද, ආයතන ප්‍රධානීන් විසින් නිකුත් කරනු ලබන නියෝගවලට ද අනුව කටයුතු කළ යුතු ය.

04. *අයදුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (ඒ4 ප්‍රමාණයේ අයදුම්පතක් සකස් කර, අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2019.01.18 දිනට පෙර "ලේකම්, බේරුවල නගර සභාව, බේරුවල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලි වල පිටපත් එවිය යුතුය.

i. උප්පැන්න සහතිකය,
ii. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්,
iii. අධ්‍යාපන සහතික/ පාසල හැර යාමේ සහතිකය,
iv. ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
v. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික,
vi. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,
vii. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්,
viii. පොලිස් වාර්තාව.

පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරීක්ෂණයට/ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලබන අතර, එම කැඳවීම් ලද පමණින් ඔබ පත්වීමක් ලැබීමට සුදුස්සෙකු ලෙස නොසැලකිය යුතුය.

* මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම පූර්ණ බලතල මා සතු වන අතර මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය බේරුවල නගර සභාවේ ලේකම් සතු වන්නේ ය.

* මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලත්වයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය නිරවද්‍ය ලෙස බල පැවැත්වෙන්නේ ය.

ඩබ්ලිව්. ඒ. අජිත් කිත්සිරි,
ලේකම්,
බේරුවල නගර සභාව.

2018 දෙසැම්බර් මස 18 වැනි දින,
බේරුවල නගර සභා කාර්යාලයේ දීය.

ආදර්ශ අයදුම් පත්‍රය

බේරුවල නගර සභාව

..... තනතුර සඳහා ආදර්ශ අයදුම්පත්‍රය.

01. (*අ*) මුලකුරු සමග නම :——————————————————
(*ආ*) මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————————
02. ස්ථිර ලිපිනය :——————————————————
03. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :——————————————————
04. දිස්ත්‍රික්කය :——————————
05. උපන් දිනය : අවුරුද්ද :—————— මාසය :—————— දිනය :——————
අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2019.01.18) වයස :
අවුරුදු :—————— මාස :—————— දින :——————
06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————
07. ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග:——————————
08. ජාතික හැඳුනුම්පත් අංකය:——————————
09. දුරකථන අංකය :——————————
10. විවාහක/අවිවාහක බව :——————————

11. පළමු පත්වීම් දිනය (සීමිත අයදුම්කරුවන් සඳහා) :————————————————————

12. අධ්‍යාපන සුදුසුකම් :

12.1 අයදුම්කරු අවසන්වරට සමත් වූ පන්තිය:————————————

12.2 අ.පොෂ. (සා.පෙළ) විභාගය :

I. වර්ෂය :———————— මාසය :————————

II. විභාග අංකය :————————

III. ප්‍රතිඵල :

විෂයය	*සාමාර්ථය*	*විෂයය*	*සාමාර්ථය*
1.		5.	
2.		6.	
3.		7.	
4.		8.	

12.3 අ.පොෂ. (උ.පෙළ) විභාගය :

I. වර්ෂය :———————— මාසය :————————

II. විභාග අංකය :————————

III. ප්‍රතිඵල :

විෂයය	*සාමාර්ථය*
1.	
2.	
3.	
4.	

13. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :————————————————

14. වෙනත් සුදුසුකම් :————————————————

15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද?/නැතිද? යන වග :————————

16. ඔබ දැනටමත් මෙම නගර සභාවේ ස්ථිර, ආදේශක, අනියම්, තාවකාලික, ව්‍යාපෘති පදනම යටතේ සේවය කරන්නේ ද?
එසේනම් එම සේවා කාලය හා විස්තර :————————————————

17. තනතුර :————————————————

18. සේවා කාලය : අවුරුදු :———— මාස :———— දින :————

19. ගතවූ වසර 05 තුළ විනයානුකූල දඬුවමකට භාජනය වී තිබේද ?

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වන බව ද මම දනිමි.

.....
අයදුම්කරුගේ අත්සන.

දිනය :————

ආයතන ප්‍රධානියාගේ සහතිකය

01. මෙම අයදුම්කරු/අයදුම්කාරිය ..... මයා/ මිය මෙම නගර සභාවේ සේවයේ නියුතු අයෙකු බව ද,

02. ඔහු/ ඇය ස්ථිර තනතුරක් දරමින් සිටින බව ද,

03. ස්ථිර තනතුරක සේවයේ ස්ථිර කරමින් ලිපියක් ඔහුට/ඇයට නිකුත් කර ඇති බව ද,

04. ඔහු/ඇය *ගැසට්* නිවේදනයේ දිනට හෝ ඊට පෙර යටත් පිරිසෙයින් අවුරුදු 05 ක් තුළ සක්‍රීය හා සතුටුදායක සේවය සම්පූර්ණ කර ඇති බවද,

05. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම *ගැසට්* නිවේදනයේ දිනට පූර්වාසන්න අවුරුදු 05 ඇතුළත සතුටුදායක පැවති බවද,

06. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බව ද,

07. මෙම විභාගයට අදාළ විභාග නිවේදනයේ දක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බව ද මම සහතික කරමි.

.....
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :————————.

12 - 956/2

බේරුවල නගර සභාව

01. සේවා ගණය හා තනතුරු නාමය : ප්‍රාථමික අර්ධ ශිල්පීය විදුලි කාර්මික III ශ්‍රේණිය

02. පුරප්පාඩු ගණන : 01

03. සුදුසුකම් :

03.1 අධ්‍යාපන සුදුසුකම් : අ.පොස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (මින් විෂයයන් පහක් (05) එකවර සමත් විය යුතුය.)

03.2. වෘත්තීය සුදුසුකම් : තනතුරට අදාළව නියමිත පරිදි තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතාවයන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම.

සහ

අවම වශයෙන් සහ අදාල ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතික මගින් සනාථ කල යුතුය)

04. පළපුරුද්ද :

04.1. බාහිර අයදුම්කරුවන් සඳහා : අදාළ නොවේ

04.2. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා : අදාළ පළාත් පාලන ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක සේවය ස්ථිර කර ඇති සේවා කාලය වසර 05 ක් සපුරා ඇති හා අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වසර 05 ක සතුටුදායක සේවා කාලය සපුරා ඇති සේවකයෙකු විය යුතු ය.

05. වැටුප් :

05.1. වැටුප් කේත අංකය : PL2-2016 (රා : ප : ච : 03/2016 අනුව)

05.2 වැටුප් පරිමාණය රු. 25,250-10×270-10×300-10×330-12×350- රු.38,450/-

06. බඳවා ගැනීමේ ක්‍රමය :

06.1. විවෘත බඳවා ගැනීම

06.1.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

06.1.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

06.1.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : මූලික සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කෙරේ.

06.1.4.ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*	*තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය*
බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්	20	50%
සාමාන්‍ය දැනීම	75	
පෞරුෂත්වය	05	
මුළු ලකුණු	100	

සටහන : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

06.2. සීමිත බඳවා ගැනීම :

06.2.1. ලිඛිත විභාගය : අදාළ නොවේ
06.2.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ
06.2.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : මූලික සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කෙරේ.
06.2.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*	*තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය*
බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්	20	50%
සාමාන්‍ය දැනීම	75	
පෞරුෂත්වය	05	
මුළු ලකුණු	100	

සටහන : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

06.3. කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ

සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකිවන අවස්ථාවලදී විවෘතව අයදුම්පත් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි* :

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය පූර්වාසන්න වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

(iii) බේරුවල නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(iv) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු විය යුතුය හා අවු: 45 ට නොවැඩි විය යුතුය. (තනතුරට අදාළ වන පරිදි දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව සීමිත බඳවා ගැනීම සඳහා බලපානු නොලැබේ)

(v) අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබුවකු නොවිය යුතුය.

(vii) රජයේ හෝ පළාත් පාලන ආයතනයක සේවයෙන් පහ කරනු නොලැබූ අයකු විය යුතු ය.

(viii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබුවෙකු නොවිය යුතුය.

(ix) බඳවා ගැනීම් පරිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට, ප්‍රායෝගික පරීක්ෂණයකට, වෘත්තීය පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.

(x) එක් එක් තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය සියලු අවම සුදුසුකම් *ගැසට්* පත්‍රයේ සඳහන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(xi) අයදුම්පත් කැඳවීමෙන් පසු හො කැඳවන අතර කාලසීමාවේ දී බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදළ නව බඳවා ගැනීමේ පටිපාටි ව්‍යවස්ථා සංශෝධන වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවා ගැනීමේ ප්‍රමාද කිරීම්, වෙනස් කිරීම් සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම බේරුවල නගර සභාවේ ලේකම් සතුය.

03. *සේවයේ නියුක්ත කිරීමේ පොදු කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථීරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වේ.

2. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතු ය.

3. තනතුරුවලට අදළ වැටුප් පරිමාණයන් සඳහා 2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි II වන උපලේඛනය අනුව වේ. එම වැටුප් පරිමාණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වනුයේ 2020.01.01 දින සිටය.

4. මීට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහටය ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි *නොහොත්* නියෝග වලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි *නොහොත්* නියෝගවලට ද, අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝගවලට ද, ආයතන ප්‍රධානීන් විසින් නිකුත් කරනු ලබන නියෝගවලට ද අනුව කටයුතු කළ යුතු ය.

04. *අයදුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (ඒ4 ප්‍රමාණයේ අයදුම්පතක් සකස් කර, අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2019.01.18 දිනට පෙර "ලේකම්, බේරුවල නගර සභාව, බේරුවල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලි වල පිටපත් එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය,
(ii) ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්,
(iii) අධ්‍යාපන සහතික/ පාසල හැර යාමේ සහතිකය,
(iv) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
(v) වෙනත් සුදුසුකම් දක්වෙන සහතික,
(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,
(vii) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්,
(viii) පොලිස් වාර්තාව.

පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරීක්ෂණයට/ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලබන අතර, එම කැඳවීම ලද පමණින් ඔබ පත්වීමක් ලැබීමට සුදුස්සෙකු ලෙස නොසැලකිය යුතුය.

* මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම පූර්ණ බලතල මා සතු වන අතර මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියළුම කරුණු පිළිබඳව අවසන් තීරණය බේරුවල නගර සභාවේ ලේකම් සතු වන්නේ ය.

* මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලත්වයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය නිරවද්‍ය ලෙස බල පැවැත්වෙන්නේ ය.

ඩබ්ලිව්. ඒ. අජිත් කිත්සිරි,
ලේකම්,
බේරුවල නගර සභාව.

2018 දෙසැම්බර් මස 18 වැනි දින,
බේරුවල නගර සභා කාර්යාලයේ දී ය.

බේරුවල නගර සභාව

..... තනතුර සඳහා ආදර්ශ අයදුම්පත්‍රය

01. (අ) මුලකුරු සමඟ නම :——————————————————
(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම :——————————————————
02. ස්ථිර ලිපිනය :——————————————————
03. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :——————————————————
04. දිස්ත්‍රික්කය :——————————
05. උපන්දිනය : අවුරුද්ද :———————— මාසය :———————— දිනය :————————
අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2019.01.18) වයස :
අවුරුදු :———————— මාස :———————— දින :————————
06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————
07. ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග:——————————
08. ජාතික හැඳුනුම්පත් අංකය:——————————
09. දුරකථන අංකය :——————————
10. විවාහක/අවිවාහක බව :——————————
11. පළමු පත්වීම් දිනය (සීමිත අයදුම්කරුවන් සඳහා) :——————————————————
12. අධ්‍යාපන සුදුසුකම් :
12.1 අයදුම්කරු අවසන්වරට සමත් වූ පන්තිය:——————————
12.2 අ.පො.ස. (සා.පෙළ) විභාගය :
I. වර්ෂය :———————— මාසය :————————
II. විභාග අංකය :————————
III. ප්‍රතිඵල :

විෂයය	*සාමාර්ථය*	*විෂයය*	*සාමාර්ථය*
1.		5.	
2.		6.	
3.		7.	
4.		8.	

12.3 අ.පොෂ. (උ.පෙළ) විභාගය :

I. වර්ෂය :———— මාසය :————

II. විභාග අංකය :————

III. ප්‍රතිඵල :

විෂයය	*සාමාර්ථය*
1.	
2.	
3.	
4.	

13. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :————

14. වෙනත් සුදුසුකම් :————

15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද?/නැතිද? යන වග :————

16. ඔබ දැනටමත් මෙම නගර සභාවේ ස්ථිර, ආදේශක, අනියම්, තාවකාලික, ව්‍යාපෘති පදනම යටතේ සේවය කරන්නේ ද?
එසේනම් එම සේවා කාලය හා විස්තර :————

17. තනතුර :————

18. සේවා කාලය : අවුරුදු :———— මාස :———— දින :————

19. ගතවූ වසර 05 තුළ විනයානුකූල දඬුවමකට භාජනය වී තිබේද ?

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වන බව ද මම දනිමි.

.....
අයදුම්කරුගේ අත්සන.

දිනය :————

ආයතන ප්‍රධානියාගේ සහතිකය

01. මෙම අයදුම්කරු/අයදුම්කාරිය ..... මයා/ මිය මෙම නගර සභාවේ සේවයේ නියුතු අයෙකු බව ද,
02. ඔහු/ ඇය ස්ථිර තනතුරක් දරමින් සිටින බව ද,
03. ස්ථිර තනතුරක සේවයේ ස්ථිර කරමින් ලිපියක් ඔහුට/ඇයට නිකුත් කර ඇති බව ද,
04. ඔහු/ඇය ගැසට් නිවේදනයේ දිනට හෝ ඊට පෙර යටත් පිරිසෙයින් අවුරුදු 05 ක් තුළ සක්‍රීය හා සතුටුදායක සේවය සම්පූර්ණ කර ඇති බවද,
05. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම ගැසට් නිවේදනයේ දිනට පූර්වාසන්න අවුරුදු 05 ඇතුළත සතුටුදායක ලෙස පැවති බවද,
06. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බව ද,
07. මෙම විභාගයට අදාළ විභාග නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බව ද මම සහතික කරමි.

.....
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

බේරුවල නගර සභාව

01. සේවා ගණය හා තනතුරු නාමය : ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන සෞඛ්‍ය කම්කරු - III ශ්‍රේණිය

02. පුරප්පාඩු ගණන : 06

03. සුදුසුකම් :

03.1 අධ්‍යාපන සුදුසුකම් : 08 වන ශ්‍රේණිය (09 වසර) සමත් ව තිබිය යුතුය.

03.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නැත

04. පළපුරුද්ද : අදාළ නැත.

05. වැටුප

05.1. වැටුප් කේත අංකය : PL1-2006A (රා : ප : ච : 03/2016 අනුව PL1-2016)

05.2. වැටුප් පරිමාණය : රු. 11,730-120×10-130×10-145×10-160×12-17,600/-

රා : ප : ච : 03/2016 අනුව : (රු. 24,250-250×10-270×10-300×10-330×12- රු. 36,410/-)

06. බඳවා ගැනීමේ ක්‍රමය :

06.1. විවෘත බඳවා ගැනීම :

06.1.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

06.1.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

06.1.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

06.1.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ	උපරිම ලකුණු ප්‍රමාණය	තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය
පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය. (වසරකට ලකුණු 05 බැගින්)	15	50%
තනතුරට අදාලව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික	05	
ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය	75	
පෞරුෂත්වය	05	
මුළු ලකුණු	100	

සටහන .- පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනු පිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහිදී සලකා බලනු ලැබේ.

06.2. සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ

06.3. කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි* :

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්පත් භාර ගන්නා අවසාන් දිනට පූර්වාසන්න වසර තුනක (03)කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

(iii) බේරුවල නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(iv) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු විය යුතුය හා අවු: 45 ට නොවැඩි විය යුතුය. (තනතුරට අදළ වන පරිදි දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව සීමිත බඳවා ගැනීම සඳහා බලපානු නොලැබේ)

(v) අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

(vii) රජයේ හෝ පළාත් පාලන ආයතනයක සේවයෙන් පහ කරනු නොලැබූ අයකු විය යුතු ය.

(viii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

(ix) බඳවා ගැනීම් පරිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට, ප්‍රායෝගික පරීක්ෂණයකට, වෘත්තීය පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.

(x) එක් එක් තනතුරකට බඳවා ගැනීමට අවශ්‍ය සියලු අවම සුදුසුකම් *ගැසට්* පත්‍රයේ සඳහන් දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? යන බව :————————————
11. අධ්‍යාපන සුදුසුකම් :

අ.පොෂ. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

පළමු වතාව
වර්ෂය හා මාසය:————————
විභාග අංකය:————————

දෙවන වතාව
වර්ෂය හා මාසය:————————
විභාග අංකය:————————

විෂයය	*ශ්‍රේණිය*	*විෂයය*	*ශ්‍රේණිය*
1.		1	
2		2	
3		3	
4		4	
5		5	
6		6	
7		7	
8		8	
9		9	

12. වෘත්තීය සුදුසුකම් : .....
.....
.....
13. පළපුරුද්ද: .....
.....
.....
14. ඔබ දැනටමත් රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින්නේ නම්:————————

14.01 සේවය කරන දෙපාර්තමේන්තුව/ආයතනය:————————
14.02 දැනට දරන තනතුර:————————
14.03 එම තනතුරට පත් වූ දිනය:————————

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුව හොත් මා නුසුදුස්සකු බවට පත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගත හොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් පැහැදිලිව දන්වමි.

අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම අයදුම්පත ඉදිරිපත් කරන..... මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක වශයෙන් සේවය කරන බව සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව කාරුණිකව දන්වමි.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————————

12-973/1

නාවලපිටිය නගර සභාව

නාවලපිටිය නගර සභාවේ රියදුරු (ප්‍රාථමික ශිල්පීය) තනතුරේ පුරප්පාඩු පිරවීම

නාවලපිටිය නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ තනතුරුවලට බඳවා ගැනීමට නාවලපිටිය නගර සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුර	පුරප්පාඩු සංඛ්‍යාව
රියදුරු	03

01. *බඳවා ගැනීමේ ක්‍රමය:*

01.1 බඳවා ගන්නා අනුපාතය :

ධාරාව	ප්‍රතිශතය
විවෘත	70%
සීමිත	30%

01.2 විවෘත බඳවා ගැනීම :

01.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය III ශ්‍රේණිය

01.2.2 සුදුසුකම් :

01.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම, මින් විෂයන් 05 ක් එක් වරකදී සමත්වී තිබිය යුතුයි.

01.2.2.2 වෘත්තීය සුසුකම් : මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ පහත තනතුර සඳහා අදාල වන කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

තනතුරු නාමය	සම්පූර්ණ කළ යුතු සුදුසුකම්
රියදුරු	තාර බර හොන්ඩර් 34 ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මඟින් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03 කට පෙර අවම වශයෙන්, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ඩී පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.)

01.2.2.3 පළපුරුද්ද : මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම.
(පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතුය.)

01.2.2.4 කායික සුදුසුකම් :

i. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේදී සහ රාත්‍රී කාලටෙය්දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

ii. අවම උස අඩි 05 අඟල් 02 , 1/2 ක් විය යුතුය.

01.2.2.5 වෙනත් :

i. පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුයි.

iii. මහාමාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.

iv. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

v. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

01.2.3 වයස :

01.2.3.1 අවම සීමාව : අවුරුදු 18 යි

01.2.3.2 උපරිම සීමාව : අවුරුදු 45 යි

01.2.4 *බඳවා ගැනීමේ ක්‍රමය* : ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

01.2.4.1 ලිඛිත විභාගය: 02 වන පරිශිෂ්ටයේ සඳහන් පරිදි ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් පවතින පුරප්පාඩු මත වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

01.2.4.2 වෘත්තීය පරීක්ෂණය :

පරීක්ෂා කර ලබාදෙනුලබන ශිර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය*
1. රිය පැදවීමේ නිපුණතාවය/යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය	40	ලිඛිත පරීක්ෂණයෙන් මුලු ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබා ගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.
2. මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම	40	
3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම	20	
මුළු ලකුණු සංඛ්‍යාව	100	

01.3 සීමිත බඳවා ගැනීම් :

දැනටමත් අදාළ පළාත් පාලන ආයතනයේ තනතුරක ස්ථිර කර ඇති මූලික සුදුසුකම් සපුරා ඇති සේවකයින් සඳහා අදළ වේ.

01.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

01.3.2 සුදුසුකම් :

01.3.2.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයන් 05 ක් එක් වරක දී සමත්වී තිබිය යුතුයි.

01.3.2.2 වෘත්තීය සුදුසුකම් :- මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ පහත තනතුර සඳහා අදාළ වන කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

තනතුරු නාමය	*සම්පූර්ණ කළ යුතු සුදුසුකම්*
රියදුරු	තාර බර හොන්ඩර් 34 ට වැඩි බර මොටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම, (බඳවා ගන්නා දිනට වසර 03 කට පෙර අවම වශයෙන්, මෝටර් රථප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ඩී පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.)

01.3.2.3 පළපුරුද්ද : මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම. (පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතුය.)

01.3.2.4 කායික සුදුසුකම් :

i. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

ii. අවම උස අඩි 5 අඟල් 02 1/2 ක් විය යුතුය.

1.3.2.5 වෙනත් :

i. අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුල වසර 3කට නොඅඩු ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි.

ii. මාර්ග නීති හා මාර්ග සංඥා පිළිබඳ මනා දැනුමකින් යුක්ත විය යුතුයි.

iii. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූරණ කර තිබිය යුතුයි.

01.3.3 වයස :

01.3.3.1 අවම සීමාව : අවුරුදු 18යි

01.3.3.2 අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ යෙදී සිටින අය සම් බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

01.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :

කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමඟ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයක දී සුදුසුකම් ලබාගත යුතුය.

පරීක්ෂා කර ලබාදෙනු ලබන ශීර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය*
1. රිය පැදවීමේ නිපුණතාවය	40	ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබා ගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.
2. මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම	40	
3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම	20	
මුළු ලකුණු සංඛ්‍යාව	100	

01.4. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

01.4.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය.

01.4.2 වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

01.4.3 වැටුප් :

01.4.3.1 වැටුප් ක්‍රේතය : PL - 3-2016

01.4.3.2 වැටුප් පරිමාණය : රා.ප.ව. 03/2016 අනුව රු. 25,790- 270 x 10 - 300 x 10 - 330 x 10 -350 x 12 - රු. 38,990 (2020.01.01 දින සිට මෙම වැටුප් පරිමාණයට එළඹේ.)

2019.01.01 දින සිට මූලික වැටුප :රු. 23,126 ක් හා ගැලපුම් දීමනාව රු. 1,965 ක් ගෙවනු ලැබේ.

01.5. *අයදුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ අයදුම්පත් සකස් කරන තනතුර අදාළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2019.01.31වැනි දිනට පෙර "ලේකම්, නගර සභාව, නාවලපිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දූනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයගේ අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය.

1. අධ්‍යාපන සහතික
2. හැඳුනුම්පතේ ඡායා පිටපතක්
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය
4. මෑතකදී ගත් චරිත සහතික 02 ක්
5. වෘත්තිය සුදුසුකම් සම්බන්ධ සහතික
6. පොලිස් වාර්තාව
7. උප්පැන්න සහතිකය

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම නාවලපිටිය නගර සභාවේ ලේකම් සතුය.

මෙම නිවේදනයේ සිංහල, දෙමළ අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, සිංහල නිවේදනයට අනුව අදාළ කරුණු බලපැවැත්වේ.

ලේකම්,
නගර සභාව, නාවලපිටිය.

2018 දෙසැම්බර් මස 17 වැනි දින,
නාවලපිටිය නගර සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

නාවලපිටිය නගර සභාවේ රියදුරු තනතුර සඳහා ඉල්ලුම් කිරීමේ අයදුම්පත්‍රය

විවෘත ☐
සීමිත ☐

1. මුලකුරු සමඟ නම :——————————
2. සම්පූර්ණ නම :——————————
3. ජාතික හැඳුනුම්පත් අංකය:——————————
4. උපන් දිනය: වර්ෂය:—————— මාසය:—————— දිනය:——————
5. අයදුම්පත් භාර ගන්නා 2019.01.31 දිනට වයස : අවුරුදු :—————— මාස:—————— දින:——————
6. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————
7. විවාහක/අවිවාහක බව :——————————
8. ජාතිය :——————————
9. ස්ථිර ලිපිනය :——————————
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? යන බව :——————————
11. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

පළමු වතාව
වර්ෂය හා මාසය:——————
විභාග අංකය:——————

දෙවන වතාව
වර්ෂය හා මාසය:——————
විභාග අංකය:——————

විෂයය	ශ්‍රේණිය	විෂයය	ශ්‍රේණිය
1.		1	
2		2	
3		3	
4		4	
5		5	
6		6	
7		7	
8		8	

12. වෘත්තීය සුදුසුකම් : .....
.....
.....

13. පළපුරුද්ද: .....
.....
.....

14. ඔබ දැනටමත් රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින්නේ නම්:

14.01 සේවය කරන දෙපාර්තමේන්තුව/ආයතනය:——————————

14.02 දැනට දරන තනතුර:——————————

14.03 එම තනතුරට පත් වූ දිනය:——————————

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුව හොත් මා නුසුදුස්සකු බවට පත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් පැහැදිලිව දන්වමි.

——————————

අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම අයදුම්පත ඉදිරිපත් කරන..... මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක වශයෙන් සේවය කරන බව සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව කාරුණිකව දන්වමි.

——————————

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————————

12-973/2

පළාත් පාලන නිවේදන

මීගමුව මහා නගර සභාව

මහා නගර සභා සීමාව තුළ මස් වෙළඳසැල් වසා තැබිය යුතු දින ප්‍රකාශයට පත් කිරීම

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනතේ (272) අධිකාරි 17 දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නිසි බලධාරියා වශයෙන් මීගමුව මහා නගර සභාව වෙනුවෙන් නගරාධිපති වර්ණකුලසූරිය මෝසෙස් දයාන් ලාන්සා වන මම 2019 වර්ෂයේදී පහත උපලේඛනයේ සඳහන් දිනයන් හා පළාත් සභාව සහ මධ්‍යම රජය විසින් ඉදිරියේ දී අවස්ථාෝචිත ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකි දිනයන්හිදී ද මීගමුව නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම, මස් වෙළඳාම් කිරීම හා මස් කඩ විවෘතව තැබීම සම්පූර්ණයෙන් තහනම් බව දන්වා සිටිමි.

ඩබ්. එම්. දයාන් ලාන්සා,

නගරාධිපති,

මීගමුව මහා නගර සභාව,

මීගමුව.

උපලේඛනය

2019.01.20	දුරුතු පුර පසලොස්වක පෝය දිනය
2019.02.04	ජාතික නිදහස් දිනය
2019.02.19	නවම් පුර පසලොස්වක පෝය දිනය
2019.03.20	මැදින් පුර පසලොස්වක පෝය දිනය
2019.04.19	බක් පුර පසලොස්වක පෝය දිනය
2019.05.18	වෙසක් පුර පසලොස්වක පෝය දිනය
2019.05.19	වෙසක් පුර පසලොස්වක පෝය දිනට පසු දින
2019.06.16	පොසොන් පුර පසලොස්වක පෝය දිනය
2019.07.16	ඇසළ පුර පසලොස්වක පෝය දිනය
2019.08.14	නිකිණි පුර පසලොස්වක පෝය දිනය
2019.09.13	බිනර පුර පසලොස්වක පෝය දිනය
2019.10.04	ලෝක සත්ත්ව දිනය
2019.10.13	වප් පුර පසලොස්වක පෝය දිනය
2019.11.12	ඉල් පුර පසලොස්වක පෝය දිනය
2019.12.11	උදුවප් පුර පසලොස්වක පෝය දිනය

12-861

කටාන ප්‍රාදේශීය සභාව

සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ දෙසැම්බර් මස 13 වන දින පවත්වන ලද කටාන ප්‍රාදේශීය සභාවේ මහසභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. නන්ද විජේරත්න සිල්වා,
සභාපති,
කටාන ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 14 වැනි දින,
කටාන ප්‍රාදේශීය සභාව,
දෙමංහන්දිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්ය සඳහා හෝ නිත්‍ය හෝ විධිමත් ලෙස වගා කිරීමේ කාර්ය සඳහා සුදුසු යම් ඉඩමක-

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්; හෝ

(ආ) සැබවින්ම ගොඩනැගිලි වලින් ආවරණය වූ ඒ ඉඩමේ බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ මුළු බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය විස්සට එක (20) ට 1ට වඩා අඩු වන්නේනම්, හෝ

(ඇ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටෙක

එකී ඉඩම, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධන නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම මත 2019 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට එක (1%) ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2019 මාර්තු 31 වැනි දිනට පෙර කටාන ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු යැයි යෝජනා කරමි.

12-880

මොරටුව මහ නගර සභාව

1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනත

මෙහි පහත උපලේඛනයේ දැක්වෙන තැනැත්තා විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාව එකී ස්ථානයේ පැවැත්වීම සඳහා 2019 වර්ෂයට බලපත්‍රයක් ලබා ගැනීමට මා වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජශාලා වලට බලපත්‍ර දීමේ පනතේ 6 වැනි වගන්තිය යටතේ දැනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලාව අසළ හෝ සමාජශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය අසළ හෝ යම් පදිංචි තැනැත්තෙකු එම සමාජශාලාව සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 4 ක් ඇතුලත තම විරෝධතාවයට හේතු ලියවිල්ලකින් දක්වමින් පිටපත් දෙකකින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය	*සමාජශාලාවේ සභාපති ද ලේකම් ද කළමනාකරුද යන වග*	*සමාජශාලාවේ නම*	*සමාජශාලාවේ කටයුතු කරගෙන යාමට බලාපොරොත්තු වන ස්ථානය*
ආර්. එස්. ප්‍රනාන්දු	සභාපති	යෝව් ක්ලබ් ක්‍රීඩා සමාජය	අංක 31, ඉදිබැද්ද, මොරටුව.

කඳාන ආරච්චිගේ තිලකරත්න,
නාගරික කොමසාරිස්,
මොරටුව මහ නගර සභාව.

12-804

හබරාදුව ප්‍රාදේශීය සභාව

ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව ප්‍රකාශයට පත්කළ දියුණු කළ ප්‍රදේශය තුළ පිහිටි එක් එක් දේපළ මත වරිපනම් නියම කිරීමට, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (i) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, හබරාදුව ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් එකී පනතේ 9(3) වගන්තියෙන් එවකට ලේකම් වෙත පැවරී තිබූ බලතල පරිදි, 2018.02.22 දින තීරණ අංක 11 යටතේ මෙහි පහත සඳහන් පරිදි තීරණය අනුමත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ වරිපනම් නියම කිරීමේ කාර්යය සඳහා ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ නියමයන් සම්පූර්ණ කර ඇති බව වැඩිදුරටත් දන්වමි.

02. ඉහත කී වර්ෂයට අදාල සම්පූර්ණ වරිපනම් මුදල 2019 ජනාවරි මස 31 දින හෝ එදිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් ඒ මුදලෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, කිසියම් කාර්තුවකට අදාළ වරිපනම් මුදල ඒ කාර්තුවේ පළමුවන මාසය අවසන් වීමට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් ඒ කාර්තුවේ මුදලෙන් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලබන බවත්, ඒ ආකාරයෙන් යම් වට්ටමක් ලබා ගැනීමට හැකි වන්නේ අදාළ කාලයට පෙර පැවති හිඟ වරිපනම් වේ නම්, ඒ හිඟය ද ගෙවා අවසන් කළහොත් පමණක් බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදානගමගේ,
සභාපති,
හබරාදුව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 31 වැනි දින.

ලේකම් තීරණ පොත 2018.02.22 දිනැති අංක 11 දරන තීරණය

හබරාදුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දැනට වරිපනම් අය නොකරනු ලබන , එහෙත් 2008.08.08 දිනැති අංක 1562 දරන *ගැසට් පත්‍රය* මගින් දියුණු ගම් ප්‍රදේශයක් ලෙස ගාල්ල දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය මත ප්‍රකාශයට පත් කරන ලද බල ප්‍රදේශයේ පිහිටි සෙසු සියලුම ප්‍රදේශය සඳහා නව, දේපළ තක්සේරුවක් සිදු කිරීමටත්, ඒ අනුව දැනට බලයලත් ප්‍රදේශයේ දේපළ වටිනාකමින් වරිනම් බදු ලෙස අයකරනු ලබන 6% ක බදු වටිනාකමම මෙම දියුණු කළ ප්‍රදේශය තුළ පනවා අය කිරීමටත්, ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට නිසි මගින් යොමු කිරීමට හබරාදුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට එකී පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන්, එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරන ලදී.

12-685/14

කුරුණෑගල මහා නගර සභාව

2018 වර්ෂයේ පරිපූරක අයවැය අංක 01

මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 214(ආ) වගන්තිය ප්‍රකාර 2018 වර්ෂයේ අංක 01 දරන පරිපූරක අයවැය ඇස්තමේන්තුව 2018 දෙසැම්බර් 12 දින සිට දින 07 ක කාලයක් මහජනයාට දැකබලා ගැනීම සඳහා මහා නගර සභා කාර්යාලයේ තබා ඇති බව දැනුම් දෙමි.

තුෂාර සංජීව විතාරණ,
නගරාධිපති.

2018 දෙසැම්බර් මස 10 වැනි දින,
කුරුණෑගල මහා නගර සභා කාර්යාලයේ දී ය.

12-755

මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාව

මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභා මායිම තුළ පිහිටා ඇති පහත සඳහන් ප්‍රදේශ ගොඩනැගිලි පිහිටි ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 වන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය අනුව මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටා ඇති වූ ද, පහත දක්වා ඇති ලේඛනයේ සඳහන් කර ඇති වූ ද, ග්‍රාම නිලධාරී වසම් ගොඩනැගිලි පිහිටන ලද ස්ථාන ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත් කරන බව 2017 වර්ෂයේ මැයි මස 31 වන දිනැති අංක 85 දරන පරිපාලන නියෝග යටතේ මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන ලදී. මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාවේ ගොඩනැගිලි පිහිටා ඇති ප්‍රදේශය ලෙස 2018.12.17 වැනි දින සිට ක්‍රියාත්මක වන සේ ඉහත පනත අනුව, ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය වෙත පවරන ලද අධිකාරී බලය යටතේ මුලතිව් පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් ජේ. රාජමල්ලිකෙ වන මා අනුමැතිය ලබා දී මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ජේ. රාජමල්ලිකෙ,
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්,
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,
මුලතිව් දිස්ත්‍රික්කය,

2108 නොවැම්බර් මස 26 වැනි දින,
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය.
මුලතිව්.

අනු. අංකය	*වට්ටාරමේ නම*	*ග්‍රාම නිලධාරී වසම*	*ග්‍රාම නිලධාරී වසම් අංකය*	*ග්‍රාම නිලධාරී වසම (වර්ග කි. මී.)*	*වට්ටාරමේ(මායිම) සීමාව*
1	මුල්ලයි නගරය මුල්ලපඩ්ඩිනම අංක -**03**	1. සෙල්වපුරම් 2. කොයිර්කුටියිරුප්පු 3. මණර්කුඩියි රුප්පු 4. මුල්ලපඩ්ඩිනම	MU/94 MU /95 MU /96 MU /97	1.17 0.67 0.13 0.39	උතුර- මුල්ලිවෙයික්කාල් නැගෙනහිරේ සීමාව මුහුද, කල්ලප්පාඩු උතුර ග්‍රාම නිලධාරී වසමේ උතුර, කල්ලප්පාඩු දකුණ ග්‍රාමනිලධාරී වසමේ බටහිර නැගෙනහිර : මුහුද දකුණ : සිලාවතෙයි හා සිලාවතෙයි දකුණ ග්‍රාම නිලධාරී වසමේ උතුරු සීමාව බටහිර - නීරාවිප්පිඩ්ඩි ග්‍රාමනිලධාරී වසමේ නැගෙනහිර, හිජ්ජාපුරම් ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර හා උතුරත්, වට්ට්‍රාපලයි ග්‍රාම නිලධාරී වසමේ උතුරු සීමාව (මායිම)

අනු. අංකය	*වට්ටාරමේ නම*	*ග්‍රාම නිලධාරී වසම*	*ග්‍රාම නිලධාරී වසම් අංකය*	*ග්‍රාම නිලධාරී වසම (වර්ග කි. මී.)*	*වට්ටාරමේ(මායිම) සීමාව*
2	මුල්ලියවලයි නැගෙනහිර අංක **06**	1. මුල්ලියවලයි උතුර 2. පුතරිකුටා 3. මුල්ලිවලයි නැගනෙහිර 4. තන්නිරුට්ටු බටහිර	MU/104 MU /105 MU /108 MU /109	2.61 1.04 1.22 0.75	උතුර - කෝප්පාපිලව්, වට්ට්‍රාපලයි ග්‍රාම නිලධාරී වසම්වල දකුණු සීමාව (මායිම) නැගෙනහිර - තන්නිරුට්ටු ග්‍රාම නිලධාරී වසමේ බටහිර සීමාව දකුණ - කණුක්කේණි නැගෙනහිර ග්‍රාම නිලධරී වසමේ උතුර, බටහිර සීමා මාමූලෙයි, මුල්ලියවලයි දකුණ ග්‍රාම නිලධාරී වසම්වල උතුර බටහිර - මුල්ලියවලයි මධ්‍යම, මුල්ලියවලයි බටහිර ග්‍රාම නිලධාරී වසම්වල නැගෙනහිර සීමා.
3	මුල්ලියවලයි බටහිර අංක **07**	1. මුල්ලියවලෙයි බටහිර 2. මුල්ලියවලයි මධ්‍යම 3. මුල්ලියවලයි උතුර	MU/103 MU/106 MU/107	25.58 15.72 17.09	උතුර -පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභා සීමාව, කේප්පාපිලව්, මුල්ලියවලයි උතුර ග්‍රාම නිලධාරී වසම්වල දකුණු මායිම නැගෙනහිර - මුල්ලියවලයි නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ බටහිර හා දකුණත්, තනියූට්ටු බටහිර ග්‍රාම නිලධාරී වසමේ උතුර දකුණ - සීලාවතෙයි හා සීලාවතෙයි දකුණ ග්‍රාම නිලධාරී වසමේ උතුරු සීමාව බටහිර - පුදුකුඩිරුප්පු ප්‍රාදේශීය සභාවේ සීමාව
4	කණුකේණි අංක **08**	1. මාමූලෙයි 2. කණුකේණි නැගනෙහිර 3. කණුකේණි බටහිර	MU/110 MU/116 MU/117	5.70 0.48 0.53	උතුර - මුල්ලියවලයි නැගෙනහිර, තනියූට්ටු බටහිර, තනියූට්ටු නැගෙනහිර, නීරාවිප්පිඩ්ඩි නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම්වල, දකුණු සීමාව නැගෙනහිර - සීලාවතෙයි දකුණ, උප්පුමාවේලි, අලම්පිල් උතුර ග්‍රාම නිලධාරී වසම්වල බටහිර සීමාවන් දකුණ - කුමුලමුනෙයි බටහිර, කුමුලමුනෙයි නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම්වල උතුරු සීමාව බටහිර- මුල්ලියවලයි දකුණ ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර හා උතුරු සීමාව

මහනුවර මහා නගර සභාව

ගෝඝාතක ආඥාපනත

ගෝඝාතක ආඥාපනතේ (272 අධිකාරය අංක 17 (1) දරන වගන්තිය යටතේ මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව නියමිත අධිකාරී තැන වූ මහනුවර පුරපති කේසර ඩී. සේනානායක වන මා විසින් 2019 වර්ෂය තුළ මෙහි පහත පළමුවැනි උපලේඛනයෙහි හා දෙවැනි උපලේඛනයෙහි සඳහන් දිනයන්හි දී ද, විශේෂ හේතූන් මත රජය විසින් හා මා විසින් නියෝග කරනු ලබන වෙනත් දිනයන්හි දී ද මස් පිණිස සතුන් මැරීම, මස් විකිණීම, මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කොට තැබීම හා මස් වර්ග විකුණනු ලබන ස්ථාන විවෘත කොට තැබීම සම්පූර්ණයෙන් තහනම් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

කේසර ඩී. සේනානායක,
පුරපති,
මහනුවර මහා නගර සභාව.

2018 දෙසැම්බර් මස 14 වැනි දින,
මහා නගර සභාව, මහනුවර

පළමුවැනි උපලේඛනය

ජනවාරි	20	ඉරිදා	දුරුතු පුර පසළොස්වක පෝය දිනය
පෙබරවාරි	19	අඟහරුවාදා	නවම් පුර පසළොස්වක පෝය දිනය
මාර්තු	20	බදාදා	මැදින් පුර පසළොස්වක පෝය දිනය
අප්‍රේල්	19	සිකුරාදා	බක් පුර පසළොස්වක පෝය දිනය
මැයි	18	සෙනසුරාදා	වෙසක් පුර පසළොස්වක පෝය දිනය
මැයි	19	ඉරිදා	වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය
ජූනි	16	ඉරිදා	පොසොන් පුර පසළොස්වක පෝය දිනය
ජූලි	16	අඟහරුවාදා	ඇසළ පුර පසළොස්වක පෝය දිනය
අගෝස්තු	14	බදාදා	නිකිණි පුර පසළොස්වක පෝය දිනය
සැප්තැම්බර්	13	සිකුරාදා	බිනර පුර පසළොස්වක පෝය දිනය
ඔක්තෝබර්	13	ඉරිදා	වප්පුර පසළොස්වක පෝය දිනය
නොවැම්බර්	12	අඟහරුවාදා	ඉල් පුර පසළොස්වක පෝය දිනය
දෙසැම්බර්	11	බදාදා	උදුවප් පුර පසළොස්වක පෝය දිනය

දෙවැනි උපලේඛනය

වර්ෂය තුළ සෑම මසකම ඉරිදා සහ පහත සඳහන් ප්‍රසිද්ධ නිවාඩු දිනයන් :

ජනවාරි	15	අඟහරුවාදා	දෙමළ තෙපොංගල් දිනය
පෙබරවාරි	04	සඳුදා	ජාතික නිදහස් දිනය
මාර්තු	04	සඳුදා	මහා ශිවරාත්‍රී දිනය
අප්‍රේල්	13	සෙනසුරාදා	සිංහල හා දෙමළ අළුත් අවුරුදු දිනයට පෙර දිනය
අප්‍රේල්	14	ඉරිදා	සිංහල හා දෙමළ අළුත් අවුරුදු දිනය
අප්‍රේල්	19	සිකුරාදා	මහ සිකුරාදා දිනය
මැයි	01	බදාදා	ලෝක කම්කරු දිනය
ජූනි	05	බදාදා	ඊදුල් ෆිතර් (රාමසාන් දිනය)
අගෝස්තු	12	සඳුදා	ඊදුල් අල්හා (හජ්ජි උත්සව දිනය)
ඔක්තෝබර්	04	සිකුරාදා	ලෝක සත්ත්ව දිනය
ඔත්තෝබර්	27	අඟහරුවාදා	දීපවාලි උත්සව දිනය
නොවැම්බර්	10	ඉරිදා	මීලාදුන්-නබි (නබි නායකතුමාගේ උපන් දිනය)
දෙසැම්බර්	25	බදාදා	නත්තල් උත්සව දිනය

කොළඹ මහා නගර සභාව

ගෝඝාතක ආඥාපනතේ 272 අධිකාරයේ අංක 17 (1) දරන වගන්තිය යටතේ මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව කොළඹ මහා නගර සභාවේ නගරාධිපති වන මා විසින් 2019 වර්ෂය තුළ මෙහි පහත පළමුවැනි උපලේඛනයෙහි හා දෙවැනි උපලේඛනයෙහි සඳහන් දිනයන්හි දී ද, රජය විසින් විටින් විට නිකුත් කරනු ලබන නියෝග අනුව වැසිය යුතු දිනයන් හි දීද කොළඹ මහා නගර සභා ප්‍රදේශය තුළ මස් පිණිස සතුන් මැරීම, මස් විකිණීම. මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කොට තැබීම හා මස් වර්ග විකුණනු ලබන ස්ථාන විවෘත කොට තැබීම සපුරා තහනම් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

බී. ආර්. සේනානායක,
නගරාධිපති,
කොළඹ මහා නගර සභාව.

2018 දෙසැම්බර් මස 17 වැනි දින,
නගර ශාලාව,
කොළඹ 07.

පළමුවැනි උපලේඛනය

ජනවාරි	20	දුරුතු මස පුර පසලොස්වක පෝය දිනය
පෙබරවාරි	19	නවම් මස පුර පසලොස්වක පෝය දිනය
මාර්තු	20	මැදින් මස පුර පසලොස්වක පෝය දිනය
අප්‍රේල්	19	බක් මස පුර පසලොස්වක පෝය දිනය
මැයි	18	වෙසක් මස පුර පසලොස්වක පෝය දිනය
මැයි	19	වෙසක් මස පුර පසලොස්වක පෝය දිනට පසු දින
ජුනි	16	පොසොන් මස පුර පසලොස්වක පෝය දිනය
ජූලි	16	ඇසළ මස පුර පසලොස්වක පෝය දිනය
අගෝස්තු	14	නිකිණි මස පුර පසලොස්වක පෝය දිනය
සැප්තැම්බර්	13	බිනර මස පුර පසලොස්වක පෝය දිනය
ඔක්තෝබර්	13	වප් මස පුර පසලොස්වක පෝය දිනය
නොවැම්බර්	12	ඉල් මස පුර පසලොස්වක පෝය දිනය
දෙසැම්බර්	11	උදුවප් මස පුර පසලොස්වක පෝය දිනය

දෙවැනි උපලේඛනය

පෙබරවාරි	04	ජාතික නිදහස් දිනය
මැයි	01	ලෝක කම්කරු දිනය
ඔක්තෝබර්	04	ලෝක සත්ත්ව දිනය

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

261 වන අධිකරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 උපවගන්තිය ප්‍රකාරව පහත සඳහන් යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. පී. ඩබ්. එම්. එස්. බී. යටවර,
සභාපති,
මහනුවර කඩවත් සතර සහ
ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව,
අම්පිටිය.

2018 නොවැම්බර් මස 21 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ දී.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 දින අංක 1816/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ IV (ආ)* කොටසේ පළ කරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද්දවූ ඝණ අපද්‍රව්‍ය කළමනාකරනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙම යෝජනාව ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පල කරනු ලබන දින සිට මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 උපවගන්තියෙන් මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018.09.13 වැනි දින පැවති මහ සභා තීරණ අංක 05.19 යටතේ සභාව යෝජනා කරන්නී ය.

12-943

මාවතගම ප්‍රාදේශීය සභාව

මංමාවත් පිළිබඳ දැන්වීමයි

අංක 2,082 හා 2018.07.06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටා ඇති වටරක කොට්ඨාසයට අයත් ඉගුරුවත්ත ඇලේකුඹුර හරහා වරකාකන්ද නමැති මංමාවත සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තියට අනුව කිසිම විරෝධතාවයක් ලැබී නොමැත. එබැවින් එම මාර්ගය මාවතගම ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් ලෙස ක්‍රියා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. කේ. අනුර කමල් පෙරේරා,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මාවතගම.

2018 නොවැම්බර් මස 16 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

12-969/1

සංශෝධනය කිරීම

මාවතගම ප්‍රාදේශීය සභාව

මාර්ග දැන්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍ර* අංක 2075 හා ජුනි මස 08 වන දිනෙන් හා *ගැසට් පත්‍ර* අංක 2088 හා සැප්තැම්බර් මස 07 වැනි දිනවල IV (ආ) කොටස යටතේ පළකරන ලද මාර්ග දැන්වීම්වල 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24 (2) වැනි වගන්ති යටතේ කරනු ලබන දැන්වීමයි යන වගන්තිය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) හා 24(2) වැනි වගන්ති යටතේ කරනු ලබන දැන්වීමයි. ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

සභාපති,
ප්‍රාදේශීය සභාව,
මාවතගම.

12-969/2

කුරුවිට ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා එළ හරක් මස් වෙළෙඳාම පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම

මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් අය විසින් පහත සඳහන් ස්ථානයන් හි එළ හරක් මස්, එළු මස් හා කුකුල් මස් වෙළෙඳාම කරගෙන යාම සඳහා බලපත්‍ර ලබා ගැනීමට ඉදිරිපත් වී සිටින බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 7(2) වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ නම්, ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණක් නිසා ද යන බව සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වමි.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙහි පහත උපලේඛනයෙහි සඳහන් ඉල්ලුම්කරු වෙත අදාළ ව්‍යාපාර ස්ථානවල වෙළෙඳාම කරගෙන යාම සඳහා 2019.12.31 වැනි දින දක්වා බලපත්‍ර ලබාදීම සිදුකරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

උපලේඛනය

	ඉල්ලුම්කරුගේ නම	වෙළෙඳාම කරනු ලබන ස්ථානය	වෙළෙඳාමේ ස්වභාවය
01.	ඒ. ඒ. එම්. නසාර් මයා, අංක 494, මලව, කුරුවිට.	වාණිජ -A ගොඩනැගිල්ල	එළහරක් මස්

12-967/1

කුරුවිට ප්‍රාදේශීය සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් උපලේඛනයේ සඳහන් ස්ථානයන්හි 2019 වර්ෂයට ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලමින් අයදුම්පත්‍ර මා වෙත ඉදිරිපත් කර ඇති බවත් එම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි හා ජීවත්වන අයවළුන් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් පදනම්

කරගෙන ද යන්න පිළිබඳ විස්තර ලිඛිතව පිටපත් 02 කින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (ආ) කොටසේ පළ වූ දා සිට දින 14 ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනත (272 වැනි අධිකාරිය 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ප්‍රේමරත්න මල්කැකුළ,
සභාපති,
ප්‍රාදේශීය සභාව - කුරුවිට.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය	*ගෝඝනකාගාරය පවත්වාගෙන යන ස්ථානය*
01. ඒ. ඒ. එම්. නසාර් මයා. අංක 494, මලව, කුරුවිට.	මංකඩහේන මලව, කුරුවිට.

12-967/2

ලුණුගල ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථාව

261 අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2018.10.18 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී පහත උපලේඛනයේ සඳහන් අංක 01 සිට 23 දක්වා වූ අංක දරන සම්මත අතුරු ව්‍යවස්ථා යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. ජගත් චන්ද්‍ර දළුකොටුව,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 30 වැනි දින,
සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර ඌව පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ප්‍රාදේශීය සභා පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාවේ අංක 01 සිට 23 දක්වාවූ කාණ්ඩයන් වැළඳගැනීමටත්, මෙම යෝජනාව *ගැසට් පත්‍රයේ* පළකරන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ලුණුගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.''

12-692

හොරණ ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

හොරණ ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ජූලි මස 10 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක ඉ:01:04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

අනිල් අසෝක රණතුංග,
සභාපති,
හොරණ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 10 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2011.07.05 වැනි දින අංක 1713/11 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ පළකරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2019.01.01 වැනි දින සිට අදාළ විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-952

මාතර මහා නගර සභාව

1957 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් තැනැත්තන් විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාවලට එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 2019 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීම සඳහා මා වෙත ඉල්ලුම්පත් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනතේ (6) වැනි වගන්තියේ (ඇ) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලා අසල හෝ එකී සමාජ ශාලා සඳහා අපේක්ෂිත ස්ථානය අදාළ හෝ පදිංචි යම් තැනැත්තෙකු එම ක්‍රීඩා සමාජශාලා සඳහා බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන්නේ නම් එම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට සති 04 ක් ඇතුළත තමාගේ විරුද්ධත්වයට හේතු ලිඛිතව පිටපත් 02 කින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

සේනක පල්ලියගුරුගේ,
නාගරික කොමසාරිස්,
මාතර මහා නගර සභාව.

2018 දෙසැම්බර් මස 05 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.
(උපලේඛනය පහත දැක්වෙන)

උපලේඛනය

අයදුම්කරුගේ නම	*සමාජශාලාවේ ලේකම්/ සභාපති/කළමනාකරු*	*සමාජ ශාලාවේ නම*	*සමාජ ශාලාවේ කටයුතු කරගෙන යන ස්ථානය*
1. ලලිඳු කාවින්ද ද සිල්වා	ලේකම්	නිල්මිණි ක්‍රීඩා සමාජය	අංක 66, අලුත් තංගල්ල පාර, කොටුවේගොඩ, මාතර.

12-947

කොළඹ මහා නගර සභාව

ගෝඝාතක ආඥාපනත (272 වැනි පරිච්ඡේදය)

මතු සඳහන් උපලේඛනයේ නම් සඳහන් අය විසින් එකී නම ඉදිරියෙන් විස්තර දක්වා ඇති ස්ථානයට 2019 වර්ෂය තුළ මස් විකිණීමට අදාළව කටයුතු පවත්වාගෙන යාම පිණිස ගෝඝාතක බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව කොළඹ මහා නගර සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එය පිටපත් දෙකකින් යුත් සවිස්තර ලියවිල්ලක් වශයෙන් සකස් කර මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වී දින 14 ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත්, ගෝඝාතක ආඥාපනතේ (272) වැනි අධිකාරිය 7(2) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

බී. ආර්. සේනානායක,
නගරාධිපති,
කොළඹ මහා නගර සභාව.

2018 නොවැම්බර් මස 17 දින,
නගර ශාලාව,
කොළඹ 07.

උපලේඛන 01

අනු. අංකය	*ටෙන්ඩර්කරුගේ නම*	*කඩ අංකය*	*වෙළෙඳ ස්වභාවය*
මැනිං පොදු වෙළඳපොළ :			
1	දෙල්ගහවත්ත සත්ව ගොවිපල පුද්ගලික සමාගම	821	ඌරු මස්
2	සී. බී. ඒ. කාදර් මයා.	823	ගව මස්
3	එන්. එම්. එම්. යූෂූෆ් මයා.	824	ගව මස්
4	කේ. එස්. ප්‍රනාන්දු මයා.	825	එළු මස්
5	එස්. එස්. මරියම් මිය.	827	ගව මස්
6	අයි. ආර්. එම්. අශ්රොෆ් මයා.	829	ගව මස්
7	එස්. එම්. සබුර්ඩීන් මයා.	830	ගව මස්
8	එම්. එච්. සමාන් මයා.	831	ගව මස්
9	ජී. රවීන්ද්‍රනාතන් මයා.	832	එළු මස්
බොරැල්ල පොදු වෙළඳ සංකීර්ණය :			
10	එම්. ආර්. එච්. නජිමුදීන් මයා.	7 B/26	ගව මස්
11	එච්. බී. එෆ්. හිනායා මිය.	7 B/29	ගව මස්
12	එස්. ඕමාර් කත්තා මයා.	7 B/30	ගව මස්
13	සී. එම්. එස්. නසාර් මයා.	7 B/31	එළු මස්
14	ඒ. එස්. මොහොමඩ් මයා.	7 B/35	ගව මස්
15	එස්. ඕ. කත්තා මයා.	7 B/37	ගව මස්
16	බී. කේ. එන්. බේගම් මිය.	7 B/41	ගව මස්
17	එච්. ආර්. එච්. නජිමුදීන් මයා.	7 B/42	ගව මස්
18	එස්. එච්. එන්. රහීම් මයා.	7 B/43	එළු මස්
19	ආර්. ඒ. සී ද අල්විස් මයා.	7 B/55	ඌරු මස්

අනු. අංකය	*ටෙන්ඩර්කරුගේ නම*	*කඩ අංකය*	*වෙළෙඳ ස්වභාවය*
දෙමටගොඩ පොදු වෙළඳපොළ :			
20	එම්. එෆ්. කේ. එම්. නවුෆර් මයා.	50/03	ගව මස්
ඩීන්ස් පාර පොදු වෙළඳපොළ			
21	එම්. වයි ඕ. එම්. ඉක්බාල් මයා.	44/03	ගව මස්
22	එම්. බී. එෆ්. අමීනා මයා.	44/06	ගව මස්
23	එම්. එස්. එම්. ඉක්බාල් මයා	44/08	ගව මස්
24	එන්. එම්. රබීක් මයා.	44/09	ගව මස්
25	එම්. කිවු, අබ්දුල් කාදර් මයා.	44/10	ගව මස්
26	එම්. එම්. ඩිල්ෂාර් මයා	44/11	එළු මස්
27	ජේ. ඒ. එස්. එස්. එම්. ෂෆ්රාස් මයා.	44/12	ගව මස්
28	එම්. එස්. එම්. මුසාජීර් මයා.	44/14	ගව මස්
කොල්ලුපිටිය පොදු වෙළඳපොල :			
29	දෙල්ගහවත්ත සත්ව ගොවිපල පුද්ගලික සමාගම	01A	ඌරු මස්
30	එස්. බී. එම්. ඩිල්ෂාන් මයා.	3	එළු මස්
31	එස්. එම්. ශබ්රීන් මයා.	4	ගව මස්
32	එම්. එෆ්. එම්. රවුෂාන් මයා.	9	එළු මස්
33	එස්. එච්. එම්. සෆ්රාස් මයා.	12	ගව මස්
බම්බලපිටිය පොදු වෙළඳපොළ :			
34	එන්. එම්. එස්. ඩාවුඩ් මයා.	21	ගව මස්
35	එස්. සයිෂාන් මයා.	22	ගව මස්
36	එන්. කේ. එම්. නිහාර් මයා.	23	එළු මස්
37	එම්. ආර්. එම්. සෆික් මයා.	25	ගව මස්
වැල්ලවත්ත පොදු වෙළඳපොළ :			
38	ඒ. සී. එන්. මොහොමඩ් මයා.	1	ගව මස්
39	එම්. අස්වර්ඛාන් මයා.	2	ගව මස්
40	ඒ. කේ. එන්. මොහොමඩ් මයා.	3	ගව මස්
41	එච්. ආර්. එම්. ෆාහිම් මයා.	4	ගව මස්
42	ඒ. සී. එන්. මොහොමඩ් මයා.	1	එළු මස්
43	එම්. අයි. එන් ඛාන් මයා.	2	එළු මස්

අනු. අංකය	ටෙන්ඩර්කරුගේ නම	කඩ අංකය	වෙළෙඳ ස්වභාවය
මාලිගාවත්ත පොදු වෙළඳපොළ :			
44	එන්. එම්. එම්. මුස්තකීන් මයා.	2	එළු මස්
45	එම්. ආර්. එම්. නවුෂාඩ් මයා.	4	ගව මස්
46	එස්. බී. එම්. සාදික් මයා.	5	ගව මස්
47	එන්. එම්. එම්. මුස්තකීන් මයා.	6	ගව මස්
48	එන්. එම්. එම්. ෆුර්ඛාන් මයා.	7	ගව මස්
49	ජේ. එම්. යූෂුෆ් මයා.	8	ගව මස්
50	එම්. එස්. එම්. සාජහාන් මයා.	9	ගව මස්
කොටහේන පොදු වෙළඳපොළ :			
51	අයි. එච්. බී. එස්. තුල්කාර්නි මයා.	11	ගව මස්
52	අයි. එච්. බී. එස්. තුල්කාර්නි මයා.	13	ගව මස්
53	එම්. එෆ්. එම්. රිෆාස් මයා.	14	එළු මස්
54	එම්. එච්. එම්. ෂරීෆා මිය.	17	එළු මස්
ජාතික පොල වෙළඳපොල :			
55	මොහොමඩ් රූමී මයා.	275	ගවමස්
56	මොහොමඩ් රූමී මයා.	277	එළුමස්
නාගස් හන්දිය පොදු වෙළඳපොල :			
57	එස්. ඕ. සමද් මයා.	10/08	ගවමස්
58	ඩබ්. ඒ. කාදර් මයා.	10/09	ගව මස්
59	ඒ. කේ. එස්. හමීඩ් මයා.	10/10	එළු මස්
60	ඒ. එස්. එම්. බී. නසාර්	10/11	ගව මස්
61	ඉසෙඩ්. ඒ. එම්. සාරාස් මයා.	10/12	ගව මස්
ජින්තුපිටිය පොදු වෙළඳපොල :			
62	ජේ. එස්. එම්. අස්ලාම් මයා.	1	එළුමස්

අනු. අංකය	*ටෙන්ඩර්කරුගේ නම*	*කඩ අංකය*	*වෙළෙඳ ස්වභාවය*
විස්ටවයික් පොදු වෙළඳපොල :			
63	කේ. එම්. තන්සිල් මයා	30/4	ග ව මස්
64	එච්. එම්. එම්. ඔමර්දීන් මයා	30/5	එළු මස්
65	එම්. නජුර්ඩීන් මයා.	30/6	ගව මස්
නාගලගම්වීදිය පොදු වෙළඳපොල :			
66	ඒ. ආර්. එම්. ඩී. මොහිදීන් බාන් මයා.	381/6	එළු මස්
67	ඒ. ආර්. එම්. අලිබාන් මයා.	381/3	ගව මස්
68.	ඒ. ආර්. එම්. හජ්මීර් බාන් මයා.	381/4	ගව මස්
69	ඒ. ආර්. එම්. අලිබාන් මයා.	381/5	ගව මස්
මෝදර පොදු වෙළඳපොල :			
70	ඒ. ආර්. එම්. අලිබාන් මයා	4	ගව මස්
කිරුළපන පොදු වෙළඳපොල :			
71	ආර්. ඒ. සී ද අල්විස් මයා	103	ඌරු මස්
72	ෆාරුක් අයුබ්බාන් මයා	147	එළු මස්
73	ඒ. එස්. මොහමඩ් මයා	148	ගව මස්
74	එස්. එම්. සියාම් මයා	149	ගව මස්
75	එස්. එච්. එම්. රහීම් මයා	150	ගව මස්
කොම්පඤ්ඤවීදිය පොදු වෙළඳපොල :			
76	එම්. එස්. නිහාර්ඩීන් මයා	1	එළු මස්
77	එම්. එච්. බී. නිසාර් මිය.	2	ගව මස්
78	කේ. එම්. ෆවුස්ඩීන් මයා.	3	ගව මස්
79	එස්. එම්. තාවුස් මයා.	4	ගව මස්

පෞද්ගලික ගව මස් වෙළෙඳසැල් :

නම	*ස්ථානය*
එම්. එච්. එම්. නිලාම් මයා.	324, දෙමටගොඩ පාර, කොළඹ 09
එස්. කේ. කාදර් මයා.	07, ද මැල් වීදිය, කොළඹ 02
ජේ. ජේ. ජමාල් මයා.	07 ඒ. මැල් වීදිය, කොළඹ 02
එස්. නිහාර්ඩින් මයා.	07 බී. ද මැල් වීදිය, කොළඹ 02
ඒ. එච්. එම්. සුහෙයිර් මයා.	242, මැසෙන්ජර් වීදිය, කොළඹ 12
මර්ලින් කීගල් මිය.	102, හල්ෆ්ඩ්‍රොප්පාර, අලුත් යොන් වීදිය, කොළඹ 12
ආර්. ඒ. ෆතිමා නසීරා මෙය.	102, ශාන්ත අන්තෝනි පාර, කොළඹ 13
ඒ. ආර්. එම්. අලිබාන් මයා.	488, මාදම්පිටිය පාර, කොළඹ 14
එම්. එෆ්. ජෙයිනුල් ආබ්දීන් මයා.	97, අබ්දුල් හමීඩ් වීදිය, කොළඹ 12
ටී. කේ. එන්. ෆාරීනා මිය	211/52, ජුම්මා මස්ජිඩ් පාර, කොළඹ 10
එම්. ටී. ආර්. අමීර් මයා.	01, හුසේනියා වීදිය, කොළඹ 12
එම්. එම්. මොහොමඩ් රිල්වාන් මයා.	227, ලෙයාඩ්ස් බ්‍රෝඩ්වේ, කොළඹ 14
එම්. ආර්. එම්. රම්ලි මයා.	195, මිරානියා වීදිය, කොළඹ 12
එම්. ටී. ආර්. අමීර් මයා.	111/2, මධ්‍යම පාර, පිටකොටුව
එස්. එම්. ෂූක්රි මයා.	226 , මොහිදීන් මස්ජිඩ් පාර, කොළඹ 10
ඒ. එම්. ෂාහුල් හමීඩ් මයා.	A. G. 05, විතානගේ මාවත, කොළඹ 02

පෞද්ගලික එළු මස් වෙළඳසැල් :

ඒ. එච්. මොහමඩ් සීනි මයා	බී/ජී/07, මිහිඳු මාවත, කොළඹ 12

පෞද්ගලික ගව/එළු/ඌරු මස් වෙළඳසැල් :

කාගිල්ස් ලංකා පුද්ගලික සමාගම	අංක 40, යෝක් වීදිය, කොළඹ 01
ජේ. කේ. මාකටින්ස් (පුද්) සර්විසස්	
කීල්ස් ෆුඩ් ප්‍රොඩක්ට්ස් පී. එල්. සී.	අංක 148, වොක්හෝල් වීදිය, කොළඹ 02

කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන (අනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති CLG5/4/K/4 හා 2018.01.04 දිනැති ලිපිය අනුව පහත උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සළකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහා ද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම්පාන යම් පාර්ශවයක් වේ නම් මෙම දැන්වීම පළ කළ දින සිට මාස 03ක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව,
බුළුරුප්ප, හෙට්ටිමුල්ල.

උපලේඛනය

පාරේ නම	:	උතුරු රවුම්පාරේ සිට ගන්ගොඩ වෙලමැදපාර දක්වා ඇති මාර්ගය
වසම	:	52 A බෙරගල වසම
දිග	:	මීටර් 237
පළල	:	මීටර් 2.4

පාරේ වම්පස

1. ජී. ඩී. ප්‍රේමසිරි
2. බී. පී. ගංගා ඉදුනිල්
3. එල්. සුසන්ත සිල්වා
4. ජී. ඩී. මෛත්‍රිපාල අමරසිංහ

පාරේ දකුණුපස

1. බී. පී. උදය පුෂ්ප කුමාර
2. සේනානි දිනුෂා බදුල්ලගහපිටිය
3. ඒ. ආර්. අමිල නුවන් බණ්ඩාර
4. කේ. ඩී. පියසේන
5. එච්. ඩබ්ලිව්. ජී. ඩබ්ලිව්. ඒ. ඩබ්ලිව්. වික්‍රමසිංහ

පාරේ නම	:	හෙට්ටිමුල්ල, දික්කොහුපිටිය, කරඩුවාවලහේන වත්තට පිවිසෙන මාර්ගය
වසම	:	දික්කොහුපිටිය
දිග	:	මීටර් 100
පළල	:	අඩි 10

පාරේ වම්පස

1. ඩබ්. කේ. පී. පෙරේරා
2. එච්. එම්. එස්. කේ. හේරත්

පාරේ දකුණුපස

1. එම්. පී. සී. ටී. සුදසිංහ

A.B.Wasalatantri,
Licensed Surveyor,
Land Lr and Valuer,
Kegalle.

PLAN NO: 1262/A

Lot 1 in
Plan No: 3379

Lot 4 in Plan No: 0502
made by Mr.P.P.G.Jayasena,
Licensed Surveyor

Lot 5 in Plan No:
0502

Lot 3 in
Plan No: 3379

Lot 6 in
Plan No: 0502

From Bulurupp[illegible] 9 ROAD(PS) to Ekiriyagala

Reference
(PS) - Pradeshiya Sabha

Scale : 1 : 1000

PLAN

of a part of an allotment of land called
Karaduwewalahena
depicted as lot 5 in Plan No: 3379 dated
29. 04. 1986 made by Mr.K.S.Panditaratne
Licensed Surveyor
(Proposed 10' wide Means of Access with
1' wide Drain, from Bulurupp to Ekiriyagala
Pradeshiya Sabha Road to Houses)
Situated in the Village of Ekiriyagala
In Mawatha Pattu of Paranakuru Korale
Kegalle District
SABARAGAMUWA PROVINCE

Containing in Extent:

Lot No:	Hectares	A.	R.	P.	Distance
1	0.03048	0.	0.	12.05	100 Metres

Bounded as described above.
Surveyed on: 22. 10. 2009

A.B.Wasalatantri
Licensed Surveyor

12-980

යාපනය මහ නගර සභාව

1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත

පහත නම සඳහන් තැනැත්තා විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාව එහි සඳහන් ස්ථානයෙහි පවත්වාගෙන යාම සඳහා 2019 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීම පිණිස මා වෙත අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බව 1975 අංක 17 දරන සමාජශාලා බලපත්‍ර දීමේ පනතේ (6) වැනි වගන්තියේ (ඈ) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනු දෙමි.

එකී සමාජශාලා අසල හෝ එකී සමාජ ශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය හෝ අදාළ හෝ පදිංචි යම් තැනැත්තෙකු එම සමාජශාලාව සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් එම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළමුවන දිනයේ සිට සති 04 ක් ඇතුලත තමා විරුද්ධත්වයට හේතු ලිඛිතව දක්වමින් පිටපත් දෙකකින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වමි.

ආර්. ටී. ජෙයසීලන්,
මහ නගර කොමසාරිස්,
යාපනය මහ නගර සභාව.

2018 දෙසැම්බර් 21 වැනි දින,
මහ නගර සභාව,
යාපනය.

උපලේඛනය

අනු. අංකය	ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය	සමාජශාලාවේ සභාපතිද, ලේකම්ද, කළමනාකරුද යන වග	සමාජ ශාලාවේ නම	සමාජ ශාලාවේ කටයුතු කරගෙන යාමට බලාපොරොත්තු වන ස්ථානය
1.	කේ. සුදන් කන්දරෝඩෙයි බටහිර, චුන්නාකම්	ලේකම්	සෙවන් ලෙවන් ක්‍රීඩා සමාජය	අංක 66 රාසාවන් තෝට්ටම් වීදිය යාපනය

12-995

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථාව

261 වන අධිකාරය වන අංක 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව විසින් 2018.10.19 දින පවත්වන ලද රැස්වීමේදී පහත උපලේඛනයේ සඳහන් අංක 18 දරන යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්.ජී. වී. ඒ. ශ්‍රී ලාල් සෙනරත්.
සභාපති,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 25 වැනිදින,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

උපලේඛනය

"1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ සබරගමුව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සාදනු ලැබ 2011.01.28 දිනැති අංක1691 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරනු ලද

හා සබරගමුව පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරනු ලැබූ බව 2012.03.30 දිනැති අංක 1752 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරන ලද්දා වූ සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළි ගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (3) වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

12-978/1

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථාව

261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව විසින් 2018.10.19 දින පවත්වන ලද සභා රැස්වීමේදී පහත අංක 01 හා අංක 02 උපලේඛන වල සඳහන් අංක 19 දරන යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්.ජී. වී. ඒ. ශ්‍රී ලාල් සෙනරත්.
සභාපති,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 25 වැනි දින,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

උපලේඛනය (1)

"1989 අංක 12 දන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) උපවග න්තිය යටතේ සබරගමුව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සාදනු ලැබ 2013.06.28 දිනැති අංක 1817 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරනු ලද හා සබරගමුව පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරනු ලැබූ බව 2018.07.20 දිනැති අංක 2081 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරන ලද්දා වූ සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළි ගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (3) වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

ඉහත සම්මත අතුරු ව්‍යවස්ථාවේ අංක 29 යටතේ අර්ථ නිරූපනය කර ඇති කොටසේ XXIV ඡේදයේ "සභාව" යන්නෙන් සඳහන්ව ඇති ස්ථානයේ හිස්තැනට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව ලෙස ඇතුලත් කෙරේ.

ඉහත සම්මත අතුරු ව්‍යවස්ථාවේ අංක 8 හි ii ඡේදයේ සඳහන් ගාස්තු යන්න උපලේඛන අංක 02 යටතේ දක්වා ඇත.

උපලේඛනය (2)

ඉහත සම්මත අතුරු ව්‍යවස්ථාව අනුව වරිපනම් එකතු කරන බල ප්‍රදේශයේ පිටත ප්‍රදේශවල කරන කසළ එකතු කිරීමේ ගාස්තු පහත උපලේඛනයේ පරිදි ඉඹුල්පේ ප්‍රාදේශීය සභා සීමාවේ සභාව විසින් කසළ එකතු කරන්නා වූ ප්‍රදේශයන්හි පහත උපලේඛනයෙහි I කොටසේ සඳහන් ස්ථාන වලින් එම උපලේඛනයෙහි ii කොටසට අනුරූප වූ කසල එකතු කිරීමේ ගාස්තුවක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

I කොටස	II කොටස
	රු. ශත
නිවසක් සඳහා මාසයකට	200 0
හෝටල්, නොවන ව්‍යාපාර සඳහා මාසයකට	500 0
නවාතැන් රහිත හෝටලයක් සඳහා මාසයකට	1,000 0
නවාතැන් සහිත හෝටල් සහ කර්මාන්ත ශාලා සඳහා මාසයකට	6,000 0

මඩකලපුව මහ නගර සභාව

2019 වර්ෂයට අදාලව වරිපනම් බදු පැනවීම

මඩකලපුව මහනගර සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 13 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කර ඇති අතර (252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනතේ 230, 247 යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව මඩකලපුව මහනගර සභා බල ප්‍රදේශය දේපල සඳහා 2019 වර්ෂයට අදාලව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහනගර සභා ආඥාපනතේ 238 වන වගන්තියේ (1) වන උප වගන්තිය 239 වන වගන්තිය යටතේ මඩකලපුව මහ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මහනගර සභාව බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගේපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2012 වර්ෂය සඳහා වූ තක්සේරුව 2019 වර්ෂය සඳහා තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත මහ නගර සභා ආඥාපනතේ 286ඒ වගන්තිය සමග කියවිය යුතු එම ආඥාපනතේ 230 (1), 230 (1A), 230 (1AA)වග න්තියෙහි ඇති විධිවිධාන ප්‍රකාරව, නව කොට්ඨාස මායිම නිශ්චිත කිරීම අනුව පහත උපලේඛන 1 හි සඳහන් කර ඇති පරිදි වාර්ෂික වරිපනම් බද්දක් 2019 වර්ෂයේ ජනවාරි මස සිට නියමවිය යුතු බව තීරණය කර ඇත.

උපලේඛන 1

නව කොට්ඨාස	*නිවාස*	*වෙළෙඳ ස්ථාන*	*හිස් ඉඩම්*	*රජයේ දේපල*
නගර ප්‍රදේශය 8, 9, 10, 11, 17, 18	7%	8%	25%	15%
උප නගර ප්‍රදේශය 4. 5, 6, 7, 13, 14, 15, 16	6%	7%	20%	15%
ගම් 1, 2, 3, 12. 19, 20	5%	6%	15%	15%

තවද, 2019 වර්ෂයෙහි ඔබ වෙත පනවා ඇති සම්පූර්ණ වරිපනම් බද්ද හෝ උපලේඛන II හි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වරිපනම් බද්ද මඩකලපුව මහ නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2018 වර්ෂයෙහි දෙසැම්බර් මස 1 වන දින සිට 2019 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින තුල ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, උපලේඛන II හි සඳහන් එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනටය පෙර අදාල වරිපනම් බදු මුදල මඩකලපුව මහ නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාල මුදලින් 5% වට්ටමක් ද, ලබා දීමටත්, එම වාර්ෂික වරිපනම් නොගෙවන්නේ නම් නිවාසවලට 15% ද වෙළෙඳ ස්ථානවලට 20% ද දඩ මුදල් අය කිරීමට තීරණය කර ඇත.

උපලේඛන II

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	මාර්තු 31	අප්‍රේල් 30
දෙවන කාර්තුව	ජුනි 30	ජූලි 31
තුන්වන කාර්තුව	සැප්තැම්බර් 30	ඔක්තෝබර් 31
හතරවන කාර්තුව	දෙසැම්බර් 31	

ති. සරවණපවන්,
මහනගරාධිපති.

2018 නොවැම්බර් 23 වැනි දින,
මඩකලපුව මහනගර සභාව.

12-996

යාපනය මහ නගර සභාව

2019 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

"යාපනය මහා නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන යාපනය මහා නගර සභාවේ ගරු ඉම්මානුවල් ආර්තල්ඩ් නගරාධිපති වන මම මහා නගර සභා ආඥාපනතේ 286 අ වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 230(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව යාපනය මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2019 වර්ෂයට අදාලව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්

මහා නගර සභා ආඥාපනතේ 238 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ යාපනය මහා නගර සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල,ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2018 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යෝක්ෂණය 2019 වර්ෂය සඳහා තක්සේරුව/සත්‍යෝක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත මහා නගර සභා පනතේ 286 අ වගන්තිය සමඟ කියවිය යුතු එම ආඥාපනතේ 230 (1) වගන්තියෙහි ඇති විධිවිධාන ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට (6%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2019 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද යාපනය මහා නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2019 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාල වරිපනම් බදු මුදල යාපනය මහ නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවට අදාළ මුදලින් 5% ක වට්ටමක් ද යාපනය මහ නගර සභාව ලබා දිය යුතු බවටත් තීරණය කරමි. ඉහත කියන ලද කාලය තුලදී නොගෙවන්නේ නම් හිස් ඉඩම්වලට සහ පදිංචි ස්ථාන සඳහා 15% ක (සියයට පහලවක) දඩ මුදලක් සහ අනෙකුත් සියලුම ස්ථාන සඳහා 20% ක (සියයට විස්සක) අමතර දඩ මුදලක් අයකිරීමට තීරණය කරමි.

ගරු ඉම්මානුවල් ආර්තල්ඩ්,
නගරාධිපති,
මහා නගර සභාව,
යාපනය.

යාපනය මහා නගර සභා

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	01.01.2019-31.03.2019	31.01.2019
දෙවන කාර්තුව	01.04.2019-30.06.2019	30.04.2019
තුන්වන කාර්තුව	01.07.2019- 30.09.2019	31.07.2019
හතරවන කාර්තුව	01.10.2019-31.12.2019	31.10.2019

12-994

මහව ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 27(1) වගන්තිය යටතේ කරුණු දැන්වීම

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය සභාව විසින් මෙම පහත උපලේඛනයෙහි දක්වා ඇති මංමාවත් මහව ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත් වලට අදාල ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයක් හෝ යම් විරුද්ධතාවයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 27(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලියාපදිංචි ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මෙම කාල සීමාව තුල මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුවහොත්, උපල්බනයේ සඳහන් මංමාවත් මහව ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එච්. පියසේන,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 06 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලය,
මහව.

අනු අංකය	*මාර්ගයේ නම*	*ආරම්භක ස්ථානය*	*අවසන් ස්ථානය*	*වම් පස ඉඩම*	*දකුණු පස ඉඩම*	*දිග (කි.මී.)*	*සාමාන්‍ය පළල (මී)*
1	NWKMHE 139 මාකඩුවාව සියෝදාගම මාර්ගය	මහව රෝහල හංදියේ සිට මාකඩුවාව මාර්ගය	මහව සිට රන්දෙණිගම මාර්ගය	පී. එම්. කුමාරි හේරත් මැණිකේට අයිති ඉඩම එච්. එම්. මානෝලිට අයිති ඉඩම ඩබ්. එම්. විජේසුන්දරට අයිති ඉඩම එච්. එම්. නිශාන්ත මංජුල හේරත් සහ ඊ. එම්. සුමනාවතීට අයිති ඉඩම එච්. එම්. නිමල් කරුණාරත්නට අයිති ඉඩම ඊ. එම්. අරුණානායක බංඩාරට අයිති ඉඩම එච්.එම්. රංජිත් අරුණ බංඩාරට අයිති ඉඩම එච්. එම්. රණසිංහට අයිති ඉඩම ඩබ්. එම්. මදුෂිකාට අයිති ඉඩම මහව ප්‍රාදේශීය සභාව සතු ඉඩම සුසාන භූමියට වෙන්කර ඇති ඉඩම අබේපාලට හා නන්දපාලට අයිති ඉඩම ඊ. ඒ. පී. විල්සන්ට අයිති ඉඩම එච්. එම්. චන්ද්‍රාවතීට අයිති ඉඩම ඩී. එම්. ගුණපාලට අයිති ඉඩම මාර්ගය අර්ජුනට අයිති ඉඩම	අ. ග. පි. 3696 ගැටිලෑව එච්. එම්. ජයතිලක සහ තවත් අයට අයිති ඉඩම එච්. එම්. බස්නායකට අයිති ඉඩම මාර්ගය අ.ග.පි. 3704 මාකඩුවාව එච්. එම්. ඩිංගිරි අම්මාට අයිති ඉඩම එච්. එම්. මුතුබංඩාට අයිති ඉඩම එච්. එම්. රම්බණ්ඩාට අයිති ඉඩම සුසිල්ට අයිති ඉඩම ඊ. එම්. උදේනි කුමාරි ඒකනායකට අයිති ඉඩම දයානන්දට සහ මුදියන්සේට අයිති ඉඩම ඩබ්. එම්. හේරත් බංඩාට අයිති ඉඩම අ.ග.පි. 1851 මහව ඩබ්. එම්. හේරත් බණ්ඩාට අයිති ඉඩම ඩබ්. එම්. මදුෂිකාට අයිති ඉඩම ජී. හේමචන්ද්‍රට අයිති ඉඩම ඒ. එස්. ලීලානන්දට අයිති ඉඩම සරත් කුමාරසිංහට අයිති ඉඩම ඒ. එස්. ලීලානන්දට අයිති ඉඩම	1.079	9

අනු අංකය	*මාර්ගයේ නම*	*ආරම්භක ස්ථානය*	*අවසන් ස්ථානය*	*වම් පස ඉඩම*	*දකුණු පස ඉඩම*	*දිග (කි.මී.)*	*සාමාන්‍ය පළල (මී)*
2	NWKMHE 142 මාකඩුවාව ගම්මායිම් මාර්ගය	රන්දෙණිගම සිට මහව දක්වා මාර්ගය	රන්දෙණිගම සිට මහව දක්වා මාර්ගය	එච්. එම්. විජේරත්නට අයිති ඉඩම උක්තුඅම්මාට අයිති ඉඩම මාර්ගය ජයතිලකට අයිති ඉඩම මාර්ගය හේරත් බංඩාට අයිති ඉඩම ජී. එම්. බස්නායකට අයිති ඉඩම බංදුලට අයිති ඉඩම මාර්ගය නාලකට අයිති ඉඩම වැව මහින්දට අයිති ඉඩම	නිමල් විජේසුන්දරට අයිති ඉඩම වන්නිනායකට අයිති ඉඩම එල්. ජේ. එම්. ටී. බණ්ඩාරට අයිති ඉඩම වැව ටී. එම්. ගුණරත්න බංඩාට අයිති ඉඩම ටී, එම්. නලීන් රත්නායකට අයිති ඉඩම නලීම්ට අයිති ඉඩම බුබාරක්ට අයිති ඉඩම අබ්දුල්ලාට අයිති ඉඩම මුබාරක්ට අයිති ඉඩම	1.034	9

12-705

යටිනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත්වලින් කොටසක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත් අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත්, යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ආර්. එන්. කේ. රූපස්සර,
සභාපති,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

යටිනුවර ප්‍රාදේශීය සභාව,
ඇඹිල්මීගම,
පිළිමතලාව

අනු අංකය	*මාර්ගයේ නම*	*ග්‍රාම නිලධාරී වසම*	*පටන් ගන්නා ස්ථානය*	*අවසන් වන ස්ථානය*	*වම් පැත්ත*	*දකුණු පැත්ත*	*දිග*	*පළල*	*පිඹුරු පත් අංකය*
01	වීරසිංහ මාවත	අරඹේගම බටහිර	කොට කුඹුර පාරේ සිට	තලව්දෙනිය වත්ත	යූ. ආර්. නන්දාවතී රාජපක්ෂ යූ. ආර්. ජයවර්ධන යූ. ආර්. සුභරත්න එන්. රන්දුනුගේ	එම්. අයි. එම්. මුක්තාර් ජී. කේ. ජී. චන්ද්‍රලතා කේ. බී. මල්කාන්ති ද සිල්වා ජේ. කේ. බී. කිරින්දෙණිය කේ. බී. මල්කාන්ති ද සිල්වා	මීටර් 200	මීටර් 2.43	3702

12-944

2019 වර්ෂයට අදාළව වරිපනම් බඳු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියෙන් කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයෙහි සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

පී. එච්. එස්. රංජර අක්මීමන,
සභාපති,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 13 වැනි දින,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) උප වගන්තියෙන් කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත් වල 2019 වාර්ෂික වටිනාකම සඳහා 2018 වර්ෂයේ දී සිදු කරන ලද තක්සේරුව 2019 වර්ෂය සඳහා පිළිගැනීමට එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව එකී දේපල මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) වරිපනම් බද්දක් පනවා අය කළ යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය

01.	තෙල්දෙණිය පාර වම දකුණ	02.	සිරිමල් වත්ත 625 වම දකුණ
03.	සංගිලිපාලම පාර වම දකුණ	04.	එරමුදුගොල්ල පාර වම දකුණ
05.	කෙන්ගල්ල පාර වම දකුණ	06.	මල්පාන කෙන්ගල්ල පාර වම දකුණ
07.	කටුගස්තොට පාර වම දකුණ	08.	අමුණුගම පාර වම දකුණ
09.	අමුණුගම පොල්ගොල්ල පාර වම දකුණ	10.	ගල්අලුව පාර වම දකුණ
11.	කිරිමැටිය පාර වම දකුණ	12.	ගල්අලුව කරදගොල්ල පාර වම දකුණ
13.	නාරම්පනාව පාර වම දකුණ		

12-950

හපුතලේ නගර සභාව

හපුතලේ නගර සභා ආඥාපනත (255 වැනි අධිකාරය)

193 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 170 වන වගන්තිය යටතේ පහත සඳහන් ගාස්තු අයකිරීම 2019 ජනවාරි මස 01 වැනි දින සිට 2019 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා ක්‍රියාත්මක වන පරිදි පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සම්පත් කුමාර ළමාහේවා,
සභාපති,
නගර සභාව,
හපුතලේ.

2018 නොවැම්බර් මස 12 වැනි දින,
හපුතලේ නගර සභා කාර්යාලයේ දී ය.

බැකෝ ලෝඩර් යන්ත්‍රය හා ලොරි රථය කුලියට දීමේ ගාස්තු - 2019

01.	බැකෝ ලෝඩර් යන්ත්‍රය කුලියට දීමේ ගාස්තු	-	රු. 2,500.00 (පැයක කාලයක් සඳහා)
02.	ලොරි රථය කුලියට දීමේ ගාස්තු	-	රු. 11,000.00 (පැය 08ක කාලයක් සඳහා)

12-821

උඩුනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතා විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල හිමිකරුවන් ලෙස අයත් ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය නිවේදනය කිරීම ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(02) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

02. මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. ගාමිණී තෙන්නකෝන්
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව
ගෙලිඔය

අනු. අංකය	ග්‍රාම නිලධාරී වසම	මාර්ගයේ නම	ආරම්භය	අවසානය	වම්පස පදිංචිකරුවන්	දකුණු පස පදිංචිකරුවන්	දිග (අඩි)	පළල (අඩි)
01	අංක 52- එළදැත්ත නැගෙනහිර	පරණවත්ත මාර්ගය	එළමල්දෙණිය ප්‍රධාන මාර්ගයේ සිට	ඩබ්. ටී. කාන්ගර මයා	1. එච්. එල්. එම් නජිමුදීන් මයා, උළුඅම්බලමගාවවත්ත *හෙවත්* පිටියෙගෙදරවත්ත. 2. එම්. එස්. එම්. මුනාම්මර් හසන් මයා, උළුඅම්බලම ගාවවත්ත හෙවත් පිටියෙ ගෙදරවත්ත. 3. එම්. එස්. එම්. මුනීර් මයා උළුඅම්බලමගාවවත්ත *හෙවත්* පිටියෙගෙදරවත්ත 4. එච්. එල්. එම්. අබ්දුල් මලික් මයා, පිටියෙ ගෙදරවත්ත. 5. කේ. එම්. සී. කේ. කාන්ගර මිය නයකුඹුරේගොඩහේන	1. ඕ. ලෙබ්බේ මයා, එම්. එල්. එම්. සුවිර් මයා, වෙලේගෙදරවත්ත 2. එම්. එච්. එම්. මහරුෆ් මයා, වෙලේගෙදරවත්ත 3. කේ. එම්. බී. කාන්ගර මයා, නයකුඹුරේ ගොඩහේන. 4. පී. ආර්. කාන්ගර මයා නයකුඹුරේගොඩහේන	මීටර් 800	අඩි 10

අනු. අංකය	ග්‍රාම නිලධාරී වසම	මාර්ගයේ නම	ආරම්භය	අවසානය	විමිපස පදිංචිකරුවන්	දකුණු පස පදිංචිකරුවන්	දිග (අඩි)	පළල (අඩි)
					6. ඒ. එම්. එම්. හෙම්මාතගම මයා, නයකුළුවේ ගොඩහේන.			
					7. කේ. එම්. සී. ආර්. කාන්ෆර මයා, නයකුළුවේගොඩහේන			
					8. කේ. එම්. එස්. එම්. කේ. කාන්ෆර මිය, නයනකුළුවේගොඩහේන			
					9. කේ. එම්. ප්‍රේමා නිශ්ශංක කාන්ෆර මයා පරණවත්ත ඉඩම			
02	අංක - 93 ගංගත	ගංගත මාතගලහේන සිට කිතුල්ගොල්ලහේන දක්වා දිගෙන මාර්ගය	මාතගලහේන	කිතුල්ගොල්ල හේන	1. එස්. එම්. ඩී. එන්. සමරකෝන් මයා, මාතගලහේන	නැත	අඩි 600	අඩි 08
					2. ආර්. එම්. එස්. රත්නායක මිය, මාතගලහේන.			
					3. ආර්. එම්. එල්. රත්නායක මයා, මාතගලහේන			
					4. කේ. එම්. සී. අබේරත්න මයා			
					5. එස් එම්. යූ. සමරකෝන් මයා මාතගලහේන			
					6. ඒ. ආර්. එම්. පොඩිමැණිකේ මිය. මාතගලහේන			
					7. එස්. එම්. එම්. එස්. රත්නායක මයා, මාතගලහේන			
					8. ඩී. ජී. එම්. මාලනී මිය, මාතගලහේන			
					9. එස්. එම්. ඩබ්. රත්නායක මයා, මාතගලහේන			

අනු. අංකය	ග්‍රාම නිලධාරී වසම	මාර්ගයේ නම	ආරම්භය	අවසානය	වම්පස පදිංචිකරුවන්	දකුණු පස පදිංචිකරුවන්	දිග (අඩි)	පළල (අඩි)
					10. කේ. එම්. හීන්මැණිකේ මිය, කිතුල්ගොල්ලෙහේන.			
					11. කේ. එම්. සිංගිරිඅප්පු මයා, කිතුල්ගොල්ලෙහේන			
					12. ඩබ්. ජී. මල්ලිකා මිය. කිතුල්ගොල්ලෙහේන			
					13. ඕ. ජී. වීරජන්න මයා, කිතුල්ගොල්ලෙහේන.			
					14. ශ්‍රී. ජී. එස්. නිහාල් කුමාර මයා කිතුල්ගොල්ලෙහේන.			
					15. එන්. ජී. ජේමිස් මයා කිතුල්ගොල්ලෙහේන.			
03	අංක 37- දෙකිපාගොඩ නැගෙනහිර	අග්බෝධි විහාර මාවත	ගෙලිඔය බුවැලිකඩ මාර්ගය	අංගල කුඹුර මාර්ගය	අග්බෝධි විහාරය, පිරියෙහේන	අග්බෝධි විහාරය, පිරියෙහේන	අඩි 700	අඩි 10
04	අංක 89 කිරිවවුල නැගෙනහිර	පොරෝමාරුව කුඹුර මාර්ගය	පොරෝමාරුව මාර්ගය	බෙරවෙහේන අංග මාර්ගය	1. කේ. ඒ. ජී. විල්සන් ප්‍රේමකීර්ති මයා පොරෝමාරුව. 2. කේ. ඒ. ජී. සුනිල් ප්‍රේමකීර්ති මයා, බෙරවාහේන. 3. ඩබ්. එම්. ධර්මසිරි වාසල මයා	1. ඩී. ජී. කරුණාරත්න මයා, බෙරවාහේන	මීටර් 674	අඩි 08
05	අංක 70 ඇම්බැක්ක	ඇම්බැක්ක අරඹාවල මාර්ගයේ සිට හිල්මිගේ නිවස දක්වා යන මාර්ගය	ඇම්බැක්ක අරඹාවල මාර්ගයේ අප්‍රෝක්කාන්ගේ නිවස අසල	පාලිල් මයාගේ ඉඩම දක්වා	නැත	1. එම්. එච් උම්මු සුලයිනා බීබී මිය, මැටිවලපිටියෙහේන	අඩි 145	අඩි 07

අනු. අංකය	ග්‍රාම නිලධාරී වසම	මාර්ගයේ නම	ආරම්භය	අවසානය	වම්පස පදිංචිකරුවන්	දකුණු පස පදිංචිකරුවන්	දිග (අඩි)	පළල (අඩි)
06	අංක 61- දස්සර	හේරත්ගේ අරඹ මාර්ගය	මාර්ගයට යාබද හේත්ගේ අරඹේ ඉතිරි කොටස	බන්දුල සමන්ත බණ්ඩාර බඹරදෙණියගේ නිවස දක්වා	1. ආර්. ආර්. එම්. එස්. බී. බඹරදෙණිය මයා, හේරත්ගේ අරඹ 2. ආර්. ආර්. එම්. සෙනෙවිරත්න මයා හේරත්ගේ අරඹ 3. ආර්. ආර්. එච්. බඹරදෙණිය මයා, හේරත්ගේ අරඹ 4. ආර්. ආර්. එම්. ජූ. බඹරදෙණිය මයා හේරත්ගේ අරඹ 5. ආර්. ආර්. එම්. ටිකිරිබණ්ඩා මයා, හේරත්ගේ අරඹ	1. ආර්. ආර්. එම්. බී. එස්. බී. බඹරදෙණිය, හේරත්ගේ අරඹ 2. ආර්. ආර්. එම්. එස්. බී. බඹරදෙණිය මයා, හේරත්ගේ අරඹ 3. ආර්. ආර්. එම්. අබේරත්න මයා, හේරත්ගේ අරඹ	අඩි 375	අඩි 10
07	අංක 59- අම්බරපොල	අම්බරපාල ඇතුල් පාර	අල්මනාර් පාසල් මාවත	නවුෆර් මහතාගේ නිවස අසලින්	1. ජේ. එම්. රිස්වාන් මයා අම්බරපොලවත්ත 2. ඉජේ. එම්. සාජි මයා අම්බරපොලවත්ත 3. අයි. එල්. ඒ ගපූර් මයා අම්බරපොලවත්ත .4. ඒ. එම්. අසීස් මයා අම්බරපොලවත්ත 5. ඒ. ආර්. එම්. හනීෆා මිය, අම්බරපොලවත්ත. 6. එම්. එම්. ඉස්මයිල් මයා, අම්බරපොලවත්ත 7. ඉජේ. ඡ. ඉජසීමා මිය, අම්බරපොලවත්ත 8. එස්. ආදම් ලෙබ්බේ මයා, අම්බරපොලවත්ත	1. එම්. ඉජේ. එම්. නිසාම් මයා, අම්බරපොලවත්ත 2. එම්. ඉජේ. එම්. හිජාස් මයා, අම්බරපොලවත්ත 3. එම්. ඉජේ. එම්. සියාත් මයා, අම්බරපොලවත්ත 4. ඒ. ආර්. එම්. ජමාලිදීන් මයා.අම්බරපොලවත්ත 5. එම්. ආර්. එම්.සියාඩ් මයා, අම්බරපොලවත්ත	මීටර් 350	අඩි 08

අනු. අංකය	ග්‍රාම නිලධාරී වසම	මාර්ගයේ නම	ආරම්භය	අවසානය	වම්පස පදිංචිකරුවන්	දකුණු පස පදිංචිකරුවන්	දිග (අඩි)	පළල (අඩි)
					9. එස්. එම්. නවුෆර් මයා, අම්බරපොලවත්ත 10. එම්. ඒ. එම්. ඉක්රම් මයා, පුස්සේපිටියවත්ත 11. එස්. එච්. එස්. මෙහම්මදු මයා, පුස්සේපිටියවත්ත, 12. එස්. එම්. එම්. සත්වාන් මයා, පුස්සේපිටියවත්ත 13. එම්. එම්. එස්. එස්. නිහාර මිය, පුස්සේපිටියවත්ත 14. එස්. එච්. එම්. ජෙලීල් මයා, පුස්සේපිටියවත්ත 15. එම්. එම්. සිපාන් මයා, අම්බරපොලවත්ත			
08	අංක-63 බඹරදෙණිය	බඹරදෙණිය අටවාලේ මාර්ගය	බඹරදෙණිය වතුපොල මාර්ගය	121/ඒ, නිවස දක්වා	1. ඒ. එම්. දයාමැණිකේ මිය, ගොන්ගාලේවත්ත 2. ඩබ්. ජී. නිලන්ති කුමාරි මිය, ගොන්ගාලේවත්ත	1 සී. බී. ආර්. ඩී. එම්. බංඩාර මිය, ගොන්ගාලවත්ත 2. කේ. එම්. කේ. කාංගර මිය, ගොන්ගාලේවත්ත සහ ගොන්ගාලේ කොටුව 3. කේ. කේ. ජී. සුමිත් රණසිංහ මයා, ගොන් ගාලේවත්ත 4. සී. බී. ආර්. දිසානායක මයා, ගොන්ගාලේවත්ත	මීටර් 500	අඩි 10

අනු. අංකය	ග්‍රාම නිලධාරී වසම	මාර්ගයේ නම	ආරම්භය	අවසානය	වම්පස පදිංචිකරුවන්	දකුණු පස පදිංචිකරුවන්	දිග (අඩි)	පළල (අඩි)
09	අංක - 30 පල්ලේඅඵදෙණිය	නෙල්ලිගහමුල හතේ කණුවට යන මාර්ගයේ වැලිඅංගවත්ත අතුරු මාර්ගය	කැප්පැටි-ගොල්ලහේන හරහා	වැලිඅංග වත්ත	1. ජී. එම්. ශ්‍රියා පුෂ්පකුමාරී මිය, වැලිඅංගවත්ත 2. ඩබ්. ඩබ්. එම්. මද්දුමබණ්ඩා මයා, වැලිඅංගවත්ත 3. කේ. එල්. මියුරියල් හාමිනේ මිය, කැප්පැටිගොල්ල හේන 4. ජේ. එම්. එස්. කුමාරී ජයසුන්දර මිය, කැප්පැටිගොල්ලහේන 5. ඒ. එම්. එස්. ශාන්ත සෙනෙවිරත්න බණ්ඩා මයා, කැප්පැටිගොල්ල හේන	1. එච්. වී. හේමලතා ජයලත් මිය, වැලිඅංගවත්ත 2. ඒ. එම්. එස්. ශාන්ත සෙනෙවිරත්න බණ්ඩා මයා, කැප්පැටිගොල්ල හේන	මීටර් 400	අඩි 08
10	අංක -08 රාජගිරිය	දිග්ගල්පොත්ත පළවෙනි පටුමග	අංක 168 ඉඩම හරහා දිග්ගල්පොත්ත බෝධිය අසලට	අංක 162 ඉඩම දක්වා	1. කේ. ජී, එන්. සී කුමාර මයා 2. ඩබ්. ජී. එස්. සේනාරත්න මයා 3. එච්. එම්. ප්‍රේමරත්න මයා	1. පී. ජී. රූපරත්න මයා 2. ඊ. ඒ. අබේරත්න මයා 3. එස්. හෙට්ටිආරච්චි මිය 4. එම්. ජී. ජයසුන්දර මයා 5. ඩබ්. ජී. ගුණසෝම මයා 6. ඩබ්. ජී. ආරියවතී මිය 7. ඩබ්. ජී. මානෙල් කුමාරී මිය 8. එම්. එල්. එච්. චින්තා මිය 9. ආර්. එම්. ටී. ධර්මවර්ධන බණ්ඩා මයා	අඩි 500	අඩි 10
11	අංක -37 දෙහිපාගොඩ නැගෙනහිර	අංගල කුඹුර මාර්ගය	අංගල කුඹුර මාර්ගය	එම්. ජී. ජයන්ති මියගේ නිවස	1. එන්. ජී. ජයන්ති මිය 2. එන්. ජී. අනුලාවතී මිය 3. ඒ. ජී. ජී. ප්‍රේමරත්න මයා 4. එන්. ජී. ඉන්ද්‍රලතා මිය 5. ඒ. ජී. විමලාවතී මිය	1. එන්. ජී. එස්. ගුණතිලක මිය 2. එන්.ජී. එන්. ගුණරත්න මයා	අඩි 280	අඩි 04

M.K.S.M.M.Dissanayake
Registered Lic'd. Surveyor & Leveller
Court Commissioner
Gelioya
T.P.No 072-4606148

PLAN No. 1037





— PLAN —

of Land called "Paranuwatta" Road Portion of Nayakumburegodahena, Pitiyegedarawatta, Uluambalamagawawatta & Welegedarawatta
Situated at Eladatta Village in Medapalatha of Udunuwara D.S.Division
KANDY DISTRICT
CENTRAL PROVINCE

Surveying done for Road Development in this area according to Udunuwara Pradeshiya Saba Letter No CPC/UNPS/5/4/1 dated 2018.07.20

Lot No.	Extent Hect.	A.	R.	P.	Remarks
1	0.0564	0	0	22.30	8ft - 10ft Road width

Boundaries pointed out by Mr.A.M.M.Hemmathagama & Others

Surveyed on 24.10.2018
M.K.S.M.M. Dissanayake
Registered Licensed Surveyor
Court Commissioner
Reg. No. 20041057
2018 . 11 . 03

28 DEC 2018

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 "2" වගන්තිය යටතේ කරන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 පනත ප්‍රකාර දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් කිරින්ද පුහුල්වැල්ල ප්‍රදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02.මෙසේ ප්‍රකාශයට පත් කරනු ලබන මංමාවත් ලකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහාද එම ඉඩමේ අයිතිකරුවන් ලෙස හිමිකම්පාන යම් පාර්ශවයක් විසින් කිසියම් විරෝධයක් පල කරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට එක් මසක් ඇතුළත අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 "2" වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

03. ඉහත කාල සීමාව තුළ මෙම නිවේදනයේ සඳහන් මංමාවත් පිළිබඳව කිසියම් විරෝධතාවක් ඉදිරිපත් නොකලහොත් මෙහි සඳහන් මංමාවත් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව සතු පොදු මංමාවත් වශයෙන් පාලනය කරනු ලබන බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

සනත් හෙට්ටිආරච්චි
සභාපති
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

2018 දෙසැම්බර් මස 06 වැනි දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2018 වර්ෂය

අනු අංකය	*මාර්ගයේ නම*	*ග්‍රාම නිලධරී වසම*	*ආරම්භය*	*අවසානය*	*වම්පස ඉඩම්*	*දකුණුපස ඉඩම්*	*පාරේ දිග*	*පාරේ පළල*
01	ඕවිටිගමුව දේවාලමුල්ල ප්‍රධාන මාර්ගයේ සිට තේක්ක වත්ත අංක 05 නිවස දක්වා මාර්ගය	ඕවිටිගමුව දකුණ	ඕවිටාගමුව දේවාලමුල්ල ප්‍රධාන මාර්ගය	තේක්කවත්ත අංක 05 ඉඩම දක්වා	තේක්කවත්ත ඉඩමේ කැබලි අංක 3, කැබලි අංක 04, කැබලි අංක 02.	තේක්කවත්ත ඉඩමේ කැබලි අංක 6, කැබලි අංක 07	40m	අඩි 12
02	වන්නිගෙවත්ත මාර්ගය	ඕවිටිගමුව උතුර	අලහේන්පිට ප්‍රධාන මාර්ගය	වන්නිගෙවත්ත ඉඩම	වන්නිගෙවත්ත ඉඩම	ගේගාව ඉඩම	65 m	අඩි 10
03	පොතුදෙණිය හරස් මාර්ගය	පුහුල්වැල්ල බටහිර	දේවාලමුල්ල සමඟි මාවතේ සිට	පොතුදෙණිය අත්මඟ ඉඩමේ කැබලි අංක 05 දරන ඉඩම	1.පොතුදෙණිය අත්මඟ ඉඩමේ නන්දසේන මහතාට අයත් ඉඩම 2. කැබලි අංක 05 දරන ඉඩම	1. රනිල් වනිගසිංහ මහතාගේ අංක 02 දරන ඉඩම 2. එස්.කේ.මහේෂ් මහතාගේ අංක 05 දරන ඉඩම	80 m	අඩි 13

අනු අංකය	මාර්ගයේ නම	ග්‍රාම නිලධාරී වසම	ආරම්භය	අවසානය	විමසිය යුතු	දකුණුපස ඉඩම්	පාරේ දිග	පාරේ පළල
04	වලකඩ වත්ත පාරේ ගම්වත්ත හරහා පංගන්කොරටුව සහ බෙරිගහ කොරටුව දක්වා මාර්ගය	ගල්කන්ද	ගල්කන්ද කොංකඹුල්ල ප්‍රධාන මාර්ගයේ ඉහල ගහකොරටුව බෝක්කුව අසලින්	ගල්කන්ද කොං-කඹුල්ල ප්‍රධාන මාර්ගයේ පංගන් කොරටුව ඉඩම අසලින්	ඉහලගහකොරටුව මැදගෙදර, පාටිගෙ වත්ත පංගන් කොරටුව	ඉහලගහකොරටුව වලකඩවත්ත, පහල ගෙදර බෙරිගහ කොරටුව	300 m	අඩි 12
05	දේවාලමුල්ල සමගි මාවතේ සිට කැබලි අංක 06/06A මැදඋණිය ඉඩම්වලට යන මාර්ගය	පුහුල්වැල්ල බටහිර	සමගි මාවත නයිදමලගේවත්ත මාර්ගයෙන්	කැබලි අංක 06/06A මැදඋණිය ඉඩම අසලින්	පොතුදෙණිය අත්මඟ කුඹුර	මැදඋණිය කුඹුර	62 m	අඩි 12
06	එකමුතු මාවත ඉහිර කොටස	පුහුල්වැල්ල බටහිර	එකමුතු මාවතේ රුප්පෙ ගෙදර වත්ත ඉඩම අසලින්	කිරිගොන්නාග හවත්ත ඉඩම	පාසල් ඉඩම, මහනුවර ගෙදර ඉඩම	1.රුප්පෙ ගෙදර වත්ත ඉඩම 2.කිරිගොන්නාගහවත්ත ඉඩම	80 m	අඩි 12
07	ශ්‍රී ධර්මාරාම මාවතේ දොළේ ගෙදර හරහා ගැටමාන්න පාර දක්වා මාර්ගය	බොරළුකැටිය	කරනෙට ධර්මාරාම මාර්ග යෙන්	දොළේගෙදර ඉඩම අසල අප බල පුද්ගලයේ මායිම දක්වා	දොළේගෙදරහේන ඉඩම රතුකොෂ්ඨ තෙත්ත ඉඩම ගංගොඩගම්හේන්න ඉඩම	කොෂ්ඨහේන්න ඉඩමේ කැබලි අංක 09, 12, 16, 19, 29, 35, 43, 48, 55, 58, 65, 63, 54, 50, 41, 36, 26, 22, 21, 15, 12, 09	175 m	අඩි 16
08	කොෂ්ඨහේන්න වටරවුම් මාර්ගය	කිරිත්ද මඟින් ඉහළ දකුණ	පුහුල්වැල්ල නැන්නසිට වතු-කොළඋත්ද දක්වා මාර්ගයේ කැබලි අංක 02 දරන ඉඩම අසලින්	පුහුල්වැල්ල නැන්නසිට වතු-කොළඋත්ද දක්වා මාර්ගයේ කැබලි අංක 02 දරන ඉඩම අසලින්	කොෂ්ඨහේන්න ඉඩමේ කැබලි අංක 05, 06, 10, 11. 17, 18, 30, 31, 32, 44, 45, 47, 67, 65, 64, 62, 61, 60, 53, 52, 51, 39, 38, 37, 24, 23, 1, 4, 13, 08, 07, 04	කොෂ්ඨහේන්න ඉඩමේ කැබලි අංක 09, 12, 16, 19, 29, 35, 43, 48, 55, 58, 65, 63, 54, 50, 41, 36, 26, 22, 21, 15, 12, 09	360 m	අඩි 15
09	කන්ද විහාර මාර්ගයේ සිට හක්මණහේන දක්වා මාර්ගය	වතුකොළ කන්ද උතුර	කන්ද විහාර පන්සල මාර්ග යේ හක්මණහේන ඉඩම අසලින්	හක්මනහේන මහගෙදර ඉඩම අසලින්	හක්මණහේන ඉඩමේ කැබලි කිහිපයක්	හක්මණහේන ඉඩමේ කැබලි කිහිපයක්	100 m	අඩි 12
10	නාප්පබැදිවත්තට යන මාර්ගය	වවුලන්ඛෙ-ක්ක	ගැටමාන්න බෙලිඅත්ත මාර්ග යෙන්	නාප්පබැදිවත්තේ කැබලි අංක 03 ඉඩම	නාප්පබැදිවත්තේ කැබලි අංක 07, 06, 05, 04.	නාප්පබැදිවත්ත ඉඩමේ කැබලි අංක 01, 02	80 m	අඩි 10
11	නුගහේන මාර්ගය	කිරිත්ද මඟින් ඉහළ නැගෙ නහිර	හීල්කන්ද මාර්ගය	නුගහේන ඉඩමේ කැබලි අංක 21	ඇඩම්පදුරහේන යාය ඉඩමේ කැබලි අංක 12, 15, 16, 19	ඇඩම්පදුරහේන යාය ඉඩමේ කැබලි අංක 13, 14, 17, 18	140 m	අඩි 12

අනු අංකය	මාර්ගයේ නම	ග්‍රාම නිලධරී වසම	ආරම්භය	අවසානය	වම්පස ඉඩම්	දකුණුපස ඉඩම්	පාරේ දිග	පාරේ පළල
12	මණ්ඩලාරාම විහාරස්ථා-නයට යන මාර්ගය	කිරින්ද මඟින් ඉහළ මධ්‍යම	සාරානන්ද මාවත	මණ්ඩලාරාම විහාරස්ථානය	1.කිරිමඩුව වත්ත 2.සෙල්ලවත්ත අංක 4 කැබැල්ල 3.සෙල්ලවත්ත අංක 1 කැබැල්ල	දංගහ ලියද්ද කුඹුර	57 m	අඩි 12
13	මාරගහවත්ත මාර්ගය	මල්වතුගොඩ	ඉහළවත්ත මාර්ග යේ සිට	මාරගහවත්ත	අළුත්වත්ත	අළුත්වත්ත මාරගහවත්ත	60 m	අඩි 10
14	කොපුවඩිගෙහේන ඉඩමට යන මාර්ගය	කිරින්ද මඟින් ඉහළ නැගෙනහිර	පුවක්ගහ මඩිත්ත ආරණ්‍ය පාරේ සිට	කොපුවඩිගෙහේනේ ඉඩම	ආඬියාකන්ද වත්ත ඉඩමේ කොටසක්	ආඬියාකන්ද වත්ත ඉඩමේ කොටසක්	150 m	අඩි 12
15	කෝංගහහේන මාර්ගය	බොරළුකැටිය	සමඟි මාවතේ පසිඳු නිවස අසල	කෝංගහහේන ඉඩමේ කැබලි අංක 248	කෝංගහහේන ඉඩමේ කැබලි අංක 246, කැබලි අංක 247	කෝංගහහේන ඉඩමේ කැබලි අංක 28	90 m	අඩි 12
16	පරගහවත්ත මාර්ගය	හෙට්ටියාවල උතුර	හෙට්ටියාවල කරතොට මාර්ග යේ සිට	පරගහවත්ත ඉඩමේ කැබලි අංක 08	පරගහවත්ත ඉඩමේ කැබලි අංක 04, 07, 06	පරගහවත්ත ඉඩමේ කැබලි අංක 03	50 m	අඩි 12
17	මුරුතමඬිත්තහේන බැරගම ගෙදර දක්වා මාර්ගය	මල්වතුගොඩ	මල්වතුගොඩ ආයුර්වේද මාර්ගය	බැරගම ගෙදර, පීල්ලගාව අත්මඟ ඉඩම	උස්රුප්ප ඉඩම	පැලරුප්ප ඉඩම දිවෙල්වත්ත ඉඩම	125 m	අඩි 12
18	අක්කර 100 පාරේ ගලගාවදෙණිය සිට අක්කර 25 මුදුන් පාර දක්වා	වතුකොළ කන්ද නැගෙනහිර	අක්කර 100 පාරේ ගලගාවදෙණිය ඉඩම අසලින්	අක්කර 25 මාර්ගය	1. ගලගාවදෙණිය 2. කැකිරිවරාකනත්ත ඉඩමේ කැබලි අංක 08, 04, 11, 17, 27, 32 3. තැන්නපිටහේනේ ඉඩම	1.ගලගාවදෙණිය කුඹුර 2.කැකිරිවරාහේන රබර් ඉඩම 3.කැකිරිවරාකනත්ත ඉඩමේ කැබලි අංක 02, 13, 16, 28, 31 3. බැද්දවත්තහේන ඉඩම	650 m	අඩි 16
19	ජනසභා කාර්යාලය අසල මාර්ගය	වලකන්ද බටහිර	පුවක්ගහහේන පාරේ ජනසභා කාර්යාලය අසලින්	විජිත කොඩිතු-වක්කු මහතාගේ ඉඩම අසලින්	කඩේහේන ඉඩම දොලවත්තහේන ඉඩම	ජනසභා කාර්යාලයේ ඉඩම ප්‍රසන්න කොඩිතුවක්කු මහතාගේ ඉඩම කුමාර මහතාගේ ඉඩම	106 m	අඩි 16

අනු අංකය	මාර්ගයේ නම	ග්‍රාම නිලධාරී වසම	ආරම්භය	අවසානය	වම්පස ඉඩම්	දකුණුපස ඉඩම්	පාරේ දිග	පාරේ පළල
20	මහලන්දෙවත්ත මාර්ගය	වලකන්ද නැගෙනහිර	බජ්ජන්කැලේ බඹරවැල්කැටිය මාර්ගය	මහලන්දෙවත්ත ඉඩම දක්වා	මහගෙදර වත්ත, ලන්දෙ වත්ත මහලන්දෙ වත්ත	අඹ ගෙදර ඉඩම පුංචිලන්දෙ වත්ත ඉඩම ඉදිගහදෙණිය ඉඩම	70 m	අඩි 12
21	කැලේහේන ඉඩම්වලට යන මාර්ගය	වලකන්ද බටහිර	පුවක්ගහහේන මාර්ගයෙන්	කැලේහේන ඉඩමේ කැබලි අංක 02/A	1. නාකුට්ටියහේන ඉඩම 2. පුංචි අළුත් ගෙදර ඉඩම 3. තිහගොඩ ගෙදර ඉඩම 4. කොනේවත්ත ඉඩම 5. රජයේ රක්ෂිතය 6. කඩේහේන වත්ත ඉඩම	1. තැන්නහේන ඉඩම 2. කැලේහේන ඉඩමේ කැබලි අංක 02/I, 02/H, 02/G, 02/F , 02/E, 02/D, 02/C, 02/B	820 m	අඩි 12
22	මීගහ හන්දියේ සිට මාහේන දක්වා මාර්ගය	කිරින්ද මඟින් ඉහළ මධ්‍යම	තැන්නපිට මාර්ගයේ මීගහ හන්දිය	මාහේන ඉඩම දක්වා	1. කෝංගහ කුට්ටිය ගෙදර ඉඩමේ 2/A කැබැල්ල 2. 2/B කැබැල්ල 3. මාරවහේන ඉඩමේ 4 කැබැල්ල 4. මාරවහේන ඉඩමේ 5 කැබැල්ල 5. මාරහේන ඉඩමේ 3/ A3 කැබැල්ල	1. මාරවහේන ඉඩමේ 1A කැබැල්ල 1B කැබැල්ල 3 A1 කැබැල්ල	78 m	අඩි 10
23	කජ්ජුකනත්ත මාර්ගය	නාරද්ද	ගංගොඩගම කරතොට මාර්ගය	කජ්ජුකනත්ත ඉඩම	දියගහදෙණිය කුඹුර කජ්ජුකනත්ත ඉඩම	දියගහදෙණිය කුඹුර වංදෙණිය හේන කජ්ජුකනත්ත ඉඩම	95 m	අඩි 12
24	කරතොට සමඟි මාවතේ සිට අමුදෑහේන වත්ත දක්වා මාර්ගය	කරතොට	කරතොට සමඟි මාවතේ සිට	අමුදෑහේන වත්ත	පරගහවත්ත අමුදෑහේන වත්ත	පරගහවත්ත අමුදෑහේනවත්ත	300 m	අඩි 10
25	ගාලේගොඩවත්ත මාර්ගය	ඕවිටිගමුව දකුණ	කිරින්ද කඹුරුපිටිය ප්‍රධාන මාර්ගය	ගාලේගොඩවත්ත ඉඩමේ 13 වන කැබැල්ල	ගාලේගොඩවත්ත ඉඩමේ කැබලි අංක 10 කැබලි අංක 13	ගාලේ ගොඩවත්ත ඉඩමේ කැබලි අංක 04 කැබලි අංක 05	40 m	අඩි 10

අතුරු ව්‍යවස්ථා

බිංගිරිය ප්‍රාදේශීය සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව ඝන අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස සඳහන් කරනු ලැබේ.

2. බිංගිරිය ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීථිවල, මංමාවත්වල ජනනය වන ඝණ අපද්‍රව්‍ය වෙන් කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

3. බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙකුම හෝ පදිංචිකරුවෙකුම තම පරිශ්‍රය අපද්‍රව්‍යවලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්වයෙන් තබා ගත යුත්තේ ය.

4. බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුළත ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම හා බැහැර කළ යුත්තේ ය. නැත්නම් මෙම ඇතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව කළ යුත්තේ ය.

5. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිත කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උපවගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 8 සිට 20 දක්වා වන වගන්තිවල විධිවිධානවලට අනුකූලව වෙන් කළ යුත්තේ ය. නැතිනම් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීම හෝ මුදා හැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් මෙම අතුරු ව්‍යවස්ථාවේ වගන්තිවල වන කාර්යයන් සඳහා මනා තත්වයෙන් පවත්වාගත යුතු වේ.

(iv) බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 5(1) උපවගන්තියට අනුකූලව එක්රැස් වන කසල භාර ගැනීම සඳහා බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් පූර්ව දැනුම් දීමකින් අනතුරුව නිශ්චිත සේවාවක් පවත්වාගෙන යා යුතු අතර එකී (1) වන උප වගන්තියේ ම සඳහන් ආකාරයට එක් රැස් කරන ලද අපද්‍රව්‍ය සභාව විසින් කලින් කලට තීරණය කර ප්‍රසිද්ධ කරනු ලැබූ ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වන්නා වූ අපද්‍රව්‍ය එක් රැස් කිරීමේ ක්‍රමයට හා කාලසටහනට අනුකූලව හිමිකරු හෝ පදිංචිකරු විසින් භාර දිය යුත්තේ ය.

(v) හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ, අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍යයට හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්වයට හානිකර හෝ අන්තරාකාරී වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැර කිරීම නොකළ යුත්තේ ය.

6. (i) කිසිම තැනැත්තෙක් වීදියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට රක්ෂිතයකට හෝ ජලාශයකට, ජල මූලාශ්‍රයකට අපද්‍රව්‍ය මුදහැරීම නොකළ යුත්තේය.

(ii) කිසියම් තැනැත්තෙක් බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුත්තේ ය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අංක 7 දරන වගන්තියේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක් මුදා හැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබා ගැනීමට සිදුවන අවස්ථාවකදී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දිය හැකිය.

(iv) අංක 7 දරන වගන්තියේ විධිවිධාන යටතේ සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත 6 (iii) හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

7. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රයේ ඇතුළතම බැහැර කළ හැකිය.
(අ) බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කරන ලද ප්‍රදේශයක් වීම.
(ආ) බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් නිශ්චිතවම නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග.

(ii) පරිශ්‍රයේ හිමිකරුට හෝ පදිංචිකරුට ලේකම්වරයා විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියකට අනුකූලව ඉදිකරනු ලැබූ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කළ හැකිය.

(iii) යම් හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු "කොම්පෝස්ට් බඳුන්" සඳහා ලේකම්වරයා වෙතින් ඉල්ලීක් කළහොත් ඒ හිමිකරුට හෝ පදිංචිකරුට එම කොම්පෝස්ට් බඳුන් නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් පරිශ්‍රය තුළ තිබේනම් ලේකම්වරයා එම කොම්පෝස්ට් බඳුන්වල පිරිවැයෙන් කොටසක් හෝ මුළුමනින් හෝ සහනාධාරයක් වශයෙන් ලබා-දෙමින් එම කොම්පෝස්ට් බඳුන් හිමිකරුට හෝ පදිංචිකරුට සැපයිය හැකිය.

(iv) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුළත එකතුවන "ගෙවතු අපද්‍රව්‍ය" හැකිතාක් අදළ පරිශ්‍රය තුළ මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව බැහැර කිරීමට කටයුතු කළ යුතුය. අනතුරුව ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍ය-යක් වේ නම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍ය වල ස්වභාවය සැලකිල්ලට ගෙන බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේ ය.

(v) වීථියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක් හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කළ යුත්තේ ය. නැතිනම් ඉවත් කිරීමට සැලැස්විය යුත්තේ ය. නැතිනම් ඉවත් කරීමට සැලැස්විය යුත්තේ ය. එසේත් නැතිනම් බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තු ගෙවීමක් මත බිංගිරිය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් කසල එක්රැස් කරනු ලබන අයට භාර දිය යුත්තේ ය.

(vi) සෑම තැනැත්තෙක්ම ඔහුගේ පාලනය යටතේ සිටින යම් සතෙකු වීථියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේ ය. එසේ මළපහ කරනු ලැබුවහොත් අතුරු ව්‍යවස්ථාවට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේ ය.

(vii) කිසිම තැනැත්තෙක් බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යයක් වාහනයක සිට වීථියකට, ඇලකට, දෙළකට, ජල මූලාශ්‍රයකට රක්ෂිතයකට මුදා හැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුත්තේ ය.

(viii) නිවෙසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදි කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට සැලැස්මක් අනුමත කරවා ගැනීමට අයදුම් කරන යම් කෙනෙක් ඔහුගේ පරිශ්‍රයේ ජනනය වන ඝණ අපද්‍රව්‍ය හා මුදා හරිනු ලබන ද්‍රව්‍ය පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ සැළසුම ඔහුගේ අයදුම්පත්‍රයේ ඇතුළත් කළ යුත්තේ ය.

නිවාස පරිශ්‍රයන්

8. (i) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක් ම අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි
(ඉ) පරිශ්‍රය අතුගෑමෙන් පස් එකතු වන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම් වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක් තැබිය යුත්තේ ය. ආහාර අපද්‍රව්‍ය හා ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය තෙතමනය කාන්දු නොවන ද්‍රව්‍යයෙන් සාදනු ලැබූ සහ මියන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේ ය. සතුන්ගේ මළකුණු ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිතව අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍ය වල ස්වභාවය සැලකිල්ලට ගෙන බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා කලින් කලට බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් අය කිරීමෙන් පසුව බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් අදාල අපද්‍රව්‍ය භාර ගැනීම සිදු කළ යුතු ය.

(iii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම 8 (i) උපවගන්තියේ (අ) සහ (ආ) ආයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය එක්රැස් කරන බහාලුමකට බැහැරලීම කළ හැක්කේ ය.

9. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක්ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි
(ඉ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) 9 (i) වන වගන්තියෙන් නිශ්චිතවම සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු ඉහත (අ), (ආ) සහ (ඈ) යන අයිතමය යටතේ විස්තර කර ඇති අපද්‍රව්‍ය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ ප්‍රමිතීන්ට පිරිවිතරයන්ට අනුකූල වූ බහාලුම් සපයාගත යුතු අතර ඒවා පවිත්‍රව හා සනීපාරක්ෂක තත්වයන් පවත්වාගත යුතුය.

(iii) 9 (i) වන උප වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු ඉහත (ii) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවකදී ලේකම්වරයා විසින් දැනුම්දෙනු ලබන දිනයකදී හෝ ඊට පෙර අදාළ බඳුන් හෝ බහාලුම් සපයන ලෙසට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට ලේකම්වරයාට බලය ඇත්තේ ය. ලේකම්වරයාගේ නියමයන් අනුව ක්‍රියා කිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේ ය.

(iv) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුනකට හෝ බහාලුමකට දැමිය යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 9(i) වන උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නෙකුගේ කාර්යය වන්නේ ය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් ඒ සාදන විශේෂයෙන් සකස් කර පවත්වාගෙන යනු ලබන ස්ථානයකට බැහැර කිරීම හෝ එසේ බිංගිරිය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් කසල එක්රැස් කරන්නෙකුට භාර දීම කළ යුත්තේ ය.

(vi) ඉහත 9(i) (ඇ) අයිතමයෙහි සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ), (ඈ) සහ (ඉ) යන අයිතමයන් යටතේ මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර නිවාස පරිශ්‍රයේ අයිතිකරු, කුලී නිවැසියා හෝ පදිංචිකරු එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක් රැස් කරන්නෙකුට විය යුතුය.

10. (i) බිංගිරිය ප්‍රාදේශීය සභාවේ පූර්ව අනුමැතිය ලබාගෙන මුඩුක්කු නිවැසියන්ගේ භාවිතය සඳහා ලේකම්වරයා විසින් අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නොමිලේ සැපයීම නීත්‍යානුකූල වේ.

(ii) සෑම මුඩුක්කු නිවාසෙකම හිමිකරු හෝ පදිංචිකරු ඔහුගේ වාසස්ථානයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කර ඔහුගේ වාසස්ථනයට ආසන්නවම සපයනු ලබන අනුමත බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(iii) මේ අතුරු ව්‍යවස්ථාවේ 10 (ii) වන උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම පිණිස අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට අවසර දීම ලේකම්වරයාගේ කාර්යය විය යුත්තේ ය.

සාප්පු හා කාර්යාල

11. (i) සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ කළමණාකරුවෙක්ම එක් එක් සංකීර්ණයේ එකතුවන අපද්‍රව්‍ය පහත ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබනතුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ කළමණාකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ 11(i) වන උපවගන්තියේ (අ) සහ (ආ) ආයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දිය හැකිය.

(iv) මහල් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ කළමණාකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 11(iv) වන උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති සාප්පුවක හෝ කාර්යාලයක යම් හිමිකරුවෙක් තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ 11(i) වන උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දීමට සෑම හිමිකරුවෙකුට සහ කළමනාකරුවෙකුට අයිතිවාසිකමක් ඇත.

(vi) බලයලත් අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකු විසින් එක්රැස් නොකරන ලද මෙම අතුරු ව්‍යවස්ථාවේ 11(i) වන උප වගන්තියේ (ඈ) අයිතමයේ සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් අය කිරීමෙන් පසු බිංගිරිය ප්‍රාදේශීය සභාවේ කසල එක්රැස් කරන්නෙකු වෙත භාරදීම නීත්‍යානුකූල වන්නේ ය.

(vii) ඉහත (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ), (ඈ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර සාප්පුවක හෝ කාර්යාලයක හැම හිමිකරුවෙකුම හෝ කළමනාකරුවෙකුම එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතුය.

(viii) අසල්වාසීන්ට හෝ එකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේම හෝ කළමනාකරුවෙකුගේ ම වගකීම වන්නේ ය.

හෝටල්

12. (i) සෑම හෝටල් කරුවෙකුම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක් රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය. *නැනහොත්* එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iii) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතෙකු ඇතුළු වීම වළකමින් සියළුම ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක ඇසිරිය යුත්තේ ය.

" (iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 12(i) වන උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 12(iv) වන උපවගන්තිය යටතේ භාරගනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් එවැනි කසල එක්රැස් කිරීම සඳහා විශේෂිතව සකස් කරන ලද බහාලුමකට හෝ නම් කරන ලද ස්ථානයට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(vi) ඉහත (ඇ) ඡේදයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ), (ඈ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර සෑම හෝටල් හිමිකරුවෙකුම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය දී ඇති කසල එක් රැස් කරන්නෙකුට විය යුතුය.

එළවළු සහ පළතුරු වෙළෙඳසැල්

13. (i) සෑම එළවළු සහ පලතුරු වෙළෙඳසලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම වෙළෙඳසලේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය:

(අ) මිනිස් පරිභෝජනයට නුසුදුසු එළවළු, පළතුරු හෝ වෙනත් යම් දිරන අපද්‍රව්‍ය ,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13(i) වන උපවගන්තියේ (අ) අයිතමයෙහි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13(i) වන උපවගන්තියේ (අ), (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13(iii) වන උපවගන්තිය යටතේ භාර ගනු නොලැබූ ඉහත (අ), (ආ) ඡේද යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය සභාව විසින් එවැනි කසළ එක්රැස් කිරීම සඳහා විශේෂිතව පත් කරන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

මස්, මාළු හෝ බිත්තර වෙළෙඳ කුටි

14. (i) තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් ඊට අදාළ යම් ලිඛිත නීතියක් යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ප්‍රකාර එහි සඳහන් ස්ථානයේ දී කිසිම තැනැත්තෙක් ගෝඝාතක ආඥාපනතේ විධිවිධාන යටතේ අවසරලත් සතුන් හැරුනුවිට වෙනත් කිසිම සතෙකු ඝාතනය නොකළ යුත්තේ ය.

(ii) මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාරය කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය. :

(අ) මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ත්ව මළකුණුවල කොටස් හෝ වෙනත් දිරන අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම භාජනයක හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ 14(ii) වන උපවගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක් ඇතුලළත තිබිය යුතු අතර එම බහාලුමට මැස්සන්, මීයන් හෝ වෙනත් සතුන් ඇතුලු වීම වළකමින් එය නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 14(ii) වන උපවගන්තියේ (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍යයක් බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යන කසල එක්රැස් කරන තැනැත්තෙකුට භාරදීම හෝ ස්ථානයකට බැහැර කිරීම කළ යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 14(iv) වන උපවගන්තිය යටතේ භාරගනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් එවැනි කසල එක්රැස් කිරීම සඳහා විශේෂිතව පත් කරන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

පදික වෙළෙඳාම හෝ සංචාරක වෙළෙඳාම

15. (i) අපද්‍රව්‍ය ජනනය වන්නා වූ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සංචාරක හෝ පදික වෙළෙන්දෙක්, ඊට අදළව යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ විධිවිධාන සලසා ඇති පරිදි හා ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේ ය. එවැනි කිසිම අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ මහා මාර්ගයේ ජල කාණුවකට හෝ පොදු ස්ථානයකට නොදැමිය යුත්තේ ය.

(ii) සෑම පදික හෝ සංචාරක වෙළෙන්දෙක්ම වාහන වල ගමනාගමනයට හෝ පදිකයින්ගේ ගමනාගමනයට බාධා ඇති වන ආකාරයෙන් බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේ ය.

(iii) සෑම පදික හෝ සංචාරක වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීයකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(iv) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ 15(ii) උපවගන්තියේ (අ) අයිතමයේ සඳහන් කර ඇත්තා වූ අපද්‍රව්‍ය කෑමීන් , මීයන් හෝ වෙනත් සතුන් විසින් කා දැමීමට නොහැකි වන පරිදි ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේ ය.

(v) සෑම පදික වෙළෙන්දෙක්ම හෝ සංචාරක වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ 15(ii) උපවගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතුය.

(vi) ඉහත (iii) (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර පදික වෙළෙන්දා හෝ සංචාරක වෙළෙන්දා එම කසළ බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසළ එක්රැස් කරන්නෙකුට විය යුතුය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (v) වන උපවගන්තිය යටතේ භාරගනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ භාරගනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් එවැනි කසළ එක්රැස් කිරීම සඳහා විශේෂිතව තබන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය. සෑම සංචාරක/පදික වෙළෙන්දෙක්ම අපද්‍රව්‍ය බඳුන් නාගරික අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාර දීමට පෙර බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවිය යුත්තේ ය.

කර්මාන්ත ශාලා

16. (i) සෑම කර්මාන්ත ශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදනයක්ම කර්මාන්ත ශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීයකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 16(i) යන උප වගන්තියේ (අ), (ආ) හා (ඈ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ගාස්තුවක් බිංගිරිය ප්‍රාදේශීය සභාවේ කසළ එක්රැස් කරන්නෙකුට භාර දීම කළ යුතුය.

(iii) වයඹ පළාතේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේ ය.

(iv) ඉහත 16(i)(ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ), (ඈ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර කර්මාන්ත ශාලා හිමිකරු හෝ ඔහු විසින් බලය දී ඇති තැනැත්තා එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක්‍රැස් කරන්නෙකුට විය යුතුය.

කැණීම්, ඉදිකිරීම් සහ කඩා දැමීම

17. (i) යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින හෝ යම් නිර්මාණයක් ඉදි කරන හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩා දමන සෑම තැනැත්තෙක්ම එමඟින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක් පරිශ්‍රය ඇතුළත හෝ ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේ ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 17 (i) වන උපවගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්‍රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

18. (i) ආරෝග්‍ය ශාලාවක භාරකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය:

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) සායනික අපද්‍රව්‍ය,
(ඈ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඉ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) 18 (i) වන උපවගන්ති යටතේ (අ) සහ (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුතු අතර, එකී අපද්‍රව්‍ය බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා විශේෂයෙන් සලසා ඇති වැඩ පිළිවලක් යටතේ කසල එක්‍රැස් කරනු ලබන අවස්ථාවක බිංගිරිය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් එසේ කසල එක්‍රැස් කරන්නා වෙත භාර දිය යුතුය. 18 (i) උපවගන්තියේ (ඉ) අයිතමය යටතේ සඳහන් කර ඇති අපද්‍රව්‍ය බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසු එක්‍රැස් කරන්නා වෙත භාර දිය යුතුය.

(iii) 18 (i) (ඇ), (ඈ) අයිතම යටතේ එකතුවන අපද්‍රව්‍ය කවර ආකාරයකින් හෝ වෙනත් අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර නොකළ යුතු අතර එකී අපද්‍රව්‍ය වයඹ පළාතේ 1990 අංක 01 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව බැහැර කළ යුත්තේ ය.

පෞද්ගලික රෝහල් හා රසායනාගාර

19. (i) පෞද්ගලික රෝහලක හෝ රසායනාගාරයක හිමිකරු හෝ අයිතිකරු තම ආයතනය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය:

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීයකරණීය අපද්‍රව්‍ය,
(ඇ) සායනික අපද්‍රව්‍ය,
(ඈ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඉ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) 19 (i) උපවගන්තිය යටතේ (අ) සහ (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුතු අතර එකී අපද්‍රව්‍ය බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා විශේෂයෙන් සලසා ඇති වැඩ පිළිවෙලක් යටතේ සකස් කළ එක්‍රැස් කරන අවස්ථාවක බිංගිරිය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් එසේ කසල එක්‍රැස් කරන්නා වෙත භාර දිය යුතු ය.

(iii) 19 (i) උපවගන්තියේ (ඉ) අයිතමය යටතේ සඳහන් කර ඇති අපද්‍රව්‍ය බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට කළ තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසු එක්‍රැස් කරන්නා වෙත භාර දිය යුතුය.

(iv) ඉහත 19 (i) උපවගන්තියේ (ඇ), (ඈ) අයිතමය යටතේ එකතු වන අපද්‍රව්‍ය කවර ආකාරයකින් හෝ වෙනත් අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර නොකළ යුතු අතර එකී අපද්‍රව්‍ය 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව බැහැර කළ යුත්තේ ය.

වෙනත් පරිශ්‍රයන්

20. (i) අංක 8 සිට 19 දක්වා වන ඡේදයන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගිත්වය ඇතිව පොදු, ආගමික, සාමාජීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය :

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීයකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) 20 (i) වන උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන පුද්ගලයෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීමට විශේෂ වැඩපිළිවෙලක් යෙදීමට හැකි වනු පිණිස ඒ ගැන කල්තියා බිංගිරිය ප්‍රාදේශීය සභාවට දැනුම් දිය යුත්තේ ය.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 20 (i) වන උපවගන්තියේ (ඇ), (ඈ) අයිතමය යටතේ එක්රැස් වන අපද්‍රව්‍ය බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබූ පරිදි ප්‍රකාශයට පත් කර ඇති ගාස්තුවක් අය කර බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් බලය දී ඇති කසල එක් රැස් කරන්නෙකු විසින් භාර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

(v) එසේ වුවද කිසියම් ආගමික ස්ථානයක ආගමික කාර්යයක් වශයෙන් වානිජ පරමාර්ථයකින් තොරව පවත්වාගෙන යන කවර ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් වුවද එකී ක්‍රියාකාරකම හේතුවෙන් එක්රැස් වන ඉහත (i) උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) යන අයිතම යටතේ එක්රැස් වන අපද්‍රව්‍ය බැහැර කරලීම සම්බන්ධයෙන් ඉහත (iv) උප වගන්තියේ සඳහන් සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් අය කිරීම යන්න අදාළ නොවේ.

(vi) ඉහත (i) (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ) සහ (ඇ) යන අයිතම යටතේ (ඇ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර අදාළ පරිශ්‍රවල හිමිකරුවන් එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක්රැස් කරන්නෙකු විය යුතුය.

වීථි සහ පොදු ස්ථාන

21. (i) බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන ආකාරයට සභාපතිවරයා විසින් පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුත්තේ ය :

(අ) බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි වීථි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළෙඳපොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වාගෙන යාම;

(ආ) බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කසල තාවකාලිකව එක්රැස් කිරීමට යථායෝග්‍යයැයි හඳුනාගන්නා ස්ථානයන්හි ප්‍රමාණවත් බක්කි සංඛ්‍යාවක් සවි කිරීම හා නඩත්තු කිරීම;

(ඇ) උත්සව වලදී, විශේෂ සිදුවීම් අවස්ථාවලදී හෝ බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවලදී බිංගිරිය ප්‍රාදේශීය සභාවෙන් තීරණය කරන විටකදී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බක්කි සැපයීම;

(ඈ) කසල තාවකාලික එක්රැස් කිරීමට යථායෝග්‍ය යැයි හඳුනාගෙන ඇති ස්ථානවල සවි කර ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම;

(ඉ) පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ෂණය කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම.

(iii) බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් විශේෂයෙන්ම එක් එක් අපද්‍රව්‍ය සඳහා වෙන් කරනු ලැබූ බක්කියක ඊට අදාළ නොවන අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේ ය.

බිංගිරිය ප්‍රාදේශීය සභාවේ යුතුකම්

22. (i) ලේකම්වරයා විසින් සභාපතිවරයා සමඟ සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණ කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේ ය:

(අ) අපද්‍රව්‍ය අඩු කිරීමට, ප්‍රතිභාවිතයට හා ප්‍රතිචක්‍රීකරණයට ජනතාව දෙර්මත් කිරීම.

(ආ) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදා හැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මඟින් ප්‍රචාරණය කිරීම,

(ඇ) ප්‍රතිභාවිතකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම,

(ඈ) අපද්‍රව්‍ය අඩු කිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණ කිරීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින අයට දිරි ගැන්වීම් පිරිනැමීම,

(ඉ) අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ ආකෘති නියාමනය කිරීම,

(ඊ) බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක් එක් ප්‍රදේශයන්හි එක් එක් අපද්‍රව්‍ය වර්ග සඳහා බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ කාල සටහනක් පිළියෙල කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාල සටහනේ ඇතුළත් කිරීම.

(උ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නටන්ට වෙනම භාර දෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යයක් කාල සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම,

(ඌ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාර දෙනු නොලැබූ අන්තරායකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම,

(එ) අන්තරායකාරී අපද්‍රව්‍ය හෝ ලේකම්වරයා විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීථි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බක්කිවලින් එක්රැස් කරන අපද්‍රව්‍ය සහ බිංගිරිය ප්‍රාදේශීය සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දීම හෝ බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් විධිමත් පරිදි බැහැර කිරීමට කටයුතු කිරීම,

(ඒ) ආහාර සහ වෙනත් ජෛව ජීර්ණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකිතාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ පිළිවෙලක් ද ඇතුළත්ව බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නන් විසින් එක්රැස් කරනු ලබන වෙන් කරන ලද අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාවලියෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ලේකම්වරයා අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම,

(ඔ) වයඹ පළාත් පරිසර අධිකාරිය සමඟ අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් සියළු කටයුතු නියාමනය කිරීම,

(ඕ) 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීම සහ එම බලපත්‍රයේ හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම හෝ විධිමත් විකල්ප ක්‍රමවේදයක් පවත්වාගෙන යාම,

(ක) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන්හි නිරතවන සෑම සේවකයෙකුටම පිරිසිදුකාරක ද්‍රව්‍ය, සුදුසු ඇඳුම්, අත් ආවරණ, මුඛ ආවරණ, සහ බූට් සපත්තු සැපයීම හා එකී සේවකයන් සඳහා සුදුසු රක්ෂණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම හා වසරකට දෙවරකට නොවැඩි සෞඛ්‍ය සායනයක් පැවැත්වීම,

(ග) බිංගිරිය ප්‍රාදේශීය සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමණාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම,

(ඝ) 2000 අංක අපද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳ ජාතික උපාය මාර්ගය සහ අදාළ නීතියට හා 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙයින් එක් ලිත් වර්ෂයක් ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක් ඉදිරියට ආවරණය කරන සෘණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම හා එම සැලැස්ම එය ආවරණය කරන කාල සීමාව අනුව නිරන්තර පදනම මත බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව අනුමත කරනු ලැබීම,

(ඞ) (අ) සිට (ඝ) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එම අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුළතත් වෙනත් පැමිණිල්ලක් නම් දින දාහතරක් ඇතුළතත් විමර්ශණය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

අවසර පත්‍රය

23. (i) අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නා වූ හෝ කොම්පෝස්ට්, ජීව වායු හෝ වෙනත් නිපැයුම් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙක් හෝ තැනැත්තන් පහත දැක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් අවසර පත්‍රයක් නිකුත් කරනු ඇත:

(අ) බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යාවස්ථ ප්‍රකාර බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත හෝ වෙනත් පළාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම,

(ආ) 1990 අංක 112 දරන වයඹ පළාත් පරිසර ප්‍රඥප්තිය යටතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම.

(ඇ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන තිබීම,

(ඈ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන තිබීම,

(ඉ) අදාළ ව්‍යාපාරය බිංගිරිය ප්‍රාදේශීය සභාවේ සීමාවක් ඇතුළත කරගෙන යනු ලබන විටෙක දී බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් සභාවට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේ දී හෝ පිරියම් කිරීමේ දී අවශේෂ වන්නා වූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ අපද්‍රව්‍ය බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරනු ලබන පරිදි බිංගිරිය ප්‍රාදේශීය සභාවට භාර දීමට එකඟ වෙමි.

(ii) බිංගිරිය ප්‍රාදේශීය සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිශ්ප්‍රභා කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිශ්ප්‍රභා කිරීමට හේතු අවසර පත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රය ලැබී ඇති දින 30 ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේ ය,

(iii) ලේකම්වරයා විසින්, වලංගු කාල පරිච්ඡේදය තුළ එක්රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ග හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රදේශය සහ වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දැක්විය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 23 (i) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා නොකරන අවස්ථාවක දී මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු කළ යුත්තේ ය.

විනෝද බදු ආඥාපනත යටතට ගැනිය හැකි විනෝද සංදර්ශනයකට ඇතුළුවීම සඳහා මුදල් අයකරමින් දඹුල්ල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ සංදර්ශනය කරනු ලබන විටෙක දී එසේ ඇතුළුවීමට අයකරනු ලබන මුදලින් 20% ක ප්‍රතිශතයක් වශයෙන් වූ විනෝද බද්දක් පනවා අයකළ යුතු බවට විනෝද බදු ආඥාපනතේ 2 (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව දඹුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

තවද එකී තීරණයෙහි සඳහන් වූ ප්‍රතිශතයට විනෝද බදු ආඥාපනතේ 2(2) වැනි උපවගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව එකී අනුමැතිය සම්බන්ධයෙන් වන නිවේදනයක් *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව බලපැවැත්වෙන බව ද තවදුරටත් යෝජනා කරන්නීය.

12-787/7

දඹුල්ල ප්‍රාදේශීය සභාව

ගෝඝාතක ආඥාපනතේ 7 (2) වැනි උපවගන්තිය ප්‍රකාරව ගෝඝාතක බලපත්‍ර ලබාදීම සම්බන්ධ විරෝධතා කැඳවීම

ගෝඝාතක බලපත්‍ර ලබාදීම සම්බන්ධ විරෝධතා කැඳවීම ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය) දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි සඳහන් ගෝඝාතකාගාරය පවත්වාගෙන යාමට සහ මස් විකිණීම සඳහා 2019 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බැවින් ගෝඝාතක ආඥාපනතේ 7(2) වැනි උපවගන්තිය ප්‍රකාරව විරෝධතා කැඳවීමට දඹුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ දෙසැම්බර් මස 07 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 06.06.08 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

තව ද, මෙම ස්ථාන සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම පිළිබඳ දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් එකී විරුද්ධ වීමට හේතු සඳහන් කර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් ඇතුළත ඒ බව ලේඛනගත තැපෑලෙන් මා වෙත එවන මෙන් දන්වා සිටිනු ලැබේ.

කේ. ජී. සෝමතිලක,
සභාපති,
දඹුල්ල ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
දඹුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ගෝඝාතක ආඥාපනතේ (272 අධිකාරියේ) 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය ප්‍රකාරව ගෝඝාතක බලපත්‍රයක් අයදුම්කර ඇති පහත උපලේඛනයේ සඳහන් ස්ථාන සඳහා එකී බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ගෙන් අයෙක් විරුද්ධ වන්නේ නම් ඒ සඳහා දින 14ක කාලයක් තුළ විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීමට දඹුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

01. ඒ. එල්. එම්. සියාට්, අංක 18/1, නිකවටවන කිඹිස්ස - ගෝඝාතකාගාරය සහ මස් අලෙවිසල

12-787/8

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2019 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කරමි.

එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1524 හා 2007.11.16 දිනැති *ගැසට් පත්‍රය* යටතේ හා අංක 1617 හා 2009.08.28 දිනැති *ගැසට් පත්‍රය* යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2018 වර්ෂය සඳහා වූ තක්සේරුව 2019 වර්ෂය සඳහා තක්සේරුව ලෙස සම්මත කළයුතු බවටත්, එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 134(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපල මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට දහයක (10%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2019 වර්ෂයෙහි මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 දිනයන්ට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2019 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, කාර්තු වශයෙන් අදාළ වරිපනම් බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එකී කාර්තුවේ පළමුවන මාසය තුළ දී අදාළ මුදලින් 5% ක වට්ටමක් ද ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 11 වැනි දින,
ඇහැලියගොඩ,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-815/1

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 (3) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව හා එම විධිවිධාන අනුව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අක්කර බද්ද නියම කිරීමේ හා අයකිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් සලකනු ලබන බව අංක 544(IV) ආ හා 1989.02.03 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති නියමයට ඇතුළත් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා සීමා ඇතුළත පිහිටියා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ හෙක්ටයාර් එකක් සඳහා 2019 වර්ෂයට රුපියල් 50/- ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමට ද ඒ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 5 හෝ ඊට වැඩි වන හෙක්ටයාර එකක් මත 2019 වර්ෂය සඳහා රු. 10 ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකර ගැනීමට මම තීරණය කරමි.

2018 වසරේ අක්කර බදු සඳහා පදනම් කොටගත් සත්‍යෝක්ෂණය 2019 වසර සඳහා ද සත්‍යෝක්ෂණය ලෙස පිළිගැනීමටත් තව ද, 2019 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද 2019 වර්ෂයෙහි ජනවාරි මස

31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ හතරවන තීරුවේ නිරූපිත දිනයට පෙර අදළ අක්කර බදු මුදල ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට මුදලින් 5% ක වට්ටමක් ද ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් ලබා දිය යුතු බවටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපගන්තිය ප්‍රකාරව මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 11 වැනි දින,
ඇහැලියගොඩ,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*10% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය ජනවාරි 31*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	මාර්තු 31		ජනවාරි 31
දෙවන කාර්තුව	ජූනි 30		අප්‍රේල් 30
තුන්වන කාර්තුව	සැප්තැම්බර් 30		ජූලි 31
හතරවන කාර්තුව	දෙසැම්බර් 31		ඔක්තෝබර් 31

12-815/2

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9. 3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය හා 148 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2019 වර්ෂයට අදළව නියම කර අයකිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 11 වැනි දින,
ඇහැලියගොඩ,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉහත කී උපලේඛනය

මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	රු. 25.00
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා :-	
(අ) වෙළෙඳ කාර්ය සඳහා යොදවන්නේ නම්	18.00
(ආ) වෙළෙඳ කාර්ය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම්	4.00
සෑම කරත්තයක් සඳහා	20.00

සෑම අත්කරත්තයක් සඳහා	10.00
සෑම රික්ෂෝවක් සඳහා	7.50
සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15.00
සෑම ඇතෙකු සඳහා	50.00

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ "වෙළඳ කාර්ය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-815/3

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2019 වර්ෂයට අදළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම් ;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2019 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පලක් වන විට දී, ඊට අදළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2018 වර්ෂයේ ලැබීම් වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2019 වර්ෂය සඳහා නියම කර අය කිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 11 වැනි දින,
ඇහැලියගොඩ,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

පළමුවන උපලේඛනය

I තීරුව	*II තීරුව*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක*
"	*රු. ශත*	*රු. ශත*	*රු. ශත*
අප්‍රසන්න ව්‍යාපාර :			
	රු: ශත	රු: ශත	රු: ශත
01 සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
02 රබර් ෂීට්, ඔට්ටපාළු එකතු කර අළෙවි කිරීම.	500 0	750 0	1,000 0
03 පශු වෛද්‍ය සායනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04 තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම.	500 0	750 0	1,000 0

	I තීරුව	*II තීරුව*		
	බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක*
"		*රු. ශත*	*රු. ශත*	*රු. ශත*
05	කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150 කට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම.	500 0	750 0	1,000 0
06	පොල්කටු අඟුරු හෝ දූව අඟුරු නිපදවීම.	500 0	750 0	1,000 0
07	සත්ත්ව ආහාර නිපදවීම හා විකිණීම.	500 0	750 0	1,000 0
08	පුන්නක්කු නිපදවීම.	500 0	750 0	1,000 0
09	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
10	ට්‍රන්ක පෙට්ටි සෑදීම	500 0	750 0	1,000 0
11	අළුත් ලෝහ හෝ පරන ලෝහ තබා ගැනීම	500 0	750 0	1,000 0
12	ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
13	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
14	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
15	සිරප් හෝ පළතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
16	රසකැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
17	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
18	විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0
19	කෙඳි සායම් කිරීම	500 0	750 0	1,000 0
20	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
21	ඇඹරුම්හලක් පැවැත්වීම (කෝපි, ධාන්‍ය, මිරිස්, කුඩු කිරීම)	500 0	750 0	1,000 0
22	බේකින් පව්ඩර් නිපදවීම	500 0	750 0	1,000 0
23	පොටි නිපදවීම	500 0	750 0	1,000 0
24	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
25	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
26	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
27	සුවඳ විලවුන් නිපදවීම	500 0	750 0	1,000 0
28	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
29	ගඩොල් පිලිස්සීම	500 0	750 0	1,000 0
30	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
31	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
32	පලතුරු වෙළඳාම	500 0	750 0	1,000 0
33	එළවළු වෙළඳාම	500 0	750 0	1,000 0
34	සිල්ලර වෙළඳාම	500 0	750 0	1,000 0
35	සිල්ලර වෙළඳාම (තොග)	500 0	750 0	1,000 0
36	සමුපකාර වෙළඳ ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37	පාපැදි අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
38	මෝටර් රථ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
39	මෝටර් සයිකල් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
40	ත්‍රීරෝද රථ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
41	ලී මෝල (අතින් ඉරන ලී)	500 0	750 0	1,000 0
42	කම්මල	500 0	750 0	1,000 0
43	විදුලි කර්මාන්ත වැඩපල (ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර අළුත්වැඩියාව)	500 0	750 0	1,000 0

I තීරුව	*II තීරුව*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක*
"	*රු. ශත*	*රු. ශත*	*රු. ශත*
44 දුම්ගේ/රබර් රෝල් (අත් යන්ත්‍රය)	500 0	750 0	1,000 0
45 අනුමත ආයතන තුළ සකස් කර පැකට් කරන ලද ශීත කළ කුකුල් මස් හා මාළු අලෙවිය	500 0	750 0	1,000 0
46 රෙදි සායම් කිරීම/නූල් ඔප දැමීම	500 0	750 0	1,000 0
47 කරවල විකිණීම	500 0	750 0	1,000 0
48 බිත්තර විකිණීම	500 0	750 0	1,000 0
49 ග්‍රොසරි	500 0	750 0	1,000 0
50 පුවක්, කරුංකා, කෝපි, කොකෝවා, ගම්මිරිස් වැනි ද්‍රව්‍ය මිලට ගැනීම.	500 0	750 0	1,000 0
51 කැබලි රෙදි විකිණීම	500 0	750 0	1,000 0
52 ලී කැටයම් වැඩ කිරීමේ ස්ථානය	500 0	750 0	1,000 0
53 ලියන තීන්ත, අච්චු තීන්ත හා ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
54 සායම් කුඩු වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
55 හම්/රෙක්සින් භාණ්ඩ නිපදවීම (සපත්තු, බෑග් හා වෙනත්)	500 0	750 0	1,000 0
56 සුරුට්ටු හා බීඩි නිෂ්පාදනය	350.00	500 0	750 0
57 පෞද්ගලික ගෝ ඝාතකාගාරයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
58 ශබ්ධ වාහිනී යන්ත්‍ර ක්‍රියාකරවීම/ කුළියට දීම	500 0	750 0	1,000 0
59 හෝටලය	500 0	750 0	1,000 0
60 බත්කඩ, ආපනශාලා සහ තේ, කෝපි කඩ	500 0	750 0	1,000 0
61 බේකරි	500 0	750 0	1,000 0
62 කිරි පට්ටි හා කිරි වෙළඳාම	500 0	750 0	1,000 0
63 මාළු විකිණීම	500 0	750 0	1,000 0
64 මස් විකිණීම	500 0	750 0	1,000 0
65 ලොන්ඩරි	500 0	750 0	1,000 0
66 සංචාරක වෙළඳාම (වඩේ/ටෝස්/බයිට් වර්ග/බේකරි නිෂ්පාදන)	500 0	750 0	1,000 0
67 ගවහල්	500 0	750 0	1,000 0
68 ඝාතන මඩු	500 0	750 0	1,000 0
69 පොදු වෙළඳපල	500 0	750 0	1,000 0
70 බාබර් සාප්පු	500 0	750 0	1,000 0
71 අවමංගල්‍ය කටයුතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
72 සුවඳ විලවුන් හෝ විෂබීජ නාශක විකිණීම	500 0	750 0	1,000 0
73 තීන්ත/වාර්නිෂ් වර්ග විකිණීම	500 0	750 0	1,000 0
74 නවාතැන් පහසුකම් සහිත ව්‍යාපාර	500 0	750 0	1,000 0
75 ඇඟලුම් රෙදි සේදීම	500 0	750 0	1,000 0
76 සුරතල් මසුන් හා කුරුල්ලන් ඇති කිරීම	500 0	750 0	1,000 0
77 පරිගණක මුද්‍රණ කටයුතු	500 0	750 0	1,000 0
78 හාල් තොග සහ සිල්ලර	500 0	750 0	1,000 0
79 ඔරලෝසු අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
80 ගෝස් කැබලි නිපදවීම	500 0	750 0	1,000 0

I තීරුව	*II තීරුව*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක*
"	*රු. ශත*	*රු. ශත*	*රු. ශත*

දෙවන උපලේඛනය

අන්තරායදායක ව්‍යාපාර

01	වෑල්ඩින් වැඩපල (ඔක්සි ඇසිඩ් භාවිතය)	500 0	750 0	1,000 0
02	වෑල්ඩින් වැඩපල (විදුලි භාවිතය)	500 0	750 0	1,000 0
03	ලෑලි පදම් කිරීම	500 0	750 0	1,000 0
04	යකඩ තහඩු ගැල්වනයිස් කිරීම	500 0	750 0	1,000 0
05	වීදුරු තහඩු කැපීම	500 0	750 0	1,000 0
06	ඡායා පිටපත් ගැනීමේ ස්ථාන	500 0	750 0	1,000 0
07	කුෂන් වැඩපල	500 0	750 0	1,000 0
08	හඳුන්කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
09	ගෑස් අළෙවිය / අළෙවි නියෝජිත	500 0	750 0	1,000 0
10	ගිණිකෙළි, රතිඤ්ඤු විකිණීම	500 0	750 0	1,000 0
11	ස්වර්ණාභරණ නිපදවීම, අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
12	හිස් ගෝනි, බෝතල් තබා ගැනීම (අබලි ද්‍රව්‍ය)	500 0	750 0	1,000 0
13	වීදුරු භාණ්ඩ අලෙවිය	500 0	750 0	1,000 0
14	පින්තූරු රාමු කිරීම	500 0	750 0	1,000 0
15	ග්‍රිල් ගේට්ටු සෑදීම	500 0	750 0	1,000 0
16	ටින්කර් වැඩ	500 0	750 0	1,000 0

තුන්වන උපලේඛනය

අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර :

		රු: ශත	රු: ශත	රු: ශත
01	තැඹිලි, කුරුම්බා විකිණීම	350.00	500 0	750 0
02	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
03	ලී පෙට්ටි නිපදවීම (පැලට්)	500 0	750 0	1,000 0
04	පොහොර/රසායනික පොහොර/කෘෂි රසායන ද්‍රව්‍ය අළෙවිය	500 0	750 0	1,000 0
05	නුණුගල් පිලිස්සීම හා විකිණීම	500 0	750 0	1,000 0
06	කළු ගල් වැඩපල	500 0	750 0	1,000 0
07	රූපලාවණ්‍යාගාර	500 0	750 0	1,000 0
08	ඇසිඩ් වර්ග විකිණීම	500 0	750 0	1,000 0
09	වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ, අධි ශීතකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම.	500 0	750 0	1,000 0

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2019 වර්ෂයට අදලව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කරමි. එනම් ;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා නියම කර අය කිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 11 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

ඉහත කී උපලේඛනය

අනු. අංකය	*I තීරුව* *කර්මාන්තය*	*II තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක*
		රු: ශත	*රු: ශත*	*රු: ශත*
01	අභ්‍යාස පොත් නිපදවීම	500 0	750 0	1,000 0
02	කඩදසි බෑග් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
03	පැණි නිපදවා විකිණීම	500 0	750 0	1,000 0
04	මදුරු දැල් මසා අලෙවිය	500 0	750 0	1,000 0
05	සිමෙන්ති භාණ්ඩ නිපදවීම හා අලෙවිය	500 0	750 0	1,000 0
06	ජී අයි බාල්දි නිපදවා විකිණීම	500 0	750 0	1,000 0
07	පාවහන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
08	ප්‍රචාරක දැන්වීම් පුවරු/බැනර් සකස් කිරීම	500 0	750 0	1,000 0
09	තෙල් මෝල්	500 0	750 0	1,000 0
10	යෝගට් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	බෙලෙක් වැඩපල	500 0	750 0	1,000 0
12	ඇඳ ඇතිරිලි, කොට්ට උර නිපදවීම හා අලෙවිය	500 0	750 0	1,000 0
13	ඇඳුම් මැසීමේ ස්ථාන	500 0	750 0	1,000 0
14	මැටි භාණ්ඩ නිපදවීම/ අලෙවිය	500 0	750 0	1,000 0
15	වඩු මඩුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රමවන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 (1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2019 වර්ෂයට අදාලව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කරමි. එනම් ;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2018 වර්ෂයේ අදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණයට ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා නියම කර අය කිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 11 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

ඉහත කී උපලේඛනය

I තීරුව	*II තීරුව*
2018 වර්ෂයේ ව්‍යාපාරයේ ආදායම	*රු. ශත*
රු: 6,000/- නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු: 6,000/- ඉක්මවන එහෙත් රු: 12,000/- නොඉක්මවන අවස්ථාවක	90.00
රු: 12,000/- ඉක්මවන නමුත් රු: 18,750/- නොඉක්මවන විට	180.00
රු: 18,750/- ඉක්මවන නමුත් රු: 75,000/- නොඉක්මවන විට	360.00
රු: 75,000/- ඉක්මවන නමුත් රු: 1,50,000/- නොඉක්මවන විට	1,200.00
රු: 1,50,000/- ඉක්මවන විට	3,000.00

ව්‍යාපාර බදු අදාළ වන ස්ථානයන් :

1. රක්ෂණ ව්‍යාපාර
2. බැංකු ව්‍යාපාර
3. අළෙවි නියෝජිත ව්‍යාපාර (ඇන්කර්/බිස්කට්/සිගරට්)
4. සැපයුම් කරුවන්
5. විදේශ රැකියා නියෝජිත
6. දේශීය රැකියා නියෝජිත
7. රියැදුරු පුහුණු ආයතන
8. මුදල් ණයට දෙන ස්ථාන
9. ප්‍රධාන නියෝජිතයන්
10. පෞද්ගලික ආයුර්වේද මධ්‍යස්ථාන
11. පෞද්ගලික ඉංග්‍රීසි වෛද්‍ය මධ්‍යස්ථාන
12. වෙන්දේසිකරුවන්
13. ඉන්ධන පිරවුම්හල්
14. වාහන විකිණීමේ ස්ථාන (සේල්)

15. උකස් මධ්‍යස්ථාන
16. ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම (ලීබඩු/මැෂින්/මොටර් සයිකල් වැනි වෙනත්)
17. දුරකතන සම්බන්ධ කරන ව්‍යාපාර
18. රේස් ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාර
19. පෞද්ගලික උත්සව ශාලා ව්‍යාපාර
20. සිනමා ශාලා
21. සීමාසහිත සමාගම්
22. ඒජන්සි තැපැල් කාර්යාල
23. සුපිරි අලෙවිසැල්
24. දුම් පරීක්ෂා කිරීමේ ස්ථාන
25. මෝටර් සයිකල් විකිණීමේ ස්ථාන
26. නාන කාමර කට්ටල හා පිඟන් ගඩොල් අලෙවි ප්‍රදර්ශනාගාර
27. රටබීම ශාලාවක් පවත්වාගෙන යාම
28. වැලි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
29. තොග ගබඩාවක් පවත්වාගෙන යාම
30. නිමි ඇඳුම් ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම
31. ලීසිං මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
32. උත්සව භාණ්ඩ කුළියට දීම
33. නිවාස සැලසුම් ඇඳීම
34. පෞද්ගලික පන්ති
35. බල ප්‍රදේශය තුළ තේ දළු රබර් කිරි එකතු කිරීමේ ව්‍යාපාරය (ජංගම)
36. ඡායාරූප ශාලා
37. සංගීත භාණ්ඩ, නර්තන භාණ්ඩ විකිණීම හා අළුත්වැඩියාව
38. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය
39. ඉංග්‍රීසි බෙහෙත් විකිණීම (ෆාමසි)
40. සිංහල බෙහෙත් විකිණීම
41. පරිගණක වෙළෙඳාම
42. සිමෙන්ති හොන්ඩර 25 ට වැඩි ගබඩාවක්
43. ටයර් ටියුබ් විකිණීම, වොල්කනයිස් කිරීම
44. විදුලි උපකරණ අලෙවිය
45. දේශීය විදේශීය දුරකතන ඇමතුම් හා ජංගම දුරකථන අලෙවිය
46. වීඩියෝ පට කුලියට දීම, ගීත පටිගත කිරීම හා විකිණීම
47. පිඟන් භාණ්ඩ අලෙවිය
48. මුළුතැන්ගෙයි උපකරණ අලෙවිය
49. විදුලි උත්පාදන යන්ත්‍ර කුලියට දීම
50. ස්වර්ණාභරණ අලෙවිය
51. යතුරු පැදි අමතර කොටස් අලෙවිය
52. පා පැදි අමතර කොටස් අලෙවිය
53. මෝටර් රථ අමතර කොටස් අලෙවිය
54. ත්‍රීවිල් රථ අමතර කොටස් අලෙවිය
55. රෙදිපිළි විකිණීම
56. සාප්පු බඩු අලෙවිය
57. පොත් සහ ලිපි ද්‍රව්‍ය වෙළෙඳාම
58. පුවත්පත්, සඟරා වෙළෙඳාම
59. විසිතුරු භාණ්ඩ වෙළෙඳාම
60. කෘත්‍රිම මල් අලෙවිය
61. පූජා භාණ්ඩ අලෙවිය
62. මනි බඩු අලෙවිය
63. ලොතරැයි අලෙවිය/අලෙවි නියෝජිත

64. පා පැදි විකිණීම
65. වේවැල් භාණ්ඩ අලෙවිය
66. ඇස්කණ්නාඩි අලෙවිය
67. ජ්‍යෝතිෂ කාර්යාලය
68. බුලත් දුම්කොළ විකිණීම
69. කිරි හලක් පැවැත්වීම
70. රසායනාගාර
71. බැටරි චාජ් කිරීම හා අළුත්වැඩියා කිරීම
72. රසකැවිලි, පළතුරු බීම විකිණීම
73. බේකරි නිෂ්පාදන අලෙවිය
74. සෞඛ්‍ය ආරක්ෂක උපකරණ විකිණීම
75. ප්ලාස්ටික් බඩු අලෙවිය
76. ගල් ස්මාරක විකිණීම
77. ගුවන් විදුලි යන්ත්‍ර අමතර කොටස් අළෙවිය
78. ඇළුමිනියම් භාණ්ඩ අලෙවිය
79. මිරිදිය මසුන් ඇතිකිරීම හා අලෙවිය
80. මල් පැළ විකිණීම
81. පානීය ජලය බෝතල් තුළ ඇසිරීම
82. මැණික් කැපීම, ඔප දැමීම, මිලදී ගැනීම හා අළෙවිය
83. රබර් කිරි එකතු කිරීම, ඔට්ටපාලු ඇඹරීම
84. මංගල ඇඳුම් කුලියට දීම
85. පාවහන් අලෙවි කරන ස්ථාන
86. පොල් විකිණීම
87. රෙදි විවීම
88. සතොස වෙළෙඳ ආයතනයක් පවත්වාගෙන යාම
89. යතුරු පැදි හා ත්‍රී රෝද රථ සර්විස් කිරීම
90. වාහන සර්විස් කිරීම
91. යාන්ත්‍රික වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
92. යන්ත්‍රානුසාරයෙන් කළගල් මැටල් සැකසීම
93. යන්ත්‍රානුසාරයෙන් කම්මල (ලියවන පට්ටල්)
94. යාන්ත්‍රික ලී මෝල් ව්‍යාපාරය
95. යාන්ත්‍රික ගල් මෝල් ව්‍යාපාරය
96. මුද්‍රණාල
97. ඇඟළුම් කර්මාන්ත ශාලා
98. මහා පරිමාණයේ කර්මාන්ත ශාලා
99. තේ කර්මාන්ත ශාලා
100. ලේ සාම්පල් එකතු කිරීම
101. මිරිදිය මසුන් ඇති කිරීම
102. දන්ත ශල්‍යාගාර
103. යන්ත්‍ර උපකරණ කුලියට දීම
104. උත්සව ශාලා සැරසිලි කුලියට දීම
105. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම
106. පිඟන් ගඩොල් නිපදවීම හා අලෙවිය
107. සාරි වෙළෙඳාම
108. බලවේග පෙහෙකම් නිපදවීම
109. තේ කොළ පැකට් කිරීම හා අලෙවිය
110. ඕනෑම ද්‍රව්‍යයක් වෙළඳාම් කිරීම සඳහා

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයෙහි තාවකාලික අලෙවි කුටි සඳහා ගාස්තු අය කිරීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාවට ඇතුළත් වූ ප්‍රදේශයෙහි ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් නම් කරනු ලබන ස්ථානයන්හි තාවකාලික අලෙවි කටයුතු සඳහා මෙහි නිරූපිත අනුප්‍රමාණ අනුව වූ බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 11 වැනි දින,
ඇහැලියගොඩ
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ දී ය.

01	තාවකාලික සේල් පොළවල් සඳහා දිනකට ගාස්තු	රු. 500 සිට 1500 දක්වා
02	රෙදි සහ අනෙකුත් ද්‍රව්‍ය සඳහා	රු. 250 සිට 1500 දක්වා

12-815/7

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයෙහි සමාජ ශාලාවලට බලපත්‍රය ලබා දීම

1975 අංක 77 දරන සමාජශාලා වලට බලපත්‍ර ලබාදීම් පනත මගින් පැවරී ඇති බලතල ප්‍රකාර ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා පරිපාලන සීමාවේ පවත්වන සමාජ ශාලා වලට මෙහි නිරූපිත අනුප්‍රමාණ අනුව වූ බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 11 වැනි දින,
ඇහැලියගොඩ
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ දී ය.

		රු. ශත
01	ඉල්ලුම් පත්‍ර ගාස්තු	1,500 0
02	වාර්ෂික බලපත්‍ර ගාස්තු	500 0

12-815/8

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

2019 වර්ෂය සඳහා සිනමාහල් නොවන මුදල් අයකර පෙන්වන දර්ශන සඳහා වන ප්‍රවේශ පත්‍රයක සඳහන් මුදලින් 15% විනෝද බදු මුදල් වශයෙන් අය කළ යුතුයැයි මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 11 වැනි දින,
ඇහැලියගොඩ,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ දී ය.

12-815/9

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ලබාදීම

2000 අංක 53 දරන පාරිසරික සංශෝධන පනත යටතේ පැවරී ඇති බලතල අනුව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශය සඳහා පරිසර බලපත්‍ර පැනවීමේ දී මෙහි නිරූපිත අනුප්‍රමාණ අනුව වූ බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කළයුතු යැයි මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 11 වැනි දින,
ඇහැලියගොඩ,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ දී ය.

මූලික ආයෝජන මුදල රු.		ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව රු. ශත
01	රු. 250,000 ට අඩු	3000.00
02	රු. 250,001 ත් රු. 500,000 ත් අතර	3750 0
03	රු. 500,001 ත් රු. 1,000,000 ත් අතර	5000.00
04	රු. 1,000,001 ට වැඩි	10,000.00
05	පරිසර බලපත්‍ර ගාස්තු	4000.00

12-815/10

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වෙනත් ගාස්තු අය කිරීම

2019 වර්ෂය සඳහා බදු මුදල් අය කිරීමට අදාළ නොවන්නා වූ වෙනත් ගාස්තු පහත සඳහන් අනු ප්‍රමාණය අනුව අය කිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 11 වැනි දින,
ඇහැලියගොඩ,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ දී ය.

	රු. ශත
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000.00
ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.	1,000.00
පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීම. (වැඩිහිටි)	1,000.00
පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීම. (ළමා)	50.00
පුස්තකාල සාමාජිකත්වය අළුත් කිරීම. (වැඩිහිටි)	50.00
පුස්තකාල සාමාජිකත්වය අළුත් කිරීම. (ළමා)	30.00
(සෑම සාමාජිකයෙකුම සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු වාර්ෂික සාමාජිකත්වය අළුත් කර ගත යුතුය)	
ප්‍රමාද ගාස්තු දිනකට	1.00

	රු. ශත
ප්‍රමාද ගාස්තු දින 31-90 දක්වා	40.00
ප්‍රමාද ගාස්තු දින 91-180 දක්වා	60.00
ප්‍රමාද ගාස්තු දින 181 ට වැඩි	100.00
අයදුම්පත් ගාස්තු	5.00

පොතකට අලාභයක් සිදුවුවහොත් හෝ නැතිවුවහොත් පොතේ
වටිනාකම මෙන් දෙගුණයක් හා පොතේ වටිනාකමින් 25% ක් රජයේ ගාස්තු වශයෙන් ගෙවිය යුතුය.
බල ප්‍රදේශයෙන් පිටත පදිංචි කරුවන් සඳහා සාමාජිකත්වය ලබා ගැනීමේදී අවුරුදු 12 ට අඩු වූවන් සඳහා රු. 200 ක් හා අවුරුදු 12 ට වැඩි වූවන් සඳහා රු. 500 ක් බැගින් තැන්පතුවක් තැබිය යුතුය. (මීට අමතරව සාමාජික ගාස්තු ගෙවිය යුතුය.)

	රු. ශත
අනතුරුදායක කොස් ගස් එකක් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීමට ගාස්තුව	1,000 0
කොස් නොවන ඕනෑම වෙනත් අනතුරුදායක ගස් එකක් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීමේ ගාස්තුව	500.00
ප්‍රසිද්ධ රැඟුම් සඳහා බලපත්‍ර ගාස්තු	500 0
පාපැදි ඉල්ලුම්පත් ගාස්තු	20.00
එක් දිනක වෙන්දේසි ගාස්තු	1200.00
සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු	60.00
ගවයෙකු ඝාතනය කිරීම සඳහා තාවකාලික බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු	1000.00
දිවුරුම්පිටිය ජල යෝජනා ක්‍රමයේ ජලය ලබා දීමට නව ජල සම්බන්ධතා ගාස්තුව	6,000 0
ප්‍රාදේශීය සභා මාර්ගවල දෑව/පස් ප්‍රවාහනයට මාර්ග පරීක්ෂා කර අනුමැතිය ලබා දීමේදී ආපසු නොගෙවන ගාස්තුව	2,500 0
මැණික් පතල් කැපීම සඳහා ස්ථාන පරීක්ෂා කර සහ නිර්දේශය/ අනුමැතිය ලබා දීමට ආපසු නොගෙවන ගාස්තුව	2,500 0

සේවාලාභීන් සඳහා ලිපි ලේඛන පිටපත් ලබා දීමේදී එක් පිටපතක් සඳහා රු. 25/- ක මුදලක් සභාවට ගෙවිය යුතුය.

12-815/11

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් සඳහා සැලසුම් අනුමත කිරීම හා ඒ සම්බන්ධ වෙනත් කාර්යයන්, ඉඩම් අනුබෙදුම් හා විථිරේඛා හා නොපවරා ගැනීමේ සහතික සඳහා ගාස්තු

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම වන මට සංවර්ධන අවසර පත්‍ර ලබාදීම සඳහා පෙරසැරි ගාස්තු, ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු හා සේවා ගාස්තු අයකිරීම, අදළ සේවා සඳහා අයදුම්පත් ගාස්තු අයකිරීම, විථිරේඛා හා නොපවරා ගැනීමේ සහතික සඳහා ගාස්තු අයකිරීම, දඩ මුදල් අයකිරීම පහත සඳහන් අනුප්‍රමාණ අනුව වූ ගාස්තුවක් 2019 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 11 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ.

	රු. ශත
ගොඩනැගිලි අයදුම්පත් ගාස්තුව	200.00
භූමි යෝග්‍යතා සහතිකපත් ලබා ගැනීම සඳහා අයදුම්පත්‍ර ගාස්තු	25.00
විථිරේඛා හා නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම	750 0
පිඹුරු අනුමත කිරීමේ ගාස්තු (නාගරික නොවන එක් බිම්කඩක් සඳහා)	300.00

නාගරික සංවර්ධන අධිකාරියෙන් නාගරික ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශවල ගොඩනැගිලි ඉදිකිරීම, වෙනත් ඉදිකිරීම් හා ඒ සම්බන්ධ සියළුලු කාර්යයන්, ඉඩම් අනු බෙදුම් හා ඒ සම්බන්ධයෙන් වන සංවර්ධන අවසර පත්‍ර ලබා ගැනීම සඳහා පෙරසැරි ගාස්තු, ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු අය කිරීම 2009.04.17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් ගාස්තු පරිදි අය කිරීම සිදු කළ යුතුය.

උක්ත කලාපයට අයත් නොවන නාගරික ප්‍රදේශයෙන් පිටත පිහිටා ඇති ප්‍රදේශවල ගොඩනැගිලි ඉදි කිරීම, පවත්නා ගොඩනැගිලි වලට අළුතින් කොටස් එකතු කිරීම/නැවත ඉදි කිරීම යන සංවර්ධන කාර්යයන් සඳහා ගාස්තු අය කිරීම පහත පරිදි විය යුතුය.

ගෙබිම විශාලත්වය	*පදිංචිය සඳහා (නේවාසික)*	*වාණිජ හෝ වෙනත් භාවිත*
	රු. ශත	*රු. ශත*
වර්ග අඩි 100-500	300.00	450.00
501-1,000	450.00	750.00
වර්ග අඩි 1,000 සිට වැඩිවන සෑම වර්ග අඩි 100 ක් හෝ කොටසකට	100.00	150.00

1.	ගොඩනැගිලි සැලසුම් අනුමත කාලය වසරකින් දීර්ඝ කිරීම (නාගරික)		රු. 1,000 0
2.	ගොඩනැගිලි සැලසුම් අනුමත කාලය වසරකින් දීර්ඝ කිරීම (ග්‍රාමීය)		රු. 250.00
3.	මායිම් තාප්ප ආරක්ෂක බැමි ඉදිකිරීම (ග්‍රාමීය)	නේවාසික දික් මීටර් 1 ක් සඳහා	රු. 300.00
		වාණිජ හා වෙනත් වර්ග සඳහා (දිග මීටර් 1 ක් සඳහා)	රු. 400.00
4.	දුරකථන කුළුනු / ඇන්ටනා කුළුණු ඉදිකිරීම (ග්‍රාමීය හා නාගරික)	උස මීටර් 5-20 දක්වා රු.20,000 ක් සහ වැඩිවන සෑම මීටර් එකකටම හෝ කොටසකට රු. 100.00 බැගින් (ග්‍රාමීය හා නාගරික)	
5.	නේවාසික සඳහා වූ ඒකකය භාවිතය වෙනස් කිරීම (ග්‍රාමීය)	1. ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටර්) (පෙරසැරි ගාස්තු)	

	රු. ශත
45 ට අඩු	250.00
45-90	500 0
91-180	625.00
181-270	750 0
271-450	875.00
451-675	1000.00
676-900	1125.00

වර්ග මීටර් 901 වැඩිවන එක් එක් වර්ග මීටර් 90 සඳහා රු. 250 බැගින් වැඩිවේ.

6.	විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම (ග්‍රාමීය)	රු. මිලියන 5 කට අඩු රු. 2,500 0 ක් සහ වැඩිවන සෑම රුපියල් මිලියන එකකට රු. 50 බැගින්

අනුකූලතා සහතික නිකුත් කිරීම (ග්‍රාමීය)

ඉඩම් අනුබෙදුම් (ග්‍රාමීය)	i.	පළමු බිම් කොටසකට රු. 500ක් හා ඊට වැඩිවන සෑම බිම් කට්ටියකටම රු. 250.00 බැගින්
නේවාසික ඉදිකිරීම් (ග්‍රාමීය)	ii.	වර්ග මීටර් 300ට අඩු රු. 1,500 ක් සහ ඊට වැඩිවන සෑම වර්ග මීටර් 1ට හෝ කොටසකට රු. 5 බැගින්

වාණිජ හා වෙනත් ඉදිකිරීම් (ග්‍රාමීය)	iii.	වර්ග මීටර් 100ට අඩු 1,500 ක් සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කට හෝ කොටසකට රු. 10 බැගින්
මායිම් තාප්ප ආරක්ෂක බැමි ඉදිකිරීම (ග්‍රාමීය)	iv.	පළමු දික් මීටර් 100 සඳහා රු. 500 ක් සහ ඊට වැඩිවන සෑම මීටර් 1 කට හෝ කොටසකට රු. 5.00 බැගින්
දුරකථන/විදුලි සංදේශ කුළුණු	v.	උස මීටර් 5 සිට 20 දක්වා රු. 2,000 සහ ඊට වැඩිවන සෑම මීටර් 1 කට රු. 100 බැගින්
විශේෂ ව්‍යාපෘති (ග්‍රාමීය)	vi.	කුඩා පරිමාණ සඳහා රු. 2,500 0 මධ්‍ය පරිමාණ සඳහා රු. 5,000 0 මහා පරිමාණ රු. 10,000 0

නිසි බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම/ කොටස් එකතු කිරීම/ නැවත ඉදිකිරීම (ග්‍රාමීය)

ඉදිකිරීමේ අදියර	නේවාසික වර්ග මීටර් 01 සඳහා ගාස්තු රු. ශත	වාණිජ හා වෙනත් වර්ග මීටර් 01 ක් සඳහා ගාස්තු රු. ශත
අත්තිවාරම් වැඩ පමණක්	100.00	250.00
වහල මට්ටම දක්වා (වහලය රහිතව)	150.00	500.00
වහලය ඇතුළුව ඉදිකොට ඇති විට	200.00	750.00
සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	250.00	1,000.00
මායිම් තාප්ප ආරක්ෂිත බැමි ඉදිකිරීම	200.00	200.00

12-815/12

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වන උපවගන්තිය යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත යම් ඉඩමක් වෙන්දේසිකරුවකු, තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් 1% කට සමාන බද්දක් විකුණුම්කරු, තැරැව්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 11 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

12-815/13

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සභාව සතු ක්‍රීඩා භූමි හා සභා ශ්‍රවණාගාරය බදු දීමේ දී ගාස්තු අය කිරීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩා භූමි බදු දීමේ දී පහත සඳහන් අනු ප්‍රමාණ අනුව වූ ගාස්තුවක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 11 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ.

ක්‍රීඩා පිටි වෙන් කිරීම එක් දිනක් සඳහා		රු.ශත
01	ප්‍රා.ස. බල ප්‍රදේශයේ පාසල් සඳහා	නොමිලේ
02	ප්‍රා.ස. බල ප්‍රදේශයේ ක්‍රීඩා සමාජ සඳහා	250.00
03	ප්‍රා.ස. බල ප්‍රදේශයෙන් පිටත ක්‍රීඩා සමාජ සඳහා	500 0
04	පෞද්ගලික ආයතන ක්‍රීඩා උත්සව හෝ වෙනත් කටයුතු සඳහා	1,000 0
05	දේශපාලන රැස්වීම් සඳහා	250.00
06	සංදර්ශන, කානිවෙල් සහ වෙනත් කාර්යයන් සඳහා	1,500 0
ශ්‍රවනාගාරය වෙන් කිරීම එක් දිනකට		
01	ආදයම් උත්පාදන වැඩසටහන සඳහා	3,000.00
02	අනෙකුත් වැඩසටහන් සඳහා	1,000 0
03	එක් පුටුවක් සඳහා	5.00
ශ්‍රවනාගාරය වෙන් කිරීම (දම්මුල්ල)		
01	දින 1/2 සඳහා	250 0
02	දින 01 ක් සඳහා	500 0

12-815/14

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අය කිරීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාවට ඇතුළත් වූ ප්‍රදේශයෙහි ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා පහත සඳහන් අනු ප්‍රමාණ අනුව වූ ගාස්තුවක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 11 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

		වර්ග අඩියකට *රු. ශත*
01	බිත්ති හා තාප්ප උපයෝගි කර ගන්නා ප්‍රචාරක දැන්වීම් සඳහා	25 0
02.	ස්ථිර දැන්වීම් පුවරු සඳහා	50 0
03.	රෙදි මගින් කෙරෙන ප්‍රචාරක දැන්වීම් සඳහා (බැනර් සහ කටවුට්)	25 0
04.	ඩිජිටල් මුද්‍රණ දැන්වීමක් සඳහා	35 0

12-815/15

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ජල බදු අය කිරීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාවට ඇතුලත් වූ ප්‍රදේශයෙහි 2019 වර්ෂය සඳහා ජල බදු අය කිරීම් පහත සඳහන් අනු ප්‍රමාණ අනුව විය යුතු යැයි මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 11 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

		රු.ශත
01	නිවෙස් සඳහා ස්ථිර බද්ද	100.00
02	ව්‍යාපාරික ස්ථාන සඳහා ස්ථිර බද්ද	300.00
03	මාසික ඒකක 10 දක්වා ඒකකයක් සඳහා (නේවාසික)	25.00
04	මාසික ඒකක 10 ට වැඩි වන විට ඒකකයක් සඳහා (නේවාසික)	35.00
05	මාසික ඒකක 05 දක්වා ඒකකයක් සඳහා (ව්‍යාපාරික)	25.00
06	මාසික ඒකක 05 ට වැඩිවන විට ඒකකයක් සඳහා (ව්‍යාපාරික)	35.00

12-815/16

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වාහන කුලියට දීමේ දී ගාස්තු අය කිරීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු වාහන කුලියට දීමේ දී පහත සඳහන් අනුප්‍රමාණ අනුව වූ ගාස්තුවක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 11 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

උපලේඛනය

		රු. ශත	
01	ට්‍රැක්ටරය දිනකට	3600.00	(උපරිම පැය 8 - ඉන්ධන සහිතව)
02	ට්‍රැක්ටරය සහ අඩි 75 ට්ලරය	5,200.00	(උපරිම පැය 8 - ඉන්ධන සහිතව)
03	බැකෝ ලෝඩර (පැයකට)	2,500 0	(උපරිම පැය 8 - ඉන්ධන සහිතව)
04	ජල බවුසරය (ජලය රහිත පැයකට)	1,000 0	(උපරිම පැය 8 - ඉන්ධන සහිතව)
05	ඩ්‍රම්ප්ට්‍රක් ලොරිය (දිනකට)	8,500 0	(උපරිම පැය 8 - ඉන්ධන සහිතව)
06	තණකොල කපන මැෂිම (පැයකට)	335.00	(උපරිම පැය 8 - ඉන්ධන සහිතව)

12-815/17

අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ දෙසැම්බර් මස 06 වන දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේදී තීරණ අංක ඉ-2(i) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්. යෝගරාජ්,
සභාපති,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 06 වැනි දින,
අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතින් 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මධ්‍යම පළාත්, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.23 වැනි දින අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කොට 2017 .05.05 වැනි දින අංක 2017/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙන් ලැබී ඇති බලතල අනුව 2019 වර්ෂයේ දී අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් මගින් පහත උපලේඛනයේ දැක්වෙන බලපත්‍ර ගාස්තු පනවා අය කිරීමට අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

02 උපලේඛනය

අනු. අංකය	*ප්‍රවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250.00	350.00	500 0
		1 ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින්		
02	රෙදි ඩිජිටල් බැනර් සඳහා	3 ට අඩු	250.00	350.00	500 0
		3 ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500 0	750 0	1,000 0
		1 ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.300.00 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500 0	750 0	1,000 0
		1 ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.300.00 බැගින්		
05	ඉටි රෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250.00	350.00	500 0
		1 ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින්		

අනු. අංකය	*ප්‍රවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
06	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250.00	350.00	500 0
		1 ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	750 0	850.00	1,000 0
		1 ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.500 0 බැගින්		

12-819/1

අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ දෙසැම්බර් මස 06 වන දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේදී තීරණ අංක ඉ-2(ii) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්. යෝගරාජ්,
සභාපති,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 06 වැනි දින,
අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

267 වන අධිකාරය වූ විනෝද බදු ආඥාපනතේ 02 වගන්තිය (1) උපවගන්තිය ප්‍රකාරව අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව ඇතුළත තාවකාලිකව ප්‍රදර්ශනය කරනු ලබන ආධාර චිත්‍රපට දර්ශන, සර්කස්, දර්ශන සහ සෑම සංගීත සංදර්ශනයක් සඳහා සහ වෙනත් ඕනෑම විනෝද සංදර්ශනයක් වෙනුවෙන් මුද්‍රණය කරනු ලබන ප්‍රවේශපත්‍රවල වටිනාකමින් 12% ක විනෝද බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට සුදුසුයැයි යෝජනා කරමි.

12 - 819/2

අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ දෙසැම්බර් මස 06 වන දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේදී තීරණ අංක ඉ-2(iii) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්. යෝගරාජ්,
සභාපති,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 06 වැනි දින,
අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ 02 උපලේඛනයේ සඳහන් කිසියම් ව්‍යාපාරයක් අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

පළමුවන උපලේඛනය

	I තීරය *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*	*II තීරය* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
01.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
02.	රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
03.	රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
04.	රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
05.	රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
06.	රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

ඉහත කී දෙවන උපලේඛනය

ඇතැම් ව්‍යාපාර සම්බන්ධ බදු

01. කොමිස් ඒජන්තවරු
02. වෙන්දේසිකරුවන්
03. බ්‍රෝකර්කරුවන්
04. මුදල් ආයෝජකයින්
05. උකස් බඩු ගන්නවුන්
06. සැපයුම්කරුවන්
07. කොන්ත්‍රාත්කරුවන්
08. රියැදුරු පුහුණු ආයතන
09. රක්ෂණ නියෝජිතයින්
10. මෝටර් රථ වෙළෙඳාම් කරන්නවුන්
11. මූල්‍ය ආයතන හා බැංකු පවත්වාගෙන යාම
12. පෞද්ගලික සායනයක් හා සාත්තු නිවාසයක්
13. පෞද්ගලික පාසල්/පෞද්ගලික උපකාරක පන්ති
14. ඇඟළුම් කම්හලක් පවත්වාගෙන යාම
15. ගුවන්විදුලි, රූපවාහිනී දුරකථන හා සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයක් හෝ කුළුණක් පවත්වාගෙන යාම
16. කුලී රථ අයිතිකරුවන් (කැබ් සර්විස්)
17. ප්‍රවාහන නියෝජිතයින්
18. අපනයනකරුවන්
19. වැලි තොටුපල
20. සැළසුම් ශිල්පීන්
21. කර්මාන්තශාලා

අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ 2019 වර්ෂය සඳහා ජලගාස්තු අයකිරීම

අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ දෙසැම්බර් මස 06 වන දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේදී තීරන අංක ඉ-2(iv) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්. යෝගරාජ්,
සභාපති,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 06 වැනි දින,
අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් සකස් කරන ලද 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv(ආ) කොටසේ පළකරන ලද්දා වූ පොදු අතුරු ව්‍යවස්ථාවල අංක 34 ජල සම්පාදන අතුරු ව්‍යවස්ථාවලට අනුව අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන පළමු උපලේඛනයේ සඳහන් ජල යෝජනා ක්‍රම මගින් පරිභෝජනය කරනු ලබන ජලය සඳහා 2 වන උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2019 වර්ෂයේ දී පනවා අය කිරීමට අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

පළමුවන උපලේඛනය

01. **පොම්පීය ජල යෝජනා ක්‍රම :**

රංමුතුගම ජල යෝජනා ක්‍රමය

02. **ගුරුත්ව ජල යෝජනා ක්‍රම :**

කුඹල්ඔළුව ජල යෝජනා ක්‍රමය
මොරගහමඩ ජල යෝජනා ක්‍රමය
රත්තොටමලේ ජල යෝජනා ක්‍රමය
කුකුරුමාන ජල යෝජනා ක්‍රමය
ඇහැලගස්තැන්න ජල යෝජනා ක්‍රමය
සිරංගහවත්ත ජල යෝජනා ක්‍රමය
එගොඩ පුස්සැල්ල ජල යෝජනා ක්‍රමය

දෙවන උපලේඛනය

01. **පොම්පීය ජල යෝජනා ක්‍රම සඳහා ජල ගාස්තු :**
ස්ථාවර ගාස්තුව රු. 150 ක් වන අතර, ප්‍රයෝජනයට ගන්නා සෑම ඒකකයට සඳහාම රු. 35 බැගින් අය කෙරේ.

02. **ජලමනු සවිකර ඇති ගුරුත්ව ජල යෝජනා ක්‍රම සඳහා ජල ගාස්තු :**

ස්ථාවර ගාස්තුව රු. 100 ක් වන අතර ප්‍රයෝජනයට ගන්නා පළමු ඒකක 10 සඳහා එක් ඒකකයට රු. 15 0 බැගින් ද හා එකොළොස්වන ඒකකයේ සිට සෑම ඒකකයක් සඳහාම රු. 20.00 බැගින් ද අයකෙරේ.

අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ඇතැම් ඉඩම් විකිණීම සම්බන්ධයෙන් බදු පැනවීම

අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ දෙසැම්බර් මස 06 වන දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේදී තීරණ අංක ඉ-2(v) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එන්. යෝගරාජ්,
සභාපති,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 06 වැනි දින,
අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල අනුව යෝජනා කරන්නීය. අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු /තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුනියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවකදී ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුනියෝජිතයා විසින් අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යැයි යෝජනා කරමි.

12 - 819/5

අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව අක්කර බදු පැනවීම

අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ දෙසැම්බර් මස 06 වන දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේදී තීරණ අංක ඉ-2(vi) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී සභා සම්මතය සඳහා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 02 වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්ති ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති බවත් 2019 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද මාර්තු 31, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුලදී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් ඒ සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) වට්ටමක් ද එක් එක් කාර්තුවට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

එන්. යෝගරාජ්,
සභාපති,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 06 වැනි දින,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019 වර්ෂයේ දී බලාත්මක කරන ලද සත්‍යාක්ෂණය කිරීම 2019 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී පනතේ 134 වන වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ ද,

පළමු උපලේඛනය

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2019 වර්ෂය සඳහා රුපියල් 10 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමටත්,

(ආ) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද යෝජනා කරමු.

12 - 819/6

අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදළ අතුරු ව්‍යවස්ථා යටතේ 2019 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ දෙසැම්බර් මස 06 වන දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේදී තීරණ-අංක ඉ-2(vii) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2019 වර්ෂයේ දී අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මත ගාස්තුවක් අය කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එන්. යෝගරාජ්,
සභාපති,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 06 වැනි දින,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපනශාලාවක් හෝ නවාතැන්පලක්වන විට, එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන්පොලෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම් වලින් 1% ක ප්‍රමාණය හෝ උපලේඛනයේ 2 වන තීරුවේ නිරූපිත ප්‍රමාණය යන මුදල් ප්‍රමාණ දෙකෙන් වඩා අඩු මුදලට සමාන ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත් අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

	I වැනි තීරය	*II* වැනි තීරය		
	බලය දෙනු ලබන කාර්යය	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
1.	ඇඳුම් මැසීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	තොග බඩු බෙදාහැරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	මෝටර් රථ අමතර කොටස් විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	ටයර්, ටියුබ් අලෙවි සැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	අත්යන්ත්‍ර රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	පාවහන් නිෂ්පාදනය කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	සිල්ලර /පෙට්ටි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	එළවළු විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	වේවැල් භාණ්ඩ විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	කෙටි ආහාර විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	බෝතල් පාණීය ජලය සඳහා	500 0	750 0	1,000 0
15.	ලී බඩු අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	තේ කොළ පැකට් කිරීමේ හා බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	උත්සව ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	පාසල් බෑග්, ගමන් මළු, නිෂ්පාදනය හා විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	බාබර් සැප්පුවක් පවත්වාගෙන යාම	350 0	600 0	800 0
21.	නවාතැන්පළක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
22.	බයිට්ස් වර්ග නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	350 0	600 0	800 0
23.	රසකැවිලි නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	350 0	600 0	800 0
24.	මාළු වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	350 0	600 0	800 0
25.	පළතුරු අලෙවිසැලක් පවත්වාගෙන යාම	350 0	600 0	800 0
26.	ශීතකළ මස් මාංශ වර්ග විකිණීම	350 0	600 0	800 0

උපලේඛනය

i කොටස — අන්තරාදායක ව්‍යාපාර

	I වැනි තීරය	*II* වැනි තීරය		
	බලය දෙනු ලබන කාර්යය	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
1.	යන්ත්‍ර භාවිතා කරන කම්හලක් පවත්වාගෙන යාම	350 0	600 0	1,000 0
2.	විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	350 0	600 0	1,000 0
3.	විසිතුරු පින්තාරු කිරීම (ස්ප්‍රේ) වැඩපලක් පවත්වාගෙන යාම	350 0	600 0	1,000 0

	I වැනි තීරය	*II වැනි තීරය*		
	බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
4.	මැටල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	මැතිලේටඩ් ස්ප්‍රිත්තු නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	350 0	600 0	1,000 0
6.	රබර් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	350 0	600 0	1,000 0
7.	පොල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	350 0	600 0	1,000 0
8.	විනාකිරි නිෂ්පාදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	350 0	600 0	1,000 0
9.	සබන් නිෂ්පාදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	350 0	600 0	1,000 0
10.	සිසිල් බීම නිෂ්පාදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	350 0	600 0	1,000 0
11.	ගිනිපෙට්ටි නිපදවීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	350 0	600 0	1,000 0
12.	ගඩොල් හෝ උළු පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	ශාරීරික ව්‍යායාම් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05. ජල සැපයුම් විසන්ධි කිරීමෙන් පසු නැවත ජල සැපයුම් සම්බන්ධතාව ලබා දීම සඳහා ගාස්තු	2,500 0

12 - 777/9

කන්දකැටිය ප්‍රාදේශීය සභාව

ආකෘතිපත්‍ර සහ සේවා ගාස්තු - 2019 වර්ෂය

කන්දකැටිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව ආකෘති පත්‍ර සහ සේවා ගාස්තු පනවා අයකිරීමට 2018.11.15 වැනි දින යෝජනා අංක 07 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් මහජනතාව වෙත නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. කමල් රාජපක්ෂ,
සභාපති,
කන්දකැටිය ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 15 වැනි දින,
කන්දකැටිය ප්‍රාදේශීය සභාව,
කන්දකැටිය.

යෝජනාව

2019 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට පහත උපලේඛනයේ සඳහන් ආකෘතිපත්‍ර හා සේවා ගාස්තු පනවා අය කිරීමට සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය	*විස්තරය*	*ගාස්තුව රු. ශත*
01	දුරකතන කුළුනක් ඉදිකිරීම සඳහා පෙරසැරි ගාස්තු	8,75,000 0
02	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම :	
	(i) ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර ගාස්තු	250 0
	(ii) පෙරසැරි ගාස්තු - ගෘහස්ථ (වර්ග අඩියකට)	3 50
	ව්‍යාපාරික - වර්ග අඩියකට	06 0
	කර්මාන්ත (වර්ග අඩියකට)	10 0
03.	(i) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු - ගෘහස්ථ	700 0
	ව්‍යාපාරික	900 0
	කර්මාන්ත	1,500 0
	(ii) අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තු	2,100 0

අනු. අංකය	විස්තරය	ගාස්තුව රු. ශත
04.	වීථිරේඛා සහතික සහ නොපරවා ගැනීමේ සහතික සඳහා :	
	(i) ඉල්ලුම්පත්‍ර ගාස්තු	150 0
	(ii) වීථි රේඛා/නොපරවා ගැනීමේ සහතිකපත්‍ර ගාස්තු	2,900 0
	(iii) අනු බෙදුම් අනුමත කිරීමේ ගාස්තු	600 0

05. නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ඉදිකිරීම/කොටසක් එකතු කිරීම/නැවත ඉදිකිරීම සඳහා ආවරණ අනුමැතිය දීමේ ගාස්තු :

	නේවාසික වර්ග මීටර් 1ක් සඳහා ගාස්තුව රු. ශත	වාණිජ හා වෙනත් වර්ග මීටර් 1ක් සඳහා ගාස්තු රු. ශත
(i) අත්තිවාරම් වැඩ පමණක් (කසීරු මට්ටම් සම්පූර්ණ කොට ඇති විට)	200 0	500 0
(ii) වහල මට්ටම දක්වා (වහලය රහිතව) ඉදිකොට ඇති විට	300 0	1,000 0
(iii) වහලය ඇතුළුව ඉදිකොට ඇති විට	400 0	1,500 0
(iv) සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	500 0	2,000 0

		රු. ශත
06.	නිවාස ණය සහ ඊට අදාළ සහතිකපත් සඳහා	1,250 0
07.	ප්‍රවර්ධන වැඩසටහන් සහ උත්සව/රැස්වීම් සඳහා පොළ භූමිය සහ ප්‍රසිද්ධ වෙනත් ස්ථාන ලබා දීම (දිනකට)	5,000 0
08.	ට්‍රැක්ටරය කුළියට දීම (දිනකට) (ඉන්ධන සහිතව)	4,000 0
09.	ජල බවුසරය සහිතව කුලියට දීම (දිනකට යෑමට සහ ඒමට)	
	(i) කි. මී. 10 ඇතුළත	1,950 0
	(ii) කි. මී. 10ට වැඩි වැඩිවන සෑම කි.මී. 10 සීමාව සඳහා 500 බැගින් වැඩිවේ.	2,750 0
10.	ජෙනරේටරය කුලියට දීම දිනකට (ඉන්ධන සහ ප්‍රවාහනය නොමැතිව)	3,000 0
11.	සමහට් 01ක් කුලියට දීම (දිනකට)	250 0
12.	ප්ලාස්ටික් පුටු 01ක් කුලියට දීම (දිනකට)	5 0
13.	ටකරන් එකක් කුලියට දීම (දිනකට)	33 0
14.	ශබ්දවාහිනී යන්ත්‍රය කුලියට දීම (දිනකට)	1,000 0
15.	කොඩිකණු 01ක් කුළියට දීම (දිනකට)	50 0
16.	ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය කුළියට ලබා දීම (දිනකට) :	
	(i) රාජ්‍ය ආයතන සඳහා	2,500 0
	(ii) පෞද්ගලික ආයතන සඳහා	7,000 0
17.	ශ්‍රවනාගාරය ශබ්ද විකාශන යන්ත්‍රය සඳහා සේවා ගාස්තු	750 0
18.	(i) පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීමේ ගාස්තු ගෙවීම	
	පාසල් ළමුන් සඳහා	150 0
	වැඩිහිටි අය සඳහා	200 0
	(ii) පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු	100 0
19.	නෙස් කැෆේ යන්ත්‍රය කුළියට දීම (දිනකට)	500 0
20.	වතුර ටැංකි 01ක් කුළියට දීම සඳහා (දිනකට)	250 0

හාලිඇල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර වෘත්තීන් මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 152 වැනි වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2019 වර්ෂයට පහත උපලේඛනය පරිදි ව්‍යාපාර හා වෘත්තීන් මත බදු අය කිරීමට 2018 නොවැම්බර් මස 30 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 01 අනුව හාලිඇල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම නිවේදනය කරමි.

නිමල් සේනානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2018 දෙසැම්බර් මස 03 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් ව්‍යාපාර හා වෘත්තීන් මත බදු අය කිරීමට යම් ව්‍යාපාරයක් හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එකී ව්‍යාපාරයේ 2019 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයේ 1 තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි 11 වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කළයුතු යැයි ද,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත් වන තැනැත්තකු විසින්ම යටෝක්ත බද්ද 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හාලිඇල ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය අනුව මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම්*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශ.*
1. රු. 6,000 නොඉක්මවූ අවස්ථාවක	කිසිවක් නැත
2. රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවූ විට	90 0
3. රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවූ විට	180 0
4. රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවූ විට	360 0
5. රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවූ විට	1,200 0
6. රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

උපලේඛනය (ආ)

ව්‍යාපාරය හෝ වෘත්තීන් :

1. රක්ෂණ නියෝජිතවරයෙකු ලෙස කටයුතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
2. පෞද්ගලික ප්‍රවාහන අයිතිකරුවන් ලෙස කටයුතු කිරීම
3. පෞද්ගලික පන්ති පවත්වන්නන් ලෙස කටයුතු කිරීම
4. උකස් බඩු ගන්නන් ලෙස කටයුතු කිරීම
5. කොන්ත්‍රාත්කරුවන් ලෙස කටයුතු කිරීම
6. රටබීම අලෙවිසැල් පවත්වාගෙන යාම
7. කොමිස් නියෝජිතයෙකු වශයෙන් ව්‍යාපාර පවත්වාගෙන යාම

8. නීතිඥවරුන්, නොතාරිස්වරුන්, මිනින්දෝරුවන්, සැලසුම් ශිල්පීන් ලෙස කටයුතු කිරීම
9. පුද්ගලික බස්රථ හිමියන් ලෙස කටයුතු කිරීම
10. බැංකු කරුවෙකු ලෙස ව්‍යාපාර පවත්වාගෙන යාම
11. රියදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
12. කුළී රථ හිමියන් ලෙස කටයුතු කිරීම
13. ලොතරැයි නියෝජිතවරුන් ලෙස කටයුතු කිරීම
14. මුදල් ආයෝජකයින් ලෙස කටයුතු කිරීම
15. රැකියා ඒජන්සිකරුවන් ලෙස කටයුතු කිරීම
16. සැපයුම්කරුවන් (සේවා සපයන්නන් ඇතුළුව) ලෙස කටයුතු කිරීම
17. පෞද්ගලික දේපළ අලෙවි කිරීමේ සමාගමක් පවත්වාගෙන යාම
18. බඩු ප්‍රවාහන ආයතනයක් පවත්වාගෙන යාම
19. ඇඟළුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
20. වෙන්දේසිකරුවන් ලෙස කටයුතු කිරීම
21. පානීය ජලය සහ පළතුරු බීම නිෂ්පාදනය කිරීම
22. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
23. රූපවාහිණී, ගුවන් විදුලි හා දුරකතන විකාශන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
24. දුරකතන කණ්ණු, විදුලි කණ්ණු හා කොන්ක්‍රීට් නිෂ්පාදිත ද්‍රව්‍ය අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
25. සංචාරක හෝටලයක් පවත්වාගෙන යාම
26. මල් ශාලාවක් පවත්වාගෙන යාම
27. පරණ වාහන අමතර කොටස් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
28. ප්ලාස්ටික් බෝතල් නිෂ්පාදනය කිරීම
29. ඉන්ධන පිරවුම් නියෝජිතයකු ලෙස කටයුතු කිරීම
30. ත්‍රීවිලර් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
31. වෙබ් අඩවි නිර්මාණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
32. අළුත් සහ පරණ සියලුම මෝටර් රථ අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
33. අළුත් සහ පරණ සියලුම යතුරුපැදි අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
34. පාපැදි අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
35. පෞද්ගලික පොළ භූමියක් පවත්වාගෙන යාම
36. වෙන්දේසි හා තැරැව්කරුවෙකු වශයෙන් කටයුතු කිරීම
37. ප්‍රවාහන සේවා අයිතිකරුවෙකු හෝ ප්‍රවාහන නියෝජිතයෙකු වශයෙන් කටයුතු කිරීම
38. මැණික් වෙළෙන්දෙකු වශයෙන් කටයුතු කිරීම
39. ආනයන අපනයන නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම
40. ගල් හා වැලි අලෙවි කිරීම
41. නිවාඩු නිකේතනයක් පවත්වාගෙන යාම
42. ලියාපදිංචි දූව ගබඩාවක් පවත්වාගෙන යාම
43. ආරෝග්‍ය ශාලාවක් පවත්වාගෙන යාම
44. කවර හෝ නිෂ්පාදන ඒජන්සියක් පවත්වාගෙන යාම
45. ආරක්ෂක සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
46. දූව හෝ ලී ගබඩා කිරීම හා අලෙවිය
47. වෙන්දේසි පොළක් පවත්වාගෙන යාම
48. මිනී පෙට්ටි සාප්පුවක් පවත්වාගෙන යාම
49. බඩු උකස් ගන්නා ස්ථානක් පවත්වාගෙන යාම
50. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
51. සම් පදම් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
52. ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් කටයුතු කිරීම
53. නීතිඥයකු වශයෙන් කටයුතු කිරීම
54. ශ්‍රමිකයන් සපයන ආයතනයක් පවත්වාගෙන යාම
55. පරිගණක ආශ්‍රිත නිර්මාණ සැකසීම

හාලිඇල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සහතික පත්වලින් හා අවසරදීම් ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වගන්තිය ප්‍රකාරව හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයට පහත උපලේඛනයේ සඳහන් සහතික පත්වලින් හා අවසරදීම්වලින් ගාස්තු අයකිරීමට 2018 නොවැම්බර් මස 30 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 01 අනුව හාලිඇල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම නිවේදනය කරමි.

නිමල් සේනානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2018 දෙසැම්බර් මස 03 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ(1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ යම් ව්‍යාපාරයක් හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ම එකී ව්‍යාපාරයේ 2019 වර්ෂයේ ආදායම මෙහි පහත සඳහන් උපලේඛනයෙහි I වන තීරුවෙහි නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණ ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ද,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත් යම් තැනැත්තෙකු විසින්ම යථෝක්ත බද්ද හාලිඇල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව මම තීරණය කරමි.

උපලේඛනය (අ)

පුස්තකාල :		*රු. ශත*
1.	පුස්තකාල සාමාජික ගාස්තු	
	* පාසල් සිසුන්	50 0
	* වැඩිහිටියන්	100 0
2.	පුස්තකාලීය සාමාජික තැන්පත් මුදල	
	* පාසල් සිසුන්	100 0
	* වැඩිහිටියන්	200 0
3.	පුස්තකාල දඩ :	
	පොතක් අස්ථානගත වූ විට පොතේ වටිනාකම සමග	28.75%
4.	ප්‍රමාද දඩ මුදල් (දිනකට)	2 0
5.	පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීම :	
	පාසල් සිසුන්	25 0
	වැඩිහිටියන්	50 0

හාලිඇල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා පෙර පාසල් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයට පහත උපලේඛනය පරිදි ගාස්තු අය කිරීමට 2018 නොවැම්බර් මස 30 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 01 අනුව හාලිඇල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම නිවේදනය කරමි.

නිමල් සේනානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2018 දෙසැම්බර් මස 03 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ නිරූපිත අනුප්‍රමාණය ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ද,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත් යම් තැනැත්තකු විසින් ම යටෝක්ත බද්ද හාලිඇල ප්‍රාදේශීය සභාව ගෙවනු ලැබිය යුතු යැයි මම තීරණය කරමි.

පෙර පාසැල් :

1. පෙර පාසැල් සේවා ගාස්තු වාර්ෂික	රු. 1,250 0
2. පෙර පාසැල් ඇතුළත්වීමේ ගාස්තු වාර්ෂික	රු. 500 0

12 - 817/3

හාලිඇල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ප්‍රචාරණ දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ* ගැසට් පත්‍රය වර්ෂයට පහත උපලේඛනය පරිදි ව්‍යාපාර හා වෘත්තීන් මත බදු අය කිරීමට 2018 නොවැම්බර් මස 30 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 01 අනුව හාලිඇල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම නිවේදනය කරමි.

නිමල් සේනානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2018 දෙසැම්බර් මස 03 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 122(1) වැනි වගන්තිය යටතේ යම් ප්‍රචාරක දැන්වීම් යටතේ ගෙවීම් අවශ්‍ය නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් හාලිඇල ප්‍රාදේශීය සභා බල

ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවෙහි නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි 11 වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ද,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින්ම යථෝක්ත බද්ද 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හාලිඇල ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි මම තීරණය කරමි.

දැන්වීම් පුවරු ගාස්තු :

	තාවකාලික දැන්වීම් පුවරු හා බැනර්	*රු. ශත*
1.	තාවකාලික ප්‍රචාරක දැන්වීම් පුවරු (බැනර්) වර්ග අඩියකට (මසකට)	75 0
2.	මසකට වඩා වැඩි සෑම අතිරේක දිනකට ම	10 0

ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු :

1.	ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරු ඉදිකිරීම සඳහා වර්ග අඩියකට	100 0
2.	ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට (වර්ෂයක් සඳහා ප්‍රදර්ශනයට අනුමැතිය ඇතිව)	100 0
3.	ආලෝක සංඥා නාම පුවරු සඳහා වර්ග අඩියකට (වර්ෂයක් සඳහා පමණි)	50 0
4.	අදාළ ව්‍යාපාරික ස්ථානයේ නමට අමතරව එම නාම පුවරුවේ වෙනත් වෙළෙඳ නාමයක් ප්‍රදර්ශනය කර ඇත්නම් වර්ග අඩියකට (වර්ෂයක් සඳහා පමණි)	100 0
5.	ඩිජිටල් නාම පුවරු ප්‍රදර්ශනය කිරීමේදී වර්ග අඩියට	500 0

ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ඇප තැන්පත් :

1.	වර්ග අඩි 50ට අඩු නම්	500 0
2.	වර්ග අඩි 1,000 ට අඩු නම්	1,000 0
3.	වර්ග අඩි 1,000 ට වැඩි නම්	1,500 0

12 - 817/4

හාලිඇල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා පාරිසරික බලපත්‍ර ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වැනි වගන්තිය යටතේ හා 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1987 අංක 47 දරන ජාතික පාරිසරික පනත් සහ ඒ යටතේ පවත්වන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 1523/16 දරන වර්ෂ 2008 ක් වූ ජනවාරි මස 25 දිනැති *අති විශේෂ* ගැසට් පත්‍රයෙන් "ඇ" කොටසේ නියමිත පරිදි හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයට පහත උපලේඛනය පරිදි පරිසර බලපත්‍ර ගාස්තු අයකිරීමට 2018 නොවැම්බර් මස 30 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 01 අනුව හාලිඇල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම නිවේදනය කරමි.

නිමල් සේනානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2018 දෙසැම්බර් මස 03 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉහත කී යෝජනාව

2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1987 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 1523/16 දරන වර්ෂ 2008 ක් වූ ජනවාරි මස 25 දිනැති *අති විශෙෂ* ගැසට් පත්‍රය "ඇ" කොටසේ

නියමිත පරිදි හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනත හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ උපලේඛන හා ගාස්තු අය කිරීම හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ 2019 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේනයෙහි 1 වන තීරුවෙහි නිරූපිත පරිසර බලපත්‍ර ගාස්තු අයකිරීම යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එකී 2 තීරුවෙහි අනුරූප සටහනෙහි නිරූපිත අනු ප්‍රමාණයක පරිසර බලපත්‍ර ගාස්තු අයකිරීම 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ද,

(ආ) 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1987 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 1523/16 දරන වර්ෂ 2008ක් වූ ජනවාරි මස 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය "ඇ" කොටසේ නියමිත පරිදි පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත් වන තැනැත්තෙකු විසින්ම යථොක්ත බද්ද 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හාලිඇල ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු යැයි මම තීරණය කරමි.

පරිසර කටයුතු :

		රු. ශත
1.	පාරිසරික බලපත්‍ර අළුත්කිරීමේ ඉල්ලුම්පතක්	500 0
2.	පාරිසරික බලපත්‍ර ඉල්ලුම්පත්‍රයක් :	
	* සුළු පරිමාණ	50 0
	* මධ්‍යම පරිමාණ	200 0
	* මහා පරිමාණ	1,000 0
3.	පරීක්ෂණ ගාස්තු :	
	මුදල් ආයෝජන 250,000 හෝ ඊට අඩු	3,000 0
	250,000 සිට 500,000 දක්වා	3,750 0
	500,000 සිට 1,000,000 දක්වා	5,000 0
	1,000,000 හෝ ඊට වැඩි	10,000 0
4.	පරිසර බලපත්‍ර ගාස්තු :	4,000 0
5.	පරිසර බලපත්‍ර අළුත් කිරීමේ ගාස්තු	4,000 0

12 - 817/5

හාලිඇල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ගොඩනැගිලි හා දේපල ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයට පහත උපලේඛනය පරිදි ව්‍යාපාර හා වෘත්තීන් මත බදු අයකිරීමට 2018 නොවැම්බර් මස 30 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 01 අනුව හාලිඇල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම නිවේදනය කරමි.

නිමල් සේනානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2018 දෙසැම්බර් මස 03 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් ව්‍යාපාර හෝ වෘත්තීන් මත අයකිරීමට යම් ව්‍යාපාරයක් හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 1 තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි 11 වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණ ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකල යුතු යැයි ද,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත් යම් තැනැත්තකු විසින් ම යථොක්ත බද්ද 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හාලිඇල ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි මම තීරණය කරමි.

ගොඩනැගිලි හා දේපළ :		*රු. ශත*
1.	ගොඩනැගිලි අයදුම්පතක් නිකුත් කිරීම	1,250 0
2.	අනුබෙදුම් සැලැස්ම අනුමත කිරීම - කට්ටි එකකට	1,000 0
3.	මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීම - කට්ටි එකකට	2,000 0
4.	වීථිරේඛා හා නොපවරා ගැනීමේ සහතිකය සඳහා වූ පරීක්ෂණ ගාස්තු	1,600 0
	පොදු ක්‍රීඩාංගනය වෙන් කිරීම (දිනකට) පොදු ආයතන සඳහා	4,600 0
5.	ආපසු ගෙවන තැන්පත්	2,000 0
6.	වෙළෙඳ ප්‍රචාරක අනුග්‍රහය සහිතව ක්‍රීඩා පිටිය වෙන් කිරීම සඳහා	15,000 0
7.	රාජ්‍ය ආයතන සඳහා	3,500 0
8.	ආපසු ගෙවන තැන්පත්	3,000 0
9.	හාලිඇල ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය වෙන් කිරීම (පැය 8) බල ප්‍රදේශ සීමාව තුළ	8,000 0
10.	ආපසු ගෙවන තැන්පත්	3,000 0
11.	හාලිඇල ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය වෙන් කිරීම (පැය 8) බල ප්‍රදේශ සීමාවෙන් පිට	10,500 0
12.	ආපසු ගෙවන තැන්පත්	3,500 0
13.	ශ්‍රවණාගාරය වෙන්කිරීමේ දී හා නියමිත කාලයෙන් බැහැරව වෙන් කිරීමේ දී	500 0
14.	අවම පැය 06ක් සඳහා	4,000 0
15.	රජයේ ආයතන සඳහා ශ්‍රවණාගාරය (රාජ්‍ය උත්සව සඳහා පමණි)	5,000 0
16.	ඇප තැන්පත්	2,000 0
17.	හාලිඇල, රිල්පොළ, උඩුවර හා ඇටම්පිටිය, කැටවල උපකාර්යාල සීමා තුළ සභාව සතු :	
	අනෙකුත් භූමි තාවකාලිකව වෙන් කිරීම (දිනකට)	1,500 0
18.	අවම පැය 06ක් සඳහා	4,000 0
19.	වරිපනම් ලේඛනය පරීක්ෂා කිරීමේ ගාස්තු (වර්ෂයකට)	250 0
20.	ඔප්පු සාරාංශ පරීක්ෂණ ගාස්තු	50 0
21.	පොදු සේවාවන් සඳහා වරිපනම් සහතිකයක් නිකුත් කිරීම	100 0
22.	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ගොඩනැගිලි වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය	1 50
	හා එක් එක් තට්ටුවල වර්ග අඩි ප්‍රමාණයන්	
23.	නාගරික සංවර්ධන අධිකාරි සීමාව තුළ අංක 1597/8, 2009.04.17 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය	
	අනුව ගාස්තු අය කළ යුතුය.	
24.	නගරයේ ව්‍යාපාරික ස්ථාන ඉදිරිපස රථ වාහන නැවැත්වීම සඳහා	500 0
	(වෙන් කරන ලද විශේෂ ස්ථානවල) වර්ග අඩියක් සඳහා	
25.	ඔප්පු සාරාංශ පෝර්ම ගාස්තු	750 0
26.	පෙරසැරි ගාස්තු වර්ග අඩියක් සඳහා (නාගරික සීමාව තුළ)	3 0
27.	මාර්ග පළුදු කිරීම	2,500 0

හාලිඇල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 152 වැනි වගන්තියේ (03) වන උපවගන්තිය යටතේ හාලි ඇල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 වර්ෂයට පහත උපලේඛනය පරිදි අක්කර බදු අය කිරීමට 2018 නොවැම්බර් මස 30 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 01 අනුව හාලිඇල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම නිවේදනය කරමි.

නිමල් සේනානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2018 දෙසැම්බර් මස 03 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් හාලිඇල ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර, හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ ද, ඉහත කී පනතේ 134(3) වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද,

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමකටම 2017 වර්ෂයේ දී බලාත්මක සත්‍යාක්ෂණය 2019 වර්ෂයේ සත්‍යාක්ෂණය ලෙස පිළිගැනීමට ද,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් වැඩිදුරටත් සඳහන් විධිවිධාන යටතේ අක්කර බද්ද නියම කිරීම හා අය කිරීමේ කාර්යන් සඳහා විශේෂ ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශයන්හි 2019 වර්ෂයේ දී මෙහි පහත උපලේඛනයේ (1) වැනි තීරුවෙහි නිරූපිත යම් විෂය අංකයක සීමාවක ඇතුළත පවතින අවස්ථාවක අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණයක අක්කර බදු පනවා අයකළ යුතු යැයි ද,

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(06) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව. යථොක්ක බද්ද 2019 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන කාර්තු 04 තුළදී සමාන වාරික 04කින් හාලිඇල ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස බද්දට යටත්වන සෑම තැනැත්තකුටම නියම කිරීමට ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය අනුව මම තීරණය කරමි.

උපලේඛනය

ඉඩම් ප්‍රමාණය	*බදු අනු ප්‍රමාණය වර්ෂයකට (රු. ශත)*
01. ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 05කට අඩු නමුත් හෙක්ටයාර් 01ට නොඅඩු අවස්ථාවක හෙක්ටයාර් එකකට	50 0
02. ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩිවන අවස්ථාවක හෙක්ටයාර් එකකට	10 0

හාලිඇල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියෙන් හාලි ඇල ප්‍රාදේශීය සභාව වෙත පැවරී බලතල ප්‍රකාරව, 2018 නොවැම්බර් මස 30 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 01 අනුව හාලිඇල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම නිවේදනය කරමි.

නිමල් සේනානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2018 දෙසැම්බර් මස 03 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉහත කී යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල ගොඩනැගිලිවල, ඉඩම්වල 2019 වාර්ෂික වටිනාකම සඳහා 2012 වර්ෂයේ පිළිගනු ලැබූ තක්සේරු 2019 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

(ආ) එකී තක්සේරුව මත 1987 අංක 15 දරන හාලිඇල ප්‍රාදේශීය සභා පනතේ අංක 134 වන වගන්තියේ 1 වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව,

(I) හාලිඇල සහ ඇටම්පිටිය යන කොට්ඨාසවල පිහිටි සෑම නිශ්චල දේපලක් මත සියයට හතරක (4%)ක වරිපනම් බද්දක් ද,

(II) ස්ප්‍රිංවැලි නගරය සහ උඩුවර 5 කණුව සිට උඩුවර 6 කණුව දක්වා යන කොට්ඨාසවල පිහිටි සෑම නිශ්චල දේපලක්ම මත සියයට තුනක (3%) ක වරිපනම් බද්දක් ද පනවා අය කළ යුතු බවටත්,

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (06) උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාර, යථෝක්ත වරිපනම් බද්ද 2019 වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවල දී අවසන් වන කාර්තු 04 තුළදී සමාන වාරික 04කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස ද, බද්දට යටත්වන සෑම පුද්ගලයකුටම විධානය කිරීමට ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය අනුව මම තීරණය කරමි.

12 - 817/8

හාලිඇල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ජල සේවා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2019 වර්ෂයට පහත උපලේඛනය පරිදි ව්‍යාපාර හා වෘත්තීන් මත බදු අයකිරීමට 2018 නොවැම්බර් මස 30 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 01 අනුව හාලිඇල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම නිවේදනය කරමි.

නිමල් සේනානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2018 දෙසැම්බර් මස 03 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් ව්‍යාපාර හෝ වෘත්තීන් මත බදු අය කිරීමට යම් ව්‍යාපාරයක් හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තකුගෙන්ම එකී ව්‍යාපාරයේ 2019 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයේ 1 තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි 11 වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකල යුතු යැයි ද,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, බද්දට යටත් යම් තැනැත්තකු විසින් ම යටොක්ත බද්ද 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හාලිඇල ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි මම තීරණය කරමි.

ජල සේවා :		*රු. ශත*
1.	ජල අයදුම්පතක්	750 0
2.	දෙපාර්තමේන්තු ගාස්තු ඇස්තමේන්තු ගත මුදලින්	33 %
3.	ජලනල සන්ධි කිරීමේ ගාස්තු (විසන්ධි කරන ලද)	1,000 0
4.	ජල සේවා තැන්පත් ගාස්තු	1,000 0
5.	පරීක්ෂණ ගාස්තු	2,500 0
6.	කම්කරු ගාස්තු	3,500 0

සියලුම ගෘහස්ථ ජල ගාස්තු ජලමනු සහිතව ආරම්භ කරන ලද ජල යෝජනා ක්‍රම :

1.	ස්ථාවර ගාස්තු	150 0
2.	ඒකක 01 සිට 15 දක්වා (ඒකකයක්) සඳහා	15 0
3.	ඒකක 16 සිට 20 දක්වා ඒකකයක් සඳහා	20 0
4.	ඒකක 21 සිට 25 දක්වා ඒකකයක් සඳහා	30 0
5.	ඒකක 26 සිට 40 දක්වා ඒකකයක් සඳහා	40 0
6.	ඒකක 40ට වැඩි ඒකකයක් සඳහා	50 0
7.	ජලමනු නොමැති හා අක්‍රීය මනු සඳහා මාසිකව (මනු තාවකාලිකව ඉවත්කර ඇති විට)	500 0

වාණිජ ආයතන : (ජලමනු සහිතව ආරම්භ කරන ලද ජල යෝජනා ක්‍රම) මාසික :

1.	ස්ථාවර ගාස්තු	250 0
2.	පළමු ඒකක 1-5	50 0
3.	වැඩිවන සෑම ඒකකයක් සඳහාම	60 0
4.	ජල මනු නොමැති හා අක්‍රීය මනු සඳහා මාසිකව	1,000 0

හාලිඇල, රිල්පොළ, උඩුවර හා ඇටම්පිටිය යන ප්‍රදේශවල අනෙකුත් ජල සේවා (මාසිකව) :

1.	ව්‍යාපාරික	500 0
2.	ගෘහස්ථ	200 0
3.	උඩුවර හපුවල කුඹුර ජල යෝජනා ක්‍රමය (ගෘහස්ථ)	200 0

හාලිඇල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා රථ වාහන තාවකාලිකව කුලියට ලබාදීම මත ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වැනි උපවගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2019 වර්ෂයට පහත උපලේඛනය පරිදි වාහන තාවකාලික, කුලියට ලබාදීම මත ගාස්තු අයකිරීමට 2018 නොවැම්බර් මස 30 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 01 අනුව හාලිඇල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම නිවේදනය කරමි.

නිමල් සේනානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2018 දෙසැම්බර් මස 03 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉහත කී යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි උපවගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ හෝ එම පනත අනුව හාලිඇල ප්‍රදේශීය සභාවට අයිති වාහනයක් තාවකාලිකව කුලියට ගැනීම පදනම් කර ගනිමින්, බල ප්‍රදේශය තුළ 2018 වර්ෂයේ දී පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම එහි 11 වැනි තීරුවෙන් අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම යෝජනා කරමි.

වාහන :

		රු. ශත
1.	ට්‍රැක්ටර් රථ කුළියට දීම දිනකට (පැය 08)	7,000 0
2.	අවම පැය	3,500 0
3.	ඇප තැම්පත්	2,000 0
4.	ඩෝසරය කුලී (J.C.B.) පැයකට	2,550 0
5.	ඇප තැම්පත්	5,000 0
6.	ලොරි රථ කුළී (ලොකු) කියුබ් 2 1/2 පැය 8ට	12,000 0
7.	අවම වරුවකට	5,500 0
8.	ඇප	2,000 0
9.	ප්‍රමාද පැයකට	1,450 0
10.	මෝටර් ග්‍රේඩරය දිනකට (පැය 8)	25,000 0
11.	ඇප	5,000 0
12.	ප්‍රමාද පැයකට	3,500 0
13.	ජල බවුසරය	2,600 0
14.	ජල බවුසරය (ව්‍යාපාරිකයින් සඳහා) ජල සම්පාදනයේ සිට ගෙනයන සෑම කිලෝ මීටරයක් සඳහාම රු. 50 බැගින් ඉල්ලුම්කරු දැරිය යුතුය.	3,000 0
15.	බල ප්‍රදේශය තුළ ත්‍රිරෝද රථ ගාස්තු ලියාපදිංචි ගාස්තු (2007 අතුරු ව්‍යවස්ථාව අනුව	500 0
16.	මාසිකය අයකරනු ලබන ගාස්තු (2007 අතුරු ව්‍යවස්ථාව අනුව)	50 0

අනෙකුත් සියලුම වාහන සඳහා - අතුරු ව්‍යවස්ථාව අනුව අයකරනු ලැබේ.

	හාලිඇල ප්‍රාදේශීය සභාව සතු ගොඩනැගිලි, ජලය හා විදුලිය සපයා පැය 24ක කාල සීමාවකට වෙන් කිරීම.	5,000 0
	තැන්පත්	2,000 0

හාලිඇල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වෙන්දේසිකරුවන්ගේ හා කොන්ත්‍රාත්කරුවන්ගේ ගාස්තු අය කිරීම

2019 වර්ෂයේ වෙන්දේසිකරුවන්ගේ හා කොන්ත්‍රාත්කරුවන්/කම්කරුවන්ගේ ආඥාපනත අනුව ගාස්තු අය කිරීම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 154(1) වැනි වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 1988 අංක 15 දරන වෙන්දේසිකරුවන්ගේ පනත යටතේ 2019 වර්ෂයට පහත උපලේඛනය පරිදි ගාස්තු හා බදු අය කිරීමට 2018 නොවැම්බර් මස 30 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 01 අනුව හාලිඇල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම නිවේදනය කරමි.

නිමල් සේනානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2018 දෙසැම්බර් මස 03 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවේ සීමාවන් ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසිය හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% සමාන බද්දක් විකුණුම්කරුගෙන් ඒ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් එම ඉඩම විකිණීමට ලත් මුදලින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි මම තීරණය කරමි.

වෙනත් පොදු කටයුතු :

කර්මාන්ත ගිවිසුම් ගැන්වීමේ දී අය කරනු ලබන පෝරම ගාස්තු :

1.	පොදු අරමුදල් කර්මාන්ත හා අනෙකුත් සෑම කර්මාන්තයක් සඳහාම ගිවිසුම්ගත මුදලින්	1%
2.	ටෙන්ඩර් මගින් පිරිනමනු ලබන කර්මාන්ත සඳහා ගිවිසුම්ගත මුදලින් රු. 1,000 සිට රු. 99,999 දක්වා	1%
3.	වැඩි වන සෑම රු. 1,00,000 ටම හෝ ඉන් කොටසකට	1%
		රු. ශත
4.	එක් තාවකාලික ගව ඝාතන පෝරමයක්	3,000 0
5.	එක් තාවකාලික ගව ඝාතන බලපත්‍රයක්	25 0
6.	විනෝද බදු නිදහස් කිරීමේ ඉල්ලුම් පත්‍රයක් විනෝද බදුවලින් 10%ක් සභාවට ගෙවිය යුතුය.	1,000 0
7.	හාලිඇල ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත්කරුවෙකු බ්‍රෝකර්වරයෙකු, වෙන්දේසිකරුවෙකු, සැපයුම්කරුවෙකු වශයෙන් ලියාපදිංචි වීමේ ගාස්තු (රු. 50,000ට වැඩි)	500 0
8.	වාර්ෂික සැපයුම්කරුවන් හා රු. 1,00,000 ක වටිනාකම ඉක්මවා යන කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි ගාස්තු	1,000 0

හාලිඇල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 147 වැනි වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2019 වර්ෂයට පහත උපලේඛනය පරිදි රථවාහන සහ සතුන් පිළිබඳ බදු අයකිරීමට 2018 නොවැම්බර් මස 30 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 01 අනුව හාලිඇල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම නිවේදනය කරමි.

ඒ අනුව හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකු ම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30ක් සම්පූර්ණ වූ වහාම 2018 වර්ෂය සඳහා වන මෙම බද්ද හාලිඇල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

නිමල් සේනානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2018 දෙසැම්බර් මස 03 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් හාලිඇල ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම එහි II වැනි තීරුවෙන් අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි ද ;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාර, බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින්ම යථෝක්ත බද්ද 2019 මාර්තු 31 දිනට ප්‍රථමව හාලිඇල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි ද මම තීරණය කරමි.

උපලේඛනය

		රු. ශත
I.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක් , මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
II.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -	
	(*අ*) වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
	(*ආ*) වෙළෙඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0
	* සෑම කරත්තයක් සඳහා	20 0
	* සෑම අත්කරත්තයක් සඳහා	10 0
	* සෑම රික්ෂෝවක් සඳහා	7 50
	* සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
	* සෑම අලියකු හෝ ඇතෙකු සඳහා	50 0

2. විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

හාලිඇල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149 වැනි වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2019 වර්ෂයට පහත උපලේඛනය පරිදි බලපත්‍ර ගාස්තු අය කිරීමට 2018 නොවැම්බර් මස 30 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 01 අනුව හාලිඇල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම නිවේදනය කරමි.

නිමල් සේනානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2018 දෙසැම්බර් මස 03 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 149 වැනි වගන්තිය යටතේ යම් බලපත්‍ර ගාස්තු අයකිරීමට යම් ව්‍යාපාරයක් හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණ ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ද,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, බද්දට යටත් යම් තැනැත්තෙකු විසින් ම යථෝක්ත බද්ද 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හාලිඇල ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි මම තීරණය කරමි.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
		වාර්ෂික වටිනාකම		
		රු.750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	භෝජනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	රෙස්ටුරන්ට් එකක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	ගවමස් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	කුකුල් මස් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	කබොක් ගල් හෝ කලුගල් ගබඩා කිරීම (අලෙවිය)	500 0	750 0	1,000 0
8.	බොරලු පස් කැපීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	ගැලුම් 50 ට වැඩි ප්‍රමාණයක් පොල්තෙල් ගබඩාකර තැබීම හා අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
		රු.750 නොඉක්මවන අවස්ථාවක	*වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
10.	ධාන්‍ය හෝ මාංශ වර්ග 50Kg ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීමේ හා අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	දැව ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොඳ15ට වැඩි ප්‍රමාණයක් ගබඩාකිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	අලුත් හෝ පාවිච්චි කරන ලද ටයර් හෝ ටියුබ් 25ට වැඩි ප්‍රමාණයක් ගබඩාකිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	සිමෙන්ති කොට්ට 25ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	රෙදි සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	වානේ ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනය හා අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	ලී වෙළඳ සැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	සුළු පරිමාණ පාවහන් අළුත් වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	පාවහන් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	දේශීය වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	අයිස්ක්‍රීම් හා ශීතකළ බීම වර්ග නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	ශීතකරණවල බහා මාළු/මස් විකිණීම (අවසරලත්) ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	සාප්පු බඩු අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	ඇලුමිනියම්, ප්ලාස්ටික් ද්‍රව්‍ය අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	පිඟන් හා වීදුරු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	මැණික් ගල් කැපීම හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	වායු සමීකරණ හා ශීතකරණ යන්ත්‍ර අලුත් වැඩියාව	500 0	750 0	1,000 0
31.	යකඩ බඩු අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	වැලි කියුබ් 05ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	සත්ත්ව ආහාර විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	මත්පැන් විකුණන සමාජශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	කුෂන් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	බටහිර වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	රේස් ඔට්ටු පළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	රසකැවිලි අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	මිරිස් මෝල්ක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			වාර්ෂික වටිනාකම	
		රු.750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
41.	දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	වීඩියෝ කිරීම හා වීඩියෝ පටි අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	බිම්මල් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	පොල්තෙල් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	ඇස්බැස්ටස් ෂීට් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	කරවල වර්ග අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	ඇස්කණ්නාඩි රාමු සැකැසීම සහ අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	තාවකාලික අලෙවි ප්‍රවර්ධන කුටි පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
50.	කඩල/බයිට්ස් නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	පරිගණක මාර්ගයෙන් ප්‍රචාරක දැන්වීම් පුවරු සැකසීමේ (නව) මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	ලැගුම් හලක්/නවාතැන්ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
53.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54.	ගඩොල් හෝ උළු ගබඩාකර තැබීමේ හා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	දර විකිණීම සඳහා ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
57.	නිදන මෙට්ට/පුටු කොට්ට නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
58.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (සුළු ප්‍රමාණයේ)	500 0	750 0	1,000 0
59.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (මධ්‍යම ප්‍රමාණයේ)	500 0	750 0	1,000 0
60.	සිමෙන්තිවලින් නිෂ්පාදිත ද්‍රව්‍ය අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
61.	පොත් හා ලිපි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
62.	මහන මැෂින් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
63.	සිංහල බෙහෙත් බඩු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	ඉංග්‍රීසි බෙහෙත් බඩු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	මැටි වලං නිෂ්පාදනය කිරීම හා අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	ඡායා පිටපත් කිරීමේ හා රෝනියෝ කිරීම/ බයින්ඩින් කිරීමේ ලැමිනේටින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
67.	ගීත පටිගත කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
68.	ලොතරැයි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
69.	සුළු පරිමාණයේ සිල්ලර බඩු අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
70.	ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
71.	සුරතල් සතුන් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
72.	බුලත්, පුවක් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
73.	එළවළු හෝ පළතුරු වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම (සිල්ලර)	500 0	750 0	1,000 0
74.	එළවළු හෝ පළතුරු වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම (තොග)	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
		රු.750 නොඉක්මවන අවස්ථාවක	*වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
75.	සිමෙන්ති විකිණීම හෝ ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
76.	දුම්කොළ ගබඩා කිරීම හා විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
77.	තීන්ත හා සායම් වර්ග ගබඩා කිරීම හා අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
78.	රබර් සීල් තැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79.	පැණි හකුරු නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
80.	පපඩම් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
81.	කුළු බඩු වර්ග නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
82.	ලියුම් කවර නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
83.	ඉටිපන්දම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
84.	කෝපි, ගම්මිරිස් ගබඩා කිරීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
85.	තේ කුඩු පැකට් කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
86.	සමුපකාර වෙළෙඳසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
87.	පූජා භාණ්ඩ අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
88.	විත්කලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
89.	භූමිතෙල් ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
90.	ස්ප්‍රීතු වර්ග ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
91.	ඉන්ධන ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
92.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
93.	හුණු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
94.	හඳුන්කුරු නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
95.	දැව කැටයම් (විසිතුරු) කැපීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
96.	මිනිරන් උපයෝගී කරගෙන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
97.	විවිධ පැල තවාන් හා විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
98.	ෆයිබර් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
99.	විදුලි උපකරණ අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
100.	මධ්‍යම ප්‍රමාණයේ සිල්ලර බඩු අලෙවි සැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
101.	ටින් කරන ලද ආහාර ද්‍රව්‍ය ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
102.	කිරුම් මිනුම් උපකරණ අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
103.	යෝගට් අයිස්ක්‍රීම් ජෑම් නිෂ්පාදනය හා අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
104.	පී.වී.සී බට ගබඩාවක් හා විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
105.	පාරිභෝගික ද්‍රව්‍ය තොග වශයෙන් අලෙවිය හා බෙදාහැරීම	500 0	750 0	1,000 0
106.	දිවා සුරුකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
107.	සාත්තු සේවක මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
108.	දුරකථන අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
109.	පිත්තල භාණ්ඩ පිරිසිදු කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			වාර්ෂික වටිනාකම	
		රු.750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
110.	බ්ලොක් ගල් නිපදවීම හා අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
111.	කෘෂි රසායනික යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
112.	ජ්‍යොතිෂ්‍ය කටයුතු කිරීම (පරිගණක ද ඇතුළුව) මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
113.	ජංගම මාළු වෙළෙඳසල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
114.	ජංගම විසිතුරු භාණ්ඩ අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම			
115.	ජංගම රස කැවිලි හා පළතුරු අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
116.	මදුරු දැල් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
117.	වාහන සේදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
118.	රසකාරක වර්ග/ජෙලි වර්ග නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
119.	මල් පැල වර්ග අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
120.	පෞද්ගලික දුරකථන හා ෆැක්ස් පණිවිඩ යැවීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
121.	තහඩු කැපීමේ, නැවීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
122.	වාහන පින්තාරු කිරීම හා ස්ටිකර් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
123.	වීදුරු කැපීමේ සහ අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
124.	ත්‍රිරෝද රථ හා යතුරු පැදි අමතර කොටස් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
125.	මුළුතැන්ගේ/ගෘහ උපකරණ නිෂ්පාදනය හා අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
126.	වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
127.	වාහන සයිලන්සර් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
128.	සිම් කාඩ්/රීලෝඩ් කාඩ්පත් අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
129.	පිඟන් ගඩොල් හා ඒ ආශ්‍රිත උපාංග අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
130.	කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
131.	ඩොලමයිට් ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
132.	කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
133.	කොන්ක්‍රීට් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
134.	ගුවන් විදුලි හා රූපවාහිනී අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
135.	බැටරි වතුර නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
136.	තරාදි අලුත්වැඩියාව හා අලෙවිය	500 0	750 0	1,000 0
137.	වැලි ගොඩ දැමීමේ තොටුපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
138.	වැලි/ගඩොල් ගබඩා කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
139.	ජල ටැංකි ගඩබා කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
140.	ගුවන් විදුලි යන්ත්‍ර අලෙවිය	500 0	750 0	1,000 0
141.	ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
142.	පරිගණක ආශ්‍රිත සේවාවන්	500 0	750 0	1,000 0
143.	මංගල උත්සව සඳහා භාණ්ඩ සැපයීම (සැරසිලි පෝරු)	500 0	750 0	1,000 0
144.	දුරකථන නිපදවීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			වාර්ෂික වටිනාකම	
		රු.750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
145.	විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව හෝ එකලස් කිරීම	500 0	750 0	1,000 0
146.	පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම	500 0	750 0	1,000 0

පළමු උපලේඛනය - පීඩාකාරී ව්‍යාපාර

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			වාර්ෂික වටිනාකම	
		රු.750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	මිණිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
2.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
3.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
4.	සත්ත්ව පාලන (මස්, කිරි, බිත්තර සඳහා) සතුන් ඇති කරන ස්ථාන	500 0	750 0	1,000 0
5.	උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ කි. 50ට වඩා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
6.	රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබාගැනීම	500 0	750 0	1,000 0
7.	පශු වෛද්‍ය ඖෂධ හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුලු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම	500 0	750 0	1,000 0
9.	සම් විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	කරවල, මාළු හෝ ජාඩි කි .100ට වඩා වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
11.	මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේළීම, අයිස් දැමීම	500 0	750 0	1,000 0
12.	පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
13.	දුම්කොළ වියළීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
15.	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
16.	සත්ත්ව මාංශ හෝ ලේ පැසවීම	500 0	750 0	1,000 0
17.	සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
18.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	ට්‍රන්ක පෙට්ටි සෑදීම	500 0	750 0	1,000 0
20.	අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	ලෝහ සුන්බුන් තබා ගැනීම	500 0	750 0	1,000 0
22.	ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
23.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
24.	වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	සිරප් හෝ පළතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
26.	රසකැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
27.	පොල් ලෙලි නිපදවීම හෝ (පල් කිරීම)	500 0	750 0	1,000 0
28.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0

ආණමඩුව ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු පැනවීම - 2019 වර්ෂය

ආණමඩුව ප්‍රාදේශීය සභාව විසින් 2018 නොවැම්බර් මස 13 වැනි දින පවත්වන ලද ආණමඩුව ප්‍රාදේශීය සභා රැස්වීමේ දී යෝජනා අංක 19 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එච්. එම්. ප්‍රියන්ත බණ්ඩාර රාජකරුණා,
සභාපති,
ආණමඩුව ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 13 වැනි දින,
ආණමඩුව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ආණමඩුව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දියුණුකළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇත්තාවූ ප්‍රදේශය තුළ පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2013 වර්ෂයේ තක්සේරු කරන ලද වාර්ෂික වටිනාකම 2019 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

(ආ) එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් 10%ක වරිපනම් බද්දක් පනවා අයකළ යුතු බවටත්,

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යථෝක්ත වරිපනම් බද්ද 2019 වර්ෂයේ මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30, දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන කාර්තු 4 තුළදී සමාන වාරික 4කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙසට ද,

(ඈ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව එසේ නියම කරන ලද වරිපනම් බද්ද 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, පහත උපලේඛනයේ එක් එක් කාර්තුව ඉදිරියේ 3 වැනි තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් එක් කාර්තුවට අදාළ මුදලින් 5%ක වට්ටමක් ද සභාව විසින් ලබාදිය යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු අවසන් දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවැනි කාර්තුව	ජනවාරි 01 - ජනවාරි මස 31 දක්වා	ජනවාරි මස 31ට පෙර
දෙවැනි කාර්තුව	අප්‍රේල් 01 - අප්‍රේල් 30 දක්වා	අප්‍රේල් 30ට පෙර
තුන්වැනි කාර්තුව	ජූලි 01 - ජූලි 31 දක්වා	ජූලි 31 දක්වා
හතරවැනි කාර්තුව	ඔක්තෝබර් 01 - ඔක්තෝබර් 31 දක්වා	ඔක්තෝබර් 31ට පෙර

ආණමඩුව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

ආණමඩුව ප්‍රාදේශීය සභාව විසින් 2018 නොවැම්බර් මස 13 වැනි දින පවත්වන ලද ආණමඩුව ප්‍රාදේශීය සභා රැස්වීමේ දී යෝජනා අංක 20 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එච්. එම්. ප්‍රියන්ත බණ්ඩාර රාජකරුණා,
සභාපති,
ආණමඩුව ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 13 වැනි දින,
ආණමඩුව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ආණමඩුව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ආණමඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද සථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ ද,

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ආණමඩුව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ආණමඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමකම 2018 වර්ෂයේදී බලාත්මක කරන ලද සත්‍යයෙක්ෂණය 2019 වර්ෂයේ සත්‍යයෙක්ෂණය ලෙස පිළිගැනීමට ද,

(ආ) හෙක්ටයාර් 5ට අඩු නමුත් හෙක්ටයාර් 1ට නොඅඩු ඉඩමක් සඳහා 2019 වර්ෂය සඳහා රු. 50ක් බැගින් ද, හෙක්යාර් 5 හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් මතම 2019 වර්ෂය සඳහා රු. 10ක් බැගින් වන වාර්ෂික බද්දක් පනවා අයකළ යුතුයැයි ද,

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යථෝක්ත අක්කර බද්ද 2019 වර්ෂයේ මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30, දෙසැම්බර් මස 31 වන දිනවලින් අවසන් වන කාර්තු 4 තුළදී සමාන වාරික 4කින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරන්නී ය.

12 - 887/2

ආණමඩුව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වාහන හා සත්ත්ව බදු පැනවීම

ආණමඩුව ප්‍රාදේශීය සභාව විසින් 2018 නොවැම්බර් මස 13 වැනි දින පවත්වන ලද ආණමඩුව ප්‍රාදේශීය සභා රැස්වීමේ දී යෝජනා අංක 24 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එච්. එම්. ප්‍රියන්ත බණ්ඩාර රාජකරුණා,
සභාපති,
ආණමඩුව ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 13 වැනි දින,
ආණමඩුව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

ආණමඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2019 වර්ෂයට අදාළව වාහන හා සත්ත්ව බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට යෝජනා කරන්නී ය.

ආණමඩුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තකුම එහි II වැනි තීරුවේ සඳහන් අනුප්‍රමාණයක වාහන හා සත්ත්ව බද්දක් 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් එකී වාහන හා සත්ත්ව බද්දට යටත් තැනැත්තකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2019 වර්ෂය සඳහා වන මෙම බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් යෝජනා කරන්නී ය.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
(1) (i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් සයිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා -	
	(අ) වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළෙඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0
(iii)	සෑම කරත්තයක් සඳහා	20 0
(iv)	සෑම අත් කරත්තයක් සඳහා	10 0
(v)	සෑම රික්ෂෝවක් සඳහා	7 50
(vi)	සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
(vii)	සෑම ඇතෙකු සඳහා	50 0

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

(3) ඉහත සඳහන් වන "වෙළෙඳ කාර්ය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 887/3

ආණමඩුව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

ආණමඩුව ප්‍රාදේශීය සභාව විසින් 2018 නොවැම්බර් මස 13 වැනි දින පවත්වන ලද ආණමඩුව ප්‍රාදේශීය සභා රැස්වීමේ දී යෝජනා අංක 22 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එච්. එම්. ප්‍රියන්ත බණ්ඩාර රාජකරුණා,
සභාපති,
ආණමඩුව ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 13 වැනි දින,
ආණමඩුව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

106	විසිතුරු මසුන්/ කුරුල්ලන් ආදී සුරතල් සතුන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
107	මිරිස්, කෝපි, ධාන්‍ය හෝ කුළු බඩු ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	300.00	500.00	750.00
108	බ්ලොක් ගල් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
109	කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
110	බීරළු වැඩපලක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
111	ප්‍රතිමා නෙලීමේ හා ගල් ස්මාරක සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
112	තීන්ත වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

වෘත්තීය බදු පැනවීම - 2019 වර්ෂය

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේදී තීරණ අංක 8 (ඉ) iii යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද එම වෘත්තීය බද්ද එම වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවා බලපත්‍රය ලබා ගත යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

සනත් හෙට්ටිආරච්චි,
සභාපති,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 25 වැනි දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තීයක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛන I හි I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනු ප්‍රමාණය අනුව වූ උපලේඛන II හි සඳහන් පරිදි වෘත්තීය ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී වෘත්තීය බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය I

I තීරුව *ව්‍යාපාරයේ ආදායම*		*II තීරුව* *ගෙවිය යුතු බදු ප්‍රමාණය* *රු. ශත*
01	රු. 6,000 ක් නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
02	රු. 6,000 ක් ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90.00
03	රු. 12,000 ක් ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180.00
04	රු. 18,750 ක් ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360.00
05	රු. 75,000 ක් ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200.00
06	රු. 1,50,000 ක් ඉක්මවන අවස්ථාවක	3,000.00

උපලේඛනය II

01	පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
02	පෙරපාසල් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
03	පරිගණක මෘදුකාංග සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
04	පරිගණක පුහුණු පාඨමාලා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
05	ජෝතිෂ සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
06	රියදුරු පුහුණුව සපයන ආයතනයක් පවත්වාගෙන යාම
07	ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් (ඩිස්පැන්සරියක්) පවත්වාගෙන යාම
08	බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
09	වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
10	සත්ව සායන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
11	නීතීඥ නොතාරිස් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
12	පෞද්ගලික විගණන හෝ ගණකාධිකාරී සේවා සපයන ආයතනයක්
13	බැංකු සේවා සපයන ආයතනයක් (බැංකුවක්) පවත්වාගෙන යාම
14	රක්ෂණ සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
15	මූල්‍ය පහසුකම් සපයන මූල්‍ය සමාගමක් පවත්වාගෙන යාම

16 ප්‍රසිද්ධ සමාගමක භාණ්ඩ බෙදා හැරීමේ නියෝජිතයෙකු වශයෙන් කටයුතු කිරීම
17 ප්‍රසිද්ධ සමාගමක භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම හා විකිණීම සඳහා ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම
18 යතුරු පැදි හා මෝටර් වාහන අලෙවි කිරීමේ ස්ථානයක්
19 ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
20 රට බීම (අරක්කු) තොග වශයෙන් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
21 අරක්කු බියර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
22 සිනමා ශාලාවක් පවත්වාගෙන යාම
23 මගී ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම
24 භාණ්ඩ ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම
25 අමු තේ දළු එකතු කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
26 තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
27 වෙන්දේසිකරුවෙකු හෝ තරැව්කරුවෙකු වශයෙන් කටයුතු කිරීම
28 කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් කටයුතු කිරීම
29 මිනින්දෝරු සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
30 ගෘහ නිර්මාණ සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
31 වාස්තු විද්‍යා සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
32 ඉදිකිරීම් ඉංජිනේරු සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
33 විශේෂඥ වෛද්‍ය චැනල් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
34 පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම
35 විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම
36 ඇඟළුම් කම්හලක් පවත්වාගෙන යාම
37 දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම
38 නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම
39 දුරකතන සේවා සපයන්නෙකු ලෙස ව්‍යාපාර කටයුතු කිරීම
40 උකස් බඩු ගන්නෙකු වශයෙන් කටයුතු කිරීම
41 ජලය බෝතල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
42 සුපිරි වෙළඳ සංකීර්ණයක් පවත්වාගෙන යාම
43 රට උළු කම්හලක් පවත්වාගෙන යාම
44 පුද්ගලික ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම
45 මැණික් මිලයට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
46 ආයුර්වේද ඖෂධ හා තෙල් වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47 ප්‍රචාරක නියෝජිත ආයතනයක් සේ කටයුතු කිරීම
48 රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
49 ලොතරැයි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
50 යන්ත්‍රෝපකරණ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
51 කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
52 රේස් බුකියක් පවත්වාගෙන යාම
53 දුරකතන කුළුනක් හෝ සන්නිවේදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

12 - 699/3

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු පැනවීම 2019 වර්ෂය

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේදී තීරණ අංක 8 (ඉ) iv යටතේ පහත දැක්වෙන යෝජනාව සභ සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද වරිපනම් මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික 04කින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයෙන් අවසන් දිනයට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

සනත් හෙට්ටිආරච්චි,
සභාපති,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 25 වැනි දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලි වල, ඉඩම්වල හා ගෙපත්වල 2018 වර්ෂයේ බල පැවැත් වූ වාර්ෂික වටිනාකම 2019 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත් එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හතක (7%) වරිපනම් බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට සහ

ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2019 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවේ පළමු මාසය තුළ දී අදාළ වරිපනම් බදු ගෙවන්නේ නම් එක කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%) ක වට්ටමක් ද දෙනු ලැබේ. ඉහත සඳහන් පරිදි නියමිත දිනට පසුව ගෙවීම් කරන ගාස්තු මත 15%ක වරෙන්තු වියදම් අය කිරීමට ද කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 - 699/4

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා අක්කර බදු අය කිරීම

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේදී තීරණ අංක 8 (ඉ) v යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද අක්කර බද්ද මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික 04කින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයෙන් අවසන් දිනයට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

සනත් හෙට්ටිආරච්චි,
සභාපති,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 25 වැනි දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ -

(අ) 146 වන වගන්තියේ (3) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමකම 2018 වර්ෂයේදී බලාත්මක වූ වාර්ෂික වටිනාකම 2019 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්,

(ආ) කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ වල පිහිටි හෙක්ටයාර් එකකට නොඅඩු එහෙත් හෙක්ටයාර් පහකට අඩු සෑම ඉඩමක් මත රුපියල් පනහක (50.00) අනු ප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි සෑම ඉඩමක සෑම හෙක්ටයාරක් මත රුපියල් දහය (10.00) බැගින් වූ වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට සහ,

(ඇ) 134 වන වගන්තියේ (6) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, යථොක්ත බද්ද 2019 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස බද්දට යටත් සෑම තැනැත්තෙකුට විධාන කළ යුතු බවට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 - 699/5

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු බදු අයකිරීම

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේදී තීරණ අංක 8 (ඉ) vi යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සනත් හෙට්ටිආරච්චි,
සභාපති,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 25 වැනි දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 1988.08.23 වැනි දින අංක 520/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ IV (ආ) වැනි කොටස පළාත් පාලන ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි ඡේදය යටතේ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි එක් එක් දැන්වීමකට මුදලක් 2019 වර්ෂයට අය කිරීමට සුදුසු යැයි යෝජනා කරන්නීය.

උපලේඛනය

	පුවරුවේ ස්වභාවය	*බලපත්‍ර ගාස්තුව*	
		එක් මසකට	*වර්ෂයකට*
		රු. ශත	*රු. ශත*
01.	ස්ථිර දැන්වීම් පුවරුවක් සඳහා - වර්ග අඩි 01 ට	-	50.00
02.	විශාල ප්‍රමාණයේ කටවුට් ප්‍රදර්ශන පුවරු සඳහා - වර්ග අඩි 01 ට	20.00	30.00
03.	රෙදි උපයෝගී කර ගනිමින් දැන්වීම් ප්‍රදර්ශනය සඳහා - වර්ග අඩි 01 ට	25.00	-
04.	බිත්ති හෝ ගොඩනැගිලි උපයෝගී කර ගනිමින් දැන්වීම් ප්‍රදර්ශනය සහ ගමන් කරන වාහනයකට සවිකර ඇති දැන්වීමකට (චිත්‍ර පට ප්‍රචාරක දැන්වීම් හැර) සෑම වර්ග අඩි 01 ට	20.00	40.00
05.	ප්‍රතිදීප්ත ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා - වර්ග අඩි 01 ට	-	100.00

12- 699/6

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

රථ වාහන බදු පැනවීම 2019 වර්ෂය

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේදී තීරණ අංක 8 (ඉ) vi යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සනත් හෙට්ටිආරච්චි,
සභාපති,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 25 වැනි දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ (4) වන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේදී පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකු මත ම, එහි II වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට ද, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් තබාගන්නා සෑම තැනැත්තෙකුම විසින්, එකී වාහනය තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2019 වර්ෂය සඳහා වන මෙම බද්ද ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වන තීරුව	*II වන තීරුව*
	රු. ශත
01. (i) මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීප් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25.00
(ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
(අ) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18.00
(ආ) වෙළඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4.00

02. විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල් බැරෝ හුදෙක් පොදුගලික ස්ථාන වල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12 - 699/7

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

ඉඩම් විකිණීම මත බදු අය කිරීම - 2019 වර්ෂය

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේදී තීරණ අංක 8 (ඉ) viii යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සනත් හෙට්ටිආරච්චි,
සභාපති,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 25 වැනි දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම් විකිණීමෙන් ලත් ආදායමින් 1% ට සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා හෝ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවට 2019 වර්ෂයට ගෙවිය යුතු බව යෝජනා කරන්නීය.

12 - 699/8

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු අය කිරීම - 2019 වර්ෂය

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේදී තීරණ අංක 8 (ඉ) ix යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සනත් හෙට්ටිආරච්චි,
සභාපති,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 25 වැනි දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ (1) වැනි උප වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කර ඇති සීමාව ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක -

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්; *හෝ*

(ආ) එම ඉඩමෙහි ගොඩනැගිලිවලට සත්‍ය වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය හා එම ඉඩමෙහි සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය නියමිත ප්‍රමාණයට වඩා අඩු නම් ප්‍රාදේශීය සභා යෝජනා සම්මතයක් මගින් දරන්නා වූ; *හෝ*

(ඇ) ඒ ඉඩමේ ස්ථාවර නැතහොත් නිතිපතා කරන ගොවිතැනට යොදවා නොමැති අවස්ථාවක ප්‍රාදේශීය සභාව විසින් ඒ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක් (2%) වූ බද්දක් සංවර්ධනය නොකළ ඉඩම් වලින් බදු වශයෙන් ඉඩම් අයිතිකරුවන්ගෙන් 2019 වර්ෂය සඳහා අයකළ යුතු බවට යෝජනා කරන්නීය.

12 - 699/9

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

විනෝද බදු ආඥාපනත යටතේ බදු අය කිරීම - 2019 වර්ෂය

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේදී තීරණ අංක 8 (ඉ)x යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සනත් හෙට්ටිආරච්චි,
සභාපති,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 25 වැනි දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

විනෝද බදු ආඥා පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය ප්‍රකාර චිත්‍රපට දර්ශනයක්, මැජික් දර්ශනයක්, සර්කස් දර්ශනයක් හා සෑම සංගීත සංදර්ශනයක් සඳහාම මුද්‍රණය කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10% ක විනෝද බද්දක් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත්, මීට අමතරව ඉහත සංදර්ශනය වෙනුවෙන් පහත සඳහන් අයුරින් බලපත්‍ර ගාස්තුවක් ද ගෙවිය යුතු යැයි යෝජනා කරන්නීය.

		රු. ශත
I.	මුදල් අය කරන සංගීත සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව	1,000.00
II.	මුදල් අය නොකරන සංගීත සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව	1,000.00
III.	මුදල් අය කරන සර්කස් සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව	1,000.00
IV.	නාට්‍ය සංදර්ශනයක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තුව වැඩි වන සෑම දිනයක් සඳහා ම රු. 50.00 බැගින්	1,000.00

12 - 699/10

මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය යටතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 12 වැනි දින පවත්වන ලද මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බම මෙයින් නිවේදනය කරමි.

එල්. පත්මකුමාර අරංගල්ල,
සභාපති,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

2018 ඔක්තෝබර් මස 12 වැනි දින,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

1. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2018 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකිරීම සුදුසු බවටත් එම බද්ද 2019 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

ඉහත කී උපලේඛනය

I වන තීරය *2018 වර්ෂයේ දී ආදායම*	*II වන තීරය* *රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

ඉහත සඳහන් බදු ගෙවීමට යටත් ව්‍යාපාර හා වෘත්තීන් සම්බන්ධ විස්තර

උපලේඛනය

1. කොමිස් නියෝජිතයන්
2. වෙන්දේසිකරුවන්
3. බ්‍රෝකර්වරුන්
4. මුදල් සපයන්නන් හෝ මුදල් ණයට දෙන්නන්
5. කොන්ත්‍රාත්කරුවන්
6. උකස් බඩු ගන්නවුන්
7. පෞද්ගලික අධ්‍යාපන ආයතන
8. ගණන් පරීක්ෂකවරුන් හා ගණකාධිකාරිවරුන්
9. ගෘහ නිර්මාණ ශිල්පීන්/නිවාස සැලසුම් ශිල්පීන්
10. රක්ෂණ නියෝජිතයින්
11. ප්‍රවාහන නියෝජිතයින්
12. කුලී රථ හිමියන්
13. පෞද්ගලික ප්‍රවාහන අයිතිකරුවන්
14. රථ වාහන අලෙවිකරුවන්
15. රියැදුරන් පුහුණු කරවන්නන්
16. දෘෂ්ඨි පරීක්ෂකයින්
17. මැණික් ව්‍යාපාරිකයින්
18. අවමංගල්‍ය කටයුතු භාර ගන්නා අය
19. පෞද්ගලික මිනින්දෝරුවන්
20. පෞද්ගලික ආරෝග්‍යශාලා සහ මාතෘ නිවාස
21. ආහාර පාන සපයන්නන් (කේටරින් සර්විස්)
22. නීතිඥ කාර්යාලයක් පවත්වාගෙන යාම
23. නොතාරිස් කාර්යාලයක් පවත්වාගෙන යාම
24. රෝගීන්ට ප්‍රතිකාර කරන පෙරදිග/අපරදිග වෛද්‍ය ක්‍රමයේ බෙහෙත් ශාලා
25. උපදේශන සේවාවන් පවත්වාගෙන යාම
26. ජ්‍යොතිෂ ආයතනයක් පවත්වාගෙන යාම
27. විවිධ ප්‍රචාරණ කටයුතු සිදු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
28. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
29. රෙදිපිළි ආනයනය හෝ අපනයනය කිරීම
30. දුරකථන සම්ප්‍රේෂණ කුළුණු
31. රේස් ඔට්ටු භාරගන්නන්
32. කුලී රථගාලක් පවත්වාගෙන යාම
33. කුලී පදනම මත ශ්‍රමිකයින් සැපයීම
34. ඉංජිනේරු සේවා සැපයීම
35. සංචාරක සේවා නියෝජිත
36. නිමි ඇඳුම් නිෂ්පාදන කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම.
37. විනෝද උයනක් පවත්වාගෙන යාම/විනෝද කටයුතු සංවිධානය කිරීම.
38. උත්සව අවස්ථා සංවිධායකයින්.
39. රසායනාගාරයක් පවත්වාගෙන යාම.
40. කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
41. පොත් ප්‍රකාශකයින්.
42. රථවාහන දුම් පරීක්ෂණ ස්ථාන පවත්වාගෙන යන්නන්.
43. රටබීම වෙළෙන්දන්
44. විවිධ යන්ත්‍රෝපකරණ සැලසුම්කරන්නන්
45. පරිගණක ආශ්‍රිත අන්තර්ජාල සේවා සපයන්නන්, ග්‍රැෆික් නිර්මාණකරුවන් හෝ වෙබ් පිටු සකසන්නන්.
46. මූල්‍ය ආයතන.
47. විවිධ භාණ්ඩ ආනයනය/අපනයනය කරන්නන් හෝ බෙදාහරින්නන්.

මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තිය යටතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 12 වැනි දින පවත්වන ලද මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එල්. පත්මකුමාර අරංගල්ල,
සභාපති,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

2018 ඔක්තෝබර් මස 12 වැනි දින,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1178 හා 2001.03.30 දිනැති *ගැසට් පත්‍රය* යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තාවූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2009/2017/2018 වර්ෂ සඳහා වූ තක්සේරුව/2019 වර්ෂය සඳහා පිළිගැනීමටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) වාර්ෂික වරිපනම් බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, නියම විය යුතු බවටත්,

තව ද, 2019 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2019 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් 5% ක වට්ටමක් ද ලබා දීමටත් එසේ නොගෙවන්නේ නම් කාර්තුවකට ගෙවිය යුතු මුදලින් ගෘහස්ථ 15%කද ව්‍යාපාරික 20%ක ද වරෙන්තු ගාස්තුවක් අයකළ යුතු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2019.03.31	2019.01.31
දෙවන කාර්තුව	2019.06.30	2019.04.30
තුන්වන කාර්තුව	2019.09.30	2019.07.31
හතරවන කාර්තුව	2019.12.31	2019.10.31

12 - 726/2

මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට ඉඩම් විකිණීම මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වැනි වගන්තිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 12 වැනි දින පවත්වන ලද මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එල්. පත්මකුමාර අරංගල්ල,
සභාපති,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

2018 ඔක්තෝබර් මස 12 වැනි දින,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

3. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔවුන්ගේ සේවකයා හෝ අනුනියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක දී එසේ විකිණීමෙන් ලැබෙන මුදලින් 1%ක අනුප්‍රමාණයෙන් වූ බද්දක් එකී වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔවුන්ගේ අනු නියෝජිතයාගෙන් අයකළ යුතු බවට ගරු සභාවට යොජනා කරමි.

12 - 726/3

මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වැනි වගන්තිය යටතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 12 වැනි දින පවත්වන ලද මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එල්. පත්මකුමාර අරංගල්ල,
සභාපති,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

2018 ඔක්තෝබර් මස 12 වැනි දින,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

4. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 2015.12.28 වැනි දින අංක 1947/06 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* බස්නාහිර පළාත් ගරු අමාත්‍යතුමා විසින් අනුමත කර ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ විධිවිධාන සහ අංක 1978/22 හා 2016.08.03 ගැසට් නිවේදනය ප්‍රකාර මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් තැනැත්තෙකු විසින් යම් වීථියකට, පාරකට, ඇලකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි කිසිම දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් සංශෝධනය කරන තුරු 2019.01.01 වැනි දින සිට අයකිරීමට සුදුසු යැයි ගරු සභාවට යෝජනා කරමි.

උපලේඛනය

අංක	*ප්‍රචාරුවේ ස්වභාවය*	*වර්ග අඩි ප්‍රමාණය*	*ගාස්තු රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01.	කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම	1ට අඩු	250 0	350 0	500 0
		1ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
02.	රෙදි, ඩිජිටල්, බැනර්	3ට අඩු	250 0	350 0	500 0
		3ට වැඩි	3ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
03.	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	250 0	350 0	500 0
		1ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		

අංක	පුවරුවේ ස්වභාවය	වර්ග අඩි ප්‍රමාණය	ගාස්තු රුපියල් මාස 03 ට අඩු	මාස 03 හෝ 06 අතර	වසරක්
04.	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	250 0	350 0	500 0
		1ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
05.	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1ට අඩු	250 0	350 0	500 0
		1ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
06.	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	250 0	350 0	500 0
		1ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
07.	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	750 0	850 0	1,000 0
		1ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500 බැගින්		

12 - 726/4

මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට වාහන හා සත්ව බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 148 වැනි වගන්තිය යටතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 12 වැනි දින පවත්වන ලද මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එල්. පත්මකුමාර අරංගල්ල,
සභාපති,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

2018 ඔක්තෝබර් මස 12 වැනි දින,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

5. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 148 වැනි වගන්තිය යටතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත කිසිම වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබාගන්නා සෑම තැනැත්තෙක්ගෙන්ම එම උපලේඛනයේ ඉදිරියෙන් දක්වා ඇති අනු ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ බද්දක් මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2019 වර්ෂයට අදාළව නියම කර අය කිරීම සුදුසු බවත් එකී බද්ද 2019 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංක	*I තීරුව*	*II තීරුව රු. ශත*
01.	මෝටර් රථයක්, මෝටර් සයිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
02.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කරත්තයක් හෝ කරත්තයක් සඳහා වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කරත්තයක් හෝ කරත්තයක් සඳහා වෙළඳ කාර්යය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම්	04 0
04.	සෑම කරත්තයක් සඳහා	20 0
05.	සෑම අත් කරත්තයක් සඳහා	10 0
06.	සෑම රික්ෂෝවක් සඳහා	7 50
07.	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවකු සඳහා	15 0
08.	සෑම ඇතකු සඳහා	50 0

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන විල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මෙම උපලේඛනයේ "වෙළඳ කාර්යය" යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 726/5

මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තිය යටතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 12 වැනි දින පවත්වන ලද මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එල්. පත්මකුමාර අරංගල්ල,
සභාපති,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

2018 ඔක්තෝබර් මස 12 වැනි දින,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

6. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියෙන් මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවට වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීම සුදුසු බවටත් එකී බද්ද 2019 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

උපලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ කර්මාන්ත බදු අය කිරීම පිළිබඳ උපලේඛනය

අනු. අංක	*I* වැනි තීරුව	*II* වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන විට රු. ශත	*රු. 750 ඉක්මවන විට එහෙත් රු. 1,500 නොඉක්මවන විට* රු. ශත	*රු. 1,500 ඉක්මවන විට* රු. ශත
1.	පුවක් වේලා සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	පැණි නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
3.	ලී වෙළඳ සලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	පළතුරු විකිණීම සඳහා සාප්පුවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	එළවළු විකිණීම සඳහා සාප්පුවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	ගෘහ භාණ්ඩ සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	අඟුරු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
8.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	විදුලි උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	දුම්කොළ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
11.	පැඟිරි තෙල් හෝ කුරුඳු තෙල් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
12.	බිම් ප්‍රමාණය වර්ග අඩි 100 ඉක්මවන ස්ථානයක බඩු ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	අත්යන්ත්‍ර මාර්ගයෙන් මෙට්ට නිපදවීම	500 0	750 0	1,000 0
14.	වේවැල් බඩු නිපදවීම හා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
15.	බෝල මේස ක්‍රීඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	පුවත්පත් බෙදාහැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	පාසල් පොත් හා ලිපිද්‍රව්‍ය විකිණීම	500 0	750 0	1,000 0
18.	රෙදිපිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	මහන මැෂින් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීම	500 0	750 0	1,000 0
21.	මෝටර් සයිකල් තොග වශයෙන් ගෙන්වීම හෝ ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	සිල්ලර වෙළෙඳ සැල	500 0	750 0	1,000 0
23.	ඉංග්‍රීසි බෙහෙත් බඩු විකිණීම	500 0	750 0	1,000 0
24.	සිංහල බෙහෙත් බඩු විකිණීම	500 0	750 0	1,000 0
25.	ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	මෝටර් රථ, යතුරු පැදි, ත්‍රීවීල් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	ටයර් වෙළඳ සලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	සිසිල් බීම ගබඩා කිරීම	500 0	750 0	1,000 0
30.	මැටි භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	සංගීත භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
32.	උත්සව භාණ්ඩ කුළියට දීම	500 0	750 0	1,000 0
33.	දුරකථන පහසුකම් සැපයීම (කොමියුනිකේෂන්)	500 0	750 0	1,000 0
34.	සිසිල් බීම තොග ගබඩාකර විකිණීම	500 0	750 0	1,000 0
35.	රන් රිදී බඩු සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	ප්ලාස්ටික් භාණ්ඩ සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	තෑගි භාණ්ඩ හෝ විසිතුරු භාණ්ඩ සාප්පුව	500 0	750 0	1,000 0

අනු. අංක	*I වැනි තීරුව*	*II වැනි තීරුව* පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන විට රු. ශත	*රු. 750 ඉක්මවන විට එහෙත් රු. 1,500 නොඉක්මවන විට* රු. ශත	*රු. 1,500 ඉක්මවන විට* රු. ශත
38.	මැටි, පිඟන් මැටි භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
39.	විසිතුරු මල්පැල තවානක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	ගීත පටිගත කිරීම හා වී.සී.ඩී. තැටි විකිණීම (සංයුක්ත තැටි විකිණීම)	500 0	750 0	1,000 0
41.	සුරුට්ටු විකිණීම	500 0	750 0	1,000 0
42.	බීඩි විකිණීම	500 0	750 0	1,000 0
43.	කොප්පරා නිපදවීම	500 0	750 0	1,000 0
44.	යන්ත්‍රානුසාරයෙන් රබර් දුම් ගැස්සවීම හා නිපදවීම	500 0	750 0	1,000 0
45.	අත්යන්ත්‍ර මාර්ගයෙන් රබර් දුම් ගැස්සවීම හා නිපදවීම	500 0	750 0	1,000 0
46.	කපු පුළුන් නිපදවීම	500 0	750 0	1,000 0
47.	එක් අයෙකුට වැඩි දෙනෙක් සේවය කරන ස්ථානයක යකඩ කම්මලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
48.	බලවේග යන්ත්‍ර මගින් රෙදි නිපදවීම	500 0	750 0	1,000 0
49.	පූජා භාණ්ඩ සහ අටපිරිකර භාණ්ඩ අලෙවිකරන ස්ථාන	500 0	750 0	1,000 0
50.	නියෝජිත තැපැල් කාර්යාලයක් පැවත්වීම	500 0	750 0	1,000 0
51.	නිමි ටයර් ගබඩාව	500 0	750 0	1,000 0
52.	භාණ්ඩ බහාලුම් අංගනය	500 0	750 0	1,000 0
53.	ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54.	සහල් වෙළෙඳ සලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	ගල් කැටයම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	සිනමා ශාලා	500 0	750 0	1,000 0
57.	වීඩියෝ ක්‍රීඩා	500 0	750 0	1,000 0
58.	ඇසුරුම් කරන ලද තේ ආනයනය කිරීමේ ව්‍යාපාර	500 0	750 0	1,000 0
59.	දත්කුරු (ටූත් පික්) නිපදවීමේ ව්‍යාපාර	500 0	750 0	1,000 0
60.	ජුකී මැෂින් කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
61.	තණකොල කපන යන්ත්‍ර හා විවිධ යන්ත්‍රෝපකරණ විකිණීම	500 0	750 0	1,000 0
62.	තීන්ත බඩු බෙදා හැරීම	500 0	750 0	1,000 0
63.	පා පැදි විකිණීම	500 0	750 0	1,000 0
64.	බුලත් නිපදවීම/මිල දී ගැනීම හා විකිණීම	500 0	750 0	1,000 0
65.	ලොතරැයි අලෙවි කුටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	පොල් තොග වශයෙන් මිළට ගෙන විකිණීම	500 0	750 0	1,000 0
67.	සත්ත්ව ආහාර/සත්ත්ව බෙහෙත් විකිණීම	500 0	750 0	1,000 0
68.	හඳුන්කුරු/සුවඳ කුඩු ආශ්‍රිත ද්‍රව්‍ය අලෙවිය	500 0	750 0	1,000 0
69.	පාවහන්/බෑග් අලෙවිය	500 0	750 0	1,000 0
70.	සම් භාණ්ඩ අලෙවිය	500 0	750 0	1,000 0
71.	ජංගම දුරකතන/පරිගණක උපාංග අලෙවිය	500 0	750 0	1,000 0
72.	ව්‍යාපාරික කාර්යාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
73.	ඉටිපන්දම් හෝ ඉටි ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය	500 0	750 0	1,000 0
74.	හරිතාගාර අමුද්‍රව්‍ය අලෙවිය	500 0	750 0	1,000 0
75.	රථවාහන අලංකරණ උපකරණ අලෙවිය	500 0	750 0	1,000 0
76.	පොල් ලී මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
77.	විසිතුරු සතුන්/මසුන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
78.	ගෑස් අලෙවි කිරීම	500 0	750 0	1,000 0
79.	මුද්‍රා (බැජ්) නිපදවීම	500 0	750 0	1,000 0
80.	කජු මද අවන් කිරීම/අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංක	*I වැනි තීරුව*	*II වැනි තීරුව* පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන විට රු. ශත	*රු. 750 ඉක්මවන විට එහෙත් රු. 1,500 නොඉක්මවන විට* රු. ශත	*රු. 1,500 ඉක්මවන විට* රු. ශත
81.	වී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
82.	ලිහිසි තෙල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
83.	පිංතූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
84.	ආර්ථික භෝග වගා කර විකිණීම	500 0	750 0	1,000 0
85.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
86.	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
87.	භාණ්ඩ ඇසුරුම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
88.	මනාලියන් හැඩ ගැන්වීමේ ස්ථානයක්/රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
89.	තේ කොළ, කුළු බඩු ඇසුරුම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
90.	රෙදි කැබලි ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පදනය හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
91.	බිම්මල් නිපදවීම හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
92.	ජල නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
93.	වානේ/යකඩ ආශ්‍රිත කර්මාන්තයක් සිදුකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
94.	බෑග් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
95.	පොලිතින්/ප්ලාස්ටික් ආදී ද්‍රව්‍ය ප්‍රතිචක්‍රිකරණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
96.	ටිං නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
97.	ආරක්ෂිත කැමරා හා උපාංග අලෙවි කිරීම හෝ සවි කිරීමේ ව්‍යාපාර පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
98.	වෙස් නර්තන හා අනෙකුත් නර්තන ශිල්පීන්ගේ ආභරණ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
99.	මදුරු දැල් මැසීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
100.	ත්‍රී රෝද රථ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්ති හා 149 වන වගන්තිය යටතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 12 වැනි දින පවත්වන ලද මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එල්. පත්මකුමාර අරංගල්ල,
සභාපති,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

2018 ඔක්තෝබර් මස 12 වැනි දින,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

7. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්ති හා 149 වැනි වගන්ති යටතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2019 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2019 වර්ෂය සඳහා අයකිරීම සුදුසු බවට ද, එකී බලපත්‍රය 2019 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ලබා ගත යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විට දී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2018 වර්ෂයේ ලැබීම්වලින් 1%ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2019 වර්ෂය සඳහා අයකළ යුතු බවට ගරු සභාවට යෝජනා කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ බලපත්‍රය

ගාස්තු සඳහා වූ උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *බලය දෙනු ලබන කාර්යය*	*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන විට	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	උකස් ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	ලැගුම් නිවාසයක් හෝ බෝඩිමක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	ආපන ශාලාවක් හෝ හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	බත් කඩයක්, ආපන ශාලා සහ තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	කිරි විකිණීම හෝ කිරි එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	මාළු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	මස් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	සංචාරක වෙළඳාම් කරන්නන්	500 0	750 0	1,000 0
12.	ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	කොණ්ඩා කැපීමේ ස්ථානයක් (බාබර් සාප්පුවක්) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
	I වැනි උපලේඛනය - ජීඩාකාරී ව්‍යාපාර			
1.	මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
2.	පොහොර හෝ රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ විකිණීමට තබාගැනීම	500 0	750 0	1,000 0
3.	හම් පදම් කිරීම	500 0	750 0	1,000 0
4.	හම් විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
5.	සත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
6.	උම්බලකඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
7.	රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටි තබා ගැනීම	500 0	750 0	1,000 0
8.	පශු වෛද්‍ය ඖෂධ ගිලන්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුලු කෑම වර්ග හෝ ආහාර වර්ග තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	කරවල, ලුණු හෝ ජාඩි හොන්ඩර් 03ට වඩා තබා ගැනීම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව බලය දෙනු ලබන කාර්යය	II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන විට	රු. 750 ඉක්මවන විට එහෙත් රු. 1,500 නොඉක්මවන විට	රු. 1,500 ඉක්මවන විට
		රු. ශත	රු. ශත	රු. ශත
11.	මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
12.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
13.	දුම්කොල වියළීම	500 0	750 0	1,000 0
14.	සත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
15.	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
16.	සත්ව මාංශ හෝ ලේ පැසවීම	500 0	750 0	1,000 0
17.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
18.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
19.	ට්‍රන්ක පෙට්ටි තබාගැනීම	500 0	750 0	1,000 0
20.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
21.	පාපැදි හා යතුරුපැදි අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
22.	ගෘහ භාණ්ඩ තබා ගැනීම	500 0	750 0	1,000 0
23.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
24.	වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
26.	රස කැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
27.	පොල් ලෙලි පෙඟවීම හෝ පල් කිරීම	500 0	750 0	1,000 0
28.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
29.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
30.	විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0
31.	දැව ඉරීම	500 0	750 0	1,000 0
32.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500 0	750 0	1,000 0
33.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
34.	කෙඳි සායම් කිරීම	500 0	750 0	1,000 0
35.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
36.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
37.	කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම	500 0	750 0	1,000 0
38.	බේකින් පවුඩර් නිපදවීම	500 0	750 0	1,000 0
39.	පොටි නිපදවීම	500 0	750 0	1,000 0
40.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
41.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
42.	ලියන තීන්ත, අච්චු තීන්ත, හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
43.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
44.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
45.	සුවඳ විලවුන් සහ හඳුන්කුරු නිපදවීම	500 0	750 0	1,000 0
46.	පාසල් රට හුණු නිපදවීම	500 0	750 0	1,000 0
47.	ටයර්, ටියුබ් වෝල්කනයිසින් කිරීම	500 0	750 0	1,000 0
48.	වැලි කඩදාසි නිපදවීම	500 0	750 0	1,000 0
49.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
50.	ගඩොල් පිළිස්සීම	500 0	750 0	1,000 0
51.	යන්ත්‍රානුසාරයෙන් රෙදි නිපදවීම	500 0	750 0	1,000 0
52.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම	500 0	750 0	1,000 0
53.	සාරි හා රෙදි පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
54.	සිමෙන්ති, කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0

අන්තරායදායක ව්‍යාපාර (II වැනි උපලේඛනය)

අනු. අංකය	*I වැනි තීරුව* *බලය දෙනු ලබන කාර්යය*	*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන විට	*රු. 750 ඉක්මවන විට එහෙත් රු. 1,500 නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	කළුගල් කැඩීම හෝ කැණීම	500 0	750 0	1,000 0
2.	සිසිල් බීම/පැණි බීම නිෂ්පාදනය	500 0	750 0	1,000 0
3.	අයිස් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
4.	එළවළු තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
5.	පොල් තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
6.	සත්ව තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
7.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
8.	මෙතිලේටඩ් ස්ප්‍රිතු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
9.	තේ පෙට්ටි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10.	වීදුරු තබා ගැනීම	500 0	750 0	1,000 0
11.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
12.	යන්ත්‍රෝපකරණ භාවිතා කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
13.	හිස් ගෝනි සහ හිස් බෝතල් තබා ගැනීම	500 0	750 0	1,000 0
14.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500 0	750 0	1,000 0
15.	විසිරි පින්තාරු කිරීම	500 0	750 0	1,000 0

පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර (III වැනි උපලේඛනය)

අනු. අංකය	*I වැනි තීරුව* *බලය දෙනු ලබන කාර්යය*	*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන විට	*රු. 750 ඉක්මවන විට එහෙත් රු. 1,500 නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	තලාතු මිනිරන් ශුද්ධ කිරීම	500 0	750 0	1,000 0
2.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එන්සාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0
3.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
4.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
5.	විද්‍යුත් ලෝහ ආලේප කිරීම	500 0	750 0	1,000 0
6.	තෙල් හෝ සත්ව මේද පැසවීම	500 0	750 0	1,000 0
7.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම	500 0	750 0	1,000 0
8.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම	500 0	750 0	1,000 0
9.	මෝර තෙල් සකස් කිරීම	500 0	750 0	1,000 0
10.	බෝට්ටු තැනීම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව බලය දෙනු ලබන කාර්යය	II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන විට	රු. 750 ඉක්මවන විට එහෙත් රු. 1,500 නොඉක්මවන විට	රු. 1,500 ඉක්මවන විට
		රු. ශත	රු. ශත	රු. ශත
11.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
12.	ලෝහ වර්ග පෑස්සීම	500 0	750 0	1,000 0
13.	මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
14.	මෝටර් වාහන අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
15.	යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
16.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	මෝටර් වාහන බොඩි සෑදීම	500 0	750 0	1,000 0
19.	කෘමි නාශක, දිලීර නාශක, පැලෑටි නාශක හෝ පළිබෝධ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
20.	විෂබීජ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
21.	මදුරු දඟර නිපදවීම	500 0	750 0	1,000 0
22.	දැව ආරක්ෂක නිපදවීම	500 0	750 0	1,000 0
23.	වීදුරු කැඩපත් නිපදවීම	500 0	750 0	1,000 0
24.	වීදුරු භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
25.	පාස්සන ඊයම් නිපදවීම	500 0	750 0	1,000 0
26.	ඇළුමිනියම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
27.	කටු කම්බි නිපදවීම	500 0	750 0	1,000 0
28.	කම්බි ඇණ නිපදවීම	500 0	750 0	1,000 0
29.	කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම	500 0	750 0	1,000 0
30.	බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ කාබන් ටැංකි නිපදවීම	500 0	750 0	1,000 0
31.	ගැල්වනයිස් බාල්දි නිපදවීම	500 0	750 0	1,000 0
32.	වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ නිපදවීම හා අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
33.	බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම	300 0	500 0	750 0
34.	යන්ත්‍රෝපකරණ නිපදවීම	500 0	750 0	1,000 0
35.	විදුලි සැපයුම් උපකරණ නිපදවීම	500 0	750 0	1,000 0
36.	රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම	500 0	750 0	1,000 0
37.	විදුලි භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
38.	සංචායන බැටරි නිපදවීම	500 0	750 0	1,000 0
39.	ට්‍රැක්ටර් රථ එකලස් කිරීම	500 0	750 0	1,000 0
40.	රේඩියේටර් නිපදවීම	500 0	750 0	1,000 0
41.	ඉලෙක්ට්‍රොනික උපකරණ නිපදවීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
42.	විදුලි කෝෂ බැටරි නිපදවීම	500 0	750 0	1,000 0
43.	විදුලි බලයෙන් හෝ අත්‍යන්ත්‍ර මගින් ක්‍රියාත්මක වන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	ආබාධිතයන් සඳහා කෘතිම අවයව හා උපකරණ සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	සියලුම වර්ගයේ පොහොර නිපදවීම හෝ මිශ්‍ර කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	ප්ලාස්ටික්, පොලිතින්, බෝතල් කටු එක්රැස් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	පොල්ලෙලි පෙඟවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	යාන්ත්‍රික බලයෙන් ක්‍රියාකරන ටයර් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව බලය දෙනු ලබන කාර්යය	II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන විට	රු. 750 ඉක්මවන විට එහෙත් රු. 1,500 නොඉක්මවන විට	රු. 1,500 ඉක්මවන විට
		රු. ශත	රු. ශත	රු. ශත
49.	යාන්ත්‍රික වඩු වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
50.	අඟුරු ලබාගැනීම සඳහා පොල්කටු පිළිස්සීම	500 0	750 0	1,000 0
51.	හොන්ඩර 05කට වැඩි තරම් පොල්කටු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
52.	තලාතු මිනිරන් වේලීම	500 0	750 0	1,000 0
53.	ගෙන්දගම් දුම් ගැසීමෙන් කුරුඳු, එන්සාල් හෝ කොහු වේලීම	500 0	750 0	1,000 0
54.	කපු නූල් සායම් පොඟවා නිම කිරීම	500 0	750 0	1,000 0
55.	තෙල් මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	පරණ යකඩ, බඩු ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
57.	කොහු මෝලක්, කොහු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
58.	නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
59.	විදුලි භාණ්ඩ, ගුවන් විදුලි යන්ත්‍ර සහ රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
60.	සිමෙන්ති ගබඩා කිරීම	500 0	750 0	1,000 0
61.	යෝගට් හෝ කිරි මිශ්‍රිත ආහාර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
62.	ඉන්ජෙක්ටර් පොම්ප අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
63.	යතුරු පැදි, ත්‍රිරෝද රථ, සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	අයිස්ක්‍රීම් ගබඩාකර බෙදාහැරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	කපාපු පොල් නිපදවීම	500 0	750 0	1,000 0
66.	කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
67.	බලවේග යන්ත්‍ර මගින් රෙදි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
68.	කොහු හෝ කෙඳි වර්ග නිපදවන හෝ කෙඳි වර්ගවලින් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
69.	යන්ත්‍ර මගින් පාවහන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
70.	යන්ත්‍ර නොමැතිව පාවහන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
71.	යන්ත්‍රානුසාරයෙන් මෙට්ට නිපදවීම	500 0	750 0	1,000 0
72.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබාගැනීම	500 0	750 0	1,000 0
73.	බුරුසු වර්ග නිපදවීම. (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
74.	ගෑස් මැන්ටල් නිපදවීම	500 0	750 0	1,000 0
75.	ටයර් හෝ ටියුබ් නිපදවීම	500 0	750 0	1,000 0
76.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
77.	සිමෙන්ති නිපදවීම	500 0	750 0	1,000 0
78.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
79.	අම්ල නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
80.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කිරීම	500 0	750 0	1,000 0
81.	අළුත් ලෝහ හෝ පරණ ලෝහ ලබාගැනීම	500 0	750 0	1,000 0
82.	ලෝහ සුන්බුන් තබාගැනීම	500 0	750 0	1,000 0
83.	කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
84.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
85.	හිරිගල් හෝ හුණු කැඩීම	500 0	750 0	1,000 0
86.	ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම	500 0	750 0	1,000 0

මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට සේවා සඳහා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය යටතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 12 වැනි දින පවත්වන ලද මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එල්. පත්මකුමාර අරංගල්ල,
සභාපති,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

2018 ඔක්තෝබර් මස 12 වැනි දින,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

8. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 2015.12.28 අංක 1947/06 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* බස්නාහිර පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් අනුමත කර ප්‍රකාශයට පත්කර ඇති අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සීමාව තුළ පහත උපලේඛනයේ සඳහන් සේවා සැපයීම වෙනුවෙන් ගාස්තුවක් සංශෝධනය කරන තුරු 2019.01.01 වැනි දින සිට අය කිරීම සුදුසු යැයි ගරු සභාවට යෝජනා කරමි.

උපලේඛනය

විස්තරය

අංක	*කාරණය*	*ගාස්තුව රු. ශත*
1.	නොපවරා ගැනීම්, වීථි රේඛා, ගොඩනැගිලි සීමා, සහතික නිකුත් කිරීම	500 0
2.	වරිපනම් උධෘතයක් නිකුත් කිරීම සඳහා ගාස්තුව	500 0
3.	පුස්තකාල අයදුම් පත්‍රයක් සඳහා ගාස්තුව	20 0
4.	පුස්තකාල සාමාජික ගාස්තුව (වැඩිහිටි)	100 0
5.	පුස්තකාල සාමාජික ගාස්තුව (ළමා)	50 0
6.	පුස්තකාල සාමාජිකත්වය අළුත් කිරීම වර්ෂ 02කට වරක් (වැඩිහිටි)	50 0
7.	පුස්තකාල සාමාජිකත්වය අළුත් කිරීම වර්ෂ 02කට වරක් (ළමා)	25 0
8.	ගොඩනැගිලි අයදුම් පත්‍රයක් සඳහා ගාස්තුව	500 0
9.	අනුකූලතා සහතික නිකුත් කිරීම (නේවාසික)	1,000 0
10.	අනුකූලතා සහිතක නිකුත් කිරීම (වාණිජ)	2,000 0

12 - 726/8

මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තිය යටතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 12 වැනි දින පවත්වන ලද මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එල්. පත්මකුමාර අරංගල්ල,
සභාපති,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

2018 ඔක්තෝබර් මස 12 වැනි දින,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඩුගම්පල.

9. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) (ආ) වැනි උපවගන්තිය යටතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර මිනුවන්ගොඩ බල සීමාව ඇතුළත වූ ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යය සඳහා වන ඉඩමක් පහත සඳහන් කාර්යයන් සඳහා යොදාගෙන නොමැත්තේ නම්,

(අ) ඒ ඉඩමෙන් ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය නියමිත ප්‍රමාණයට වඩා අඩු නම්,

(ආ) ඉඩමේ ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්.

(ඇ) ස්ථාවර නැතහොත් නිතිපතා කෙරෙන ගොවිතැනට ඒ ඉඩම යොදවා නැත්නම්,

ඒ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2%ක බද්දක් පනවා අයකළ යුතු බවට ගරු සභාවට යෝජනා කරමි.

12 - 726/9

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථාව යටතේ 2019 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 29 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2019 වර්ෂයේ දී පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මතම ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. එම්. උපුල් බණ්ඩාර වීරසිංහ,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 29 වැනි දින දී,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග' කියවිය යුතු 149 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්ත වෙනුවෙන්, එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමටත්,

ඩබ්. එම්. උපුල් බණ්ඩාර වීරසිංහ,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 29 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා ආනුශාංගික විධිවිධාන පනත යටතේ මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබ මෙහි පහත දක්වන ලද ප්‍රාදේශීය සභා පොළ පිළිබඳ ගාස්තු පැනවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා එම වගන්තියෙහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව 2016 පෙබරවාරි මස 23 වැනි දින අංක 1955/7 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරනු ලැබ ඇත.

එකී සති පොළ පුවරු ගාස්තු පැනවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවන්හි ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 126 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලය ලැබී ඇති අතර, එම සතිපොළ ගාස්තු පැනවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන අයාතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙහි 3 වැනි උපවගන්තියෙහි විධිවිධාන අනුව මධ්‍යම පළාත් පළාත් සභාව විසින් අනුමැතිය ලබා ඇත. මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභාවක් වන පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2017 දෙසැම්බර් මස 15 වැනි දින අංක 2050 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් නිවේදනයක් නිකුත් කරමින් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව පිළිගෙන ඇත.

ඒ අනුව මධ්‍යම පළාත් සභාව විසින් සම්පාදිත ප්‍රාදේශීය සභා අතුරු ව්‍යවස්ථා මාලාවේ සතිපොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තියේ (xxii) වැනි වගන්තිය යටතේ සම්පාදිත ප්‍රාදේශීය සභා සතිපොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව පාතහේවාහැට ප්‍රදේශීය සභාව විසින් පිළිගෙන ඇත.

සතිපොළ ගාස්තු සතිපොළ පැවැත්වෙන දිනයේ මධ්‍යාහ්නට හෝ ඊට පෙර පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් පත්කර ඇති නිලධාරියාව, සේවකයෙකුට හෝ ප්‍රාදේශීය සභාවේ නිලධාරියෙකුට හෝ නියෝජිතයෙකුට ගෙවිය යුතු බව නිවේදනය කරන ලදී.

මෙහි පළමුවන උපලේඛනයේ පළමුවන තීරුවේ සඳහන් කිසියම් වෙළෙඳාමක් වෙනුවෙන් දෙවන තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත ගාස්තුවක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීම.

පාතාහේවාහැට ප්‍රාදේශීය සභාවට යෝජනා කරන ලද

අනු. අංකය	විස්තරය	සතිපොළ ගාස්තු දෛනික පිරිවැටුම							
		සිට රු.	දක්වා රු.	ගාස්තුව රු.	සිට රු.	දක්වා රු.	ගාස්තුව රු.	වැඩි රු.	ගාස්තුව රු.
01.	එළවලු	2,500 0	5,000 0	50 0	5,000 0	10,000 0	100 0	10,000 0	250 0
02.	පළතුරු	2,500 0	5,000 0	50 0	5,000 0	10,000 0	100 0	10,000 0	250 0
03.	සිල්ලර බඩු	5,000 0	10,000 0	50 0	10,000 0	2,000 0	100 0	20,000 0	250 0
04.	රෙදිපිළි	2,500 0	5,000 0	50 0	5,000 0	10,000 0	100 0	10,000 0	250 0
05.	මාලු හා කරවල	2,500 0	5,000 0	50 0	5,000 0	10,000 0	100 0	10,000 0	250 0
06.	විසිතුරු පැළ වර්ග	2,500 0	5,000 0	50 0	5.000 0	10,000 0	100 0	10,000 0	250 0
07.	ගෘහ උපකරණ	2,500 0	5,000 0	50 0	5,000 0	10,000 0	100 0	10,000 0	250 0
08.	කෘෂි උපකරණ	2,500 0	5,000 0	50 0	5,000 0	10,000 0	100 0	10,000 0	250 0
09.	ප්ලාස්ටික් බඩු	2,500 0	5,000 0	50 0	5,000 0	10,000 0	100 0	10,000 0	250 0
10.	වෙනත්	2,500 0	5,000 0	50 0	5,000 0	10,000 0	100 0	10,000 0	250 0

12 - 879/19

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2019 ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ ගාස්තු අය කිරීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. එම්. උපුල් බණ්ඩාර වීරසිංහ,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 29 වැනි දින දී,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා ආනුශාංගික විධිවිධාන පනත යටතේ මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබ මෙහි පහත දක්වන ලද ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා එම වගන්තියෙහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව 2016 පෙබරවාරි මස 23 වැනි දින අංක 1955/7 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරනු ලැබ ඇත.

එකී ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවන්හි ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 126 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට බලය ලැබී ඇති අතර, එම ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන අයාතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙහි 3 වැනි උපවගන්තියෙහි විධිවිධාන අනුව මධ්‍යම පළාත් පළාත් සභාව විසින් අනුමැතිය ලබා ඇත. මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභාවක් වන පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2017 දෙසැම්බර් මස 15 වැනි දින අංක 2050 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් නිවේදනයක් නිකුත් කරමින් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව පිළිගෙන ඇත.

ඒ අනුව මධ්‍යම පළාත් සභාව විසින් සම්පාදිත ප්‍රාදේශීය සභා අතුරු ව්‍යවස්ථා 2016.02.23 වැනි දින හා අංක 1955/7 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති එම ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කර ඇති අතුරු ව්‍යවස්ථා මාලාවේ ත්‍රීරෝද රථ නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථාවේ 4 (IV) අනුව එක් එක් ත්‍රීරෝද රථ නැවතුම්පලෙහි නවතා තැබීම සඳහා බලපත්‍ර ලබාදෙන උපරිම ත්‍රීරෝද රථ සංඛ්‍යාව දෙවන උපලේඛනයේ සඳහන් වේ.

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

පළමුවන උපලේඛනය

ත්‍රීරෝද රථ නවතා තැබීමේ ගාස්තු

I වන තීරුව		*II වන තීරුව*
01.	ත්‍රීරෝද රථයක් සඳහා	රු. 1,800 0 වාර්ෂිකව

දෙවන උපලේඛනය

ත්‍රීරෝද රථ නවතා තැබීමේ ස්ථාන පිළිබඳ උපලේඛනය

නැවතුම්පලේ අංකය	*ත්‍රීරෝද රථ නැවතුම්පලෙහි නම*	*අනුමත ත්‍රීරෝද රථ සංඛ්‍යාව*
01.	අම්පිටිය, තලාතුඔය මාර්ගයේ තලාතුඔය බස් නැවතුම ඉදිරිපිට දකුණුපස දිගින් අඩි 100ක්	35
02.	තලාතුඔය, ගුරුදෙණිය මාර්ගයේ ප්‍රාදේශීය කාර්යාලයට ප්‍රවිෂ්ඨ මාර්ගයේ සිට තලාතුඔය නගරය දෙසට දික් අඩි 150ක්	50
03.	තලාතුඔය, මාරස්සන මාර්ගයේ තලාතුඔය මාරස්සන විවිධ සේවා සමුපකාර සමිතිය ඉදිරිපිට වම්පස දිගින් අඩි 150ක්	20
04.	කදාකුල බෝධිය ඉදිරිපිට ප්‍රධාන මාර්ගයේ සිට පින්නගොල්ල මාර්ගයේ දිගින් අඩි 75ක්	15
05.	තලාතුඔය මාරස්සන මාර්ගයේ මුදුණකඩේ හන්දිය ප්‍රාදේශීය සභා උපකාර්යාලයට ප්‍රවිෂ්ඨ මාර්ගයේ සිට ඉදිරියට දිගින් අඩි 05ක්	05
06.	තලාතුඔය මාරස්සන මාර්ගයේ බව්ලාන මාර්ගය ආරම්භක හන්දියේ දකුණුපස දිගින් අඩි 50ක්	25
07.	තලාතුඔය කන්ද හන්දිය මාර්ගයේ රජ මාවත සන්ධි වන කිවුල්ලිද හන්දිය දකුණුපස දිගින් අඩි 75ක්	25
08.	තලාතුඔය මාරස්සන මාර්ගයේ වෙලේගම්මැද්ද හන්දිය දකුණුපස දිගින් අඩි 50ක්	10
09.	මාරස්සන ප්‍රධාන නගරය සිට කන්දේවෙල මාර්ගය ආරම්භක හන්දියේ වම්පස දිගින් අඩි 60ක්	25
10.	මාරස්සන අම්බලම ඉදිරිපිට දිගින් අඩි 50ක්	10
11.	මාරස්සන පස්ගම හන්දිය ඉදිරිපිට දිගින් අඩි 50ක්	25
12.	මාරස්සන පස්ගම මාර්ගයේ වම්පස හේවාවිස්ස ගෝන්නගහමුල ක්‍රීඩාගාරය ඉදිරිපිට දිගින් අඩි 60ක්	05
13.	මාරස්සන පස්ගම මාර්ගයේ වම්පස බව්ලාන හන්දියේ සිට මාරස්සන දෙසට දිගින් අඩි 60ක්	05
14.	පස්ගම හන්දිය නාථ දේවාලයට ප්‍රවිෂ්ඨ මාර්ගයේ සිට මාරස්සන දෙසට දිගින් අඩි 75ක්	10
15.	මාරස්සන නගරයේ ගොවිජන කේන්ද්‍රයට ප්‍රවිෂ්ඨ මාර්ගයේ සිට ඉදිරිපිට දිගින් අඩි 100ක්	30
16.	මාරස්සන කොළඹිස්ස මාර්ගයේ කන්ද හන්දිය මොරගහමුල හන්දිය දකුණුපස දිගින් අඩි 75ක්	05
17.	කන්දහන්දිය කොළඹිස්ස මාර්ගයේ උඩුදෙණිය මුස්ලිම් විද්‍යාලයට ප්‍රවිශ්ඨ හන්දියේ දකුණුපස දිගින් අඩි 30ක්	05
18.	කන්දහන්දිය කොළඹිස්ස මාර්ගයේ වම්පස දෙහල්කඩ හන්දියේ සිට ඉදිරියට දිගින් අඩි 50ක්	05
19.	දෙහල්කඩ කහඹිලියාව මාර්ගය ආරම්භයේ සිට වම්පස දිගින් අඩි 60ක්	05
20.	කන්දහන්දිය කොළඹිස්ස මාර්ගයේ පොත්ගොඩ හන්දිය වම්පස විශාඛා වෙළෙඳසැල ඉදිරිපිට දිගින් අඩි 75ක්	15
21.	කන්දහන්දිය කොළඹිස්ස මාර්ගය නීලවල හන්දිය වම්පස දිගින් අඩි 50ක්	05
22.	කන්දහන්දිය කොළඹිස්ස මාර්ගයේ මුරපොල හන්දිය දකුණු පස දිගින් අඩි 100ක්	05
23.	කොළඹිස්ස හන්දියේ බස් නැවතුම්පල ඉදිරිපිට දිගින් අඩි 75ක්	20
24.	කොළඹිස්ස දෙල්තොට මාර්ගයේ එනසගොල්ල විද්‍යාලය හන්දිය වම්පසින් දිගින් අඩි 100ක්	05

නැවතුම්පලේ අංකය	ත්‍රිරෝද රථ නැවතුම්පලෙහි නම	අනුමත ත්‍රිරෝද රථ සංඛ්‍යාව
25.	උඩුදෙණිය බෝපිටිය හන්දිය ඉදිරිපිට දිගින් අඩි 100ක්	10
26.	උඩුදෙණිය ප්‍රධාන මාර්ගයේ සිට දෙහල්කඩ මාර්ගයට හැරෙන හන්දියේ සිට ඉදිරියට දෙහල්කඩ දෙසට දිගින් අඩි 30ක්	05
27.	මයිලපිටිය ගල්ලිද හන්දිය පැරණි මාර්ගයේ පාලම අසල සිට නගරය දෙසට දිගින් අඩි 150ක්	20
28.	මයිලපිටිය මහා විද්‍යාලයට ප්‍රවිෂ්ඨ මාර්ගයේ සිට නගරය දෙසට දිගින් අඩි 50ක්	05
29.	කන්දහන්දිය අධිකාරිගම මාර්ගයේ වටරවුම සැතපුම් පුවරුවේ සිට හඟුරන්කෙත දෙසට දිගින් අඩි 100ක්	20
30.	කන්දහන්දිය අධිකාරිගම මාර්ගයේ දකුණුපස පල්ලේමාඔය පාලමේ සිට කන්දහන්දිය දිගින් අඩි 60ක්	10
31.	හඟුරන්කෙත ප්‍රධාන මාර්ගයේ සිට කන්දහන්දිය මාරස්සන මාර්ගය ආරම්භයේ වම්පස දිගින් අඩි 150ක්	30
32.	කන්දහන්දිය හඟුරන්කෙත මාර්ගයේ වම්පස මාඔය පාලම සිට කන්දහන්දිය දෙසට දිගින් අඩි 30ක්	05
33.	කන්දහන්දිය හඟුරන්කෙත මාර්ගයේ වම්වස උනුවින්න කනත්ත අසල බස් නැවතුම ඉදිරිපිට අඩි 50ක්	05
34.	බව්ලාන බස් නැවතුම ඉදිරිපිට දිගින් අඩි 30ක්	10
35.	තලාතුඔය මොරගොල්ල අංකෙලිපිටිය හන්දිය වම්පස මඩිත්ත මාර්ගය ආරම්භයේ සිට තලාතුඔය දෙසට දිගින් අඩි	10
36.	තලාතුඔය මොරගොල්ල මාර්ගයේ මහා වංගුව බුදු පිළිමය අසල සිට ඉදිරිපිට දිගින් අඩි 60ක්	10
37.	තලාතුඔය මොරගොල්ල මාර්ගයේ මොරගොල්ල හන්දිය වම්වස බෝක්කුවේ සිට ඉදිරියට දිගින් අඩි 120ක්	10
38.	මොරගොල්ල බෙල්වුඩ් හන්දිය කිරිමැටිය අතුරු මාර්ගය ආරම්භයේ සිට ගලහ දෙසට දිගින් අඩි 100ක්	20
39.	මහනුවර ගලහ ප්‍රධාන මාර්ගයේ වම්පස බෙල්වුඩ් මාර්ගයේ ආරම්භයේ සිට ගලහ දෙසට දිගින් අඩි 30ක්	15
40.	මහනුවර ගලහ ප්‍රධාන මාර්ගයේ දකුණුපස ගලහ අන්නාසිවත්ත මාර්ගයේ සිට ප්‍රාදේශීය සභා පුස්තකාලය ඉදිරිපිට දිගින් අඩි	25
41.	ගලග පුපුරුස්ස පාර	25
42.	ගලහ ප්‍රධාන වීදියේ ආර්කරේ මාර්ගයේ ආරම්භයේ සිට දෙල්තොට දෙසට දිගින් අඩි 150ක්	40
43.	ගලහ දෙල්තොට මාර්ගයේ වම්පස ලංකා බැංකුව ඉදිරිපිට දිගින් අඩි 40ක්	05
44.	දෙල්තොට හේවාහැට පාර ගබඩාගම හන්දියේ සිට නගරය දෙසට දිගින් අඩි 50ක්	40
45.	දෙල්තොට ගලහ මාර්ගයේ හේවාහැට හන්දියේ සිට නගරය දෙසට වම්පස දිගින් අඩි 75ක්	40
46.	දෙල්තොට ප්‍රධාන වීදියේ ප්‍රාදේශීය සභා පොදු වෙළෙඳපල භූමියට ප්‍රවිෂ්ඨ මාර්ගයේ සිට කරගස්කඩ විද්‍යාලය දිගින් අඩි 100ක්	60
47.	දෙල්තොට බෝපිටිය මාර්ගයේ කරග්කඩ විද්‍යාලයට ප්‍රවිෂ්ඨ මාර්ගයේ සිට නගරය දෙසට දිගින් අඩි 75ක්	35
48.	වතුලියද්ද වැවේ කඩේ පාර ආරම්භක හන්දියේ ගාල්තැන්න දෙසට දකුණුපස අඩි 50ක්	10
49.	ගාල්තැන්න පාර බෝගහලන්ද හන්දියේ වම්පස අඩි 50ක්	05
50.	මොනරංගල රෝහල ඉදිරිපිට නැවතුම්පල	10
51.	ගාල්තැන්න පාර තලපිටිය හන්දිය වම්පස අඩි 50ක්	10
52.	ගාල්තැන්න ගොවිසෙවන ඉදිරිපිට ප්‍රාදේශීය සභා මාවතෙන් දකුණුපස අඩි	10
53.	ගාල්තැන්න මාර්ගයේ ලුණුවැල්ල හන්දිය වම්පස අඩි 100ක්	10
54.	රටේමුල්ල ග්‍රාමීය බැංකුව ඉදිරිපිට දකුණුපස අඩි 50ක්	10
55.	වැල්දඔල හන්දිය ඇතුල්ගම දෙසට වම්පස අඩි 100ක්	10
56.	පූලියද්ද හන්දියේ සිට ඇතුල්ගම දෙසට වම්පස අඩි 100ක්	10
57.	කොටබෝගල හන්දියේ සිට රටේමුල්ල දෙසට වම්පස අඩි 150ක්	10
58.	ඇතුල්ගම මහකඩේ ඉදිරිපිට රටේමුල්ල දෙසට වම්පස අඩි 50ක්	20
59.	එලමල්දෙණිය හන්දියේ සිට පනන්වල දෙසට අඩි 50ක්	10
60.	පනන්වල හන්දියේ සිට අංකෙලිපිටිය දෙසට අඩි 100ක්	15
61.	නැහිනිවල පාලම අසල සිට මහනුවර දෙසට මීටර් 50ක්	15
62.	ගලහ පොදු වෙළෙඳපොල ඉදිරිපිට	20
63.	දංගමුව හන්දියේ සිට උඩුදෙණිය පාර	10
64.	අනුරගම හන්දිය	15
65.	බෝපිටිය නගරය වනහපුව හන්දිය	05
66.	වාඩියගොඩ බස් නැවතුම්පළ අසළ	05

නැවතුම්පළේ අංකය	*ත්‍රිරෝද රථ නැවතුම්පළෙහි නම*	*අනුමත ත්‍රිරෝද රථ සංඛ්‍යාව*
67.	මාඋස්සාව හන්දිය	05
68.	ලූල්කදුර සමුපකාරය ඉදිරිපිට	10
69.	පල්ලේගම ග්‍රාමීය බැංකුව ඉදිරිපිට	05
70.	දෙල්තොට නාරංහින්න පරණ රෝහල ඉදිරිපිට	15
71.	හන්තාන 04 කණුව කෝවිල අසල	05
72.	හන්තාන 4 කණුව එඩරුමැටිය හන්දිය අසල	05
73.	දමුණුගොල්ල පොදු ළිද අසල	05

12 - 879/20

මොරටුව මහ නගර සභාව

2019 වර්ෂයට බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම

1979 අංක 42 දරන සංශෝධිත පනතින් සංශෝධනය කරන ලද 1947 අංක 29 දරන මහ නගර සභා ආඥා පනතින් මොරටුව මහ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2018.11.01 වැනි දින මාසික සභා රැස්වීමේදී පනවන ලද 6 (9) 48 යටතේ පහත සඳහන් යෝජනා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. 2019 වර්ෂය සඳහා බදු/බලපත්‍ර ගාස්තු 2019 මාර්තු 31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු බවද වැඩිදුරටත් දැනුම් දෙමි.

ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු,
නගරාධිපති,
මොරටුව මහ නගර සභාව.

2018 නොවැම්බර් මස 30 වැනි දින,
මොරටුව මහ නරග සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1979 අංක 42 දරන සංශෝධිත පනතින් සංශෝධනය කරන ලද 1979 අංක 29 දරන මහ නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරිය 247) "අ", "ආ", "ඇ", "ඉ", ප්‍රකාරව මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන්ම උපලේඛන අංක I, II, III, IV, V, VI, VII සඳහන් බලපත්‍ර ගාස්තුවක්/බද්දක් පනවා අයකළ යුතු යැයි යෝජනා කරන්නීය.

උපලේඛනය - අංක I

බලපත්‍ර ගාස්තු අය කිරීම - 247 (අ) වගන්තිය

බලපත්‍ර ගාස්තු වක්‍රය :

ස්ථානයේ වාර්ෂික නක්සේරු වටිනාකම	*බලපත්‍ර ගාස්තු* රු. ශත.
රු. 100 - රු.6,500	700 0
රු. 6,501 - රු. 10,000	1,500 0
රු. 10,001 - රු. 25,000	3,000 0
රු. 25,000 ට වැඩි	5,000 0

ඉහත ගාස්තුවලට අමතරව රජය විසින් පනවන ලද බදු අය කරනු ලැබේ.

අනු. අංකය	වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය
1.	හෝටලයක් පවත්වාගෙන යාම
2.	ඌරන් හෝ එළුවන් දහයක් හෝ ඊට වැඩි ගණනක් සඳහා ගාලක් හෝ මඩුවක් පවත්වාගෙන යාම
3.	උළු, කොන්ක්‍රීට්, පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
4.	විෂබීජ නාශක නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
5.	ටයර් නැවත පිරවීමේ හෝ කට්ට කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
6.	කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
7.	වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
8.	යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන රෙදි මෝලක් පවත්වාගෙන යාම
9.	රබර් භාණ්ඩ නිෂ්පාදනය හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
10.	පොලිතින් සැලෝලයිට් හෝ පර්ස්පෙක්ට් නිෂ්පාදනය හෝ වර්ග කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
11.	පොල්තෙල් ගබඩා කිරීම හා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
12.	රෙදි නිෂ්පාදනය හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
13.	රසකැවිලි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
14.	ලී පෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
15.	සබන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
16.	ගැල්වනයිස් තහඩු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
17.	රූපලාවන්‍ය හෝ මනාලියන් හැඩගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
18.	කේටරින් සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
19.	ආගන්තුක නිවාසයක් පවත්වාගෙන යාම
20.	සත්ව ගොවිපලක් පවත්වාගෙන යාම
21.	තීන්ත හෝ වාර්නිෂ් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
22.	විසිරි පින්තාරු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
23.	යන්ත්‍රානුසාරයෙන් ඇඳුම් මසන ස්ථානයක් පවත්වාගෙන යාම (ඇඟළුම් කර්මාන්තශාලාව)
24.	තේ කඩයක් පවත්වාගෙන යාම
25.	බතික් රෙදි නිෂ්පාදනය කිරීමේ හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
26.	රෙදි මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
27.	විදුරු භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
28.	තේ ගබඩා කිරීම හා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
29.	ගබඩාවක් පවත්වාගෙන යාම
30.	සුවඳ විලවුන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
31.	විනාකිරි නිෂ්පාදනය හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
32.	වෛද්‍ය පරීක්ෂණාගාරයක් පවත්වාගෙන යාම
33.	ෆයිබර් ග්ලාස් බෝට්ටු හා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
34.	ගෙබිම පොලිෂ් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
35.	පොලිෆෝම් කුෂන් නිෂ්පාදනය/ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
36.	ෆ්ලාස්ටර් ඔෆ් ෆැරිස් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37.	රෙදි ඩයි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
38.	සයිලන්සර් සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
39.	සමාජ ශාලාවක් පවත්වාගෙන යාම
40.	රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම හා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
41.	ඇඹරුම්හලක් පවත්වාගෙන යාම
42.	ලේත් මැෂින් වැඩපල
43.	සුපිරි වෙළඳ සංකීර්ණය තුළ ෆාමසියක් පවත්වාගෙන යාම
44.	සිනමාශාලාවක් පවත්වාගෙන යාම
45.	විදුලි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
46.	බීම පැකට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47.	විදුලි නාම පුවරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

අනු. අංකය	වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය
48.	නූල් නිපදවීමේ හා වර්ණ ගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49.	ඉලාස්ටික් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
50.	රේස් බයි රේස් ස්ථානයක් පවත්වාගෙන යාම
51.	බෝල මේසයක් පවත්වාගෙන යාම (බිලියඩ්)
52.	ඇස් කණ්නාඩි නිෂ්පාදනය හා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53.	සම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54.	එසෙන්ස් වර්ග නිෂ්පාදනය හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55.	කිරිහලක් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
56.	දන්ත සායනයක් පවත්වාගෙන යාම
57.	සත්ත්ව සායනයක් පවත්වාගෙන යාම
58.	ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
59.	බටහිර බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
60.	පොලිතීන් පටල නිෂ්පානදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61.	ගරාජයක් හැර යන්ත්‍රානුසාරයෙන් විද්‍යුත් ලෝහාලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62.	නේවාසිකාගාරයක් පවත්වාගෙන යාම
63.	බේකරියක් පවත්වාගෙන යාම
64.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම
65.	ජලය පිරිසිදු කර බෝතල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66.	වාෂ්ප බලයෙන්, ජල බලයෙන්, ලී පදම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
67.	මහාපරිමාණයේ වඩු කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම
68.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරව ලී මෝලක් පවත්වාගෙන යාම
69.	බැන්සෝ එකක් සඳහා (හැඩ කපන)
70.	ගෘහ භාණ්ඩ පොලිෂ් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
71.	රාමු කියත් (වෙහෙරාන්)
72.	පැන්ට්‍රි කබඩ් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
73.	ඉරූ දූව සහිත ලී වෙළඳසැලක් පවත්වාගෙන යාම
74.	දූව කොටස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
75.	ලී ගෘහ භණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

මෙයට සමගාමීව වඩුමඩු සඳහා බලපත්‍ර ගාස්තු පහත සඳහන් පරිදි 2019 වර්ෂය සඳහා අය කරනු ලැබේ.

	ගාස්තුව රු. ශත
වඩු මඩුව මෝටර් රහිත	250 00
වඩු මඩුව මෝටර් 01	275 00
වඩු මුඩව මෝටර් 02	300 00
වඩු මඩුව මෝටර් 03	325 00
වඩු මඩුව මෝටර් 03 ට වැඩි	700 00
වඩු මඩුවක් බැන්ඕ එකක් සමග පවත්වාගෙන යාම	1,000 00
අත්බංකු රෝද කියත් රෝල බංකු රෝද කියත්	3,000 00

76. ශීතකළ මස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම හෝ මස් වෙළඳාම

I ශීතකළ කුකුල් මස් වෙළඳාම සඳහා රු. 10,000 00
II ශීතකළ කුකුල් මස්, එළු මස්, ඌරු මස්, හා හරක් මස් වෙළඳාම සඳහා රු. 15,000 00
III සුපිරි වෙළඳසැල් හි ශීතකළ මස් වෙළඳාම සඳහා රු. 100,000 00

ඉහත ගාස්තුවලට අමතරව රජය විසින් පනවන ලද බදු අය කරනු ලැබේ.

මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර, (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්ය සඳහා පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1 මිනිරන් වර්ග ගබඩා කිරීම හා සකස් කිරීම
2 මිනිරන් ගබඩා කර තැබීම
3 පොහොර නිෂ්පාදනය
4 පොහොර ගබඩා කර තැබීම
5 හම් ගබඩාකර තැබීම
6 උම්බලකඩ හොඬර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
7 කුකුළු වෙළඳපොළක් පවත්වාගෙන යාම
8 කලුගල් කැඩීම සහ කබොක් කැපීම
9 බොරලු හැරීම
10 අශ්වයින් හෝ ගවයන් සඳහා ඉස්තාලයක්, වෙළඳපළක්, ගාළක් හෝ ලැයිමක් තබා ගැනීම
11 පශු ගිලන් හලක් පවත්වාගෙන යාම
12 රබර් සකස් කිරීම
13 පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබුණ ගෝනි ගබඩා කිරීම, ශුද්ධ කිරීම, අලුත් වැඩියා කිරීම, හෝ ඒවායේ දූලි ඉවත් කිරීම.
14 පුවක් සකස් කිරීම
15 තලාතූ මිනිරන් සකස් කිරීම
16 බැටළුවන් හෝ එළුවන් හෝ ඒ දෙවර්ගයම හෝ 10 දෙනෙකුට වඩා ගාල් කොට තැබීම සඳහා වූ මඩුවක් හෝ ගාලක් තබා ගැනීම
17 උළු, කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
18 හුණු ගබඩා කොට තැබීම
19 බොම්බයි ලූනු හොඬර 5 කට වඩා ගබඩා කොට තැබීම
20 අර්තාපල් හොඬර 5 කට වඩා ගබඩා කොට තැබීම
21 පොල්කටු අඟුරු හොඬරයකට වඩා ගබඩා කොට තැබීම
22 කුරුඳු, කරදමුංගු හෝ කෙඳි, ගෙන්දගම් දුම් ගස්සා සකස් කිරීම
23 පරණ ලෝහ ගබඩා කර තැබීම
24 සිමෙන්ති හොඬර 25 කට වඩා ගබඩා කොට තැබීම
25 කරවල හොඬර 10 කට වඩා ගබඩා කොට තැබීම
26 ලුණු දැමූ මාළු හොඬර 10 කට වඩා ගබඩා කොට තැබීම
27 රබර් ඔට්ටපාලු සුන්බුන් ඇඹරීම හෝ චේලීම
28 ට්‍රංක් පෙට්ටි නිෂ්පාදනය
29 මරා සකස් කළ කුකුළු ආදී සතුන් විකිණීම සඳහා කඩයක් පවත්වාගෙන යාම
30 ගම් වර්ග නිෂ්පාදනය
31 විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
32 බැටරි පුරවනු ලබන්නාවූ හෝ බැටරි ගබඩා කොට තබනු ලබන්නාවූ ආයතනයක් පවත්වාගෙයන යාම
33 ටයර් ප්‍රතිසංස්කරණය කරනු ලබන්නාවූ හෝ කට්ට කැපීම කරනු ලබන්නාවූ ආයතනයක් පවත්වාගෙන යාම
34 ටයර් හෝ ට්‍යුබ් වොල්කනයිස් කරන ආයතනයක් පවත්වාගෙන යාම
35 හිස් බෝතල් 100කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
36 කුරුඳු පොතු හොඬරයකට වඩා ගබඩා කොට තැබීම
37 කොකෝවා හොඬර 10කට වඩා ගබඩා කොට තැබීම
38 මිනී පෙට්ටි සෑදීම හෝ ගබඩා කොට තැබීම
39 ගෘහ භාණ්ඩ සෑදීම හෝ ගබඩා කොට තැබීම
40 මැණික් වෙළෙන්දන් විසින් මැණික් කැපීම හා ඔපදැමීම
41 බලපත්‍ර ලත් වෙළන්දන් විසින් රබර් ගබඩා කොට තැබීම
42 චේවැල් බඩු සෑදීම හෝ ගබඩා කොට තැබීම
43 කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කොට තැබීම
44 යාන්ත්‍රික බලය යොදාගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
45 පිටි හෝ කුළුබඩු ඇඹරීම
46 පුන්නක්කු හැර, සත්ත්ව ආහාර හොඬර 20 කට වඩා ගබඩා කොට තැබීම සත්ව ආහාර සඳහා හැර වෙනත් කාර්යයන් සඳහා ධන්‍ය ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම, එහෙත් සමුපකාර සමිති විසින් ගබඩා කොට තබා ගන්නා එවැනි ධාන්‍ය මෙම නියමයට යටත් නොවේ.

47 රබර් භාණ්ඩ නිෂ්පාදනය
48 මෝර වරල් සකස් කිරීම හා ගබඩා කොට තැබීම
49 යන්ත්‍රානුසාරයෙන් ඇටකටු ඇඹීරීම
50 පුන්නක්කු ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
51 පොලිතීන්, සෙලියුලොයිඩ් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය, නිපදවීම සහ ගබඩා කර තැබීම
52 ඇසිඩ් ගැලුම් 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම
53 කපුරු නිෂ්පාදනය
54 බුට් සපත්තු සහ පාවහන් නිෂ්පාදනය
55 ඉටිපන්දම් නිෂ්පාදනය

මෙහි පහත සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර, (252 වැනි අධිකාරිය වන) මහ නගර සභා ආඥාපනතේ 147 වන වගන්තියේ කාර්ය සඳහා අන්තරාදායක කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1 වාෂ්ප, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දැව හෝ ලී ඉරීම
2 සිසිල් බීම නිෂ්පාදනය
3 කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම
4 යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය
5 යන්ත්‍රානුසාරයෙන් තලතෙල් නිෂ්පාදනය
6 තෙල් හිඳීම සඳහා සෙක්කුවක් හෝ අත් මෝලක් තබා ගැනීම
7 කෙදි නිෂ්පාදනය හෝ ගබඩා කොට තැබීම
8 ගිනි පෙට්ටි නිෂ්පාදනය
9 ඉඹුල් පුළුන් ගබඩා කොට තැබීම
10 පොල්තෙල් ගැලුම් 50 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
11 මැතිලේටඩ් ස්ප්‍රිතු ගබඩා කොට තැබීම
12 ඇසිටිලින් නිෂ්පාදනය
13 උළු 500 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
14 ගඩොල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
15 කබොක් ගල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
16 සිගරට් නිෂ්පාදනය
17 බීඩී නිෂ්පාදනය
18 ටීන්ත හෝ වාර්නිෂ් හොණ්ඩර 5කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
19 ලී පෙට්ටි හොණ්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
20 කොහු නිෂ්පාදනය
21 පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබුණු ගෝනි හැර වෙනත් ගෝනි 100 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
22 පාවිච්චිකළ රබර් ටයර් හෝ ටියුබ් 150කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
23 රසකැවිලි නිෂ්පාදනය
24 පොල්කටු අඟුරු හැර වෙනත් අඟුරු හොණ්ඩරයකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
25 බෝට්ටු හෝ බත්තල් සෑදීම
26 ලී පෙට්ටි සෑදීම
27 ඔක්සිජන් සහ වෑල්ඩින් වැඩ කරනු ලබන්නාවූ මෝටර් වාහන අලුත් වැඩියා කරන්නාවුද ගරාජයක් නොවන්නාවූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
28 මෝටර් වාහන අලුත්වැඩියා කරන්නාවූ ද යකඩ සහ ලෝහ වැඩ කරනු ලබන්නාවූ ද ගරාජයක් නොවන්නාවූ වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
29 මෝටර් වාහන අලුත්වැඩියා කරන ආයතනයක් පවත්වාගෙන යාම
30 මෝටර් වාහන සර්විස් කරන ආයතනයක් පවත්වාගෙන යාම
31 යාන්ත්‍රික බලය යොදා ගනු ලබන්නාවූ මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
32 අතින් හෝ පා පොලු වලින් ක්‍රියා කරවන යන්ත්‍රයක් පාවිච්චි කෙරෙන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
33 පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තැබීම

34 පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ලීටර් 54.5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
35 ගෙන්දගම් සහ/ හෝ ගෙන්දගම් කුඩු කිලෝ ග්‍රෑම් 50 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
36 තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය
37 100කට අධික ප්‍රමාණයක් පතුරොම් ගබඩා කර තැබීම
38 කොහු හෝ පුළුන් මෙට්ට හෝ කොට්ට හෝ කුෂන් නිෂ්පාදනය සහ/ හෝ ගබඩා කර තැබීම
39 අලුත් ටයර් හෝ ටියුබ් 150 කට අධික ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
40 පාවිච්චි කළ කඩදාසි කිලෝග්‍රෑම් 250 කට අධික ප්‍රමාණයක් ගබඩා කර තැබීම
41 ස්ප්‍රේ පේන්ටිං වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම
42 යාන්ත්‍රික ශීතකරණය සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
43 යාන්ත්‍රික බලය පාවිච්චි කරනු ලබන්නාවූ ද ඇඳුම් මැසීම කරනු ලබන්නාවූ ද ආයතනයක් පවත්වාගෙන යාම
44 කමිස කොලර් සහ කමිස අත් රැළි දමන ආයතනයක් පවත්වාගෙන යාම

මෙහි පහත සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර, (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 147 වන වගන්තියේ කාර්ය සඳහා, අන්තරාදායක සහ පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1 ඩ්‍රයික්ලීන් වැඩ කරන ආයතනයක් පවත්වාගෙන යාම
2 යාන්ත්‍රික බලය පාවිච්චි නොකරන්නාවූ ද, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ, ක්‍රෝමියම් ආලේප කිරීම, රන් ආලේප කිරීම, රිදී ආලේප කිරීම හෝ තඹ ආලේප කිරීම කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම
3 යාන්ත්‍රික බලය පාවිච්චි කරන්නාවූ ද, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩකරනු ලබන්නාවූ ද ගරාජයක් නොවන්නාවූ ආයතනයක් පවත්වාගෙන යාම
4 ගල් අඟුරු ගෑස් නිෂ්පාදනය සහ ගබඩා කිරීම
5 කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදනය
6 අශුද්ධ ලෝහ උණු කිරීම
7 ගිණිකෙළි භාණ්ඩ ගබඩා කිරීම
8 කිලෝග්‍රෑම් දෙකකට අධික ප්‍රමාණයකින් වෙඩි බෙහෙත් සහ පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීම
9 ගම්, ඉටි හෝ දුම්මල (රෙසින්) ගබඩා කිරීම
10 බිම ඔප දමන පොලිෂ් නිෂ්පාදනය
11 තාර පෙරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
12 ශීතරකණ අලුත්වැඩියා කිරීම, රීකන්ඩිෂන් කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
13 මෝටර් කාර් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
14 ස්කූටර් හෝ මෝටර් සයිකල් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
15 පුපුරන ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය සහ පොහොර විකිණීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම

බලපත්‍රය නිකුත්කර ඇත්තේ යම් ව්‍යාපාරයක් සඳහා ද ඒ ව්‍යාපාරය හැර වෙනත් කිසිම ව්‍යාපාරයක්, බලපත්‍රලත් ස්ථානයෙහි පවත්වාගෙන යාමට කිසිම බලපත්‍රලාභියකු විසින් ඉඩ නොදිය යුතු ය.

මෙහි පහත සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර, (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 147 වන වගන්තියේ කාර්ය සඳහා,අප්‍රසන්න හා අන්තරාදායක වෙළෙඳාම් හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1 රබර් නිවාරණය කිරීම
2 පෝර, හුණු හෝ මිනිරන් බහා තැබූ ගෝනි මළු ගබඩා කිරීම, කුඩු පිස දැමීම, ශුද්ධ කිරීම හෝ අළුත්වැඩියා කිරීම
3 තලාතු මිනිරන් නිවාරණය කිරීම
4 හුණු ගබඩා කිරීම
5 කිලෝග්‍රෑම් 50ට වැඩියෙන් පොල්කටු අඟුරු ගබඩා කිරීම
6 ගෙන්දගම් දුම් භාවිතා කරමින් කුරුඳු, කරදමුංගු හෝ කෙඳි නිවාරණය කිරීම
7 ඔට්ටුපාල ඇඹරීම හෝ වේළීම
8 බැටරිචාර්ජ් කරනු ලබන හෝ ගබඩා කරනු ලබන, යාන්ත්‍රික බලය භාවිතයට ගන්නා ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම

9 ටියුබ් හෝ ටයර් වොල්කනයිස් කරන, යාන්ත්‍රික බලය යොදා නොගන්නා ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
10 කිලෝග්‍රෑම් 50ට වැඩියෙන් කුරුඳු ගබඩා කිරීම
11 කිලෝග්‍රෑම් 500ට වැඩියෙන් කොකෝවා ගබඩා කිරීම
12 මිනි පෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
13 දැව භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
14 බලපත්‍රය ලත් වෙළෙන්දන් විසින් රබර් ගබඩා කිරීම
15 වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
16 යාන්ත්‍රික බලය භාවිතා කරන්නාවූ රෙදි වියන කම්හලක් පවත්වාගෙන යාම
17 පිටි හෝ තුනපහ වර්ග කෙටීම
18 රබර් බඩු නිෂ්පාදනය කිරීම
19 දුම්, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දැව හෝ ලී ඉරීම
20 කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම
21 යාන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය
22 යන්ත්‍රානුසාරයෙන් තලතෙල් නිෂ්පාදනය
23 තෙල් සිදීම සඳහා සෙක්කුවක් හෝ අතින් ක්‍රියාකරවන මෝලක් පවත්වාගෙන යාම
24 කෙඳි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
25 ගිනිපෙට්ටි නිෂ්පාදනය
26 පුළුන් ගබඩා කිරීම
27 ලීටර් 227 1/2 ට වැඩියෙන් පොල්තෙල් ගබඩා කිරීම
28 මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩා කිරීම
29 ඇසිටිලින් නිෂ්පාදනය
30 සිගරට් නිෂ්පාදනය
31 බීඩි නිෂ්පාදනය
32 කිලෝග්‍රෑම් 250 ට වැඩියෙන් තීන්ත හෝ වාර්නිෂ් ගබඩා කිරීම
33 කිලෝග්‍රෑම් 250 ට වැඩියෙන් ලී පෙට්ටි ගබඩා කිරීම
34 කොහු නිෂ්පාදනය
35 රසකැවිලි නිෂ්පාදනය
36 පෝර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි මළු හැර, කිලෝග්‍රෑම් 100ට වැඩියෙන් වෙනත් ගෝනි මළු ගබඩා කිරීම
37 පාවිච්චි කළ රබර් ටයර්, හෝ ටියුබ් 150 ට වැඩියෙන් ගබඩා කිරීම
38 පොල්කටු අඟුරු හැර වෙනත් අඟුරු කිලෝග්‍රෑම් 50 ට වැඩියෙන් ගබඩා කිරීම
39 ලී පෙට්ටි නිෂ්පාදනය
40 යාන්ත්‍රික බලය පාවිච්චි කරන, ඔක්සිජන් සහ වෙල්ඩින් වැඩ කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
41 යාන්ත්‍රික බලය පාවිච්චි කරන, යකඩ හෝ ලෝහ වැඩ කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
42 යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් මෝටර් වාහන අළුත්වැඩියා කරන හෝ සර්විස් කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
43 යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් මෝටර් වාහන සර්විස් කරන හෝ අළුත්වැඩියා කරන ගරාජයක් හැර වෙනත් ස්ථානයක් පවත්වාගෙන යාම
44 යාන්ත්‍රික බලය පාවිච්චි කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
45 අත් යන්ත්‍ර හෝ පාගන යන්ත්‍ර පාවිච්චි කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
46 පරණ ඇඳුම් ගබඩා කිරීම
47 ලීටර් 54 ට වැඩියෙන් පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ගබඩා කිරීම පිණිස අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
48 ඇඳුම් ඩ්‍රයික්ලීන් කරන ආයතනයක් පවත්වාගෙන යාම
49 යාන්ත්‍රික බලය පාවිච්චියට නොගෙන විද්‍යුත් ලෝහාලේපන කිරීම, ක්‍රෝමියන් ආලේපනය කිරීම, රන් ආලේපනය කිරීම, රිදී ආලේපනය
50 යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් විද්‍යුත් ලෝහාලේපනය කිරීම, ක්‍රෝමියම් ආලේපනය කිරීම
51 මෝටර් වාහන අළුත්වැඩියා කරන ගරාජයක් සහ ආර්ක් වේල්ඩිං වැඩ කිරීම
52 කවර හෝ වර්ගයක උපකරණයක් ක්‍රියාකරවීම සඳහා විදුලි බලය හෝ යාන්ත්‍රික බලය භාවිත කෙරෙන යම් ස්ථානයක් පවත්වාගෙන යාම

53 කිලෝග්‍රෑම්ස් 50 ට වැඩියෙන් ඕනෑම වර්ගයක ප්ලාස්ටික් බඩු තබා ගැනීම
54 සියලු වර්ගයේ ප්ලාස්ටික් බඩු නිෂ්පාදනය කිරීම
55 කිලෝග්‍රෑම්ස් 50ට වැඩියෙන් කවර හෝ වර්ගයක පොලිතින් බඩු තබා ගැනීම
56 සියලු වර්ගවල පොලිතින් බඩු නිෂ්පාදනය කිරීම
57 කොහු නිෂ්පාදනය හා තබා ගැනීම
58 කිලෝග්‍රෑම්ස් 1000ට වැඩියෙන් තේ කොළ තබා ගැනීම
59 කිලෝග්‍රෑම්ස් 250ට වැඩියෙන් කඩදාසි සහ/ හෝ කවර වර්ගයක හෝ කඩදාසි බඩු ගබඩා කිරීම
60 ඇඟළුම් නිෂ්පාදනය
61 බත් කඩ
62 රසායන ද්‍රව්‍ය
63 කිලෝග්‍රෑම්ස් 50ට වැඩි සියලු වර්ගවල ගිණිකෙලි භාණ්ඩ තබා ගැනීම
64 කිලෝග්‍රෑම්ස් 150ට වැඩියෙන් එල්.පී.ජී.(LP.G) සිලින්ඩර් ගබඩා කිරීම
65 හිස් වැසුම් සහ තොප්පි නිෂ්පාදනය
66 කිලෝග්‍රෑම්ස් 100 ට වැඩියෙන් රබර් බඩු (සියලු වර්ගවල) ගබඩා කිරීම
67 කිලෝග්‍රෑම්ස් 250 ට වැඩියෙන් කපාපු පොල් ගබඩා කිරීම
68 කිලෝග්‍රෑම්ස් 250 ට වැඩියෙන් රබර් ඇට ගබඩා කිරීම
69 ලීටර් 91 ට වැඩියෙන් ඇසිඩ් ගබඩා කිරීම
70 එකවරකට සේවානියුක්තිකයින් 25 ට වැඩියෙන් සේවයෙහි නියුක්ත කරනු ලබන යම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
71 ද්‍රව ඛණිජ තෙල් ගෑස් ඇතුළුව ඛණිජතෙල් නිෂ්පාදන ගබඩා කිරීම
72 පතරොම් සහ වෙඩි බෙහෙත්

1968 අංක 14 දරන සංචාරක පනතේ කාර්යයන් සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගත ලැබූ ඇත්තාවූ හෝටලයක, ආපන ශාලාවක හෝ නවාතැන් පොළක පෙර වර්ෂයේ සියලු ලැබීම් මත 01%ක ගාස්තුවක් බලපත්‍ර ගාස්තු ලෙස අයකරනු ලැබේ.

අදාළ වර්ෂයේ ජූනි මස 30ට පෙර බලපත්‍රය ලබාගත යුතු ය.

උපලේඛනය - අංක II

කර්මාන්ත විෂයෙහි බදු අය කිරීම - 247 (ආ) වගන්තිය

බදු ගාස්තු චක්‍රය :

ස්ථානයේ වාර්ෂික තක්සේරු වටිනාකම	*අයකල යුතු මුදල බදු මුදල රු. ශත*
රු. 100 - රු.6,500	700.00
රු. 6,501 - රු.10,000	1,500.00
රු. 10,001 - රු.25,000	3,000.00
රු.25,000 ට වැඩි	5,000.00

අනු. අංකය	*වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය*
1	සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යාම
2	රෙදිපිළි වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
3	විදුලි උපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
4	විදුලි උපකරණ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
5	මෝටර් රථ අමතර කොටස් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
6	ශීතකරණ විකිණීමේ හෝ ආනයනය කර ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
7	රූපවාහිනී විකිණීමේ හෝ ආනයනය කර ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
8	වීදුරු භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

අනු. අංකය	වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය
9	කමිස, කරපටි හා කමිස අත් සකස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
10	බටහිර ඖෂධ වර්ග වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
11	ධාන්‍ය වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
12	පරිගණක එම්බ්‍රොයිඩර් කර්මාන්තයක් පවත්වාගෙන යාම
13	සපත්තු ලේස්, කෝඩ් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
14	පාපැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
15	මෝටර් සයිකල් හෝ ස්කූටර් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
16	චීන චට්ටි භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
17	පාවහන් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
18	පාවහන් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
19	සම් භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
20	ඉලෙක්ට්‍රෝනික් භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
21	ආහාර පිසීම සඳහා ගෑස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
22	වාහන ගෑස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
23	දිවා සුරාකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
24	බීඩි, සුරුට්ටු, සිගරට් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
25	පාවිච්චි කරන ලද ඇඳුම් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ස්වයං රැකියා)
26	මැණික් කැපීමේ හා පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
27	ඉවතලන නූල් හා ජුට් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
28	අපනයන හෝ ආනයන කිරීමේ වැඩ කටයුතු සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
29	දර මඩුවක් පවත්වාගෙන යාම
30	නූල් නිෂ්පාදනය කිරීමේ හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
31	ග්‍රොසරියක් පවත්වාගෙන යාම
32	මහන මැෂින් ගෙන්වීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
33	පරිගණක යන්ත්‍ර ගෙන්වීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
34	පුටු වීවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
35	ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
36	යකඩ බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37	තොග වශයෙන් සීනි ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
38	ශබ්ද විකාශන යන්ත්‍ර අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
39	අලුත් ටයර් ටියුබ් හා පුරවන ලද ටයර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
40	පරණ ටයර් ටියුබ් හා පුරවන ලද ටයර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
41	ප්‍රචාරක සේවා ආයතනයක් පවත්වාගෙන යාම
42	සිගරට් වෙළඳාම් කිරීමේ ඒජන්සියක් පවත්වාගෙන යාම
43	මසා නිමකළ ඇඳුම් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
44	වානිජමය කාර්යයන් සඳහා කාර්යාලයක් පවත්වාගෙන යාම
45	ඔරලෝසු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
46	විදේශ රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම
47	ගෘහ උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48	සුරතලය සඳහා ඇතිකරන මසුන් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49	සුපිරි වෙළඳ සංකීර්ණය තුළ මුල්‍ය ආයතනයක් පවත්වාගෙන යාම
50	විශේෂඥ වෛද්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
51	නියෝජිත (ඒජන්සි) තැපැල් හලක් පවත්වාගෙන යාම
52	වානේ හෝ යකඩ කම්බිවලින් තැනූ විවිධ උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53	ආයුර්වේද ඖෂධ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54	පොත්පත් හා ලිපිද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55	අකුරු කෙටීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

අනු. අංකය	වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය
56	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
57	බුමුතුරුණු හා ෆෝමිකා ෂීට් විකිණීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58	කේක් සෑදීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59	ලාම්පු ආවරණ නිෂ්පාදනය හෝ විකිණීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60	තොග වශයෙන් පිටි ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61	විෂබීජනාශක ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62	බීජ වර්ග හා පැල වර්ග වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
63	සංචාරක සේවා ආයතනයක් පවත්වාගෙන යාම
64	ඡායා පිටපත් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65	බේකරිවලට අවශ්‍ය ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66	ඉන්ජෙක්ටර් පොම්ප සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
67	උත්සව සඳහා භාණ්ඩ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
68	දුරකථන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
69	ගුවන්විදුලි අමතර කොටස් වෙළඳාම් හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
70	පිඟන් බඩු වෙළඳාම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
71	තෑගි භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
72	දූන්වීම් පුවරු සකස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
73	උත්සවශාලාවක් පවත්වාගෙන යාම
74	විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
75	ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
76	සැනැප් කඩදාසි හෝ පරණ කඩදාසි බෝතල්, ගෝනි, පරණ යකඩ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
77	කුෂන් මෙට්ට හා කුෂන් භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
78	ගොඩනැගිලි ද්‍රව්‍ය, නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
79	කඩදාසි බෑග් නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
80	කෞතුක භාණ්ඩ වෙළඳාම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
81	තොග වශයෙන් වෙළඳාම් සඳහා දියලුණු ගබඩා කිරීම හෝ ලුණු කුඩු පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
82	මල් ශාලාවක් පවත්වාගෙන යාම (ස්වභාවික)
83	කෘතිම මල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
84	අවමංගල්‍ය භාණ්ඩ වෙළඳාම හා කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
85	අත්යන්ත්‍ර මගින් නිෂ්පාදිත රෙදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
86	වීඩියෝ කැසට්පට හෝ වීසීඩී තැටි වෙළඳාම හෝ කුළියට දීමේ, පටිගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
87	පොත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88	හඳුන්කුරු නිෂ්පාදනය හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
89	සංගීත භාණ්ඩ වෙළඳාම හා කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
90	පුවත්පත් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
91	හිස් බැරල් ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
92	බැංකුවක් මගින් පහත සඳහන් එක් කාර්යයක් වෙනුවෙන් රු.5,000ක් බැගින් ගාස්තුවක් අය කිරීම I. ස්ථාවර හෝ ඉතිරිකිරීමේ ගිණුම් පැවැත්වීම II. ජංගම ගිණුම් පැවැත්වීම III. ක්ෂණිකව මුදල් ලබා ගැනීමේ කවුළුවක් පැවැත්වීම IV. රන් භාණ්ඩ උකස් ගැනීම V. වෙන්දේසි කටයුතු කිරීම VI. විදේශ මුදල් මාරු කිරීම
93	රක්ෂණ ආයතනයක් මගින් පහත සඳහන් එක් කාර්යයක් වෙනුවෙන් රු. 5,000ක් බැගින් ගාස්තුවක් අය කිරීම I. ජීවිත රක්ෂණය II. දේපළ රක්ෂණය III. රථවාහන රක්ෂණය

අනු. අංකය	වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය
94	ෆිනෑන්ස් ආයතනයක් මගින් පහත සඳහන් එක් කාර්යයක් වෙනුවෙන් රු. 5,000ක් බැගින් ගාස්තුවක් අය කිරීම
	I. දේපළ මිලට ගැනීම
	II. දේපළ විකිණීම
	III. පාරිභෝගික තැන්පත් ගිණුම් පැවැත්වීම
	IV. බදු ඔප්පු යටතේ ණය නිකුත් කිරීම
	V. රන් භාණ්ඩ උකස් ගැනීම
95	බිත්තර වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
96	සිහිවටන නිෂ්පාදනය කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
97	පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
98	පැණි ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
99	ප්‍රචාරක දැන්වීම් අතින් සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
100	විදුලි කාර්මික ආයතනයක් පවත්වාගෙන යාම
101	පොල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
102	ආයුර්වේද ඖෂධ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (සිල්ලරට ස්වයං රැකියා හැර)
103	ට්‍රේලර් සාප්පුවක් පවත්වාගෙන යාම
104	කුලියට ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
105	බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
106	හැලි වලං හෝ කොහු භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
107	පළතුරු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
108	ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
109	කඩල වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
110	එළවළු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
111	රබර් සීල් හෝ බ්ලොක් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
112	කුඩ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
113	මල් පෝච්චි හෝ විවිධ මල්පැල වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
114	පිත්තල භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
115	කම්හල් වැඩපලක් පවත්වාගෙන යාම
116	පරිගණක යන්ත්‍ර පිළිබඳ පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
117	ගෘහ නිර්මාණ ශිල්පය හෝ සැලසුම් ආයතනයක් පවත්වාගෙන යාම
118	රිය පැදවීම පුහුණු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
119	හාල් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
120	ස්වර්ණාභරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
121	යන්ත්‍රෝපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
122	කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
123	බුලත්, ලනු, පැදුරු, වලං, සුළු සාප්පු බඩු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
124	පුවත්පත් ඒජන්සියක් පවත්වාගෙන යාම
125	නල ලිං ඉදිකිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
126	කරවල වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
127	ඇලුමිනියම්, ප්ලාස්ටික්, ලෝහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
128	යතුරුපැදි හා ත්‍රිරෝද රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
129	පරණ ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
130	සුපිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම
131	ආරක්ෂක සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
132	රථ අංගනයක් පවත්වාගෙන යාම
133	කර්මාන්තශාලා විද්‍යුත් විදුලි උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
134	මහන මැෂින් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
135	මහන මැෂින් අමතර කොටස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

අනු. අංකය	වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය
136	රෙදිපිළි ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම
137	යකඩ හා වානේ වැඩපලක් පවත්වාගෙන යාම
138	විදුලි බල මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
139	කැබ් සර්විස් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
140	රථ වාහන වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
141	පෝලිෆෝම් කුෂන් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
142	මෝටර් සයිකල් හෝ ස්කූටර් එකලස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
143	බීඩිං, මෝල්ඩිං පටි නිෂ්පාදනය/ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
144	ෆෝමිකා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
145	තුනී ලෑලි (MDF) කර්මාන්තය, වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
146	රේස්බුකි (රේස් ඔට්ටුපල) ස්ථානයක් පවත්වාගෙන යාම
147	බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
148	ජාත්‍යන්තර පාසලක් පවත්වාගෙන යාම
149	පෙර පාසලක් පවත්වාගෙන යාම
150	ක්‍රීඩා පුහුණු ඒකකයක් පවත්වාගෙන යාම
151	ජ්‍යොතිෂ්‍ය කාර්යාලයක් පවත්වාගෙන යාම
152	අත් යන්ත්‍ර ක්‍රමයකින් හැර වෙනත් ක්‍රමයකින් රෙදි විවීම
153	පුද්ගලික රෝහලක් හෝ සාත්තු නිවාසයක් පවත්වාගෙන යාම
154	යතුරුපැදි අමතර කොටස් වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
155	වතුර බව්සර් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
156	වාහන විදුලි කර්මාන්ත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
157	කාඩ්බෝඩ් ඇසුරුම් හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
158	ඡායාරූප උපකරණ වෙළෙඳාම හා අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
159	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
160	ඡායාරූප මුද්‍රණය කිරීමේ ස්ථානයක් (කලර් ලැබ්) පවත්වාගෙන යාම
161	වේවැල් භාණ්ඩ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
162	සෙලියුලර් දුරකථන වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම හා අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
163	පා පැදි අමතර කොටස් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
164	දුරකථන එකලස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
165	මැණික් අලෙවිය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
166	බඩු උකස් ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
167	පෞද්ගලික උපකාරක පන්ති පවත්වාගෙන යාමේ ස්ථානයක් පවත්වාගෙන යාම
168	බලයලත් මත්පැන් විකිණීමේ හා නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
169	බීර, වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
170	දුරකථන සංඥ කුළුනක් පවත්වාගෙන යාම

තක්සේරු නොවූ දේපළ සඳහා මහ නගර සභාවේ ආදායම් පරීක්ෂකගේ තාවකාලික තක්සේරුව මත බලපත්‍ර ගාස්තුව ගෙවිය යුතුය. කර්මාන්ත විෂයෙහි බදු ගෙවිය යුතුය.

උපලේඛන අංක III

වෙළෙඳ ව්‍යාපාර සම්බන්ධයෙන් බද්ද - 247 (ඇ) වගන්තිය
(අ) බදු චක්‍රය

වෙළෙඳ ව්‍යාපාරයේ බද්ද ගෙවිය යුතු වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම්වලට අනුව පහත සඳහන් පරිදි ගාස්තු අය කෙරේ :

වෙළඳ ව්‍යාපාරයේ ලැබීම් :

රු.	රු.	ගාස්තුව රු. ශත
6,000 දක්වා	-	නැත
6,001	12,000	100 00

වෙළඳ ව්‍යාපාරයේ ලැබීම් :

		ගාස්තුව
රු.	රු.	රු. ශත
12,001 සිට	18,750 දක්වා	180 00
18,751 සිට	75,000 දක්වා	360 00
75,001 සිට	150,000 දක්වා	1,200 00
150,000 ට වැඩි	-	3,000 00

(අ) ව්‍යාපාර ලැයිස්තුව :

(ඒ) වෘත්තීය රැකියා පුහුණුව හෝ කැඳවීම

කොමිස් ඒජන්තවරු
ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවෝ
මුදල් ණයට දෙන්නෝ
බ්‍රෝකර්වරුන්
වෙන්දේසිකරුවන්
මුදල් ආයෝජකයන්
පෞද්ගලික අධ්‍යාපන ආයතන පවත්වන්නන්
ගෘහ නිර්මාණ ශිල්පීන්
ප්‍රචාරක දැන්වීම් උපදේශක
ජීවිත සහතික පිළිබඳ ගණන් තැබීමේ හා සකස් කිරීමේ විශේෂඥයා
පාරිසරික උපදේශක ආයතන
පෞද්ගලික ආරෝග්‍යශාලාවක් පවත්වාගෙන යාම
ආයෝජන උපදේශක
ශරීරාවයවයන් හි ක්‍රියා කිරීම පිළිබඳ චිකිත්සක
මිනින්දෝරු/ බිම සමතලාකරු
අයබදු උපදේශක
සත්ව සායන ආයතනයක් පවත්වාගෙන යාම
ඉහත සඳහන් කර නොමැති වෘත්තීය රැකියා පුහුණුවක් හෝ රැකියාවට කැඳවීම

(බී) **ව්‍යාපාරය**

ප්‍රචාරක දැන්වීම් නියෝජිත ධුරය
නියෝජිත ධුර ආයතනය
නැව් බඩු බැහැර කිරීමේ සේවාව
ගුවන් ප්‍රවේශපත්‍ර නියෝජිත ආයතනය
මුදල් ආයෝජන ආයතනයන් පවත්වාගෙන යාම
පරිගණක පුහුණු ආයතන
පරිගණක පුහුණු සේවාව
ප්‍රවහන සේවා ආයතනයක් පවත්වාගෙන යාම
ජාත්‍යන්තර පාසලක් පවත්වාගෙන යාම
විදේශ සේවා රැකියා ආයතනයක් පවත්වාගෙන යාම
චැනල් කිරීමේ ව්‍යාපාරික සේවාව
ඇඳුම් සැකසීමේ පාසල
නැටුම් පාසල
රියැදුරු පාසල
රැකියා නියෝජිත ධුරය
ගාස්තු අයකරන පාසල
ඇතුළත අලංකාර කරන්නන්
ජලය විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
රසායනාගාර සේවාවක් පවත්වාගෙන යාම
බඩු/ මිටි/ ලියකියවිලි එහා මෙහා ගෙන යන්නන්
මෝටර් රථ කුලියට දීම හා බදු දීම
කන්ටේනර් අංගනයක් පවත්වාගෙන යාම
ප්‍රවාහන අංගනයක් පවත්වාගෙන යාම

උපලේඛන අංක IV

මහා නගර සභා ආඥාපනතේ 252 අධිකාරියේ 247 ඈ (1 හි) සඳහන් පරිදි මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ සංවර්ධනය නොකළ ඉඩම්වලින් බදු අය කිරීම

මෙම බල ප්‍රදේශයේ පර්චස් 10ට අඩු ඉඩමක් සඳහා ප්‍රාග්ධන වටිනාකමින් 0.5% ක් ද, පර්චස් 10-20 අතර ප්‍රාග්ධන වටිනාකමින් 1%ක් ද, පර්චස් 20-40 ත් අතර ප්‍රාග්ධන වටිනාකමින් 1.5%ක් ද, ඊට වැඩි ඉඩම් සඳහා ප්‍රාග්ධන වටිනාකමින් 2% ක් ද අය කිරීමට ද (ඈ) වගන්තිය ප්‍රකාරව එම අදාළ ඉඩමේ පවතින ගොඩනැගිල්ලට යට වී ඇති බිම් ප්‍රමාණයට අමතරව තවත් පර්චස් 10ක් පමණ ඉවත් කර ඉතිරි ඉඩම සඳහා 247 (ඈ) අනුව කටයුතු කරනු ලැබේ.

උපලේඛන අංක V

247 (ඉ) යටතේ ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු නියම කිරීම

මොරටුව මහ නගර සභා පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර්කෙනෙකු විසින් හෝ ඔහුගේ සේවකයකු නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් ඒ විකිණීමෙන් ලැබෙන මුදලින් 1% (සියයට එකකට) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් හෝ ඔහුගේ සේවකයන් හෝ අනුනියෝජිතයා විසින් ගෙවිය යුතු ය.

වාහන ගාස්තු අය කිරීම :

- මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ හඳුනාගෙන ඇති වාහන ගාල් සඳහා ගාල් ගාස්තු වශයෙන් එක් රථයකට වාර්ෂිකව රු. 1,500.00ක් ගෙවිය යුතු ය. ඉහත ගාස්තු සඳහා අදාල බදු මුදල් ද ගෙවිය යුතු ය.

- මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ හඳුනාගෙන ඇති තිරෝද රථ ගාල් සඳහා ගාල් ගාස්තු වශයෙන් එක් ත්‍රිරෝද රථයකට වාර්ෂිකව රු. 500.00ක් ගෙවිය යුතු ය. ඉහත ගාස්තු සඳහා අදාල බදු මුදල් ද ගෙවිය යුතු ය.

- පාපැදි බලපත්‍ර ගාස්තු රු. 5.00 ක් ද දෙපාර්තමේන්තු ගාස්තු වශයෙන් රු. 35.00ක් ද අයකරනු ලැබේ.

- වෙළෙඳ කරත්ත/වෙළෙඳ පා පැදි බලපත්‍ර ගාස්තු රු. 15.00 ක් ද දෙපාර්තමේන්තු ගාස්තු වශයෙන් රු. 35.00 ක් ද අයකරනු ලැබේ.

ආකාශ කොඩි (බැනර්) සහ කටවුටි :

(වර්ග අඩියකට)	*ගාස්තුව රු. ශත*
මුදල් ඉපයීමේ කාර්යයක් නොවන විට	15.00
මුදල් ඉපයීමේ කාර්යයක් වන විට	25.00
ආධාරකයක එල්ලා තබනු ලබන කටවුටි සඳහා	30.00
ඉඩම් විකිණීමේ/වෙන්දේසි කිරීමේ කාර්යයන් සඳහා	75.00

මෙම ගාස්තු සති දෙකක කාලයක් සඳහා වන අතර අතිරේක සතියකට හෝ ඉන් කොටසකට 25% ක අතිරේක ගාස්තුවක් අය කරනු ලැබේ. සති තුනක ප්‍රදර්ශනයකින් පසු නැවත ප්‍රදර්ශනය කිරීම අවශ්‍ය නම් නැවත මුල් ගාස්තුව අය කරනු ලැබේ. ඉහත ගාස්තුවලට අතිරේකව රජයෙන් පනවන බදු අයකරනු ලැබේ.

වර්ෂ 2019 ක් වූ ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මොරටුව මහ නගර සභා සීමාව තුළ ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ගාස්තු අයකිරීම

උපලේඛන අංක - VI

අනු. අංකය	*ප්‍රචාරක දැන්වීම් විස්තරය*	*දැන්වීම් පුවරු ගාස්තු*	
		මාසයක් හෝ ඉන් කොටසකට	*මසකට වැඩි අවුරුද්දක් හෝ ඉන් කොටසක් සඳහා*
		රු. ශත	*රු. ශත*
01	වේදිකා නාට්‍යයක් හෝ නාට්‍යයක්, සිනමා ලේඛිත ප්‍රසංගයක් නොවන වෙනත් ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශණය කරන ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග මීටර් 0.09 ට හෝ ඉන් කොටසකට	20 0	200 0
02	සිනමා ලේඛිත ප්‍රසංගයක් පිළිබඳව, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග මීටර් 0.09ට හෝ ඉන් කොටසකට	30 0	300 0
03	සිනමා ලේඛිත ප්‍රසංගයක් පිළිබඳව, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග මීටර් 0.09 ට හෝ ඉන් කොටසකට	50 0	500 0
04	සිනමා ලේඛිත ප්‍රසංගයක් හෝ වෙනත් යම් ප්‍රසංගයක් සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් නොවන්නාවූ ද, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කර ඇත්තාවූ ද, ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් වර්ග මීටර් 0.09 හෝ ඉන් කොටසකට	15 0	150 0
05	සිනමා ලේඛිත ප්‍රසංගයක් සම්න්ධ ප්‍රචාරක දැන්වීමක් නොවන ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් වර්ග මීටර් 0.09 හෝ ඉන් කොටසකට	25 0	250 0
06	දැන්වීම් පුවරුවක හෝ ආධාරකයක ප්‍රදර්ශනය කෙරෙන්නාවූ ද යම් තැනැත්තකු විසින් ගෙන යනු ලබන්නාවූ, නැතහොත් ධාවනය වන වාහනයක සවිකර ඇත්තාවූ ප්‍රචාරක දැන්වීමක් සඳහා		

	වර්ග අඩි 1 සඳහා	*ලිත් වර්ෂයකට හෝ මසකට හෝ ඉන් කොටසකට ප්‍රදර්ශන ගාස්තු රු. ශත*
1.	විදුලි ආලෝකය රහිත දැන්වීම් පුවරු (වර්ග අඩි 50ට අඩු)	100 0
	A ශ්‍රේණියේ මාර්ග සඳහා	150 0
2.	විදුලි ආලෝකය රහිත දැන්වීම් පුවරු (වර්ග අඩි 50 ට වැඩි)	150 0
	A ශ්‍රේණියේ මාර්ග සඳහා	200 0
3.	විදුලි ආලෝකය සහිත දැන්වීම් පුවරු	200 0
	A ශ්‍රේණියේ මාර්ග සඳහා	250 0
4.	පුළුල් තිරයේ LED දැන්වීම් පුරුවක් ප්‍රදර්ශනය වර්ග අඩියකට	2,500 0
	පුළුල් තිරයේ LED දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය දිනක් සඳහා	500 0

වර්ග අඩි 1 සඳහා	*ලිත් වර්ෂයකට හෝ මසකට හෝ ඉන් කොටසකට ප්‍රදර්ශන ගාස්තු රු. ශත*
5. වාර්ෂිකව ගෙවිය යුතු දැන්වීම් පුවරු ගාස්තු අදාළ දිනයේදී නොගෙවන්නේ නම් එම අනවසර දැන්වීම් පුවරු ඉවත් කිරීමේදී සිදුවන (ස්ථාවර ගාස්තුවක් ලෙස) අයකරනු ලබන ගාස්තුව	5,000.00
ඉහත ගාස්තුවලට අමතරව රජය විසින් පනවන ලද බදු අය කරනු ලැබේ.	
07. නගර සභාවට අයත් භූමියක දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කරන්නේ නම් ප්‍රදර්ශන ගාස්තුවලට අමතරව බිම් කුලිය ලෙස එක් වර්ෂයකට ගෙවිය යුතු මුදල (අවම වර්ගඵලය වර්ග අඩි 200ක් සඳහා) (බිම් කුළිය ගාස්තු හා සභාව අනුමැතිය මත සංශෝධනය කළ හැක.)	25,000.00
වැඩිවන සෑම වර්ග අඩියක් සඳහා ගෙවිය යුතු බිම් කුලිය	25.00
ඉහත ගාස්තුවලට අමතරව රජය විසින් පනවන ලද බදු අයකරනු ලැබේ.	
08. මෙම සභාවට වෙළෙඳ බලපත්‍ර හෝ වෙළෙඳ බදු ගෙවන්නාවූ ස්ථානයක එම ස්ථානීය නාමය හා ස්වභාවය දක්වෙන වර්ග අඩි 20ක් හෝ ඉන් කොටසක් සහිත විදුලි ආලෝකය රහිත දැන්වීම් පුවරුවක් සඳහා උපලේඛන VI වන 06 ඡේදයේ I උපවගන්තියේ දක්වෙන ප්‍රදර්ශන ගාස්තුවලින් නිදහස් වේ.	

අර්ථ නිරූපනය :-

"ප්‍රචාරක දැන්වීම්" යන්නට ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ නිර්මිතයක් හෝ ඉහලින් හෝ ඒ මත සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ප්‍රචාරක දැන්වීම් කාර්ය සඳහා යොදා ගනු ලබන හෝ ඒ ස්වභාවයෙන් වූ යම් වචනයක්, අක්ෂරයක්, අංකයක්, සළකුණක්, පුවරුවක්, දැන්වීමක්, උපක්‍රමයක් අනුරුවක් හෝ නිරූපණයක් ඇතුළත් වේ.

"දැන්වීම් පුවරුව" යන්නෙන් යම් නිර්මිතයක්, ආධාරකයක්, කණුවක්, පුවරුවක්, බිත්ති ප්‍රදර්ශන පුවරුවක් හෝ ප්‍රචාරක දැන්වීමක්, ප්‍රදර්ශනය කිරීමේ කාර්ය සඳහා උපයෝගි කර ගන්නා වෙනත් කවර හෝ උපක්‍රමයක් අදහස් වේ, තව ද,

"ගුවන් පුවරුව" යන්නෙන් යම් ඉඩමකට, ගොඩනැගිල්ලකට හෝ වෙනත් නිර්මිතයකට ඉහලින් හෝ ඒ මත කණුවකට, රිටකට, ස්ථම්භයකට, රාමු තට්ටුවකට හෝ වෙනත් ආධාරකයක් සවිකර ඇති හෝ ඒ මත රඳවා ඇත්තා වූද, යම් වීදියක, පාරක, ඇළක හෝ වැවක යම් ලක්ෂ්‍යයක සිට අහස පසු තලය වශයෙන් ඇතිව සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් දෘශ්‍යමානව ඇත්තාවූ ද, ප්‍රචාරක කාර්යය සඳහා උපයෝගී කර ගන්නා යම් වචනයක්, අක්ෂරයක්, අනුරුවක්, සලකුණක්, උපක්‍රමයක් හෝ නිරූපණයක් අදහස් වේ.

උපලේඛන අංක VII

2019 වර්ෂයට විනෝද බදු ගාස්තු පැනවීම

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (I) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මොරටුව මහ නගර සභාව, සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි වූ පවත්වනු ලබන, එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) සියයට 25% සමාන බද්දක් පනවා අයකළ යුතු ය. නැටුමක්, තරග ක්‍රීඩාවක්, ක්‍රීඩාවක්, සිනමා දර්ශන, විනෝදවීමක්, සංදර්ශනයක්, ගායනයක් හෝ විවිධ ප්‍රසංගයක් හෝ පනතේ විනෝද කටයුත්තක් ලෙස අර්ථ කථනය කර ඇති ඕනෑම කටයුත්තක් සඳහා යම් තැනැත්තෙකු විසින් අලෙවි කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 25% ක විනෝද බද්දක් පනවා අය කිරීමට තීරණය කර ඇත.

උඩුනුවර ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියෙන් උඩුනුවර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයෙහි නොවැම්බර් මස විසිහත් වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ටී. එම්. ජී. තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයෙහි නොවැම්බර් මස 27 වැනි දින,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

යෝජනාව

(අ) 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇත්තාවූ ප්‍රදේශවල පිහිටි සියලු නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල 2019 වාර්ෂික වටිනාකම සඳහා 2013 වර්ෂයේ දී සිදුකරන ලද තක්සේරු වටිනාකම 2019 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

(ආ) එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව,

1. ගෙලිඔය නුවර පාර වම - වරිපනම් අංක 01-7 1/2 දක්වා හා 11/1/1 සිට 221 දක්වා
2. ගෙලිඔය නුවර පාර දකුණ - වරිපනම් අංක 2/ඒ- 80 දක්වා හා 80ඒ සිට 240 දක්වා
3. වැලිගල්ල නුවර පාර වම - වරිපනම් අංක 1 සිට 275/1 දක්වා
4. වැලිගල්ල නුවර පාර දකුණ - වරිපනම් අංක 2 සිට 268 දක්වා
5. වැලිගල්ල ගම්පොල පාර වම - වරිපනම් අංක 01 සිට 15 දක්වා
6. වැලිගල්ල ගම්පොල පාර දකුණ - වරිපනම් අංක 2/ඒ සිට 18බී දක්වා
7. ගෙලිඔය ගම්පොල පාර - වරිපනම් අංකය 01/බී සිට 81/1/1 හා 131/1/1 සිට 129/9 දක්වා
8. ගම්පොල පාර ගෙලිඔය - වරිපනම් අංක 87/1/1 සිට 117/ඒ දක්වා
9. මුරුතගහමුල ගෙලිඔය පාර වම -වරිපනම් අංක 01 සිට 41 දක්වා
10. මුරුතගහමුල ගෙලිඔය පාර දකුණ - වරිපනම් අංක 04 සිට 32 දක්වා
11. ඇම්බැක්ක පාර වම - වරිපනම් අංක 3/ඒ සිට 25 දක්වා
12. ඇම්බැක්ක පාර දකුණ - වරිපනම් අංක 2 සිට 38/6 දක්වා
13. එළමල්දෙණිය පාර වම - වරිපනම් අංක 1 සිට 09 දක්වා
14. එළමල්දෙණිය පාර දකුණ - වරිපනම් අංක 2 සිට 20 දක්වා

යන ප්‍රදේශවල පිහිටි එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට දහයක (10%) වරිපනම් ගාස්තුවක් ද,

ඉහත 01 සිට 14 දක්වා සඳහන් දේපළ හැර ගෙලිඔය, අලපලාවල, දවුලගල, ලංකාතිලක හා ඇල්පිටිකන්ද යන කොට්ඨාසවල දියුණු කළ ප්‍රදේශ වශයෙන් නම්කර ඇති ප්‍රදේශවල පිහිටි එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින්, සියයට හයක (6%) වරිපනම් බද්දක් ද, 2019 වසර සඳහා පනවා අයකළ යුතු බවටත්,

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යටොක්ත වරිපනම් බද්ද 2019 වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත්,

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියෙන් පැවරී ඇති එකී බලතල ප්‍රකාරව එසේ පනවන ලද 2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බද්ද 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, පහත උපලේඛනයේ එක් එක් කාර්තුව ඉදිරියේ 03 වන තීරයේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් බද්දෙන් සියයට පහක (5%) වට්ටමක් ද සභාව විසින් ලබාදිය යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5%ක වට්ටමක් සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	ජනවාරි 01 - ජනාවාරි 31 දක්වා	ජනවාරි 31
දෙවන කාර්තුව	අප්‍රේල් 01 - අප්‍රේල් 30 දක්වා	අප්‍රේල් 30
තුන්වන කාර්තුව	ජූලි 01 - ජූලි 31 දක්වා	ජූලි 31
හතරවන කාර්තුව	ඔක්තෝබර් 01 - ඔක්තෝබර් 31 දක්වා	ඔක්තෝබර් 31

12 - 818/1

උඩුනුවර ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් උඩුනුවර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයෙහි නොවැම්බර් මස විසිහත් වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ටී. එම්. ජී. තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයෙහි නොවැම්බර් මස 27 වැනි දින,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් උඩුනුවර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ ද,

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව උඩුනුවර ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමකම 2011 වර්ෂයේ බලාත්මක කරන ලද සත්‍යෝක්ෂණය කිරීම 2019 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

02.	ස්ථිර දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියකට	80 0
03.	ඉඩම් වෙන්දේසි කිරීම සම්බන්ධ දැන්වීම් පුවරුවක් වෙනුවෙන් වර්ග අඩියකට	100 0
04.	ඉඩම් වෙන්දේසි කිරීමේ රෙදි බැනරයක් සඳහා (එක් මසකට)	1,000 0
05.	වෙනත් සාමාන්‍ය රෙදි බැනරයක් සඳහා (එක් මසකට)	1,000 0
06.	කිසියම් බැම්මක, බිත්තියක ප්‍රදර්ශන දැන්වීමක් වසරකට වර්ග අඩියකට	50 0
07.	ලී රාමුවක සවි කළ කණුවක් හෝ ගල්වල ප්‍රදර්ශනය කරන කුඩා වර්ගයේ දැන්වීම් පුවරු සඳහා වර්ග අඩියකට	5 0
08.	කිසියම් විථියක හෝ පාරකට මුහුණලා පිහිටි ගොඩනැගිල්ලේ මුහුණතෙහි සීමාව ඉක්මවා යන දිගින් යුතු ප්‍රචාරක දැන්වීමක් සවි කිරීම, එල්ලා තැබීම හෝ පින්තාරු කිරීම වෙනුවෙන් වර්ග අඩියකට	50 0

රඹෑව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා පරීක්ෂණ හා සේවා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නිකුත් කරන සහතිකයක් හා සේවාවන් සැපයීම වෙනුවෙන් පහත සඳහන් පරිදි ගාස්තුවක් 2019 වර්ෂයේ සිට අය කිරීමට රඹෑව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 20 වැනි දින ප්‍රාදේශීය සභා විශේෂ මහ සභා රැස්වීමේදී තීරණ අංක 05 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න තෙන්නකෝන්,
සභාපති,
රඹෑව ප්‍රාදේශීය සභාව.
රඹෑව.

2018 ඔක්තෝබර් මස 03 වැනි දින,
රඹෑව ප්‍රාදේශීය සභා කාර්යාලය,
රඹෑව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රාදේශීය සභාවට වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නිකුත් කරන සහතිකයන් හා සේවාවන් සැපයීම වෙනුවෙන් මෙහි පහත සඳහන් උපලේඛනයට අනුව 2019 වර්ෂය සඳහා සේවා ගාස්තුවක් අයකළ යුතු යැයි ප්‍රාදේශීය සභාව තීරණය කරන ලදී.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව* රු. ශත
01.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව	2,000 0
02.	අනුබෙදුම් අයදුම්පත්‍ර ගාස්තුව	1,500 0
03.	ගොඩනැගිලි පරීක්ෂණ ගාස්තුව	1,000 0
04.	අනුබෙදුම් පරීක්ෂණ ගාස්තුව	1,000 0
05.	අනුකූලතා සහතික පරීක්ෂණ ගාස්තුව	1,000 0
06.	ගොඩනැගිලි අනුමත කිරීම් ගාස්තුව හා අනුබෙදුම් සහතික (වර්ග මීටර) අනුව නාගරික සංවර්ධන පනතට අනුව අයකරනු ලැබේ.	
07.	පුස්තකාල සාමාජික ගාස්තු - (පාසල් සිසුන් සඳහා)	50 0
08.	පුස්තකාල සාමාජික ගාස්තු - (වැඩිහිටි අය සඳහා)	120 0
09.	පුස්තකාල තැන්පත් මුදල්	100 0
10.	පුස්තකාල ප්‍රමාද ගාස්තු (දිනකට)	1 0
11.	වීථි රේඛා සහතිකයක් සඳහා	1,500 0
12.	වීථි රේඛා පරීක්ෂණ ගාස්තුවක් සඳහා	1,000 0
13.	ගොඩනැගිලි පරීක්ෂණ ගාස්තු සඳහා	1,000 0
14.	දීර්ඝ කාලීන බදු බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදීම	2,000 0
15.	දීර්ඝ කාලීන බදු බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදීමේ පරීක්ෂණ ගාස්තු	1,000 0
16.	අනුකූලතා සහතිකයක් සඳහා ගාස්තු	1,000 0
17.	සන්නිවේදන කුළුණ ඉදිකිරීමේ ගාස්තු (එක් කුළුණක් සඳහා)	10,00,00 0
18.	සන්නිවේදන කුළුණ සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තුව	3,000 0

රඹෑව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයේ කසල ගාස්තුවක් අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව වරිපනම් කලාපයේ පිහිටි රජයේ ආයතන හා ව්‍යාපාරික ස්ථානවලින් සහ වරිපනම් කලාපයෙන් බැහැර ප්‍රදේශවල පිහිටි නිවාස, රජයේ ආයතන හා ව්‍යාපාරික ස්ථානවල ජනනය වන කසල රැගෙන යාම වෙනුවෙන් පහත දැක්වෙන පරිදි කසල ගාස්තුවක් 2019 වර්ෂයේ සිට අයකිරීමට රඹෑව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 20 වැනි දින ප්‍රාදේශීය සභා විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 05 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න තෙන්නකෝන්,
සභාපති,
රඹෑව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 03 වැනි දින,
රඹෑව ප්‍රාදේශීය සභා කාර්යාලය,
රඹෑව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව වරිපනම් කලාපයේ පිහිටි රජයේ ආයතන හා ව්‍යාපාරික ස්ථානවලින් සහ වරිපනම් කලාපයෙන් බැහැර ප්‍රදේශවල පිහිටි නිවාස, රජයේ ආයතන හා ව්‍යාපාරික ස්ථානවල ජනනය වන කසල රැගෙන යාම වෙනුවෙන් ප්‍රාදේශීය සභාවට දරන්නට සිදුවන පිරිවැය සඳහා පහත දැක්වෙන පරිදි කසළ ගාස්තුවක් ප්‍රාදේශීය සභාව තීරණය කරන ලදී.

උපලේඛනය

	I වන තීරය	*II වන තීරය* රු. ශත
01.	වර්ගීකරණයට ලක්කර බැහැර කරන කසල මෙට්‍රික් ටොන් එකක් සඳහා වර්ෂයකට අයකරන ගාස්තුව	3464 0

12 - 990/10

රඹෑව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයේ වාහන කුළියට දීම වෙනුවෙන් ගාස්තුවක් අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වාහන කුළියට දීම වෙනුවෙන් පහත සඳහන් පරිදි ගාස්තුවක් අයකිරීමට රඹෑව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 20 වැනි දින ප්‍රාදේශීය සභා විශේෂ මහ සභා රැස්වීමේදී තීරණ අංක 05 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න තෙන්නකෝන්,
සභාපති,
රඹෑව ප්‍රාදේශීය සභාව,
රඹැව.

2018 ඔක්තෝබර් මස 03 වැනි දින,
රඹෑව ප්‍රාදේශීය සභා කාර්යාලය,
රඹෑව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රදේශීය සභාවට ඇති බලතල ප්‍රකාරව වාහන කුළියට දීම වෙනුවෙන් මෙහි පහත සඳහන් උපලේඛනයට අනුව 2018 වර්ෂය සඳහා වාහන කුළියට දීමේ ගාස්තුවක් අයකළ යුතු යැයි ප්‍රාදේශීය සභාව තීරණය කරන ලදී.

උපලේඛනය

I වැනි තීරය		*II වැනි තීරය* *රු. ශත*
01.	මෝටර් ග්‍රේඩරය මීටර් පැයක් සඳහා ගාස්තුව	4,000 0
02.	ජේසීබී යන්ත්‍රය මීටර් පැයක් සඳහා ගාස්තුව	3,250 0
03.	ගල්රෝල (ප්‍රවාහනය හැර) දිනකට (ඔරලෝසු පැය 06)	15,000 0
04.	ජල බවුසරය (යෑම්, ඒම් සහිත) කිලෝමීටර් 01ක් සඳහා රු. 40 සමග ලෝඩ් 01ක්	1,200 0
05.	ජල බවුසරය දිනකට (ජලය රහිතව, ඔරලෝසු පැය 06)	6,500 0
06.	ටිපර් රථය දිනකට (ඉන්ධන සහිතව)	12,000 0
	ටිපර් රථය කිලෝමීටර් 01 සඳහා (ඉන්ධන සහිතව)	130 0

12 - 990/11

රඹෑව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයේ පිරිපහදු පානීය ජලය අලෙවිකිරීම වෙනුවෙන් ගාස්තුවක් අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පිරිපහදු පානීය ජලය විකිණීම වෙනුවෙන් පහත සඳහන් ප්‍රකාර ගාස්තුවක් 2019 වර්ෂයේ සිට අයකිරීමට රඹෑව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 20 වැනි දින ප්‍රාදේශීය සභා විශේෂ මහ සභා රැස්වීමේදී තීරණ අංක 05 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න තෙන්නකෝන්,
සභාපති,
රඹෑව ප්‍රාදේශීය සභාව,
රඹෑව.

2018 ඔක්තෝබර් මස 03 වැනි දින,
රඹෑව ප්‍රාදේශීය සභා කාර්යාලය,
රඹෑව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රාදේශීය සභාවට ඇති බලතල ප්‍රකාරව පිරිපහදු පානීය ජලය අලෙවිකිරීම වෙනුවෙන් මෙහි පහත සඳහන් උපලේඛනයට අනුව 2019 වර්ෂය සඳහා ගාස්තුවක් අයකළ යුතු යැයි ප්‍රාදේශීය සභාව තීරණය කරන ලදී.

I වන තීරය		*II වන තීරය* *රු. ශත*
01.	පිරිපහදු ජලය ලීටර් 01ක් සඳහා ගාස්තුව (පිරිපහදු මධ්‍යස්ථානය තුළ)	1 0
02.	පිරිපහදු ජලය ලීටර් 01ක් සඳහා ගාස්තුව (ජල බවුසරය මගින් බෙදාහැරීම)	1 50

12 - 990/12

රඹෑව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයේ ප්‍රාදේශීය සභාවට අයත් පිළිසරු ව්‍යාපෘතියේ නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර විකිණීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පිළිසරු ව්‍යාපෘතියේ නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර විකිණීම වෙනුවෙන් පහත සඳහන් ප්‍රකාර ගාස්තුවක් 2019 වර්ෂයේ සිට අයකිරීමට රඹෑව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 20 වැනි දින ප්‍රාදේශීය සභා විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 05 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න තෙන්නකෝන්
සභාපති,
රඹෑව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 03 වැනි දින,
රඹෑව ප්‍රාදේශීය සභා කාර්යාලය,
රඹෑව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රදේශීය සභාවට ඇති බලතල ප්‍රකාරව පිළිසරු ව්‍යාපෘතියේ නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර විකිණීම වෙනුවෙන් මෙහි පහත සඳහන් උපලේඛනයට අනුව කාබනික පොහොර විකිණීම සඳහා ප්‍රාදේශීය සභාව තීරණය කරන ලදී.

උපලේඛනය

I වන තීරය	*II වන තීරය* *රු. ශත*
01. ප්‍රාදේශීය සභාවට අයත් පිළිසරු ව්‍යාපෘතිය මගින් නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර කිලෝ ග්‍රෑම් 01ක් සඳහා ගාස්තුව	10 0

12 - 990/13

රඹෑව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයේ ශ්‍රවණාගාරය කුළියටදීම වෙනුවෙන් ගාස්තුවක් අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රවණාගාරය කුළියට දීම වෙනුවෙන් පහත සඳහන් පරිදි ගාස්තුවක් 2019 වර්ෂයේ සිට අය කිරීමට අනුව රඹෑව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 20 වැනි දින ප්‍රාදේශීය සභා විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 05 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න තෙන්නකෝන්
සභාපති,
රඹෑව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 03 වැනි දින,
රඹෑව ප්‍රාදේශීය සභා කාර්යාලය,
රඹෑව.

යෝජනාව

1987 ංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රදේශීය සභාවට ඇති බලතල ප්‍රකාරව ශ්‍රවණාගාරය කුළියට දීම වෙනුවෙන් මෙහි පහත සඳහන් උපලේඛනයට අනුව ශ්‍රවණාගාරය කුළියට 2019 වර්ෂයේ දී අයකළ යුතු යැයි සඳහා ප්‍රාදේශීය සභාව තීරණය කරන ලදී.

උපලේඛනය

I වන තීරය	*II වන තීරය* රු. ශත
01. රැස්වීම් හා සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා දිනකට ගාස්තුව	7,500 0
02. පෙර පාසල් උත්සව සඳහා	5,000 0
03. ව්‍යාපාර ස්වභාවයේ කරනු ලබන උත්සව සඳහා	10,000 0

රඹෑව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයේ ප්‍රාදේශීය සභාවට අයත් සිප් නැණ පෙර පාසල සඳහා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පෙර පාසල් ගාස්තු පහත සඳහන් පරිදි 2019 වර්ෂයේ සිට අය කිරීමට රඹෑව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 20 වැනි දින ප්‍රාදේශීය සභා විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 05 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න තෙන්නකෝන්
සභාපති,
රඹෑව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 03 වැනි දින,
රඹෑව ප්‍රාදේශීය සභා කාර්යාලය,
රඹෑව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රාදේශීය සභාවට ඇති බලතල ප්‍රකාරව පෙර පාසල් ගාස්තු, මෙහි පහත සඳහන් උපලේඛනයට අනුව 2019 වර්ෂය සඳහා අයකළ යුතු යැයි ප්‍රාදේශීය සභාව තීරණය කරන ලදී.

උපලේඛනය

I වන තීරය	*II වන තීරය* රු. ශත
01. පෙර පාසල සඳහා ළමුන් ඇතුළත් කිරීමේ ගාස්තුව	1,000 0
02. එක් දරුවකු සඳහා පෙර පාසලට ලැබෙන මාසික ගාස්තුව පෙර පාසල් පාලිකාවන් සඳහා - 70% (ජල හා විදුලි බිල්පත් පියවීමට යටත්ව) ප්‍රාදේශීය සභා අරමුදල සඳහා - 30%	850 0

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 101-2018 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරිය වූ 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර උතුරු මැද පළාතේ, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016 මාර්තු මස 30 වැනි දිනැති අංක 1960/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (අ) වැනි කොටසේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද, උතුරු මැද පළාතේ පළාත් සභාව අනුමත කරන ලද බව 2017 ජුනි මස 09 වැනි දිනැති අංක 2022/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (අ) වන කොටස *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද, උතුරු මැද පළාතේ ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා, 2017 අගෝස්තු මස 01 වැනි දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* 2017.11.02 වැනි දින අංක IV (අ) කොටසේ පළකර වැළඳගත් බවත්, එසේ පිළිගත් සම්මත අතුරු ව්‍යවස්ථා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළ යුතු බවත් ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 - 989/1

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින තීරණ අංක 101 (i)-2018 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (1) උපවගන්තිය යටතේ නොච්චියාගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක්, නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2018 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2018 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක

ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි මම තීරණය කරන අතර මෙම මුදල් 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම ගෙවිය යුතු බව තවදුරටත් දන්වා සිටිමි.

උපලේඛනය

I වැනි තීරය	*11 වැනි තීරය*
පෙර (2018) වර්ෂයේදී ආදායම	*රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

12 - 989/2

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින තීරණ අංක 101 (ii)-2018 යටතේ පහත දැක්වෙන තීරණය ම විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (I) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි මම තීරණය කරන අතර මෙම මුදල් 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම ගෙවිය යුතු බවටත් දන්වා සිටිමි.

I වැනි තීරය	*II වැනි තීරය*		
	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
	රු. 750 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 ට නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01. උළු, කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
02. සපත්තු නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0

I වැනි තීරය	*II වැනි තීරය*		
	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
	රු. 750 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 ට නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
03. පරණ ලෝහ එකතු කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
04. ගම් වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
05. විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
06. ටයර් ප්‍රතිසංස්කරණය කරනු ලබන්නා වූ හෝ කට්ට කැපීම කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප සෑදීම	500 0	750 0	1,000 0
08. යාන්ත්‍රික බලය යොදා ගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09. පිටි හෝ කුළු බඩු ඇඹරීම	500 0	750 0	1,000 0
10. යන්ත්‍ර මගින් රෙදි මැසීමේ ආයතනයක් පවත්වාගෙන යාම (මෙම මුදල එක් යන්ත්‍රයක් සඳහා පමණක් වලංගු වේ)	500 0	750 0	1,000 0
11. පොලිතින්, සෙලියුලොයිඩ් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය, අලෙවිය	500 0	750 0	1,000 0
12. කපුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
13. බූට් සපත්තු හෝ පවහන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
14. ඉටිපන්දම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
15. කොප්පරා නිෂ්පාදනය	500 0	750 0	1,000 0
16. යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
17. යන්ත්‍රානුසාරයෙන් තලතෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
18. ගිනි පෙට්ටි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
19. ඇසිටලින් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
20. උළු නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
21. ගඩොල් නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
22. සිගරැට් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
23. බීඩි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
24. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
25. කොහු නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
26. ගෝනි නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
27. වඩු වැඩ කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28. රස කැවිලි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
29. පොල්කටු අඟුරු නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
30. කොහු හෝ පුළුන් මෙට්ට හෝ කොට්ට හෝ කුෂන් නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
31. අළුත් ටයර් හෝ ට්‍යුබ් නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
32. අශුද්ධ ලෝහ උණු කිරීම	500 0	750 0	1,000 0
33. ගම්, ඉටි හෝ දුම්මල නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
34. බිම ඔපදමන පොලිෂ් නිෂ්පාදනය	500 0	750 0	1,000 0

උපලේඛනය

අප්‍රසන්න ව්‍යාපාර :

I වැනි තීරය	*II වැනි තීරය*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 ට නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
සිමෙන්ති නිපදවීම	500 0	750 0	1,000 0
පාසල් රට හුණු නිපදවීම	500 0	750 0	1,000 0
ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
ලියන තීන්ත, අච්චු තීන්ත, ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
පොටි නිපදවීම	500 0	750 0	1,000 0
වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
උම්බලකඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
ගඩොල් පිළිස්සීම	500 0	750 0	1,000 0
ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
ටයර්, ටියුබ් වොල්කනයිස් කිරීම	500 0	750 0	1,000 0
ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
කෝපි, ධානය වර්ග පිටි කිරීම	500 0	750 0	1,000 0
පළතුරු, මාළු හෝ වෙන් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500 0	750 0	1,000 0
දූව ඉරීම	500 0	750 0	1,000 0
පොල් ලෙලි පෙඟවීම හෝ පල් කිරීම	500 0	750 0	1,000 0
රස කැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
සිරප් හෝ පළතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
වඩු කර්මාන්ත ශාලාවත් පැවැත්වීම	500 0	750 0	1,000 0
ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
ලෝහ සුන්බුන් තබා ගැනීම අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම	500 0	750 0	1,000 0
සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
පොල්කටු අඟුරු හෝ දූව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
කරවල, ලුනු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150කට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම	500 0	750 0	1,000 0
පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0

අන්තරාදායක ව්‍යාපාර :

I වැනි තීරය	*II වැනි තීරය*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
කළුගල් කැණීම හෝ කැඩීම	500 0	750 0	1,000 0
ලෝහ සංස්කාර්ය කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම	500 0	750 0	1,000 0
ගිණිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤ, ගබඩා කිරීම	500 0	750 0	1,000 0
විසිතුරු පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500 0	750 0	1,000 0
පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම	500 0	750 0	1,000 0
යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
පිදුරු තබා ගැනීම	500 0	750 0	1,000 0
කොහු හෝ වෙනක් කෙදි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
කොහු හෝ වෙනත් කෙදි වර්ග නිපදවීම	500 0	750 0	1.000 0
පොල්තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
එළවළු තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0

අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර :

I වැනි තීරය	*II වැනි තීරය*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
හිරිගල් හෝ හුණු ගල් පිළිස්සීම	500 0	750 0	1,000 0
කෘමිනාශක, දිලීර නාශක, පැලෑටි නාශක හෝ පළිබෝධ නාශක නිපදවීම හෝ නැවත පිරවීම	500 0	750 0	1,000 0
මෝටර් වාහන බෝඩි තැනීම	500 0	750 0	1,000 0
බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
මෝටර් වාහන අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
මොටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
ලෝහ වර්ග පැස්සවීම	500 0	750 0	1,000 0
බැටරි විද්‍යුත් ආරෝපනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම			
රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙදි වර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 101 (iii)-2018 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (I) වන උපවගන්තියෙන් නොච්චියාගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශයක් යැයි ප්‍රකාශිත ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි, ඉඩම්වල, ගෙපත්වල, නිශ්චල දේපළ සඳහා 2018 වර්ෂයේ දී සඳහන් කරන ලද තක්සේරුව 2019 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එම තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් නොච්චියාගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට 15% ක වරිපනම් පනවා අයකළ යුතු බවටත් සභාපති මම තීරණය කරමි.

තවද 2019 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම්, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක්ම තුළ දී සමාන වාරික හතරකින් නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩදුරටත් යෝජනා කරන අතර, 2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් ගාස්තු 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට මත්තෙන් නොච්චියාගම ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් ප්‍රමාණයෙන් සියයට පහක (5%) වට්ටමක් ද ලබා දීමට මම තීරණය කරමි.

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 149 වැනි වගන්තිය හා 147 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 101 (iv)-2018 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වන වගන්තිය යටතේ නොච්චියාගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2019 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01. ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02. හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03. බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04. ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05. තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06. කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07. බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08. කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09. කිරි විකිණීම	500 0	750 0	1,000 0
10. මාළු විකිණීම	500 0	750 0	1,000 0
11. මස් විකිණීම	500 0	750 0	1,000 0
12. අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15. ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16. පෞද්ගලික වෙළෙඳපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17. කොණ්ඩා සැකසීමේ සැලුන් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18. බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19. ගෝඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

ඉහත I වැනි කොටස් සඳහන් කර්මාන්ත අතරින් අංක 2 යටතේ සඳහන් කිසියම් හෝටලයක් හෝ අංක 4 යටතේ සඳහන් කිසියම් ආපන ශාලාවක් හෝ අංක 1 යටතේ සඳහන් වන කිසියම් නවාතැන් පොළක්, හෝ ඒ හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන්පොළ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ පිළිගනු ලැබ ඇත්තා වූ ද, වන අවස්ථාවක, ඉහත 2 වැනි කොටසේ කුමක් සඳහන්ව තිබුණ ද ඒ හෝටලය හෝ ආපනශාලාව හෝ නවාතැන්පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපනශාලාවේ හෝ නවාතැන් පොළෙහි හෝ 2018 වර්ෂය තුළ ලැබීම්වලින් සියයට එකක් (1%) ක් විය යුතු ය.

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව පුස්තකාල ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ සඳහන් පරිදි මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 101 (v)-2018 යටතේ පහත දැක්වෙන තීරණය ම විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 520/7 දරන 1988.08.23 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවේ පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල බලතල ප්‍රකාරව, එහි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් තැන්පත් මුදල වන, මුල්වරට සාමාජිකත්වය ලබා ගන්නා වැඩිහිටි තැනැත්තෙකු සඳහා රු. 175ක් විය යුතු බවත්, මුල් වරට සාමාජිකත්වය ලබා ගන්නා ළාබාල තැනැත්තෙකු සඳහා රුපියල් 150 0 විය යුතු බවත්, එම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් දඩය එක් පොතක් වෙනුවෙන්, ප්‍රමාද වන දින ගණන් අතරට ගැනෙන ඉරිදා සහ රජයේ නිවාඩු දින අත්හළ විට ඉතිරි වන දින ගණන සඳහා දිනකට රුපියල් 1.00 බැගින් අය විය යුතුය යන්න සහ මෙම තීරණය 2019.01.01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද නොච්චියාගම ප්‍රාදේශීය සභාව තීරණය කරන්නීය.

12 - 989/6

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග හා රඟ දැක්වීම පිළිබඳ ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ සඳහන් පරිදි මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 101 (vi)-2018 යටතේ පහත දැක්වෙන තීරණය ම විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

නොච්චියාම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 520/7 දරන 1988.02.28 වැනි දිනැති *අනිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යස්ථාවේ ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග හා රඟ දැක්වීම් පිළිබඳව අතුරු ව්‍යවස්ථා නොච්චියාගම ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, ඒ අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන ගාස්තු පහත පරිදි වේ.

1975/77 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත

	රු. ශත
(01) ඉල්ලුම් පත්‍ර ගාස්තුව	250 0
(02) වාර්ෂික බලපත්‍ර ගාස්තුව	3,000 0

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 03 වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තුව

	එක් එක් දිනකට	*සතියකට දින 07ක් හෝ ඊට අඩු*	*මසක් හෝ ඉන් කොටසකට*	*දෙසැම්බර් අවසන් වන එක් වර්ෂයකට*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*	*රු. ශත*
ආසන 199ට වැඩි නොවූ විට	10 0	25 0	50 0	250 0
ආසන 199ට වැඩි එහෙත් 399 ට වැඩි නොවූ විට	15 0	35 0	75 0	350 0
ආසන 499ට වැඩි නොවූ විට	25 0	50 0	100 0	400 0
ආසන 499ට වැඩි වූ විට	50 0	75 0	150 0	500 0
ව්‍යාපාර නොවන ආඥාපනතේ විස්තර කෙරෙන ආධාර රඟ දැක්වීමකට	15 0	25 0	100 0	200 0

12 - 989/7

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 149 වැනි වගන්තිය හා 147 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 101 (vii)-2018 යටතේ පහත දැක්වෙන තීරණය ම විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තිය සහ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2018 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මත ම, එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකිරීමට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත.*
01. (i)	මෝටර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක් අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක්ම සඳහා	25 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*
		රු. ශත.
(ii)	සෑම බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් සඳහා-	
	(*අ*) එය වෙළෙඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම්	10 0
	(*ආ*) එය වෙළෙඳ කටයුතු නොවන කාර්ය සඳහා පාවිච්චි කරන්නේ නම්	5 0
(iii)	සෑම කරත්තයක් සඳහා ම	20 0
(iv)	සෑම අත්කරත්තයක් සඳහා ම	10 0
(v)	සෑම රික්ෂෝවක් සඳහා ම	7 50
(vi)	සෑම අශ්වයෙකු , පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
(viii)	සෑම අලියෙකුම සඳහා	50 0

(02) රෝදවල විෂ්කම්භය අඟල් 26 ට නොවැඩි ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා භාවිත කෙරෙන අත් කරත්ත සහ වෙළෙඳ කටයුතු සඳහා භාවිත නොකෙරෙන අත් කරත්ත මෙම ගෙවීම්වලින් නිදහස් කෙරේ.

12 - 989/8

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ සඳහන් පරිදි මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 101 (viii)-2018 යටතේ පහත දැක්වෙන තීරණය ම විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 වගන්තිය අනුව නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 520/7 දරන 1988.08.23 දිනැති *අති විශෙෂ* ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර, නොච්චියාගම ප්‍රාදේශීය සභා බල සීමාව තුළ යම් විදියකට, පාරකට, ඇළකට, මාවතකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2019 වර්ෂයට පනවා අයකළ යුතු බවත් නොච්චියාගම ප්‍රාදේශීය සභාව තීරණය කරන්නී ය.

උපලේඛනය

	රු. ශත.
01. බිත්ති, තාප්ප හෝ පුවරුවක් උපයෝගී කර ගන්නා ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට (වසරකින් හෝ ඉන් කොටසක කාලයක් සඳහා)	100 0

	රු. ශත.
02. *ස්ථිර දැන්වීම් පුවරු ගාස්තු*	
(i) විනිවිද පෙනෙන දැන්වීම් පුවරුවකට - වර්ග අඩියකට	75 0
(ii) විදුලි ආලෝකය කරන ලද දැන්වීම් පුවරුවකට - වර්ග අඩියකට (වසරකින් හෝ ඉන් කොටසක කාලයක් සඳහා)	75 0
03. ඉටිරෙදි හෝ රෙදි මගින් දැන්වීම් පුවරු ගාස්තු :	
(i) විනිවිද පෙනෙන දැන්වීම් පුවරුවකට වර්ග අඩියකට	25 0
(ii) විදුලි ආලෝකය කරන ලද දැන්වීම් පුවරුවකට - වර්ග අඩියකට (වසරකින් හෝ ඉන් කොටසක කාලයක් සඳහා)	15 0

12 - 989/9

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව විවිධ ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ සඳහන් පරිදි මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 101 (ix)-2018 යටතේ පහත දක්වෙන තීරණය ම විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

නොච්චියාගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඉටුකරන පහත සඳහන් සේවා සහ වෙනත් ආනුෂංගික කාර්යයන් ඉටු කිරීමේ දී ප්‍රාදේශීය සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත්, මෙම සේවා ගාස්තු අය කිරීම 2019 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත්, නොච්චියාගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

	සේවාව	*ගාස්තුව* *රු. ශත.*
01.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	500 0
02.	කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම	500 0
03.	අනුබෙදුම් අයදුම් පත්‍රය	100 0
04.	වීථි රේඛා/නොපවරා ගැනීමේ සහතික සඳහා පරීක්ෂණ ගාස්තුව	350 0
05.	වීථි රේඛා සහ පවරා නොගැනීමේ සහතික නිකුත් කිරීමේ ගාස්තු	1,000 0
06.	හිමිකම් නිකුත් කිරීමේ ගාස්තු	50 0
07.	ගොඩනැගිලි පිළිබඳව සීමා සහතිකයක් නිකුත් කිරීම	1,000 0
08.	ජල සැපයුම් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීම	100 0
09.	ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර ලබා ගැනීම	
	(i) වාණිජ	1,500 0
	(ii) ගෘහස්ථ	100 0

	සේවාව	ගාස්තුව රු. ශත.
10.	(i) පුස්තකාල අයදුම්පත්‍ර නිකුත් කිරීම	10 0
	(ii) පුස්තකාල ඇප තැන්පතු ගාස්තු	100 0
	(iii) පුස්තකාල සාමාජිකත්වය වාර්ෂිකව අලුත් කිරීම	
	(i) වැඩිහිටි	75 0
	(ii) ළාබාළ	50 0
11.	දේපළ අයිතිය හැරවීමේ අයදුම් පත්‍රය	100 0
12.	*සුසානභූමි ගාස්තු :*	
	(i) භූමදානය කිරීම හෝ ආදාහනය කිරීම සඳහා	50 0
	(ii) තැන්පත් කිරීම සඳහා වර්ග අඩි 01කට	50 0
13.	වරිපනම් තක්සේරු ලේඛනයේ බදු හිමිකම සංශෝධනය කිරීම සඳහා ගාස්තු	1,000 0
14.	වරෙන්තු ගාස්තුව (වරිපනම් බදු/අක්කර බදු) බදු මුදලින්	10%
15.	බොරළු ප්‍රවාහනයේ දී ප්‍රාදේශීය සභා මාර්ග භාවිතා කිරීම වෙනුවෙන් කියුබ් එකක් සඳහා (හානි සිදුවන නිසා) 1Km	100 0
16.	මාර්ගය දෙපස ඇති අනවසර වෙළෙඳ මැසි සඳහා දෛනික	100 0
17.	මහවැලි ක්‍රීඩාංගනය වෙන් කිරීම එක් දිනයකට	1,500 0
18.	ප්‍රාදේශීය සභාවට අයත් වෙනත් ක්‍රීඩා පිටි දිනකට	500 0
19.	ගොඩනැගිලි ඉල්ලුම්පත් ලියාපදිංචි කිරීම	350 0
20.	ගලි බවුසරය	
	(i) වාණිජ	6,000 0
	(ii) ගෘහස්ථ	3,500 0
	(iii) 1 Km	30 0
21.	ජල බවුසරය	
	(i) වරිපනම් සීමාව තුළ එක් බවුසරයක්	2,000 0
	(ii) සීමාවෙන් පිට	2,500 0
	(iii) දිනකට	8,000 0
22.	JCB යන්ත්‍රය පැයකට	3,000 0
23.	මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය පැයකට	4,000 0
24.	ටොන් 08 ගල්රෝල පැයකට	
	(i) ඉන්ධන සහතිව	3,925 0
	(ii) ඉන්ධන රහිතව	1,900 0
25.	ටොන් 02 ගල්රෝල පැයකට	
	(i) ඉන්ධන සහතිව	1,725 0
	(ii) ඉන්ධන රහිතව	1,000 0
26.	පානීය ජලය	
	විසන්ධි කළ ජල සම්බන්ධතාවය සන්ධි කිරීමේ ගාස්තු	2,500 0
	අයතා ජල පරිභෝජනය සඳහා	15,000 0
	ජල සම්බන්ධතා ගාස්තු	30,078 0
	පරීක්ෂණ මීටරයක් සවි කිරීම	500 0
27.	සතිපොළ කඩ කාමරයක් සඳහා 8" - 10"	150 0
28.	පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම	
	(i) 250,000 හෝ ඊට අඩු පරීක්ෂා කිරීමේ ගාස්තු	3,000 0
	(ii) 250,000 - 500,000	3,750 0
	(iii) 500,000 - 1,000,000	5,000 0
	(iv) 1,000,000ට වැඩි	10,000 0
29.	පරිසර පෝරම ගාස්තු	500 0
30.	පරිසර බලපත්‍ර ගාස්තු	4,000 0

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ සඳහන් පරිදි මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 101 (x)-2018 යටතේ පහත දැක්වෙන තීරණය ම විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක 320 කුකුල්කටුව, 322 රනෝරාව අඹගහවැව, 321 ඉට්ටිකුලම, 326 ඇහැටුවාගම, 327 හුණුවිලගම, 329 කටුපත්වැව, 330 පහලමාරගහවැව තල්ගස්වැව, 355 හොරුවිල හැර අනෙකුත් සියලුම ග්‍රාම සේවා වසම් 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 3 වැනි වගන්තිය යටතේ නාගරික අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති හෙයින් (අංක 1197/11-2001 අප්‍රේල් 10 *අඟහරුවාදා අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් එම ප්‍රාදේශීය ගොඩනැගිලි අයදුම්පත් සම්බන්ධව අංක 1597/08 දරන 2009 අප්‍රේල් 17 සිකුරාදා ගැසට් පත්‍රයේ සඳහන් පරිදි ගාස්තු අයකිරීමට සුදුසු බවට යෝජනා කරමි. තව ද නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයට අයත් නොවන ප්‍රදේශ සඳහා ගොඩනැගිලි සැලැස්මක් අනුමත කිරීමේ දී වර්ග අඩියකට රු. 1.00 ක් ද (නේවාසික) වාණිජ සඳහා රු. 2.00 බැගින් ද, 2019 වර්ෂයේ පනවා අයකිරීම සඳහා යෝජනා කරන්නීය.

12 - 989/11

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153 (1) අ, ආ, ඇ, උපවගන්තිය යටතේ ඇති විධිවිධාන ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 101 (xi)-2018 යටතේ පහත දැක්වෙන තීරණය ම විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) අ, ආ, ඇ උපවගන්ති යටතේ නොච්චියාගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව නොච්චියාගම බල ප්‍රදේශය තුළ සංවර්ධනය නොකළ ඉඩමකින් එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2% නොඉක්මවන බද්දක් වාර්ෂිකව එම ඉඩම අයිතිකරුගෙන් අයකර ගැනීමට සුදුසු බව ඉහත සඳහන් කමිටුවෙන් තීරණය විය.

ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය අනුව නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් ඉහත සඳහන් පරිදි බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි මම තීරණය කරමි.

12 - 989/12

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව අකුරැස්ස ප්‍රාදේශීය සභාව විසින් 2018.09.28 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 05.01.(xxiv) යටතේ පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මුණිදාස ගමගේ,
සභාපති,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 31 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළක 2010 වර්ෂයේ දී බලපැවැත් වූ වාර්ෂික වටිනාකම 2019 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමට,

(ආ) එකී පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමින් සියයට අටක (8%) වරිපනම් බද්දක් 2019 වර්ෂයේ දී පනවා අය කිරීමට සහ,

(ඇ) එකී පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර යටෝක්ත වාර්ෂික වරිපනම් 2019 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යයි විධාන කිරීමට, සුදුසු යැයි මෙම සභාවට යෝජනා කර සිටින්නීය.

12-689/1

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව අකුරැස්ස ප්‍රාදේශීය සභාව විසින් 2018.09.25 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 05.01.(xviii) යටතේ පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මුණිදාස ගමගේ,
සභාපති,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 31 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ අකුරැස්ස ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති පරිදි ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම් වූ බලපත්‍ර ගාස්තුවක් ඒ ඒ ව්‍යාපාර ඉදිරියෙන් දක්වා ඇති අනු ප්‍රමාණයන්ගෙන් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

උපලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ වෙළෙඳ බලපත්‍ර ගාස්තු

	වෙළෙඳාමේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට* රු. ශ.	*වාර්ෂික වටිනාකම රු. 750සිට රු. 1,500 දක්වා* රු. ශ.	*වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි* රු. ශ.
1.	බේකරියක් පැවැත්වීම	500 0	750 0	1,000 0
2.	බත් කඩයක් හෝ භෝජනාගාරයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
3.	තේ, කෝපි කඩයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
4.	ලැගුම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5.	බාබර් සාප්පුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
6.	මාළු වෙළෙඳාම	500 0	750 0	1,000 0
7.	මස් වෙළෙඳසැල්	500 0	750 0	1,000 0
8.	ලොන්ඩරි	500 0	750 0	1,000 0
9.	සංචාරක වෙළෙඳාම	500 0	750 0	1,000 0
10.	සිසිල් බීම කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
11.	කිරි වෙළෙඳාම	500 0	750 0	1,000 0
12.	ගව ගාල	500 0	750 0	1,000 0
13.	හොටෙල්	500 0	750 0	1,000 0
14.	සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල් ආපන ශාලා, ලැගුම්හල් හා රෙස්ටුරන්ට්		පෙර වර්ෂයේ ආදායමේ 1%ක්	

අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර :

1.	ශීත කළ මාළු වෙළෙඳාම	500 0	750 0	1,000 0
2.	යෝගට් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
3.	කුකුළු ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	අවමංගල්‍ය සේවා සපයන ආයතන	500 0	750 0	1,000 0
5.	මළමිනී සකස් කරන ආයතන	500 0	750 0	1,000 0
6.	අයිස්ක්‍රීම් නිපදවන ස්ථාන	500 0	750 0	1,000 0
7.	වාහන සර්විස් කරන ස්ථාන	500 0	750 0	1,000 0
8.	හුණු පිළිස්සීම හා ගබඩා කරන ස්ථාන	500 0	750 0	1,000 0
9.	කොප්පරා නිපදවන ස්ථාන	500 0	750 0	1,000 0
10.	පොල්තෙල් සෑදීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
11.	කෘතිම දත් සකස් කරන ස්ථාන හෝ දත් ගලවන ස්ථාන	500 0	750 0	1,000 0
12.	ගල්වලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	ගල්මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවි කරන ස්ථාන	500 0	750 0	1,000 0
16.	ඇසිඩ් වර්ග නිපදවන ස්ථාන	500 0	750 0	1,000 0
17.	ගිණිකෙළි භාණ්ඩ නිපදවීම, විකිණීම	500 0	750 0	1,000 0
18.	පොහොර වෙළෙඳසැක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ප්ලාස්ටික් ෆයිබර් ග්ලාස් නිපදවන ස්ථාන	500 0	750 0	1,000 0
20.	රන් රිදී ලෝහ ආලේප කරන ස්ථාන	500 0	750 0	1,000 0
21.	ලී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර අකුරැස්ස ප්‍රාදේශීය සභාව විසින් 2018.09.25 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 05.01.(xix) යටතේ පහත දක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මුණිදාස ගමගේ,
සභාපති,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 31 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තිය යටතේ අකුරැස්ස ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති පරිදි කර්මාන්ත සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම් වූ කර්මාන්ත බද්දක් ඒ ඒ ව්‍යාපාර ඉදිරියෙන් දක්වා ඇති අනු ප්‍රමාණයන්ගෙන් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් මෙම කර්මාන්ත බදු 2019 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවන ලෙස නියම කිරීමටත් සුදුසු යැයි යෝජනා කරමි.

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

උපලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ කර්මාන්ත බදු

	වෙළෙඳාමේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට* රු. ශ.	*වාර්ෂික වටිනාකම රු. 750සිට රු. 1,500 දක්වා* රු. ශ.	*වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි* රු. ශ.
01.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	ඇලුමිනියම් ප්ලාස්ටික් භාණ්ඩ අලෙවිය	500 0	750 0	1,000 0
03.	තේ කුඩු, කුළුබඩු පැකට් කර විකිණීම	500 0	750 0	1,000 0
04.	පාපැදි අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
05.	වී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	යතුරුපැදි, ත්‍රීවිල් අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
07.	සිමෙන්ති ගඩොල් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
08.	ටයර්, ටියුබ් අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
09.	විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ගුවන් විදුලි හා රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ඩිජිටල් තාක්ෂණයෙන් මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	වෙළෙඳාමේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට රු. ශ.	වාර්ෂික වටිනාකම රු. 750සිට රු. 1,500 දක්වා රු. ශ.	වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශ.
14.	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	බීරළු, ලී කැටයම් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ගිණිකෙළි භාණ්ඩ නිපදවීම, විකිණීම	500 0	750 0	1,000 0
18.	රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	වායු සමීකරණ, ශීතකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	ඉදල්, පාපිසි කොහු ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
21.	මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	රන්, රිදී ලෝහ ආලේපන කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	මැණික් කැපීම හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-689/3

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව අකුරැස්ස ප්‍රාදේශීය සභාව විසින් 2018.09.25 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 05.01.(xx) යටතේ පහත දක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මුණිදාස ගමගේ,
සභාපති,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 31 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තිය යටතේ අකුරැස්ස ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව I වන උපලේඛනයේ පරිදි බද්දක් II වන උපලේඛනයේ සඳහන් ව්‍යාපාර සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ආදායම පදනම් කරගෙන 2019 වර්ෂයේ අය කිරීමටත් මෙම ව්‍යාපාර බදු 2019 ජුනි 30 වැනි දින හෝ ඊට පෙර ගෙවන ලෙස නියම කිරීමටත් සුදුසු යැයි යෝජනා කරමි.

I වැනි උපලේඛනය

	ව්‍යාපාරයේ ආදායම	*ගෙවිය යුතු බද්ද (රු. ශත)*
01.	රු. 6,000 සිට 12,000 දක්වා	90 0
02.	රු. 12,001 සිට 18,750 දක්වා	180 0
03.	රු. 18,751 සිට 75,000 දක්වා	360 0
04.	රු. 75,001 සිට 150,000 දක්වා	1,200 0
05.	රු. 150,000 ට වැඩි	3,000 0

II වැනි උපලේඛනය

1. රෙදි පිළි නිමි ඇඳුම් අලෙවි සැලක් පවත්වාගෙන යාම
2. සාප්පු බඩු අලෙවි සැලක් පවත්වාගෙන යාම
3. පාවහන් අලෙවි සැලක් පවත්වාගෙන යාම
4. සන්නිවේදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
5. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
6. වර්ණ රසායනාගාරයක් පවත්වාගෙන යාම
7. අපනයනය සඳහා තේ සැකසුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
8. අමු තේ දළු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
9. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
10. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
11. තීන්ත අලෙවි කිරීමේ, විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
12. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
13. පෙර පාසල් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
14. පරිගණක මෘදුකාංග සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
15. පරිගණක පුහුණු පාඨමාලා පවත්වන ආයතනයක් පවත්වාගෙන යාම
16. ජ්‍යෝතිෂ්‍ය සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
17. රියැදුරු පුහුණුව සපයන ආයතනයක් පවත්වාගෙන යාම
18. පැල තවානක් (නර්සරි) පවත්වාගෙන යාම
19. ආයුර්වේද බෙහෙත් වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
20. ඉංග්‍රීසි බෙහෙත් වෙළෙඳාම් කරන ස්ථානයක් (ෆාමසියක්) පවත්වාගෙන යාම
21. දුරකථන සේවා සපයන සමාගමක් පවත්වාගෙන යාම.
22. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
23. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
24. සත්ත්ව සායනයක් පවත්වාගෙන යාම
25. නීතිඥ, නොතාරිස් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
26. විගණන හෝ ගණකාධිකාරී සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
27. බැංකුවක් පවත්වාගෙන යාම
28. රක්ෂණ සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
29. ලීසිං සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
30. මිනින්දෝරු සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
31. ගෘහ නිර්මාණ සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
32. වාස්තු විද්‍යා සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
33. ඉංජිනේරු සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
34. විශේෂඥ වෛද්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
35. පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම
36. ඇඟළුම් කම්හලක් පවත්වාගෙන යාම
37. ස්වර්ණාභරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
38. පරිගණක හා උපාංග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
39. ලී බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
40. ප්‍රචාරක කටයුතු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
41. උත්සව භාණ්ඩ කුලියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම
42. ඇස් කණ්නාඩි සාප්පුවක් පවත්වාගෙන යාම
43. ලොතරැයි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
44. පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
45. රේස් බුකියක් පවත්වාගෙන යාම

46. නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම
47. පින්තූර රාමු කිරීමේ හා වීදුරු කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48. රබර්, කුරුඳු මිලට ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
49. දුරකතන සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
50. ජංගම දුරකතන අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
51. රැකියා නියෝජිත ස්ථානයක් පවත්වාගෙන යාම
52. උකස් බඩු ගන්නා ආයතනයක් පවත්වාගෙන යාම
53. වීඩියෝ පටි, සංයුක්ත තැටි විකිණීමේ හෝ කුලියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම
54. ලිපි ද්‍රව්‍ය හෝ පොත් සාප්පුවක් පවත්වාගෙන යාම
55. ලී වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම
56. සිල්ලර වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම
57. සංගීත භාණ්ඩ හෝ ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. ගබඩාවක් ලෙස කුලියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම
59. තොග වශයෙන් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60. විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. ප්‍රසිද්ධ සමාගම් වල භාණ්ඩ බෙදාහැරීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
62. වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
63. යතුරු පැදි/ත්‍රී රෝද රථ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64. පාපැදි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. වාහන අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. යතුරු පැදි , ත්‍රී රෝද රථ අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
67. ඉන්ධන පිරවුම් හලක් පවත්වාගෙන යාම
68. අරක්කු, බියර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. සිනමා ශාලාවක් පවත්වාගෙන යාම
70. රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම
71. රියැදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
72. මැණික් මිලදී ගන්නා ස්ථාන හා මැණික් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
73. විදේශ රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
74. සුපිරි වෙළෙඳ සැලක් (ෆුඩ් සිටි) පවත්වාගෙන යාම
75. දුරකතන පෙර ගෙවුම් කාඩ් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
76. තේ කම්හලක් පවත්වාගෙන යාම
77. අන්තර්ජාල සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
78. සුරතල් මසුන් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
79. කුළු බඩු, හාල්, සීනි, කිරිපිටි සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
80. කුළු බඩු, හාල්, සීනි, කිරිපිටි තොග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
81. යෝගට් නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
82. පොහොර වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
83. අයිස්ක්‍රීම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
84. රස කැවිලි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
85. පරණ ලෝහ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
86. දත් බඳින, ගලවන ස්ථානයක් පවත්වාගෙන යාම
87. බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88. මුද්‍රණාලයක් පැවැත්වීම
89. ගෑස් ගබඩා කිරීම හා විකිණීම
90. එළවළු පළතුරු වෙළෙඳාම

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

2019 වසරට වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් - දෘශ්‍ය පරිසර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221 (ආ) හා 122, 126 වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව අකුරැස්ස ප්‍රාදේශීය සභාව විසින් 2018.09.25 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 05.01.(xxiv) යටතේ පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මුණිදාස ගමගේ,
සභාපති,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 31 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 221(ආ) හා 122- 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන අති විශෙෂ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව 2002.11.01 වැනි දින අංක 1261 ගැසට් පත්‍රයේ නිවේදනයක් මගින් අකුරැස්ස ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවල 39 යටතේ අකුරැස්ස ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළුව) ඉදිකිරීම් හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2019.01.01 වැනි දින සිට පනවා අය කිරීම සුදුසු යැයි අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති මුණිදාස ගමගේ මහතා විසින් යෝජනා කර සිටින්නීය.

උපලේඛනය

ප්‍රචාරක දැන්වීම් විස්තරය සඳහා ගාස්තුව	*අවසර පත්‍රය*
	රු. ශ.
01. පුවරුවක ප්‍රදර්ශනය කරන දැන්වීමකට සෑම වර්ග අඩියකටම වර්ෂයකට	75 0
02. පුද්ගලයකු විසින් ගෙන යනු ලබන හෝ ගමන් කරනු ලබන වාහනයක සවි කොට ඇති පුවරුවක හෝ ආධාරකයක් මගින් ප්‍රචාරය කරනු ලබන දැන්වීමකට මසකට (රෙදි බැනර් ආදිය)	
(අ) වර්ග අඩි 6 කට වැඩි නොවන සෑම අඩියකටම	10 0
(ආ) වර්ග අඩි 6 කට වැඩි වන විට සෑම වර්ග අඩියකටම	50 0
03. කිසියම් පෞද්ගලික හෝ පොදු නිවසක හෝ ගොඩනැගිල්ලක, බිත්තියක වහලක, හෝ තාප්පයක මහජනතාවට පෙනෙන පරිදි කිසියම් වෙළඳ ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය වීමට සැලැස්වීම සඳහා වර්ග අඩියකටම	10 0

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව අකුරැස්ස ප්‍රාදේශීය සභාව විසින් 2018.09.25 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 05.01.(xxii) යටතේ පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මුණිදාස ගමගේ,
සභාපති,
31. කොන්ක්‍රීට් වැඩපළක් හා ඒ ආශ්‍රිත නිෂ්පාදනයන් සිදුකිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
32. සිහිවටන නාම පුවරු, මූර්ති කැටයම් හා පලක නිර්මාණය කිරීමේ හා සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනයන් සිදුකිරීමේ ව්‍යාපාරික ස්ථානයන් පවත්වාගෙන යාම
33. අත්යන්ත්‍ර මගින් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
34. පරිගණක ආශ්‍රයෙන් මුද්‍රණ සේවාවන් පවත්වාගෙන යාම
35. ලිපි ද්‍රව්‍ය හා පාසල් උපකරණ අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
36. ධාන්‍ය වර්ග මිලදී ගැනීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
37. කුළු බඩු/රසකැවිලි/බයිට් වර්ග පැකට් කිරීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
38. හඳුන්කුරු නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
39. තේ කොළ පැකට් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
40. පළතුරු/එළවළු හා පොල් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
41. බුලත් පුවක් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
42. කඩල, වඩේ අලෙවිසැලක් පවත්වාගෙන යාම
43. එළකිරි මිලදී ගන්නා හෝ එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
44. අමු ආහාර සැපයීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
45. බිම්මල් නිෂ්පාදනය හා අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
46. කෘතිම පොහොර හා/හෝ කොම්පෝස්ට් පොහොර අලෙවිය හෝ නිෂ්පාදිත ස්ථානයක් පවත්වාගෙන යාම
47. කෘෂි නිෂ්පාදනයට අයත් බීජ හා ඒ ආශ්‍රිත අනෙකුත් නිෂ්පාදනයන් සිදුකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48. කෘෂි උපකරණ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
49. සෙරෙප්පු හා අත්කම් නිර්මාණ නිපදවීම හා අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
50. සෙල්ලම්බඩු හා ප්ලාස්ටික් බඩු අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම
51. විදුලි භාණ්ඩ හා රේඩියෝ අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
52. රෙදිපිළි හා සාප්පු බඩු අලෙවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53. කුෂන් වැඩ කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
54. ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
55. ග්‍රැෆික් නිර්මාණයන් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
56. ඡායාරූපකරණය/වීඩියෝ කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
57. කොප්පරා නිපදවීම

58. යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිපදවීම
59. පොල්ලෙලි හා කොහු නිපදවීම හා ගබඩා කිරීම
60. කබොක් කළුගල් හැරීම
61. ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62. පුවත්පත් ඒජන්සියක් පවත්වාගෙන යාම
63. පැළ තවානක් හෝ මල්පැළ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64. යන්ත්‍රානුසාරයෙන් උළු ගඩොල් පිළිස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. ගෘහ භාණ්ඩ අලෙවිසැලක් පවත්වාගෙන යාම
66. සුදු ගල් වැඩපළක් පවත්වාගෙන යාම
67. නවාතැන්පලක් සමග උද්‍යානයක් පවත්වාගෙන යාම
68. වාහන ගෙන්වීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
69. දැව විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
70. බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
71. ටයර් ටියුබ් අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
72. පරණ බඩු විකිණීමේ හෝ එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
73. රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම
74. ජංගම දුරකථන හා උපාංග අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
75. විසිතුරු මසුන් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
76. තීන්ත අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
77. තීන්ත අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
78. ගෑස් වර්ග අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
79. යකඩ බඩු හා පිත්තල බඩු අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
80. රන් රිදී භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
81. ජල පරිපහදු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
82. සන්නිවේදන සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
83. සත්ව ගොවිපළක් පවත්වාගෙන යාම
84. ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ හා අලෙවිකිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
85. වේලන ලද මාළු ගබඩා කර තබා ගැනීමේ හා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
86. වී තම්බා කෙටීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
87. ගොඩනැගිලි සෑදීමේ යන්ත්‍රෝපකරණ සකස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
88. යතුරුපැදි ත්‍රීරෝද රථ විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
89. ට්‍රැක්ටර් විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
90. ලිහිසි තෙල් විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
91. රේඩියෝ අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක්
92. වටු බිත්තර හා සතුන් විකිණීමේ හා ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
93. දුරකථන කුලුණු පවත්වාගෙන යාම
94. විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම

ආර්. ඒ. වික්‍රමසිංහ,
සභාපති,
පලාගල ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 18 වැනි දින,
පලාගල ප්‍රාදේශීය සභාව,
ආඬියාගල.

12- 687/4

පලාගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට විනෝද බදු පැනවීම

1987 අංක 27 දරන විනෝද බදු (සංශෝධිත) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත සියලු විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 5%ක විනෝද බද්දක් 2019 වර්ෂය සඳහා පලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පනවා අයකිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව යෝජනා කර 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී එම යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. ඒ. වික්‍රමසිංහ,
සභාපති,
පලාගල ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 18 වැනි දින,
පලාගල ප්‍රාදේශීය සභාව,
ආඬියාගල.

12 -687/5

පලාගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට වෙනත් ආදායම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුව පහත සඳහන් කාර්යන් ඉටු කිරීමේදී එකී කාර්යයන් ඉදිරියෙන් ඇති ගාස්තු 2019 වර්ෂය සඳහා අය කිරීමට 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද මහ සභාවේදී තීරණය වූ බව මෙයින් නිවේදනය කරමි.

අනු. අංකය	*විස්තරය*	*මුදල*
01.	වීථි රේඛා හා නොපවරා ගැනීමේ සහතික ලබාදීමේ ගාස්තුව	රු. 500 0
02.	වීථි රේඛා හා නොපවරා ගැනීමේ සහතික ලබාදීමේ පරීක්ෂණ ගාස්තු	රු. 250 0
03.	දීර්ඝකාලීන බලපත්‍ර ලබාදීමේ ගාස්තු නේවාසික	
	* පර්චස් 40 දක්වා	රු. 500 0
	* පර්චස් 80 දක්වා	රු. 550 0
	* පර්චස් 160 දක්වා	රු. 600 0
	* පර්චස් 160 ට වැඩි	රු. 650 0
04.	දීර්ඝකාලීන බලපත්‍ර ලබාදීමේ ගාස්තු කෘෂිකාර්මික	
	* පර්චස් 40 දක්වා	රු. 550 0
	* පර්චස් 80 දක්වා	රු. 600 0
	* පර්චස් 160 දක්වා	රු. 650 0
	* පර්චස් 160 ට වැඩි	රු. 700 0
05.	දීර්ඝකාලීන බලපත්‍ර ලබාදීමේ ගාස්තු වාණිජ	
	* පර්චස් 40 දක්වා	රු. 600 0
	* පර්චස් 80 දක්වා	රු. 650 0
	* පර්චස් 160 දක්වා	රු. 700 0
	* පර්චස් 160 ට වැඩි	රු. 750 0

අනු. අංකය	විස්තරය		මුදල
06.	ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබාදීමේ ගාස්තු	රු.	500 0
07.	ගොඩනැගිලි පරීක්ෂණ ගාස්තු නේවාසික		
	* වර්ග අඩි 100 සිට 500 දක්වා	රු.	—
	* වර්ග අඩි 501 සිට 1,000 දක්වා	රු.	200 0
	* වර්ග අඩි 1,001 සිට 1,500 දක්වා	රු.	500 0
	* වර්ග අඩි 1,501 සිට 2,000 දක්වා	රු.	750 0
	* වර්ග අඩි 2,001 සිට 2,500 දක්වා	රු.	1,000 0
	* වර්ග අඩි 2,500 ට වැඩි	රු.	1,500 0
08.	ගොඩනැගිලි පරීක්ෂණ ගාස්තු වාණිජ		
	* වර්ග අඩි 100 සිට 500 දක්වා	රු.	300 0
	* වර්ග අඩි 501 සිට 1,000 දක්වා	රු.	400 0
	* වර්ග අඩි 1,001 සිට 1,500 දක්වා	රු.	750 0
	* වර්ග අඩි 1,501 සිට 2,000 දක්වා	රු.	1,000 0
	* වර්ග අඩි 2,001 සිට 2,500 දක්වා	රු.	1,250 0
	* වර්ග අඩි 2,500 ට වැඩි	රු.	2,000 0
09.	ගොඩනැගිලි අනුබෙදුම් පරීක්ෂණ ගාස්තු නේවාසික	රු.	500 0
10.	ගොඩනැගිලි අනුබෙදුම් පරීක්ෂණ ගාස්තු වාණිජ	රු.	750 0
11.	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමෙන් පසු වර්ග අඩියකට නේවාසික	රු.	1 0
12.	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමෙන් පසු වර්ග අඩියකට වාණිජ	රු.	2 0
13.	අනුකූලතා සහතික ලබාදීම පරීක්ෂණ ගාස්තුව	රු.	750 0
14.	පාරිසරික බලපත්‍ර අයදුම් පත්‍ර ගාස්තුව	රු.	100 0
15.	පාරිසරික බලපත්‍ර අලුත් කිරීමේ අයදුම් පත්‍ර ගාස්තු	රු.	50 0
16.	ගොඩනැගිලි සැලසුම් අයදුම් පත්‍ර ගාස්තු	රු.	100 0
17.	වීථි රේඛා අයදුම් පත්‍ර ගාස්තු	රු.	100 0
18.	පාරිසරික බලපත්‍ර ගාස්තු	රු.	4,000 0
19.	සැලසුම් අනුමත කිරීම කාලය දීර්ඝ කිරීම වසරකට (නේවාසික) ගාස්තුව	රු.	250 0
20.	සැලසුම් අනුමත කිරීම කාලය දීර්ඝ කිරීම වසරකට (වාණිජ) ගාස්තුව	රු.	500 0
21.	ගොඩනැගිලි අයදුම්පත්/ඉඩම් අනුබෙදුම් ලබාදීමේ පෝරම ගාස්තු (වාණිජ)	රු.	500 0
22.	ගොඩනැගිලි අයදුම්පත්/ඉඩම් අනුබෙදුම් ලබාදීමේ පෝරම ගාස්තු (නේවාසික)	රු.	300 0
23.	මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීම ගාස්තු	රු.	750 0
24.	පුස්තකාල සාමාජික ගාස්තු (පාසල් ළමුන්)	රු.	30 0
25.	පුස්තකාල සාමාජික ගාස්තු (අනිකුත්)	රු.	50 0
26.	සුසාන භූමියේ මෘත දේහය තැම්පත් කිරීම ව. අඩියක් සඳහා ගාස්තුව	රු.	50 0
27.	භූමදාන කටයුතු සඳහා ගාස්තුව	රු.	250 0
28.	කර්මාන්ත ගිවිසුම් පත්‍ර සඳහා ගාස්තුව	රු.	100 0
29.	කර්මාන්ත ලිපිද්‍රව්‍ය ගාස්තු	රු.	100 0
30.	ප්‍රචාරක ජංගම වෙළඳ රථ නගරයේ තබාගැනීම සඳහා පැයකට ගාස්තුව	රු.	100 0
31.	වැලි ගල් බොරලු ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රාදේශීය සභා මාර්ග භාවිත කිරීම කියුබ් 1	රු.	150 0

අනු. අංකය	විස්තරය	මුදල
32.	සුදුගල් කියුබ් 1	රු. 1,200 0
33.	අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් දිනකට ගාස්තු	රු. 1,000 0
34.	ආගමික උත්සවයකදී ගවයෙකු ඝාතනය කිරීම වෙනුවෙන් ගාස්තු	රු. 1,000 0
35.	ප්‍රවාහනය සඳහා ට්‍රැක්ටරය කුලියට ලබා දීමේ ගාස්තු	
	පළමුවැනි කි.මී. 5 ක් සඳහා (යාම හා ඒම කි.මී. 10)	රු. 1,000 0
	වැඩිවන සෑම කි.මී 1 ක් සඳහා	රු. 150 0
36.	ට්‍රැක්ටර් ජල බවුසරය (ජලය රහිතව)	
	දිනකට (උපරිම පැය 08 ට්‍රැක්ටරය හා රියැදුරු සමග ඉන්ධන සහිතව)	රු. 6,500 0
	දිනකට (ට්‍රැක්ටරය හා රියැදුරු රහිතව)	රු. 2,500 0
37.	ජලය සමග ට්‍රැක්ටර් ජල බවුසරය රැගෙන ගොස් ලබාදීමට	
	කි.මී. 5 ක් ඇතුළත	රු. 2,500 0
	ඊට වැඩිවන සෑම කි.මී. 1 ක් සඳහා	රු. 150 0
38.	අත් ට්‍රැක්ටරය දිනකට ගාස්තුව (උපරිම පැය 08)	රු. 3,500 0
39.	පස්තලන යන්ත්‍රය (ලොකු)	
	(ඉන්ධන හා ප්‍රවාහනය රහිතව පැයක් සඳහා ගාස්තුව	රු. 2,000 0
	කුලියට ගෙන වැඩ නොකර රඳවා තබා ගන්නා එක් දිනක් සඳහා	රු. 2,000 0
40.	පස්තලන යන්ත්‍රය (කුඩා) ඉන්ධන හා ප්‍රවාහනය රහිතව දිනක් සඳහා ගාස්තුව (පැය 08)	රු. 5,000 0
41.	මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලියට ලබා දීම පැයක් සඳහා ගාස්තුව	රු. 4,500 0
42.	විදුලිජනක යන්ත්‍රය දිනකට (පැය 12) ගාස්තුව (ඉන්ධන හා ප්‍රවාහනය රහිතව)	රු. 8,000 0
43.	ටිපර් රථය සඳහා (උපරිම පැය 8) දිනක ගාස්තුව	රු. 13,500 0
	පළමුවැනි කි.මී. 5 ක් සඳහා (යාම හා ඒම කි.මී. 10)	රු. 2,000 0
	වැඩිවන සෑම කි.මී. 01 ක් සඳහා (යාම හා ඒම කි.මී. 02)	රු. 200 0
44.	ශබ්ද විකාශන යන්ත්‍රය සඳහා දිනකට ගාස්තුව (උපරිම පැය 08)	රු. 4,000 0
45.	ලයිට් සෙට් සඳහා දිනකට ගාස්තුව	රු. 3,000 0
46.	මල්ටිමීඩියා සඳහා දිනකට ගාස්තුව	රු. 1,500 0

ආර්. ඒ. වික්‍රමසිංහ,
සභාපති,
පලාගල ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 18 වැනි දින,
පලාගල ප්‍රාදේශීය සභාව,
ආඩියාගල.

පලාගල ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් පුවරු/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු - 2019

1987 අංක15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර 1988.08.23 වැනි දින අංක 520/07 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා අනුමත කොට ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර පලාගල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, මුහුදකට හෝ අහසට පෙනෙන පරිදි වර්ග අඩියකට නොඅඩු දැන්වීමක් හෝ ඉදිකිරීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි 2019 වර්ෂයට අය කිරීමට සුදුසු බවට යෝජනා කර 2018 වර්ෂයෙහි ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අනු. අංකය	*විස්තරය*	*එක් වර්ෂයක ගාස්තුව රු, ශත*
1.	බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දර්ශන, ප්‍රචාරක දැන්වීම් හැර) ඕනෑම දැන්වීමක් සඳහා වර්ග අඩියකට	25 0
2.	බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක හෝ ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරවා ඇති දිස්න ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම	35 0
3.	සෑම වර්ගයකම ප්‍රචාරක බැනරයක් සඳහා සෑම වර්ග අඩියකටම	5 0

උපලේඛනයේ 1-3 දක්වා දැන්වීම් දෙපැත්තම ප්‍රදර්ශනය වන්නේනම් මෙම ගාස්තු දෙගුන වනු ඇත.

ආර්. ඒ. වික්‍රමසිංහ,
සභාපති,
පලාගල ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 18 වැනි දින,
පලාගල ප්‍රාදේශීය සභාව,
ආඬියාගල.

12 -687/7

පලාගල ප්‍රාදේශීය සභාව

කසල බදු අයකිරීම - 2019

ආඬියාගල, පුබ්බෝගම, ගල්කිරියාගම, බළලුවැව, පලාගල යන නගරයන්හි කසළ බැහැර කරනු ලබන ස්ථානයන්ගෙන් මාසයකට රු. 100.00 බැගින් අය විය යුතු යැයි තීරණය කරමි.

පහත සඳහන් ස්ථානයන්නි මසකට පහත පරිදි කසල බදු රැස් කළ යුතු වේ :

1. හෝටල් තේ කඩ හා ආපනශාලා	රු.	400 0
2. සිල්ලර කඩ	රු.	150 0
3. එළවළු කඩ	රු.	400 0
4. පළතුරු කඩ	රු.	150 0
5. ෆැන්සි බඩු අලෙවි ස්ථානය	රු.	150 0
6. ෆාමසියක් පවත්වාගෙන යාම	රු.	150 0
7. කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවිය	රු.	150 0
8. වඩුමඩුවක් පවත්වාගෙන යාම	රු.	150 0
9. ගරාජ් එකක් පවත්වාගෙන යාම	රු.	150 0

ආර්. ඒ. වික්‍රමසිංහ,
සභාපති,
පලාගල ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 18 වැනි දින,
පලාගල ප්‍රාදේශීය සභාව,
ආඬියාගල.

12 -687/8

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක ඉ-9 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එල්. එච්. සුදත් මංජුල,
සභාපති,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 26 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක්/ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ/ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපලක 2018 වර්ෂයේදී බල පැවැත්වූ වාර්ෂික වටිනාකම 2019 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමට,

(ආ) 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක්/ප්‍රදේශ ලෙස රුවන්වැල්ල නාගරික සීමා බල ප්‍රදේශයේ අංක 01 සිට අංක 07 දක්වා යන කොට්ඨාසවල සෑම නිශ්චල දේපළක් මතම සියයට හතක් (7%) ක වරිපනමක් ද, ගලපිටමඩ, ගෝනගල්දෙණිය, අමිතිරිගල, කන්නත්තොට යන දියුණු කළ ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපළක් මතම සියයට හතරක (4%) වරිපනමක් ද,

(ඇ) 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාර යටොක්ත වාර්ෂික වරිපනම් 2019 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු 04 තුලදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

(ඈ) 2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බදු 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2019.01.01-2019.03.31	2019.01.31
දෙවන කාර්තුව	2019.04.01-2019.06.30	2019.04.30
තුන්වන කාර්තුව	2019.07.01-2019.09.30	2019.07.30
හතරවන කාර්තුව	2019.10.01-2019.12.31	2019.10.31

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 ඔක්තෝබර් මස 11 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක ඉ-26-I යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එල්. එච්. සුදත් මංජුල,
සභාපති,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 26 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමක 2018 වර්ෂයේදී බලාත්මක වූ සත්‍යෝක්ෂණය 2019 වර්ෂයේ සත්‍යෝක්ෂණය ලෙස පිළිගැනීමට,

(ආ) 134 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, එකී උපවගන්තියේ පළමු අතුරු විධානය යටතේ 1989.03.10 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයකින් අක්කර බද්ද නියම කිරීමේ සහ අය කිරීමේ කාර්යය සඳහා පළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර එකකට නොඅඩු එහෙත් හෙක්ටයාර පහකට අඩු සෑම ඉඩමක් මත රුපියල් පනහක (50.00) අනුප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර 05 ක් හෝ ඊට වැඩි වන සෑම ඉඩමක සෑම හෙක්ටයාරයක් මත රුපියල් දහය (10.00) බැගින් වූ අක්කර බද්දක් 2019 වර්ෂයේ පනවා අය කිරීමට සහ,

(ඇ) 134 වන වගන්තියේ (6) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර යථොක්ත බද්ද 2019 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුලදී සමාන වාරික හතරකින් (04) ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස බද්දට යටත් වන තැනැත්තෙකුට විධාන කිරීමට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

(ඈ) 2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

ඉහත කී උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2019.01.01-2019.03.31	2019.01.31
දෙවන කාර්තුව	2019.04.01-2019.06.30	2019.04.30
තුන්වන කාර්තුව	2019.07.01-2019.09.30	2019.07.30
හතරවන කාර්තුව	2019.10.01-2019.12.31	2019.10.31

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 ඔක්තෝබර් මස 11 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක ඉ-26-II යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එල්. එච්. සුදත් මංජුල,
සභාපති,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 26 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්ති සහ 4 වන උපලේඛනයෙහි විධිවිධාන වලින් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2018 වර්ෂයේදී පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම එකී උපලේඛනයේ II වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2019 වර්ෂයේදී පනවා අය කිරීමට යෝජනා කරන්නීය.

ඉහත කී උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා කාර්තුව	25 0
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්කාරයක් හෝ කරත්තයක් සඳහා -	
(අ) වෙළෙඳ කාර්යය සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළෙඳ කාර්යය නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත් කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
සෑම ඇතකු සඳහා	50 0

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

(මේ උපලේඛනයේ "වෙළෙඳ කාර්යය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.)

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 ඔක්තෝබර් මස 11 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක ඉ-26 -III යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එල්. එච්. සුදත් මංජුල,
සභාපති,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 26 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් කර්මාන්තයක් 2019 වර්ෂයේදී කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම II වන තීරුවේ නිරූපිත යම් සීමාවක් ඇතුලත වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළ යුතු යැයි රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පොළක් වන විටදී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2018 වර්ෂයේ ලැබීම්වලින් 1%ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය I

අන්තරාදායක ව්‍යාපාර :

අනු. අංකය	*I වැනි තීරුව* *බලය දෙනු ලබන කාර්යය*	*II වැනි තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ, අධිශීතකරණ, සේවා කිරීමේ සහ අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	බැටරි චාර්ජ් කිරීමේ මධ්‍යස්ථානය	500 0	750 0	1,000 0
03.	රෙදි සායම් කිරීම	500 0	750 0	1,000 0
04.	ස්වර්ණාභරණ නිෂ්පාදන	500 0	750 0	1,000 0
05.	ඔරලෝසු අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
06.	ගුවන් විදුලි යන්ත්‍ර/රූපවාහිනි හා විදුලි උපකරණ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
07.	මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව බලය දෙනු ලබන කාර්යය	II වැනි තීරුව පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
08.	පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	ආහාර ද්‍රව්‍ය හා ආහාර සම්බන්ධ ජංගම වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	පුපුරණ ද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ගෑස් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
13.	පින්තූර රාමු කිරීම	500 0	750 0	1,000 0
14.	තේ කොළ පැකට් කිරීම	500 0	750 0	1,000 0
15.	විදුලි උපකරණ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
16.	ඔර්ලෝසු අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
17.	විද්‍යුත් ලෝහ ආලේපනය	500 0	750 0	1,000 0
18.	ටයර් ට්‍යුබ් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0

උපලේඛනය II

අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර :-

අනු. අංකය	I වැනි තීරුව බලය දෙනු ලබන කාර්යය	II වැනි තීරුව පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
01	තේ කඩ/කෝපි කඩ පවත්වාගෙන යාම	350 0	500 0	750 0
02	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03	ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04	බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06	ලැගුම්හලක් හා රෙස්ටුරන්ට් ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07	ගව පට්ටියක් හා කිරි අලෙවිය	500 0	750 0	1,000 0
08	මාළු වෙළෙඳාම හා ශීතකළ මාළු	500 0	750 0	1,000 0
09	මස් වෙළෙඳාම හා ශීත කළ මස්	500 0	750 0	1,000 0
10	කුකුළු හා ඌරු ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11	රස කැවිලි හා බයිට් වර්ග නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
12	එළවළු හා පළතුරු අලෙවිය	500 0	750 0	1,000 0
13	සිසිල් බීම නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
14	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව බලය දෙනු ලබන කාර්යය	II වැනි තීරුව පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
15.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම :			
	ග්‍රාමීය	300 0	500 0	750 0
	නාගරික	500 0	750 0	1,000 0
16.	සාතන මඩු පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
18.	යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	යාන්ත්‍රික ලී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	පාපැදි, යතුරුපැදි, ත්‍රිරෝද රථ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
23.	වාහන වෝල්කනයිස් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	වාහන සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	ලේත්/වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	ස්ටිකර්/නාම පුවරු සැකසීම	500 0	750 0	1,000 0
29.	ප්‍රචාරක දැන්වීම් පුවරු හා වෙනත් දැන්වීම් ආදිය මුද්‍රණය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	කෘත්‍රිම දත් බැඳීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	පෞද්ගලික දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	අත් යන්ත්‍ර මගින් රබර් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	පොල්තෙල් නිෂ්පාදනය කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	කලුගල් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	වාහන පින්තාරු කිරීම හා ලොරි බොඩි ගැසීම	500 0	750 0	1,000 0
40.	ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	කෘෂිරසායන හා පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	හුණු ආශ්‍රිත නිෂ්පාදන කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	සම්භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	පෞද්ගලික ජල විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	බිම්මල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
50.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
51.	ක්ෂණික ආහාර ද්‍රව්‍ය අලෙවිය	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව බලය දෙනු ලබන කාර්යය	II වැනි තීරුව පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
52.	ලිහිසි තෙල් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
53.	රේඩියේටර් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
54.	කිරි ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
55.	වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	ඛනිජ තෙල් ගබඩා කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
57.	මස් ප්‍රවාහනය කිරීම	500 0	750 0	1,000 0
58.	කොළ කැඳ අලෙවිය	500 0	750 0	1,000 0
59.	කරවල වෙළෙඳාම	500 0	750 0	1,000 0
60.	කේක් වර්ග අලෙවිය	500 0	750 0	1,000 0
61.	පළතුරු බීම හා ෆෘට් සැලඩ් අලෙවිය	500 0	750 0	1,000 0
62.	පානීය ජලය බෝතල්ගත කිරීම	500 0	750 0	1,000 0
63.	ආහාර වර්ග විකිණීම	500 0	750 0	1,000 0
64.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	මල් ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
67.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
68.	නිවාස සිවිලිම සකස් කිරීම	500 0	750 0	1,000 0
69.	උත්සව අවස්ථාවන් සඳහා ආහාර පාන සැපයීම	500 0	750 0	1,000 0
70.	පොල්තෙල් මෝල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
71.	හයිඩ්‍රොලික් හෝස් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
72.	ලෝහ භාණ්ඩ නිෂ්පාදනය හා එකලස් කිරීම	500 0	750 0	1,000 0
73.	ඇලුමිනියම් ප්ලාස්ටික් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
74.	පොට් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
75.	තුනී ලෑලි හා ගම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
76.	ගබඩා භාණ්ඩ හා කාර්යාල භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0

12-929/4

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 ඔක්තෝබර් මස 11 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක ඉ-26 -IV යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එල්. එච්. සුදත් මංජුල,
සභාපති,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 26 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර,

(අ) රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තය*	*II වැනි තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750ට ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	කැටයම් කැපීමේ කර්මාන්තය	500 0	750 0	1,000 0
02.	කොසු, ඉදල්, පාපිසි නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය	500 0	750 0	1,000 0
03.	යාන්ත්‍රික රෙදි විවීම හා අත් යන්ත්‍ර මගින් රෙදි විවීමේ කර්මාන්තය	500 0	750 0	1,000 0
04.	දේශීය අමුද්‍රව්‍ය යොදාගෙන අත්කම් නිර්මාණ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
05.	රෙදිපිළි පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
06.	වැලි ගොඩ දැමීම	500 0	750 0	1,000 0
07.	කිතුල් ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
08.	පාවහන් නිෂ්පාදන	500 0	750 0	1,000 0
09.	මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
10.	දර මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	මෙට්ට නිෂ්පාදනය	500 0	750 0	1,000 0
12.	හඳුන්කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
13.	යාන්ත්‍රික නොවන වඩු කර්මාන්තය	500 0	750 0	1,000 0
14.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
15.	පපඩම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
16.	පිත්තල භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
17.	විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
18.	සුරුට්ටු හා බීඩි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
19.	වාස්තු කර්මාන්ත	500 0	750 0	1,000 0
20.	පැණි/හකුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
21.	රබර් වේලන දුම්ගෙයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	සත්ව ආහාර නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
23.	ලියුම් කවර හා වෙනත් කවර නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
24.	දැන්වීම් පුවරු, බැනර්, පෝස්ටර් සැකසීම	500 0	750 0	1,000 0
25.	කම්හලක් (ආයුධ නිපදවීම)	500 0	750 0	1,000 0
26.	කොහු කෙඳි ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
27.	යන්ත්‍රානුසාරයෙන් බීරළු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
28.	නළ ලිං සැකසීම	500 0	750 0	1,000 0
29.	බෑග් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
30.	මදුරු දැල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
31.	පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය නිෂ්පාදනය	500 0	750 0	1,000 0
32.	සුරතල් සතුන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
33.	මාළු ඇම සෑදීම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව කර්මාන්තය	II වැනි තීරුව පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750ට ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
34.	කඩදාසි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
35.	කලර් සිමෙන්ති සැකසීම	500 0	750 0	1,000 0
36.	පෙනේර, බාල්දි, කිරිගොටු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
37.	පහන් තිර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
38.	ඇලුමිනියම්/ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
39.	සුරුට්ටු හා බීඩි නිෂ්පාදනය කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12 - 929/5

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 නොවැම්බර් මස 11 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක ඉ-26 -V යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එල්. එච්. සුදත් මංජුල,
සභාපති,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 26 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ,

(අ) (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය ප්‍රකාරව බලපත්‍ර ගාස්තුවට හෝ එකී පනතේ 150 වන වගන්තිය ප්‍රකාරව කර්මාන්ත බද්දට යටතේ නොවන්නාවූ යම් ව්‍යාපාරයක් රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත 2019 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2018 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්,

(ආ) (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2019 අප්‍රේල් මස 01 දිනට ප්‍රථම ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි නියම කිරීමට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ඉහත කී උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
2018 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	*රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

12 - 929/6

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 නොවැම්බර් මස 11 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක ඉ-26 -VI යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එල්. එච්. සුදත් මංජුල,
සභාපති,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 26 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව රුවන්වැල්ල ප්‍රාදේශීය සභා සීමා තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට 0.5% වන බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1) (ආ) ඡේදය යටතේ වන "සමානුපාතය" වශයෙන් එම ඉඩම් ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 1:5 විය යුතු යැයි නියම කිරීමට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 - 929/7

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා පෝරම ගාස්තු හා වෙනත් සේවා ගාස්තු අයකිරීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 නොවැම්බර් මස 11 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක ඉ-26 -VII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එල්. එච්. සුදත් මංජුල,
සභාපති,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 26 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2019 ජනවාරි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත ආකාරයට පෝරම ගාස්තු හා වෙනත් සේවා ගාස්තු පැනවීමට යෝජනා කරන්නීය.

		රු. ශ.
01.	වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික පත්‍ර ගාස්තු	300 0
02.	වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික අයදුම්පත්‍ර ගාස්තුව	100 0
03.	අනුකූලතා සහතික ඉල්ලුම් පත්‍ර ගාස්තු අය කිරීම	100 0
04.	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව	
	නාගරික	500 0
	නාගරික නොවන	200 0
05.	ඉඩමේ සැලැස්ම අනුමත කිරීමේ අයදුම්පත්‍ර ගාස්තුව	
	නාගරික	200 0
	නාගරික නොවන	100 0
06.	අනතුරුදායක ගස් ඉවත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව	
	කොස් ගස් කැපීම	500 0
	කොස් ගස් නොවන	200 0
07.	වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව	100 0
08.	වරිපනම් වාර්තා නිකුත් කිරීමේ ගාස්තු	100 0
09.	වරිපනම් බදු ගෙවන බවට සහතික නිකුත් කිරීම සඳහා ගාස්තුව	100 0
09.	යන්ත්‍ර සූත්‍ර හා වාහන කුළියට දීම	
	* කම්පන තලනය (තැටිය) දිනකට	1,500 0
	* කම්පන තලනය (රෝල) දිනකට	2,500 0
	* RS - 1796 බැකෝ යන්ත්‍රය මීටර් පැය එකකට	2,250 0
	පැයකට අඩු කාල සීමාවකට අවම ගාස්තුව	2,000 0
	* ZA - 5198 බැකෝ යන්ත්‍රය මීටර් පැය එකකට	2,250 0
	පැයකට අඩු කාල සීමාවකට අවම ගාස්තුව	2,000 0
	* ZA - 5391 මෝටර් ග්‍රේඩරය මීටර් පැය 6 කට අඩු ඕනෑම කාලය සීමාවක් සඳහා	12,600 0
	ඊට වඩා වැඩිවන සෑම පැයකටම	2,700 0

	රු. ශ.
ගලි බවුසරය (එක් කාර්යයක් සඳහා)	
(i) වරිපනම් සීමාව තුළ	5,000 0
(iii) කොට්ඨාසය තුළ	6,000 0
(iii) කොට්ඨාසයෙන් පිටත	7,000 0

කොට්ඨාසයෙන් පිටත සේවා සඳහා යාමේ දී කි. මී. 1කට යාමට සහ ඒමට රු. 150 බැගින් දුර ප්‍රමාණය අනුව ගාස්තු අය කිරීම.

* ජල බවුසරය එක් බවුසරයකට (ලොකු) දින 1/2කට (කොට්ඨාශය තුළ)	රු. 2,500 0
දිනකට පැය 8ක් සඳහා (කොට්ඨාසය තුළ)	රු. 5,000 0
දිනකට පැය 8ක් සඳහා (කොට්ඨාසයෙන් පිටත)	රු. 5,000 0

කොට්ඨාසයෙන් පිටත කි. මී. 1කට යාමට රු. 90.00 ඒමට රු. 90 0 බැගින් අයකෙරේ.

ජල බවුසරය එක් බවුසරයකට (කුඩා)	රු. 2,500 0

කොට්ඨාසයෙන් පිටත යාමට සහ ඒමට එක් කි.මී. 1 රු. 150 බැගින් අයකෙරේ.

* ටිපර් රථය සඳහා ගාස්තුව :

කිලෝ මීටර් 1 සිට 100 දක්වා ගාස්තු අයකිරීමේදී කිලෝ මීටරයක් සඳහා රු. 80 0 බැගින් අයවේ.
කියුබ් 2.5 කිලෝ මීටර් 15කට අඩු ඕනෑම දුරක් සඳහා රු. 1,800 0 ක් ද,
පැය 8ක කාලයක් සඳහා කිලෝ මීටර් 100ට අඩු ඕනෑම දුරක් සඳහා රු. 11,000 ක් ද,
කිලෝ මීටර් 100 ඉක්මවා යන්නේනම්, කිලෝ මීටර් 100 සිට කිලෝ මීටර් 200 දක්වා කිලෝ මීටරයකට රු. 70 0 බැගින් ද,
කිලෝ මීටර් 200 සිට කිලෝ මීටර් 300 දක්වා කිලෝ මීටරේ කට රු. 60 0 බැගින් අයකෙරේ. (බල ප්‍රදේශයේ තුළ හා පිටත)

* මෝටර් ග්‍රේඩරය පැය 6කට අඩු ඕනෑම කාලයක් සඳහා	12,600 0

ඊට වඩා වැඩි වන සෑම පැයක් සඳහා ම 2,700 0 බැගින් අය කෙරේ.

* ප්ලාස්ටික් පුටු - එක් පුටුවක් රු. 10 0 කි
(නැතිවීමක දී පුටුවක මිල අය කෙරේ)

* කොඩි කණු - (එක් කොඩි කණුවක් සඳහා - රු. 20 0 කි
(කොඩි කණු ලබා ගැනීමේදී රු. 2,000.00 ක තැන්පතු මුදලක් ගෙවිය යුතුය. පූජනීය ස්ථාන, රජයේ ආයතනවලට නොමිලේ සැපයෙන අතර නැති වුවහොත් කණුවක වටිනාකම රු. 1107ක් හා ඉන් 5%ක් අයකෙරේ)

* බෞද්ධ කොඩි - (එක් බෞද්ධ කොඩියක් සඳහා - රු. 10 0 කි)
(පූජනීය ස්ථාන, රජයේ ආයතනවලට නොමිලේ සැපයෙන අතර නැතිවීමක දී හෝ පලුදු වීමකදී කොඩියේ වටිනාකම ගෙවිය යුතුය.)

* ජාතික කොඩි - (එක් ජාතික කොඩියක් සඳහා - රු. 10 0 කි.)
(පූජනීය ස්ථාන, රජයේ ආයතනවලට නොමිලේ සැපයෙන අතර නැතිවීමක දී හෝ පලුදු වීමකදී කොඩියේ වටිනාකම ගෙවිය යුතුය.)

* ප්ළෑෂ් ලයිට් රු. 600 0කි.
(ෆ්ලෑෂ් ලයිට් සඳහා දින තුනකට රු. 600.00 ක් බැගින් ද, වැඩිවන සෑම දිනක් සඳහා රු. 100.00 ක් බැගින් අයකෙරේ. බල ප්‍රදේශය තුළ මළගෙවල් ආගමික ස්ථානවලට නොමිලේ සැපයේ.)

10. 2019 වර්ෂය සඳහා නාගරික නොවන ප්‍රදේශවල ගොඩනැගිලි හා අනෙකුත් ඉදිකිරීම්, සංවර්ධන කටයුතු සඳහා අයකරනු ලබන පෙරසැරි ගාස්තු පහත පරිදි අය කෙරේ :

ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණ		*නේවාසික ගොඩනැගිලි සඳහා*	*වෙළෙඳ/අනිකුත් ගොඩනැගිලි සඳහා*
වර්ග මීටර්	*වර්ග අඩි*	*ගාස්තුව රු.*	*ගාස්තුව රු.*
45 අඩු	500 අඩු	500 0	1,000 0
46-90	501-1,000	1,200 0	1,750 0
91-180	1,001-2,000	2,000 0	2,750 0
181-270	2,001-3,000	3,000 0	3,500 0
271-450	3,001-5,000	4,000 0	5,000 0
451-675	5,001-7,500	4,500 0	6,500 0
676-900	7,501-10,000	5,500 0	7,000 0
900 වැඩි	10,000 වැඩි	6,500 0	11,000 0
		m^2 100 ට වැඩි වන සෑම m^2 කටම රු. 500 0 බැගින් අයකළ යුතු ය.	m^2 100 ට වැඩි වන සෑම m^2 කටම රු. 1,000 0 බැගින් අයකළ යුතු ය.

11. **නාගරික බලප්‍රදේශයෙන් පිටත ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සේවා ගාස්තු අය කිරීම**

සංවර්ධන කාර්යයයේ ස්වභාවය	*අයකළ ගාස්තුව*	
	නේවාසික (වර්ග මීටර් 1ක් සඳහා ගාස්තු)	*වාණිජ හා වෙනත් (වර්ග මීටර් 1ක් සඳහා ගාස්තු)*
1. නිසි බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම/කොටස් එකතු කිරීම/ නැවත ඉදිකිරීම		
ඉදිකිරීමේ අදියර		
* අත්තිවාරම් වැඩ පමණක් (කයිරු මට්ටම) සම්පූර්ණ කර ඇති විට	100 0	300 0
* වහල මට්ටම දක්වා (වහලය රහිතව) ඉදිකොට ඇති විට	200 0	500 0
* වහලය ඇතුළුව ඉදිකොට ඇති විට	300 0	1,000 0
* සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	400 0	1,500 0
2. මායිම් තාප්ප/ආරක්ෂිත බැම්ම ඉදිකිරීම (දික් අඩි)	200 0	300 0
3. ඉඩම/කුඹුරු ගොඩකිරීම සඳහා	සෑම වර්ග මීටර් 150 කට රු. 5,000.00 ක් බැගින්	
4. දුරකථන/විදුලි සංදේශ කුළුණු සඳහා	උස සෑම මීටර් 5 කට රු. 10,000.00 ක් බැගින්	
5. විශේෂ සංවර්ධන ව්‍යාපෘති	සෑම මිලියන 05 කටම රු. 10,000.00 ක් බැගින්	
6. අනුකූලතා සහතිකය නොමැතිව පදිංචි වීම / භාවිතා කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම	එක් දිනකට රු. 25.00 ක් බැගින්	

12. *ආරක්ෂිත වැටවල් සඳහා පෙරසැරි ගාස්තු අය කිරීම*

	නේවාසික ගොඩනැගිලි සඳහා ගාස්තු	*වෙළෙඳ/අනිකුත් ගොඩනැගිලි සඳහා ගාස්තු*
	රු. ශත	*රු. ශත*
ගොඩනැගිලි සීමාවෙන් පිට	200 0	300 0
ගොඩනැගිලි සීමාවේ	300 0	400 0

13. රුවන්වැල්ල මහජන ක්‍රීඩාංගනය ලබාදීම වෙනුවෙන් දෛනික ගාස්තු අය කිරීම පහත සඳහන් පරිදි වේ:

අනු. අංක	*කාරණය*	*මුදල් අයකිරීම*			
		ක්‍රීඩාංගනය සඳහා		*වොලිබෝල් ක්‍රීඩාපිටිය සඳහා*	
		දිවා කාලය පෙ.ව. 7.00 සිට ප.ව. 5.00 දක්වා	*රාත්‍රී කාලය ප.ව. 6.00 සිට පසුදා පෙ.ව. 6.00 දක්වා*	*දිවා කාලය පෙ.ව. 7.00 සිට ප.ව. 5.00 දක්වා*	*රාත්‍රී කාලය (සම්පූර්ණ ආලෝකය සහිතව) ප.ව. 6.00 සිට පසුදා පෙ.ව. 6.00 දක්වා*
1.	පළාත් පාලන දෙපාර්තමේන්තුවට අදාළ විශේෂිත ක්‍රීඩා වැඩසටහන්	දෛනික ගාස්තු- නිදහස් තැන්පත් ගාස්තු නිදහස්	නිදහස් නිදහස්	නිදහස් නිදහස්	නිදහස් නිදහස්
2.	ක්‍රීඩා අමාත්‍යාංශ (මධ්‍යම/පළාත්) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන විශේෂිත ක්‍රීඩා වැඩසටහන්	නිදහස් නිදහස්	නිදහස් නිදහස්	නිදහස් නිදහස්	නිදහස් නිදහස්
3.	රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සහෝදර රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතන වල විශේෂිත ක්‍රීඩා වැඩසටහන්	දෛනික ගාස්තු- නිදහස් තැන්පත් ගාස්තු රු. 2,500	නිදහස් රු. 2,500.00	නිදහස් නිදහස්	නිදහස් රු. 2,500.00
4.	රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රීඩා සමාජ, යෞවන සමාජ, ඇතුළු ලියාපදිංචි සංවිධාන මගින් සංවිධානය කරනු ලබන විශේෂිත ක්‍රීඩා වැඩසටහන්	දෛනික ගාස්තු රු. 2,000.00 තැන්පත් ගාස්තු රු. 2,500.00	රු. 4,000.00 රු. 2,500.00	නිදහස් නිදහස්	රු. 7,500.00 රු. 2,500.00
5.	රුවල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත සහෝදර රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතන සඳහා හා ලියාපදිංචි ක්‍රීඩා සමාජ, යෞවන සමාජ වැනි සංවර්ධනවල ක්‍රීඩා වැඩසටහන් සඳහා	දෛනික ගාස්තු රු. 2,000.00 තැන්පත් ගාස්තු රු. 2,500.00	රු. 5,000.00 රු. 2,500.00	රු. 1,500.00 රු. 2,500.00	රු. 7,500.00 රු. 2,500.00

අනු අංක	කාරණය	මුදල් අයකිරීම			
		ක්‍රීඩාංගනය සඳහා		වොලිබෝල් ක්‍රීඩාපිටිය සඳහා	
		දිවා කාලය පෙ.ව. 7.00 සිට ප.ව. 5.00 දක්වා	රාත්‍රී කාලය ප.ව. 6.00 සිට පසුදා පෙ.ව. 6.00 දක්වා	දිවා කාලය පෙ.ව. 7.00 සිට ප.ව. 5.00 දක්වා	රාත්‍රී කාලය (සම්පූර්ණ ආලෝකය සහිතව) ප.ව. 6.00 සිට පසුදා පෙ.ව. 6.00 දක්වා
6.	දෙහිඕවිට අධ්‍යාපන කලාපය තුළ පාසල් හා අධ්‍යාපන කාර්යාලවල විශේෂ ක්‍රීඩා වැඩසටහන් සඳහා	දෛනික ගාස්තු රු. 2,000.00 තැන්පත් ගාස්තු රු. 2,500.00	නිදහස් රු. 2,500.00	නිදහස් නිදහස්	රු. 2,500.00 රු. 2,500.00
7.	පුද්ගලික ආයතන මගින් සංවිධිනය කරන විශේෂිත ක්‍රීඩා වැඩසටහන්	දෛනික ගාස්තු රු. 7,500.00 තැන්පත් ගාස්තු- රු. 2,500.00	රු. 10,000.00 රු. 2,500.00	රු. 2,500.00 රු. 2,500.00	රු. 10,000.00 රු. 2,500.00
8.	සැණකෙලි හා සංගීත ප්‍රසංග සඳහා ලබා දෙන්නේ නම් පමණක්	දෛනික ගාස්තු රු. 15,000.00 තැන්පත් ගාස්තු- රු. 2,500.00	රු. 25,000.00 2,500.00		

සැ.යු. -

තැන්පතු වශයෙන් අය කරන මුදල තරග අවසානයේ දී ක්‍රීඩාංගන භාරකරුගේ වාර්තාව අනුව, ක්‍රීඩාංගනය සඳහා යම් කිසි අලාභහානියක් සිදු වී නොමැති නම්, තැන්පත් කළ මුළු මුදලම ආපසු ගෙවීමටත්, අලාභ හානියක් සිදු වූයේ නම් අලාභය ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරියෙකු ලවා තක්සේරු කර එම මුදල තැන්පත් මුදලින් අඩු කරගෙන ඉතිරි මුදල ආපසු ගෙවීමටත්, තැන්පතු මුදලට වඩා වැඩි අලාභයක් සිදු වූයේ නම් කාර්මික නිලධාරි වාර්තාව අනුව අදළ පාර්ශවය වැඩිපුර වන මුදල සභාව වෙත ගෙවීමට බැඳී සිටිය යුතුයි.

14. කොම්පෝස්ට් පොහොර අලෙවි කිරීම

*කි.ග්‍රෑ 1 සිට කි. ග්‍රෑ. 99 දක්වා රු. 12 0

*කි.ග්‍රෑ 100 ට වැඩි තොග මිල රු. 10 0

15. ආදාහනාගාරය හා සුසාන භූමි ලබාදීම වෙනුවෙන් ගාස්තු අයකිරීම පහත පරිදි වේ :-

		රු. ශත
1.	බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට	6,000 0
2.	බල ප්‍රදේශයෙන් පිටත පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට	7,000 0
3.	භූමදාන ගාස්තු	25 0
4.	ආරක්ෂක ඇප මුදල්	100 0

මඳුරාවල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මඳුරාවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2018 වර්ෂයේ නොවැම්බර් මස 02 වැනි දින පවත්වන ලද මඳුරාවල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

2019 වර්ෂය සඳහා පනවන ලද එම වරිපනම් මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර, ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මඳුරාවල ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 12 වැනි දින,
මඳුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇතිබලතල ප්‍රකාර, මඳුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2007 වර්ෂයේ වාර්ෂික වටිනාකම සඳහා 2006 වර්ෂයේ දී සිදුකරන ලද තක්සේරුව 2019 වර්ෂය සඳහා පිළිගැනීමටත්,එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට (6%) ක වරිපනම් බද්දක් පනවා අය කළයුතු යැයි යෝජනා කරමි.

12-743/1

මඳුරාවල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මඳුරාවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2018 වර්ෂයේ නොවැම්බර් මස 02 වැනි දින පවත්වන ලද මඳුරාවල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරනලද බව මෙයින් නිවේදනය කරමි.

2019 වර්ෂය සඳහා පනවන ලද එම අක්කර බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර, ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම්, ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මඳුරාවල ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 12 වැනි දින,
මඳුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මඳුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩි සෑම ඉඩමක් වෙනුවෙන් ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් මත 2019 වර්ෂය සඳහා රුපියල් දහය (10/-) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා පනවා අය කළයුතු යැයි යෝජනා කරමි.

12-743/2

මඳුරාවල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ මඳුරාවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2018 වර්ෂයේ නොවැම්බර් මස 02 වැනි දින පවත්වන ලද මඳුරාවල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මඳුරාවල ප්‍රාදේශීය සභාව.

2018දෙසැම්බර් මස 12 වැනි දින,
මඳුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මඳුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ IIවැනි තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

i තීරුව		*ii තීරුව*		
කර්මාන්තයේ ස්වභාවය		*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 ට නොවැඩි	*රු. 750 ඉක්මවන රු.1500 ට අඩු*	*රු. 1500ට වැඩි*
		අවස්ථාවක ගෙවිය යුතු වාර්ෂික බද්දෙ ප්‍රමාණය රුපියල්		
01.	තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.	500.00	750.00	1,000.00
02.	රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.	500.00	750.00	1,000.00
03.	කම්මලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
04.	තේ කොල කුළු බඩු බෙහෙත් බඩු වර්ග පහන් තිර පැකට් කිරීමේ පවත්වාගෙන යාම.	500.00	750.00	1,000.00
05.	ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
06.	අවමංගල්‍ය භාණ්ඩ නිෂ්පාදනය පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
07.	හඳුන්කුරු නිෂ්පාදනය පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
08.	පොලිතින් නිෂ්පාදනය ආශ්‍රිතව භාණ්ඩ නිපදවීම පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
10.	කුෂන් වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
11.	මෙට්ට නිෂ්පාදනය පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00

		i තීරුව *කර්මාන්තයේ ස්වභාවය*	*ii* තීරුව *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
			රු. 750 ට නොවැඩි	*රු. 750 ඉක්මවන රු.1500 ට අඩු*	*රු. 1500ට වැඩි*
			අවස්ථාවක ගෙවිය යුතු වාර්ෂික බද්දෙ ප්‍රමාණය රුපියල්		
12.	පිනතුර රාමු කිරීම පවත්වාගෙන යාම		500.00	750.00	1,000.00
13.	රබර් මුද්‍රා,අංක තහඩු හෝ නාම පුවරු නිෂ්පාදනය පවත්වාගෙන යාම		500.00	750.00	1,000.00
14	ලී බිරළු හා කැටයම් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම		500.00	750.00	1,000.00
15.	සපත්තු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම		500.00	750.00	1,000.00
16.	පපඩම් සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම		500.00	750.00	1,000.00
17.	උළු ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම		500.00	750.00	1,000.00
18.	බීඩි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම		500.00	750.00	1,000.00
19.	ගමන් මළු, ජර්කින්, වැහිකබා නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම		500.00	750.00	1,000.00
20.	අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම		500.00	750.00	1,000.00
21.	ත්‍රී රෝද රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම		500.00	750.00	1,000.00
22.	රබර් මැෂිම දුම්ගෙය පවත්වාගෙන යාම		500.00	750.00	1,000.00
23.	විදුරු කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම		500.00	750.00	1,000.00
24.	මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම		500.00	750.00	1,000.00
25.	කුළු බඩු වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම		500.00	750.00	1,000.00
26.	මනාලියන් හැඩගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම		500.00	750.00	1,000.00
27.	බිම් මල් නිෂ්පාදනය පවත්වාගෙන යාම		500.00	750.00	1,000.00
28.	ඇඟළුම් ආම්පන්න නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම		500.00	750.00	1,000.00

12-743/3

මදුරාවල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය යටතේ මදුරාවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2018 වර්ෂයේ නොවැම්බර් මස 02වැනි දින පවත්වන ලද මදුරාවල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මදුරාවල ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 12 වැනි දින,
මදුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මදුරාවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් මදුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2018 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ Iවැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් අතුළත පවත්නා අවස්ථාවක එහි IIවැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

i තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයේ ලත් ලැබීම් ප්‍රමාණය*	*ii තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු.ශත*
01. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
02. රු. 6,000 ඉක්මවන නමුත් 12,000 නොඉක්මවන විට	90.00
03. රු. 12,000 ඉක්මවන නමුත් 18,750 නොඉක්මවන විට	180.00
04. රු. 18,750 ඉක්මවන නමුත් 75,000 නොඉක්මවන විට	360,00
05. රු. 75,000 ඉක්මවන නමුත් 1,50,000 නොඉක්මවන විට	1,200.00
06. රු.1,50,000 ඉක්මවන විට	3,000.00

12-743/4

මදුරාවල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය යටතේ මදුරාවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ නොවැම්බර් මස 02වැනි දින පවත්වන ලද මදුරාවල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මදුරාවල ප්‍රාදේශීය සභාව.

2018දෙසැම්බර් මස 12 වැනි දින,
මදුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තිය යටතේ මදුරාවල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනත යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2015 සැප්තැම්බර් 22 වන දින බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කරන ලද 2015.12.28 දින අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, භෝජන ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව, මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, අවමංගල්‍ය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සහ හෝටල් හා ලැගුම් හල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යන අතුරු ව්‍යවස්ථාවන්හි විස්තර කර ඇති මෙහි පහත උපලේඛණයේ 1 වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2019 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ 11 තීරුවේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවටද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විට දී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2018 වර්ෂයේ ලැබීම්වලින් 1%ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවද යෝජනා කරමි.

	I තීරුව	*II තීරුව*		
	කර්මාන්තයේ ස්වභාවය	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 ට නොවැඩි	*රු. 750 ඉක්මවන රු.1500 ට අඩු*	*රු. 1500ට වැඩි*
		අවස්ථාවක ගෙවිය යුතු වාර්ෂික ගාස්තුවේ ප්‍රමාණය රුපියල්		
	පීඩාකාරී ව්‍යාපාර :			
1.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.	500.00	750.00	1,000.00
2.	සම් පදම් කිරීම.	500.00	750.00	1,000.00
3.	සම් විකිණීම	500.00	750.00	1,000.00
4.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500.00	750.00	1,000.00
5.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500.00	750.00	1,000.00
6.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500.00	750.00	1,000.00
7.	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම	500.00	750.00	1,000.00
8.	කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500.00	750.00	1,000.00
9.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම	500.00	750.00	1,000.00
10.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1,000.00
11.	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500.00	750.00	1,000.00
හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වන වගන්ති මගින් හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 26 දින පැවැති ප්‍රාදේශීය සභා මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. සී. ය්‍රූ. විජයරත්න,
සභාපති,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 29 වැනි දින,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභා කාර්යාලය,
හොරොව්පොතාන.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147(1) (ආ) ඡේදයෙන් හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා හොරොව්පොතාන ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2019 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

	I වැනි තීරුව *බලය දෙනු ලබන කාර්යය* *(අතුරු ව්‍යවස්ථා පනවනු ලැබ ඇති කර්මාන්ත)*	*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු.1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	බේකරියක් පවත්වාගෙන යාම, නගර බද සහ ගම්බද	500 0	750 0	1,000 0
02.	මස් වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	ගෝ සාතක ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	හෝටලයක් හෝ භෝජනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	කිරි මුදවනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	සිසිල්බීම නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I වැනි තීරුව *බලය දෙනු ලබන කාර්යය* *(අතුරු ව්‍යවස්ථා පනවනු ලැබ ඇති කර්මාන්ත)*		*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*	
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු.1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
08. යෝගට් නිෂ්පාදනය සඳහා	500 0	750 0	1,000 0
09. අයිස්ක්‍රීම් නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10. සංචාරක මාළු වෙළඳාම	500 0	750 0	1,000 0
11. කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12. ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. තේ වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15. රසකැවිලි නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16. අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-883/3

හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය අනුව හොරොව්පොතාන ප්‍රදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 26 වැනි දින පැවැති ප්‍රාදේශීය සභා මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. සී. යූ. විජයරත්න,
සභාපති,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 29 වැනි දින,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, හොරොව්පොතාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ද,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, බද්දට යටත්වන සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2019 මාර්තු 31 වැනි වැනි දිනට ප්‍රථම හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි ද යෝජනා කරමි.

උපලේඛනය

1 වැනි තීරය		*11 වැනි තීරය*		
කර්මාන්තයේ ස්වභාවය		*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	වී මෝල්	500 0	750 0	1,000 0
02.	ගඩොල් කපන ස්ථාන	500 0	750 0	1,000 0
03.	වැල්ඩින් වැඩපල	500 0	750 0	1,000 0
04.	යාන්ත්‍රික වඩුමඩු	500 0	750 0	1,000 0
05.	කළුගල් කඩන ස්ථාන	500 0	750 0	1,000 0
06.	ඇඹරුම්හල්	500 0	750 0	1,000 0
07.	රන් රිදී භාණ්ඩ නිෂ්පාදන	500 0	750 0	1,000 0
08.	ලී මෝල්	500 0	750 0	1,000 0
09.	ගෘහ භාණ්ඩ නිෂ්පාදන හල්	500 0	750 0	1,000 0
10.	යකඩ කම්හල්	500 0	750 0	1,000 0

12-883/4

හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය අනුව හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 26 වැනි දින පැවැති ප්‍රාදේශීය සභා මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. සී. යූ. විජයරත්න,
සභාපති,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 29 වැනි දින,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් හොරොව්පොතාන ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2018 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකිරීමට; සහ

(ආ) (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත් වන සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2019.03.31 වන දිනට ප්‍රථම හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු බවට නියම කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව*
	2018 වර්ෂයේ දී ආදායම	*රු. ශත*
1.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
2.	රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
3.	රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
4.	රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	300 0
5.	රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
6.	රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

12-883/5

හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයේ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 148 වැනි වගන්තිය අනුව හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 26 වැනි දින පැවැති ප්‍රාදේශීය සභා මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. සී. යූ. විජයරත්න,
සභාපති,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 29 වැනි දින,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය යටතේ හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර හොරොව්පොතාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි II වැනි තීරුවේ නිරූපිත බද්දක් පනවා 2019 වර්ෂය සඳහා අයකළ යුතු යැයි ද,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව බද්දට යටත්වන සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2019.03.31 දිනට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු බව නියම කිරීමට මම යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
	රු. ශත
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් හෝ කරත්තයක් සඳහා-	25 0
(අ) වෙළෙඳ කාර්ය සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළෙඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම්	4 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත් කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	07 50
සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහා	50 0

12-883/6

හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට විනෝද බදු පැනවීම

1984 අංක 27 දරන විනෝද බදු (සංශෝධිත පනතින් 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 26 වැනි දින පැවැති ප්‍රාදේශීය සභා මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. සී. යූ. විජයරත්න,
සභාපති,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 29 වැනි දින,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1984 අංක 27 දරන විනෝද බදු (සංශෝධිත) පනතින් 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව, හොරොව්පොතාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවත්වනු ලබන විනෝද බද්දට යටත් යම් කාර්යයකට ඇතුළත්වීම සඳහා අයකරනු ලබන ගාස්තුවෙන් 10%ක විනෝද බද්දක් පනවා අයකළ යුතු යැයි නියම කිරීමට යෝජනා කරමි.

12-883/7

හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසර දැන්වීම්

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වැනි වගන්තියෙන් හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව 1988.08.23 දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV(ආ) කොටසේ පළාත් පාලන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක/දෘශ්‍ය පරිසර විධිවිධාන ප්‍රකාර හොරොව්පොතාන ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් ක්‍රමයකට පාරකට, ඇලකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2019 වර්ෂයේ සිට අය කිරීමට 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 26 වැනි දින පැවැති ප්‍රාදේශීය සභා මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. සී. යූ. විජයරත්න,
සභාපති,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 29 වැනි දින,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.03.30 වැනි දින අංක 1960/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) කොටසේ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 33A වැනි කොටසේ ප්‍රචාරක/දෘශ්‍ය පරිසර දැන්වීම් විධිවිධාන ප්‍රකාර හොරොව්පොතාන ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් ක්‍රමයකට පාරකට, ඇලකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2019 වර්ෂයේ දී අයකළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

	I වන තීරය	*II වන තීරය* රු. ශත
01.	විදුලි බුබුළු, වෙනත් විද්‍යුත් උපකරණ යොදා දැන්වීම් පුවරුවක් වෙනුවෙන් වර්ග අඩියකට	60 0
02.	ස්ථිර දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියකට	60 0
03.	ඉඩම් වෙන්දේසි කිරීම සම්බන්ධ දැන්වීම් පුවරුවක් වෙනුවෙන් වර්ග අඩියකට	25 0
04.	ඉඩම් වෙන්දේසි කිරීමේ රෙදි බැනරයක් සඳහා (එක් මසකට)	1,000 0
05.	වෙනත් සාමාන්‍ය රෙදි බැනරයක් සඳහා (එක් මසකට)	1,000 0
06.	කිසියම් බැම්මක, බිත්තියක ප්‍රදර්ශන දැන්වීමක් වසරකට වර්ග අඩියකට	30 0
07.	ලී රාමුවක සවි කළ කණ්ණුවක් හෝ ගල්වල ප්‍රදර්ශනය කරන කුඩා වර්ගයේ දැන්වීම් පුවරු සඳහා වර්ග අඩියකට	5 0
08.	කිසියම් වීථියක හෝ පාරකට මුහුණලා පිහිටි ගොඩනැගිල්ලේ මුහුණතෙහි සීමාව ඉක්මවා යන දිගින් යුතු ප්‍රචාරක දැන්වීමක් සවි කිරීම, එල්ලා තැබීම හෝ පින්තාරු කිරීම වෙනුවෙන් වර්ග අඩියකට	30 0

12-883/8

හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය වෙනත් ගාස්තු අය කිරීම

යෝජනාව

හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 26 වැනි දින පැවැති ප්‍රාදේශීය සභා මාසික මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 08 යටතේ පහත සඳහන් ගාස්තු අය කිරීමට යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. සී. යූ. විජයරත්න,
සභාපති,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 29 වැනි දින,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභා කාර්යාලය,
හොරොව්පොතාන.

		රු.
1.	වරිපනම් ලේඛනයේ නම් වෙනස් කිරීමේ පෝරම නිකුත් කිරීමේ ගාස්තු	1,000.00
2.	වීථිරේඛා සහතික හා නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීමේ ගාස්තු (පරීක්ෂණ ගාස්තු රු. 300.00, සහතික පත්‍ර ගාස්තු රු. 700.00 - 300.00+700.00 = 1,000.00)	1,000.00
3.	වෙනත් සහතික හා අවසර ලිපි නිකුත් කිරීමේ ගාස්තු (පරීක්ෂණ ගාස්තු ඇතුළුව)	1,000.00
4.	ගොඩනැගිලි අයදුම් පත්‍ර ගාස්තු	500.00
5.	ගොඩනැගිලි අයදුම් පත්‍ර පරීක්ෂණ ගාස්තු (වෙළඳ)	1,500.00
6.	ගොඩනැගිලි අයදුම් පත්‍ර පරීක්ෂණ ගාස්තු (නිවාස)	750.00
7.	ව්‍යාපාරික කාර්යයන් සඳහා වූ ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු ව.අ. 01 කට	07.50
8.	ව්‍යාපාරික නොවන කාර්යයන් සඳහා වූ ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු ව.අ. 01 කට	04.00
9.	අවසර ගැනීමකින් තොරව කරන ඉදිකිරීම් සඳහා දඩ වශයෙන් අය කරනු ලබන ගාස්තු	10,000.00
10.	අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තු	1,000.00
11.	පුස්තකාල ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමේ ගාස්තු (බල ප්‍රදේශයේ පාසල් අයදුම්කරුවන් සඳහා)	50.00
12.	පුස්තකාල ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමේ ගාස්තු (බල ප්‍රදේශයේ වැඩිහිටි අයදුම්කරුවන් සඳහා)	100.00
13.	පුස්තකාල ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමේ ගාස්තු (බල ප්‍රදේශයෙන් පිට පාසල් අයදුම්කරුවන් සඳහා)	100.00
14.	පුස්තකාල ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමේ ගාස්තු (බල ප්‍රදේශයෙන් පිට වැඩිහිටි අයදුම්කරුවන් සඳහා)	250.00
15.	පිඹුරු පිටපත් අනුමත කිරීමේ ගාස්තු	1,000.00
16.	පරිසර බලපත්‍ර අයදුම්පත් නිකුත් කිරීමේ ගාස්තු	250.00
17.	පරිසර බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පත් නිකුත් කිරීමේ ගාස්තු	100.00
18.	පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු (වර්ෂ තුනකට වලංගු බලපත්‍රය)	4,000.00
19.	දීර්ඝ කාලීන බලපත්‍ර නිකුත් කිරීම සඳහා එකඟතා සහතික ලබාදීමේ ගාස්තු	1,500.00
20.	පාපැදි බලපත්‍ර නිකුත් කිරීම - ලිපි ද්‍රව්‍ය ගාස්තු	16.00
21.	කර්මාන්ත ගිවිසුම් කට්ටලයක් නිකුත් කිරීම සඳහා ගාස්තු	1,000.00
22.	අයාලේ යන ගවයින් ඇල්ලීම වෙනුවෙන් අයකරන ගාස්තු	500.00
23.	අයාලේ යන ගවයින් අල්ලා නඩත්තු කිරීම වෙනුවෙන් අයකරන ගාස්තු (දිනකට)	100.00
24.	අයාලේ යන ගවයින් අල්ලා ආරක්ෂා කිරීම වෙනුවෙන් අයකරන ගාස්තු (දිනකට)	100.00
25.	අයාලේ යන ගවයින් ඇල්ලීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම - පරිපාලන හා වෙනත් ගාස්තු	1,000.00
26.	වාණිජ කටයුතු සඳහා බණිජ වර්ග ප්‍රවාහනය කිරීමට ප්‍රාදේශීය සභාව සතු මාර්ග භාවිත කිරීම වෙනුවෙන් කියුබ් 01ට අය කරනු ලබන ගාස්තු	150.00
27.	වාණිජ නොවන කාර්යයන් සඳහා බණිජ වර්ග ප්‍රවාහනය කිරීමට ප්‍රාදේශීය සභා මාර්ග භාවිත කිරීම වෙනුවෙන් කියුබ් 05ට අඩු ප්‍රවාහන කටයුතු සඳහා කියුබ් 01ට අය කරනු ලබන ගාස්තු	100.00
28.	ට්‍රැක්ටර් රථ කුලියට දීම ට්‍රේලරය සමග දිනකට	6,000.00
29.	ජල බවුසරයෙන් ජලය සහිතව කි.මී. 03 ක් ඇතුළත සැපයීම සඳහා ගාස්තු	1,000.00

		රු.
30.	ජල බවුසර් මගින් ජලය ප්‍රවාහනය කරදීම (පෞද්ගලික මංගල - අවමංගල්‍ය සඳහා) කි.මී. 03 ඇතුළත අමතර කි.මී. 01 ක් සඳහා ගාස්තු	50.00
31.	ජල බවුසරය කුලියට දීම ට්‍රැක්ටරය සහිතව (දිනකට)	6,000.00
32.	ජල බවුසරය කුලියට දීම ට්‍රැක්ටරය රහිතව (දිනකට)	2,500.00
33.	ගලි බවුසරය සේවා (ටැංකි 01 ඉවත ලීම) සඳහා	7,000.00
34.	ගලි බවුසරය ප්‍රවාහන ගාස්තු කි.මී. 01 සඳහා	40.00
35.	ජල බවුසර් සැපයීම (පෞද්ගලික මංගල - අවමංගල්‍ය සඳහා) දින 01 ක් සඳහා	2,000.00
36.	රැස්වීම් ශාලාව කුලියට ලබා දීම (වරුවක් - පැය 06ක කාලයක් සඳහා)	5,000.00
37.	රැස්වීම් ශාලාව කුලියට ලබා දීම (දිනකට)	10,000.00
38.	රැස්වීම් ශාලාව කුලියට ලබා දීම (දින 1 1/2 කට)	20,000.00
39.	(මෙම සෑම අවස්ථාවකදීම ශබ්දවාහිනී යන්ත්‍ර (Sounds) ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන්නේ නම් අමතර ගාස්තුව)	5,000.00
40.	මෝටර් ග්‍රේඩරය මීටර් පැය 01 (තලය අඩි 08)	4,000.00
41.	බැකෝ ලෝඩරය මීටර් පැය 01 ක් සඳහා	3,500.00
42.	ටිපර් රථ කියුබ් 02 (දිනකට පැය 08)	10,000.00

12-883/9

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 101-2018 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වූ 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර උතුරු මැද පළාතේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016 මාර්තු මස 30 වැනි දිනැති අංක 1960/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (අ) වන කොටසේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ද, උතුරු මැද පළාතේ පළාත් සභාව අනුමත කරන ලද බව 2017 ජුනි මස 09 වැනි දිනැති අංක 2022/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (අ) වන කොටස *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූද, උතුරු මැද පළාතේ ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා, 2017 අගෝස්තු මස 01 වැනි සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* 2017.11.02 වැනි දින අංක IV (ආ) කොටසේ පළකර වැළඳගත් බවත්, එසේ පිළිගත් සම්මත අතුරු ව්‍යවස්ථා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළ යුතු බවත් ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-989/1

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින තීරණ අංක 101 (i)-2018 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (1) උපවගන්තිය යටතේ නොච්චියාගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක්, නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2018 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2018 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි මම තීරණය කරන අතර මෙම මුදල් 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම ගෙවිය යුතු බව තවදුරටත් දන්වා සිටිමි.

උපලේඛනය

I වැනි තීරය *පෙර (2017) වර්ෂයේ දී ආදායම*	*11 වැනි තීරය* *රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

12 - 989/2

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින තීරණ අංක 101 (ii)-2018 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (I) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2018 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි මම තීරණය කරන අතර මෙම මුදල් 2018 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම ගෙවිය යුතු බව තවදුරටත් දන්වා සිටිමි.

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*		
	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
	රු. 750 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 ට නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01. උළු, කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
02. සපත්තු නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
03. පරණ ලෝහ එකතු කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
04. ගම් වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
05. විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
06. ටයර් ප්‍රතිසංස්කරණය කරනු ලබන්නා වූ හෝ කට්ට කැපීම කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප සෑදීම	500 0	750 0	1,000 0
08. යාන්ත්‍රික බලය යොදා ගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09. පිටි හෝ කුළුබඩු ඇඹරීම	500 0	750 0	1,000 0
10. යන්ත්‍ර මගින් රෙදි මැසීමේ ආයතනයක් පවත්වාගෙන යාම (මෙම මුදල එක් යන්ත්‍රයක් සඳහා පමණක් වලංගු වේ)	500 0	750 0	1,000 0
11. පොලිතින්, සෙලියුලොයිඩ් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය, අලෙවිය	500 0	750 0	1,000 0
12. කපුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
13. බූට් සපත්තු හෝ පාවහන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
14. ඉටිපන්දම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
15. කොප්පරා නිෂ්පාදනය	500 0	750 0	1,000 0
16. යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
17. යන්ත්‍රානුසාරයෙන් තලතෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
18. ගිනි පෙට්ටි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
19. ඇසිටලින් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
20. උළු නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
21. ගඩොල් නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
22. සිගරට් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
23. බීඩි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
24. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
25. කොහු නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
26. ගෝනි නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
27. වඩු වැඩ කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28. රස කැවිලි නිෂ්පාදනය	500 0	750 0	1,000 0

I වැනි තීරය	*II වැනි තීරය*		
	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
	රු. 750 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 ට නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
29. පොල්කටු අඟුරු නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
30. කොහු හෝ පුළුන් මෙට්ට හෝ කොට්ට හෝ කුෂන් නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
31. අළුත් ටයර් හෝ ටියුබ් නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
32. අශුද්ධ ලෝහ උණු කිරීම	500 0	750 0	1,000 0
33. ගම්, ඉටි හෝ දුම්මල නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
34. බිම ඔපදමන පොලිෂ් නිෂ්පාදනය	500 0	750 0	1,000 0

අප්‍රසන්න ව්‍යාපාර

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 ට නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
සිමෙන්ති නිපදවීම	500 0	750 0	1,000 0
පාසල් රට හුණු නිපදවීම	500 0	750 0	1,000 0
ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
ලියන තීන්ත, අච්චු තීන්ත, ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
පොටි නිපදවීම	500 0	750 0	1,000 0
වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
උම්බලකඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම	500 0	750 0	1,000 0
පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
ගඩොල් පිළිස්සීම	500 0	750 0	1,000 0
ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
ටයර් ටියුබ් වොල්කනයිස් කිරීම	500 0	750 0	1,000 0
ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම	500 0	750 0	1,000 0
පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0

I වැනි තීරය	*II වැනි තීරය*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 ට නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
පින්තාරු කිරීම්ත වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම			
දැව ඉරීම	500 0	750 0	1,000 0
පොල් ලෙලි පෙඟවීම හෝ පල් කිරීම	500 0	750 0	1,000 0
රසකැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
සිරප් හෝ පළතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
ලෝහ සුන්බුන් තබා ගැනීම	500 0	750 0	1,000 0
අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම	500 0	750 0	1,000 0
සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
සත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 කට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුලු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම	500 0	750 0	1,000 0
පශු වෛද්‍ය ගිලන් හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
සත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0

අන්තරාදයක ව්‍යාපාර

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 ට නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
කළුගල් කැණීම හෝ කැඩීම	500 0	750 0	1,000 0
ලෝහ සංස්කාරය කර්මාන්ත	500 0	750 0	1,000 0
ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම)			
ගිණිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
විසිතුරු පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500 0	750 0	1,000 0

I වැනි තීරය	*II වැනි තීරය*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 ට නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
පාපැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම	500 0	750 0	1,000 0
යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත් වැඩියා කිරීම	500 0	750 0	1,000 0
පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
පිදුරු තබා ගැනීම	500 0	750 0	1,000 0
කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
පොල්තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
එළවළු තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0

අප්‍රසන්න හා අන්තරාදයක ව්‍යාපාර

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 ට නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
හිරිගල් හෝ හුණු ගල් පිළිස්සීම	500 0	750 0	1,000 0
කෘමිනාශක දිලීර නාශක පැලෑටි නාශක හෝ පළිබෝධ නාශක නිපදවීම හෝ නැවත පිරවීම	500 0	750 0	1,000 0
මෝටර් වාහන බෝඩ් තැනීම	500 0	750 0	1,000 0
බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
මෝටර් වාහන අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
ලෝහ වර්ග පෑස්සීම	500 0	750 0	1,000 0
බැටරි විද්‍යුත් ආරෝපනය කිරීම හෝ අළුත් වැඩියා කිරීම	500 0	750 0	1,000 0
විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම	500 0	750 0	1,000 0
රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින තීරණ අංක 101 (iii)-2018 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (I) වන උපවගන්තියෙන් නොච්චියාගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශයක් යැයි ප්‍රකාශිත ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි, ඉඩම්වල, ගෙපත්වල, නිශ්චල දේපළ සඳහා 2018 වර්ෂයේදී සඳහන් කරන ලද තක්සේරුව 2019 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එම තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් නොච්චියාගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට 15% ක වරිපනම් පනවා අයකළ යුතු බවටත් සභාපති ලෙස මම තීරණය කරමි.

තවද 2019 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම්, මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක්ම තුළ දී සමාන වාරික හතරකින් නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් යෝජනා කරන අතර, 2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් ගාස්තු 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට මත්තෙන් නොච්චියාගම ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් ප්‍රමාණයෙන් සියයට පහක (5%) වට්ටමක් ද ලබා දීමට මම තීරණය කරමි.

12 - 989/4

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 149 වැනි වගන්තිය හා 147 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින තීරණ අංක 101 (iv)-2018 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වන වගන්තිය යටතේ නොච්චියාගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් කාර්යක් සඳහා නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2019 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01. ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02. හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03. බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04. ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05. තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06. කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07. බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08. කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09. කිරි විකිණීම	500 0	750 0	1,000 0
10. මාළු විකිණීම	500 0	750 0	1,000 0
11. මස් විකිණීම	500 0	750 0	1,000 0
12. අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15. ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16. පෞද්ගලික වෙළෙඳපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17. කොණ්ඩා සැකසීමේ සැලුන් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18. බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19. ගෝඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

ඉහත I වැනි කොටස් සඳහන් කර්මාන්ත අතරින් අංක 2 යටතේ සඳහන් කිසියම් හෝටලයක් හෝ අංක 4 යටතේ සඳහන් කිසියම් ආපනශාලාවක් හෝ අංක 1 යටතේ සඳහන් වන කිසියම් නවාතැන් පොළක්, හෝ ඒ හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන්පොළ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ පිළිගනු ලැබ ඇත්තා වූ ද, වන අවස්ථාවක, ඉහත 2 වැනි කොටසේ කුමක් සඳහන්ව තිබුණ ද ඒ හෝටලය හෝ ආපනශාලාව හෝ නවාතැන්පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපනශාලාවේ හෝ නවාතැන්පොළෙහි හෝ 2018 වර්ෂය තුළ ලැබීම්වලින් සියයට එකක් (1%) ක් විය යුතු ය.

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව පුස්තකාල ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ සඳහන් පරිදි මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින තීරණ අංක 101 (v)-2018 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 520/7 දරන 1988.08.23 දිනැති *අති විශෙෂ* ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවේ පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල බලතල ප්‍රකාර, එහි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් තැන්පත් මුදල වන, මුල්වරට සාමාජිකත්වය ලබා ගන්නා වැඩිහිටි තැනැත්තෙකු සඳහා රු. 175ක් විය යුතු බවත්, මුල්වරට සාමාජිකත්වය ලබා ගන්නා ළාබාල තැනැත්තෙකු සඳහා රුපියල් 150 0 විය යුතු බවත්, එම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් දඩය එක් පොතක් වෙනුවෙන්, ප්‍රමාද වන දින ගණන් අතරට ගැනෙන ඉරිදා සහ රජයේ නිවාඩු දින අත්හළ විට ඉතිරි වන දින ගණන සඳහා දිනකට රුපියල් 1.00 බැගින් අය විය යුතුය යන්න සහ මෙම තීරණය 2019.01.01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද නොච්චියාගම ප්‍රාදේශීය සභාව තීරණය කරන්නීය.

12 - 989/6

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග හා රඟදැක්වීම පිළිබඳ ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ සඳහන් පරිදි මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින තීරණ අංක 101 (vi)-2018 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

නොච්චියාම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 520/7 දරන 1988.02.28 වැනි දිනැති *අතිවිශෙෂ* ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග හා රඟ දැක්වීම් පිළිබඳව අතුරු ව්‍යවස්ථා නොච්චියාගම ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, ඒ අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන ගාස්තු පහත පරිදි වේ.

1975/77 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත

	රු. ශත
(01) ඉල්ලුම් පත්‍ර ගාස්තුව	250 0
(02) වාර්ෂික බලපත්‍ර ගාස්තුව	3,000 0

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 03 වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තුව)

	එක් එක් දිනකට	*සතියකට දින 07ක් හෝ ඊට අඩු*	*මසක් හෝ ඉන් කොටසකට*	*දෙසැම්බර් අවසන් වන එක් වර්ෂයකට*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*	*රු. ශත*
ආසන 199ට වැඩි නොවූ විට	10 0	25 0	50 0	250 0
ආසන 199ට වැඩි එහෙත් 399 ට වැඩි නොවූ විට	15 0	35 0	75 0	350 0
ආසන 499ට වැඩි නොවූ විට	25 0	50 0	100 0	400 0
ආසන 499ට වැඩි වූ විට	50 0	75 0	150 0	500 0
ව්‍යාපාර නොවන ආඥාපනතේ විස්තර කෙරෙන ආධාර රඟ දැක්වීමකට	15 0	25 0	100 0	200 0

12 - 989/7

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 149 වැනි වගන්තිය හා 147 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින තීරණ අංක 101 (vii)-2018 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තිය සහ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2018 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මත ම, එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකිරීමට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත.*
01. (i)	මෝටර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක් අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක්ම සඳහා	25 0
(ii)	සෑම බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකලයක්, කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් සඳහා-	
	(අ) එය වෙළෙඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම්	10 0
	(ආ) එය වෙළෙඳ කටයුතු නොවන කාර්ය සඳහා පාවිච්චි කරන්නේ නම්	5 0
(iii)	සෑම කරත්තයක් සඳහා	20 0
(iv)	සෑම අත්කරත්තයක් සඳහා	10 0
(v)	සෑම රික්ෂෝවක් සඳහා	7 50
(vi)	සෑම අශ්වයකු , පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
(viii)	සෑම අලියෙකු සඳහා	50 0

(02) රෝදවල විෂ්කම්භය අඟල් 26 ට නොවැඩි ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා භාවිත කෙරෙන අත් කරත්ත සහ වෙළෙඳ කටයුතු සඳහා භාවිත නොකෙරෙන අත් කරත්ත මෙම ගෙවීම්වලින් නිදහස් කෙරේ.

12 - 989/8

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ සඳහන් පරිදි මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින තීරණ අංක 101 (viii)-2018 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 වගන්තිය අනුව නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 520/7 දරන 1988.08.23 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර, නොච්චියාගම ප්‍රාදේශීය සභා බල සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇලකට, මාවතකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2019 වර්ෂයට පනවා අයකළ යුතු බවත් නොච්චියාගම ප්‍රාදේශීය සභාව තීරණය කරන්නී ය.

උපලේඛනය

	රු. ශත.
01. බිත්ති, තාප්ප හෝ පුවරුවක් උපයෝගි කර ගන්නා ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට (වසරකින් හෝ ඉන් කොටසක කාලයක් සඳහා)	100 0
02. *ස්ථිර දැන්වීම් පුවරු ගාස්තු :*	
(i) විනිවිද පෙනෙන දැන්වීම් පුවරුවකට - වර්ග අඩියකට	75 0
(ii) විදුලි ආලෝකය කරන ලද දැන්වීම් පුවරුවකට - වර්ග අඩියකට (වසරකින් හෝ ඉන් කොටසක කාලයක් සඳහා)	75 0
03. *ඉටිරෙදි හෝ රෙදි මගින් දැන්වීම් පුවරු ගාස්තු :*	
(i) විනිවිද පෙනෙන දැන්වීම් පුවරුවකට - වර්ග අඩියකට	25 0
(ii) විදුලි ආලෝකය කරන ලද දැන්වීම් පුවරුවකට - වර්ග අඩියකට (වසරකින් හෝ ඉන් කොටසක කාලයක් සඳහා)	15 0

12 - 989/9

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව විවිධ ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ සඳහන් පරිදි මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින තීරණ අංක 101 (ix)-2018 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

නොච්චියාගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඉටුකරන පහත සඳහන් සේවා සහ වෙනත් ආනුෂංගික කාර්යයන් ඉටු කිරීමේ දී ප්‍රාදේශීය සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත්, මෙම සේවා ගාස්තු අය කිරීම 2019 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත්, නොච්චියාගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

	සේවාව	*ගාස්තු රු. ශත.*
01.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	500 0
02.	කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම	500 0
03.	අනුබෙදුම් අයදුම්පත්‍රය	100 0
04.	වීථි රේඛා/පවරා නොගැනීමේ සහතික සඳහා පරීක්ෂණ ගාස්තුව	350 0

	සේවාව	ගාස්තු රු. ශත.
05.	වීථි රේඛා / පවරා නොගැනීමේ සහතික නිකුත් කිරීමේ ගාස්තු	1,000 0
06.	හිමිකම් නිකුත් කිරීමේ ගාස්තු	50 0
07.	ගොඩනැගිලි පිළිබඳව සීමා සහතිකයක් නිකුත් කිරීම	1,000 0
08.	ජල සැපයුම් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීම	100 0
09.	ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර ලබා ගැනීම	
	(i) වාණිජ	1,500 0
	(ii) ගෘහස්ථ	100 0
10.	(i) පුස්තකාල අයදුම්පත් නිකුත් කිරීම	10 0
	(ii) පුස්තකාල ඇප තැන්පතු ගාස්තු	100 0
	(iii) පුස්තකාල සාමාජිකත්වය වාර්ෂිකව අලුත් කිරීම	
	වැඩිහිටි	75 0
	ළාබාළ	50 0
11.	දේපළ අයිතිය හැරවීමේ අයදුම් පත්‍රය	100 0
12.	සුසානභූමි ගාස්තු :	
	(i) භූමිදානය කිරීම හෝ ආදාහනය කිරීම සඳහා	50 0
	(ii) තැන්පත් කිරීම සඳහා වර්ග අඩි 01කට	50 0
13.	වරිපනම් තක්සේරු ලේඛනයේ බදු හිමිකම සංශෝධනය කිරීම සඳහා ගාස්තු	1,000 0
14.	වරෙන්තු ගාස්තුව (වරිපනම් බදු/අක්කර බදු) බදු මුදලින්	10%
15.	බොරළු ප්‍රවාහනයේ දී ප්‍රාදේශීය සභා මාර්ග භාවිතා කිරීම වෙනුවෙන්	
	කියුබ් එකක් සඳහා (හානි සිදුවන නිසා) 1 Km	100 0
16.	මාර්ගය දෙපස ඇති අනවසර වෙළෙඳ මැසි සඳහා දෛනික	100 0
17.	මහවැලි ක්‍රීඩාංගනය වෙන් කිරීම එක් දිනයකට	1,500 0
18.	ප්‍රාදේශීය සභාවට අයත් වෙනත් ක්‍රීඩා පිටි දිනකට	500 0
19.	ගොඩනැගිලි ඉල්ලුම්පත් ලියාපදිංචි කිරීම	350 0
20.	ගලිබවුසරය	
	(i) වාණිජ	6,000 0
	(ii) ගෘහස්ථ	3,500 0
	(iii) 1 Km	40 0
21.	ජල බවුසරය	
	(i) වරිපනම් සීමාව තුළ එක් බවුසරයක්	2,000 0
	(ii) සීමාවෙන් පිට	2,500 0
	(iii) දිනකට	8,000 0
22.	JCB යන්ත්‍රය පැයකට	3,000 0
23.	මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය පැයකට	4,000 0
24.	ටොන් 08 ගල්රෝල	
	(i) දිනකට	15,000 0
	(ii) වරුවකට	8,000 0
25.	ටොන් 02 ගල්රෝල පැයකට	
	(i) දිනකට	3,500 0
	(ii) වරුවකට	1,750 0

	සේවාව	ගාස්තු රු. ශත.
26.	පානීය ජලය	
	විසන්ධි කළ ජලය සම්බන්ධතාවය සන්ධි කිරීමේ ගාස්තු	2,500 0
	අයතා ජල පරිභෝජනය සඳහා	15,000 0
	ජල සම්බන්ධතා ගාස්තු	30,078 0
	පරීක්ෂණ මීටරයක් සවි කිරීම	500 0
27.	සතිපොළ කඩ කාමරයක් සඳහා 8'-10'	150 0
28.	පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම	
	(i) 2,50,000.00 හෝ ඊට අඩු පරීක්ෂා කිරීමේ ගාස්තු	3,000 0
	(ii) 2,50,000.00 - 5,00,000.00 පරීක්ෂා කිරීමේ ගාස්තු	3,750 0
	(iii) 5,00,000.00 - 10,00,000.00 පරීක්ෂා කිරීමේ ගාස්තු	5,000 0
	(iv) 10,00,000.00 වැඩි	10,000 0
29.	පරිසර පෝරම ගාස්තු	500 0
30.	පරිසර බලපත්‍ර ගාස්තුව	4,000 0

12-989/10

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ සඳහන් පරිදි මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින තීරණ අංක 101 (x)-2018 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක 320 කුකුල්කටුව, 322 රනෝරාව අඹගහවැව, 321 ඉට්ටිකුලම, 326 ඇහැටුවාගම, 327 හුණුවිලගම, 329 කටුපත්වැව, 330 පහලමාරගහවැව තල්ගස්වැව, 355 හොරුවිල හැර අනෙකුත් සියලුම ග්‍රාම සේවා වසම් 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 3 වැනි වගන්තිය යටතේ නාගරික අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති හෙයින් (අංක 1197/11-2001 අප්‍රේල් 10 අඟහරුවාදා *අති විශෙෂ* ගැසට් නිවේදනය මගින් එම ප්‍රදේශයේ ගොඩනැගිලි අයදුම්පත් සම්බන්ධව අංක 1597/08 දරන 2009 අප්‍රේල් 17 සිකුරාදා ගැසට් පත්‍රයේ සඳහන් පරිදි ගාස්තු අයකිරීමට සුදුසු බවට යෝජනා කරමි. තව ද නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයට අයත් නොවන ප්‍රදේශ සඳහා ගොඩනැගිලි සැලැස්මක් අනුමත කිරීමේ දී වර්ග අඩියකට රු. 1.00 ක් ද (නේවාසික) වාණිජ සඳහා රු. 2.00 බැගින් ද, 2019 වර්ෂයේ පනවා අයකිරීම සඳහා යෝජනා කරන්නීය.)

12 - 989/11

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. බී. ගුණරත්න වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153(1) අ, ආ, ඇ උප වගන්තිය යටතේ ඇති විධිවිධාන ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින තීරණ අංක 101 (xi)-2018 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) අ, ආ, ඇ උපවගන්ති යටතේ නොච්චියාගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව නොච්චියාගම බල ප්‍රදේශය තුළ සංවර්ධනය නොකළ ඉඩමකින් එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2% නොඉක්මවන බද්දක් වාර්ෂිකව එම ඉඩම අයිතිකරුගෙන් අයකර ගැනීමට සුදුසු බව ඉහත සඳහන් කමිටුවෙන් තීරණය විය.

ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය අනුව නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් ඉහත සඳහන් පරිදි බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි මම තීරණය කරමි.

12-989/12

හොරණ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළ ව්‍යාපාරික ස්ථානවලින් ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ගාස්තු අයකිරීම

හොරණ ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ දෙසැම්බර් මස 11 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක ඉ:01.7 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ සහ බස්නාහිර පළාත් සභාවේ 2007 අංක 01 දරන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරි ප්‍රඥප්තිය අනුව හොරණ ප්‍රාදේශීය සභා සීමාව තුළ ව්‍යාපාරික ස්ථාන වලින් ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා 2019 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි මාසික ගාස්තුවක් පනවා අයකරනු ලබන බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

අනිල් අසෝක රණතුංග,
සභාපති,
හොරණ ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 13 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

හොරණ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වගන්තියෙන් පැවරී ඇති අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලතල ප්‍රකාරව එහි පනත යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2011 ජූලි මස 05 දින අංක 1713/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (අ) කොටසේ පළකරන ලද්දා වූ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව සහ බස්නාහිර පළාත් සභාවේ 2007 අංක 01 දරන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරි ප්‍රඥප්තිය අනුව හොරණ ප්‍රාදේශීය සභා සීමාව තුළ ව්‍යාපාරික ස්ථානවලින් ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා 2019 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි මාසික ගාස්තුවක් පනවා අයකිරීමට හොරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛණය

	ප්‍රමාණය	*මුදල* *රු. ශත*
කි.ග්‍රෑ. 5-10	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	500 0
කි.ග්‍රෑ. 10-15	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	600 0
කි.ග්‍රෑ. 15-20	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	750 0
කි.ග්‍රෑ. 20-30	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	1,000 0
කි.ග්‍රෑ. 30-50	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	1,500 0
කි.ග්‍රෑ. 50-100	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	2,000 0
කි.ග්‍රෑ. 100-150	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	3,000 0
කි.ග්‍රෑ. 150-200	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	4,000 0
කි.ග්‍රෑ. 200-300	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	6,000 0
කි.ග්‍රෑ. 300-500	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	7,500 0
කි.ග්‍රෑ. 500 ට වැඩි	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	10,000 0

මෙම ගාස්තුවලට රජයේ බදු එකතු වන බවද තවදුරටත් නිවේදනය කරමි.

12-864

හලාවත නගර සභාව

ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තු පැනවීම - 2019

255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 153 හා 157 වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වයඹ පළාත් සභාවේ අතුරු ව්‍යවස්ථාව වැළඳගෙන ක්‍රියාත්මක කිරීමට 2018 ඔක්තෝබර් මස 11 වැනි දින මහ සභාවේ තීරණ අංක 5/I/1 යටතේ යෝජනා සම්මුති ලැබී ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන්නට කටයුතු කර ඇති අතර, ඊට අදාළ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තු පහත උපලේඛනයේ සඳහන් ආකාරයට 2019 වර්ෂය සඳහා විය යුතු බවට 2018 දෙසැම්බර් මස 13 වැනි දින 5/I/1 අංක දරන යෝජනා සම්මුතිය ලැබී ඇති බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්ලිව්. එම්. ඒ. තුෂාන් චතුරංග,
සභාපති,
හලාවත නගර සභාව,
හලාවත.

2018 වර්ෂයේ දෙසැම්බර් මස 13 වැනි දින,
හලාවත නගර සභාවේ දී ය.

තීරණය

255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 153 හා 157 වගන්තිවලට අනුකූලව සකස් කර, වැළඳගන්නා ලද නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව පැවරී ඇති බලතල යටතේ හලාවත නගර සභාවට අයත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවාවන් සඳහා පහත උපලේඛනයෙහි සඳහන් ගාස්තු 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවට ගරු මහා සභාවට යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය	*I තීරුව*	*II තීරුව* රු. ශත
01.	වීථියකට හෝ මංමාවතකට යාබදව ගසක් හෝ කොටසක් කපා ඇති විටක දී එය ඉවත් කිරීම සඳහා ට්‍රෙලර් 01 වෙනුවෙන් කාර්යාලයේ සිට 2 km දුර ප්‍රමාණයකට එක් වරකට	1,500 0
	වීථියකට හෝ මංමාවතකට යාබදව ගසක් හෝ කොටසක් කපා ඇති විටක දී එය ඉවත් කිරීම සඳහා ට්‍රෙලර් 1/2 ක් වෙනුවෙන් කාර්යාලයේ සිට 2 km දුර ප්‍රමාණයකට එක් වරකට	1,000 0
	වැඩිවන සෑම 01 km කටම	50 0
02.	සාප්පු සහ කාර්යාල පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතු වන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය සඳහා වාර්ෂික ගාස්තුව (උපද්‍රවකාරී අපද්‍රව්‍ය හැර)	1,200 0
03.	පදික වෙළඳාම හෝ සංචාරක වෙළඳාම නිසා ජනනය වන අපද්‍රව්‍ය සඳහා (උපද්‍රවකාරී අපද්‍රව්‍ය හැර) වාර්ෂික ගාස්තුව	200 0
04.	කර්මාන්ත ශාලාවලින් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය සඳහා (උපද්‍රවකාරී අපද්‍රව්‍ය හැර) වාර්ෂික ගාස්තුව	18,000 0
05.	කැණීම් ඉදි කිරීම් හා කඩා දැමීමෙන් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය ට්‍රෙලර් 01 වෙනුවෙන් කාර්යාලයේ සිට 2 km දුර ප්‍රමාණයකට එක් වරකට	3,000 0
	කැණීම් ඉදි කිරීම් හා කඩා දැමීමෙන් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය ට්‍රෙලර් 1/2 වෙනුවෙන් කාර්යාලයේ සිට 2 km දුර ප්‍රමාණයකට එක් වරකට	2,000 0
	වැඩිවන සෑම 1 km කටම	50 0
06.	රජයේ ආරෝග්‍යශාලා පරිශ්‍රය අතුගෑමෙන් එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය (සායනික හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය හැර) වාර්ෂික ගාස්තුව	2,000 0
07.	පුද්ගලික රෝහල් හා රසායනාගාර පරිශ්‍රය අතුගෑමෙන් එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය (සායනික හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය හැර) වාර්ෂික ගාස්තුව	10,000 0
08.	වෙනත් පරිශ්‍ර (ඉහත සඳහන් කර නොමැති ව්‍යාපාර) සඳහා වාර්ෂික ගාස්තුව	1,200 0

දඹුල්ල මහා නගර සභාව

බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු පැනවීම - 2019 වර්ෂය

1979 අංක 42 දරන මහා නගර සභා සහ නගර සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1985 අංක 20 දරන මහා නගර සභා සහ නගර සභා (සංශෝධන) පනතින් වැඩිදුරටත් සංශෝධිත මහ නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරය) අංක 247 (අ) 247 (ආ) සහ 247 (ඇ) වගන්ති ප්‍රකාරව, දඹුල්ල මහා නගර සභාව විසින් 2019 වර්ෂයට පහත උපලේඛනයේ දැක්වෙන ව්‍යාපාරික කටයුතු වෙනුවෙන් බලපත්‍ර ගාස්තු කර්මාන්ත හෝ ව්‍යාපාර බදු පනවා අයකිරීමට තීරණය කර ඇත. මෙම බලපත්‍ර ගාස්තු හා බදු පැනවීම නැවත සංශෝධනය කරන තෙක් වලංගු වේ.

එකී ගාස්තු 2019 මාර්තු මස 31 වැනි දිනට පෙර ගෙවා අවසන් කළ යුතු බව ද මෙයින් නිවේදනය කෙරේ.

ආර්. එම්. කේ. ආර්. බී. රත්නායක,
නාගරික කොමසාරිස්,
දඹුල්ල මහා නගර සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
දඹුල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

247(අ) වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තු

	වෙළඳාමේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 5,000 දක්වා*	*වාර්ෂික වටිනාකම රු.5,001 සිට රු.10,000 දක්වා*	*වාර්ෂික වටිනාකම රු.10,001 සිට රු.20,000 දක්වා*	*වාර්ෂික වටිනාකම රු.20,001 සිට රු.30,000 දක්වා*	*වාර්ෂික වටිනාකම රු.30,001 සිට රු.40,000 දක්වා*	*වාර්ෂික වටිනාකම රු.40,001 සිට රු.50,000 දක්වා*	*වාර්ෂික වටිනාකම රු.50,000ට වැඩි*
		රු.	*රු.*	*රු.*	*රු.*	*රු.*	*රු.*	*රු.*
01.	බේකරියක් පවත්වාගෙන යාම	1,000	1,500	2,000	2,500	3,000	3,500	5,000
02.	ගව/එළු පට්ටියක් පවත්වාගෙන යාම :							
	එළුවන්/ගවයින් 5 ට අඩු - 500							
	එළුවන්/ගවයින් 5 ට වැඩි 10 දක්වා - 1,000							
	එළුවන්/ගවයින් 10 ට වැඩි 20 දක්වා - 1,500							
	එළුවන්/ගවයින් 20 ට වැඩි - 2,000							
03.	කිරිහලක් පවත්වාගෙන යාම	1,000	1,500	2,000	2,500	3,000	3,500	4,000
04.	අයිස්ක්‍රීම් හෝ සිසිල්බීම විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000	1,500	2,000	2,500	3,000	3,500	4,000
05.	තේ පැන් ශාලාවක් පවත්වාගෙන යාම	1,000	1,200	1,500	1,800	2,000	2,500	3,500
06.	බත් කඩයක් හෝ ආපන ශාලාවක් හෝ හෝටලයක් පවත්වාගෙන යාම	1,000	1,500	2,000	2,500	3,000	3,500	5,000
	(අ) මත්පැන් ඇති නමුත් නැවතීමේ පහසුකම් නැති	2,000	2,500	3,000	3,500	4,000	5,000	5,000
	(ආ) මත්පැන් නැති නැවතීමේ පහසුකම් ඇති	2,000	2,500	3,000	3,500	4,000	5,000	5,000
	(ඇ) මත්පැන් හා නැවතීමේ පහසුකම් ඇති (සුරාබදු දෙපාර්තමේන්තුවේ අවසරලත්)	3,000	3,500	4,000	4,500	5,000	5,000	5,000

	වෙළඳාමේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 5,000 දක්වා	වාර්ෂික වටිනාකම රු.5,001 සිට රු.10,000 දක්වා	වාර්ෂික වටිනාකම රු.10,001 සිට රු.20,000 දක්වා	වාර්ෂික වටිනාකම රු.20,001 සිට රු.30,000 දක්වා	වාර්ෂික වටිනාකම රු.30,001 සිට රු.40,000 දක්වා	වාර්ෂික වටිනාකම රු.40,001 සිට රු.50,000 දක්වා	වාර්ෂික වටිනාකම රු.50,000ට වැඩි
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
07.	සංචාරක සංවර්ධන පනත යටතේ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ අනුමත කර ඇති හෝ පිළිගනු ලැබ ඇති හෝටලයක් සහ/ හෝ ආපන ශාලාවක් පවත්වාගෙන යාම (ආරම්භක වර්ෂය නම්)	2,000	2,500	3,000	3,500	4,000	4,500	5,000
08.	සංචාරක සංවර්ධන පනත යටතේ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ අනුමත කර ඇති හෝ ලැබ ඇති ආගන්තුක නිවාසයක් පවත්වාගෙන යාම (ආරම්භක වර්ෂය නම්)	3,000	3,500	4,000	4,500	5,000	5,000	5,000
09.	සංචාරක සංවර්ධන පනත යටතේ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝ අනුමත කර නැති ආගන්තුක නිවාසයක් පවත්වාගෙන යාම	2,500	3,000	3,500	4,000	4,500	5,000	5,000
	(අ) සංචාරක සංවර්ධන පනත යටතේ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ අනුමත කර ඇති 2018 වර්ෂය තුළ පවත්වාගෙන ගිය ආගන්තුක නිවාසයක් 2019 වර්ෂයේදී ද පවත්වාගෙන යාම	- 2018 වර්ෂය තුළ ආගන්තුක නිවාසයක් පවත්වාගෙන යාමේ දී ඉටුකරන ලද සැපයුම් හා සේවාවන් සඳහා ලැබුණු හෝ ලැබීමට ඇති මුළු මුදලින් 1%කට සමාන මුදලක්.						
1. නේවාසික දේපළ සඳහා එම දේපළවල වාර්ෂික වටිනාකමින් - 12%
2. වාණිජ දේපළ සඳහා එම දේපළවල වාර්ෂික වටිනාකමින් - 14%

ඉහත දැක්වෙන සියලුම දේපළ සඳහා වරිපනම් බදු සමාන වාරික 04 කින් එනම් 2019 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් මස 30, දෙසැම්බර් 31 යන දිනවලදී හෝ ඊට පෙර ගෙවා අවසන් කළ යුතු වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වර්ෂයට අදාළ සම්පූර්ණ බදු මුදල ජනවාරි මස 31 වැනි දිනට පෙර ගෙවීමේදී 10%ක වට්ටමක් ද කාර්තු වශයෙන් ගෙවීමේදී අදාළ කාර්තුවේ මුල් මාසයේ ගෙවන විට 5%ක වට්ටමක් ද දෙනු ලැබේ.

ආර්. එම්. කේ. ආර්. බී. රත්නායක,
නාගරික කොමසාරිස්,
දඹුල්ල මහා නගර සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
දඹුල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

12-884/7

දඹුල්ල මහා නගර සභාව

විනෝද බදු පැනවීම - 2019 වර්ෂය

1984 අංක 37 දරන විනෝද බදු පනතේ සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියේ සහ ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 176 වැනි අධිකාරයේ 3 වගන්තිය විධිවිධාන පරිදි,

2018 වර්ෂයට පහත උපලේඛනයේ සඳහන් බදු පැනවීමට 2018.12.06 වැනි දින 07:01:01 දරන සභා සම්මුතියෙන් තීරණය කර ඇත. ඒ අනුව පහත සඳහන් බදු 2019 වර්ෂයේ සිට පනවනු ලබන බවත් මෙම බදු පැනවීම නැවත සංශෝධනය කරන තෙක් වලංගු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. කේ. ආර්. බී. රත්නායක,
නාගරික කොමසාරිස්,
දඹුල්ල මහා නගර සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
දඹුල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1. සෑම මැජික් දර්ශනයක්, සර්කස් දර්ශනයක්, තුරඟ හෝ සංගීත සංදර්ශනයක්, සැණකෙළියක්, මුදල් අයකරනු ලබන සෑම කටයුත්තක් සඳහාම නිකුත් කරනු ලබන ඇතුළත්වීමේ ප්‍රවේශපත්වල මූනත වටිනාකමින් 10% ක විනෝද බද්දක් ගෙවිය යුතු ය.

2. සිනමාහල්වල පවත්වනු ලබන සියලුම චිත්‍රපටි සංදර්ශන වෙනුවෙන් පමණක් ඇතුලත්වීමේ ප්‍රවේශපත්‍රවල වටිනාකමින් 7.5% ක විනෝද බද්දක් ගෙවිය යුතු ය.

3. දඹුල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ අලෙවි කරන ප්‍රවේශ පත්‍රවලින් 25% ක විනෝද බද්දක් ගෙවිය යුතු ය.

ප්‍රසිද්ධ රඟ දැක්වීමේ බලපත්‍ර ගාස්තු

4. මුදල් අයකරනු ලබන සෑම චිත්‍රපටි සංදර්ශනයක්, මැජික් දර්ශනයක්, සර්කස් දර්ශනයක්, සැණකෙලියක් හා අනෙකුත් කටයුතු වෙනුවෙන් එකී එක් කාල පරාසය සඳහා පහත සඳහන් ප්‍රසිද්ධ රඟ දැක්වීමේ බලපත්‍ර ගාස්තු ගෙවිය යුතු ය.

		රු. ශත
(i)	එක් දිනක් හෝ ඉන් කොටසක් සඳහා	1,000 0
(ii)	දින දෙකේ සිට දින පහ දක්වා (2-5)	3,000 0
(iii)	දින පහ (5) කට වැඩි	5,000 0

12-884/8

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු පැනවීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 සහ 146 වගන්ති යටතේ (1) වැනි උපවගන්තියෙන් නුවරඑළිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයෙහි නොවැම්බර් මස 09 වැනි දින පවත්වන ලද නුවරඑළිය ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 30 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නුවරඑළිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයෙහි සඳහන් දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2019 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යාක්ෂණය වර්ෂය සඳහා තක්සේරුව/සත්‍යාක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත් එකී දේපළ මත ඉහත කී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට පහලොවක් (15%) වාර්ෂික වරිපනම් බද්දක් අය කළ යුතු බවටත්,

තව ද, 2019 වර්ෂයෙහි පහත උපලේඛන 02 හි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර වාර්ෂික වරිපනම් බද්ද නුවරඑළිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2019 එම වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එකී උපලේඛන 02 හි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල නුවරඑළිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවට අදාල මුදලින් 5%ක වට්ටමක් ද, නුවරඑළිය ප්‍රාදේශීය සභාවට ලබා දිය යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*දියුණු ගම් ප්‍රදේශය*	*වරිපනම් ප්‍රතිශතය*
01.	බිලැක්පූල් නගරය	15%
02.	නානුඔය නගරය	15%
03.	කඳපොල නගරය	15%
04.	සඳතැන්න නගරය	15%
05.	බුළු ඇල නගරය	15%
06.	කටුමාන නගරය	15%
07.	සීතාඑළිය ප්‍රදේශය	15%

උපලේඛනය - 02

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා නිමිකම් ලබන අවසාන දිනය*
01. පළමු වන කාර්තුව	2109 ජනවාරි මස	2019 ජනවාරි මස 31
02. දෙවන කාර්තුව	2019 අප්‍රේල් මස	2019 අප්‍රේල් මස 30
03. තුන්වන කාර්තුව	2019 ජූලි මස	2019 ජූලි මස 31
04. හතරවන කාර්තුව	2019 ඔක්තෝබර් මස	2019 ඔක්තෝබර් මස 31

12-881/1

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

ජලය සැපයීමේ ගාස්තු - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ වෙනත් පනත් හා නීති මගින් පැවරී ඇති බලතල අනුව සහ 1952 වසරේ අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ පැවරී ඇති බලතල අනුව පහත

උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු 2019 වර්ෂය සඳහා පනවා අය කර ගැනීමට 2018 නොවැම්බර් මස 09 වැනි දින පැවති මහා සභාවේ යෝජනා අංක 05.01.05 සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 30 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ වෙනත් පනත් හා නීති මගින් පැවරී ඇති බලතල අනුව සහ 1952 වසරේ අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ පැවරී ඇති බලතල අනුව 2019 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අය කළ යුතු බවට යෝජනා කරන්නීය.

උපලේඛනය

ගෘහස්ථ

මාසික පාරිභෝගික ඒකක	*ඒකකයක් සඳහා පරිහරණ ගාස්තුව රු. ශත*	*සේවා ගාස්තුව රු. ශත*
00-05	04 0	
06-10	08 0	
11-15	15 0	
16-20	25 0	
21-25	55 0	100 0
26-30	80 0	
31-40	100 0	
41-50	120 0	
51-75	130 0	
75<	150 0	

රාජ්‍ය ආයතන/ව්‍යාපාරික/හෝටල්

මාසික ඒකක ගණන	*ඒකකයක් සඳහා පරිහරණ ගාස්තුව රු. ශ.*	*රාජ්‍ය/ව්‍යාපාරික සේවා ගාස්තුව රු. ශ.*	*හෝටල් සඳහා සේවා ගාස්තුව රු. ශත*
00-10	25 0		
11-20	35 0		
21-30	45 0		
31-40	55 0		
41-50	65 0	150 0	250 0
51-60	75 0		
61-70	85 0		
71-80	95 0		
81-90	105 0		
91-100	115 0		

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

බලපත්‍ර ගාස්තු පැනවීම - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි වගන්තියේ (ආ) ඡේදයේ පැවරී ඇති බලතල ප්‍රකාර නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ 1 වැනි තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් 2019 වර්ෂයේ දී කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම 11 වැනි තීරයේ නිරූපිත යම් සීමාවක් ඇතුළත වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනුප්‍රමාණය අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ 2018 නොවැම්බර් මස 09 වැනි දින පැවති මහා සභාවේ දී යෝජනා අංක 05.01.03 සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 30 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ නුවරඑළිය ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍ර ලබාගත යුතු යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා නුවරඑළිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් සම්බන්ධයෙන්ම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය හෝ ව්‍යාපාරය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූපී සටහනෙහි නිරූපිත ප්‍රමාණයේ බලපත්‍ර ගාස්තුවක් නියම කර අයකර ගැනීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර අතරින් ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක් වන විට එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන් පොළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එකක (1%) මුදල් අයකර ගැනීමටත් 2018 නොවැම්බර් මස 09 වැනි දින පැවති මහා සභාවේ දී තීරණය කරන ලදී.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*		
කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
1. ලැගුම් නිවාස	500 0	750 0	1,000 0
2. හෝටල්	500 0	750 0	1,000 0
3. බත් කඩ, ආපන ශාලා සහ තේ හෝ කෝපි කඩ	500 0	750 0	1,000 0
4. බේකරි	500 0	750 0	1,000 0
5. කිරි පට්ටි හා කිරි වෙළඳාම	500 0	750 0	1,000 0
6. මාළු විකිණීම	500 0	750 0	1,000 0

1 වැනි තීරුව	*II වැනි තීරුව*		
කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
7. මස් විකිණීම	500 0	750 0	1,000 0
8. අයිස් කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
9. සිසිල් බීම කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
10. ලොන්ඩරි	500 0	750 0	1,000 0
11. ගව ගාල්	500 0	750 0	1,000 0
12. ඝාතක මඩු	500 0	750 0	1,000 0
13. කොණ්ඩා සැකසීමේ සැලුන් හල් සහ බාබර් සාප්පු	500 0	750 0	1,000 0
අප්‍රසන්න ව්‍යාපාර	500 0	750 0	1,000 0
අන්තරායදායක ව්‍යාපාර	500 0	750 0	1,000 0
අන්තරායදායක සහ අප්‍රසන්න ව්‍යාපාර	500 0	750 0	1,000 0

12-881/3

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

කර්මාන්ත බද්ද පැනවීම - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි උපවගන්තියෙන් (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති (ආ) ඡේදයේ පැවරී ඇති බලතල ප්‍රකාර,

නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන මෙහි උපලේඛනයේ 1 වැනි තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම එම උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ කර්මාන්ත බද්දක් 2019 වර්ෂයේ දී පනවා අය කිරීමට 2018 නොවැම්බර් මස 09 වැනි දින පැවති මහා සභාවේ යෝජනා අංක 05.01.03 අනුව යෝජනා කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 30 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලය යටතේ නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන ඉහත කී පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට යටත්වන යම් කර්මාන්තයක් (වෙළඳාමක්) නොවන්නා වූ යම් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන අවස්ථාවක ඒ ව්‍යාපාරයෙන් පෙර

වර්ෂයේ දී ලැබූ ආදායම පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක, ඒ උපලේඛනයේ II වන තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා නියම කර අයකර ගත යුතු බවත්, අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් නුවරඑළිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තය*	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	අන්තරාදයක/අප්‍රසන්න වෙළෙඳම	*රු. 750 දක්වා*	*රු. 750ට වැඩි එහෙත් රු. 1,500 ට නොවැඩි*	*රු. 1,500 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	කබොක් ගල්, බොරළු හෝ කළුගල් කැඩීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	ලෝහමය සුන්බුන් ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරුම් මෝල්ක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	දර ගබඩාවක් හෝ මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	සෙල්ලම් බඩු නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	විදුලි උපකරණ නිෂ්පාදනය කිරීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	ගිනිකෙළි භාණ්ඩ ගබඩා කිරීම හෝ අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	පින්තාරු තීන්ත, වාර්නිෂ්, ඩිස්ටෙම්පර් සායම් වර්ග නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ඇඳුම් ගබඩා කිරීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	සිරප් හෝ පළතුරු බීම නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය, මාංශ භෝග හෝ වෙනත් ද්‍රව්‍යයක් ඇඹීරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම			
14.	කෘෂි රසායන නිෂ්පාදනය කිරීමේ හෝ ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	තේ කුඩු නිෂ්පාදනය කිරීමේ/ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	විසිරි පින්තාරු කිරීමේ (ස්ප්‍රේ පේන්ටින්) කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ඉටිපන්දම් නිෂ්පාදනය කිරීමේ හෝ ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	යන්ත්‍ර භාවිතා කරමින් වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	වී හෝ මිරිස් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	යාන්ත්‍රික නොවන ඉරුම් පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	පාවහන් අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	කිරි ආශ්‍රිත නිෂ්පාදන කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	පා පැදි අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	මෝටර් බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	කඩල, මුරුක්කු නිෂ්පාදනය කර පැකට් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	බැටරි චාජ් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	යාන්ත්‍රික නොවන වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	කරවල, ලුණු මාළු, ජාඩි, ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	රස කැවිලි නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තය*	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	අන්තරාදයක/අප්‍රසන්න වෙළෙඳාම	*රු. 750 දක්වා*	*රු. 750ට වැඩි එහෙත් රු. 1,500 ට නොවැඩි*	*රු. 1,500 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
32.	පින්තූර රාමු කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	අළුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	අයිස් ක්‍රීම් සෑදීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	වළං සෑදීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	වයරින් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	වීඩියෝ පටි/තැටි විකිණීම හෝ කුළියට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	හස්ත කර්මාන්ත වැඩපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	ඡායා පිටපත් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	ආයුර්වේද බෙහෙත් නිෂ්පාදනය කිරීමේ හා විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	හෝමියෝපති වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	බුලත්,පුවක් හෝ මණිබඩු විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	ලොන්ඩරියක් හෝ ඩ්‍රයික්ලීන් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-881/4

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

ව්‍යාපාර බදු පැනවීම - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ,

(අ) (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ පළමුවැනි කොටසේ නිරූපිත යම් ව්‍යාපාරයක් 2019 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකු මත එකී ව්‍යාපාරයේ 2018 වර්ෂයේ ආදායම දෙවන කොටසේ පළවන තීරයේ නිරූපිත යම් සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක දෙවන තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ බද්දක් පනවා අය කිරීමට, සහ

(ආ) (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින්ම යටොක්ත බද්ද 2019 අප්‍රේල් මස 01 වැනි දිනට ප්‍රථම නුවරඑළිය ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි නියම කිරීමට නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ 2018 නොවැම්බර් 09 වැනි දින පැවති මහා සභාවේ යෝජනා අංක 05.01.04 අනුව සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 30 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලය යටතේ නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන ඉහත කී පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට යටත්වන යම් කර්මාන්තයක් (වෙළෙඳුමක්) නොවන්නා වූ, යම් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන අවස්ථාවක, ඒ ව්‍යාපාරයෙන් පෙර වර්ෂයේ දී ලැබූ ආදායම, පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක, ඒ උපලේඛනයේ II වන තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක්, කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා නියම කර අයකර ගත යුතු බවත්, අප්‍රේල් මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් නුවරඑළිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

දෙවන තීරය

	I වන තීරය	*II වන තීරය*
	බද්ද අදාල වර්ෂයට පෙර වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම	*රු. ශත*
(i)	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	-
(ii)	රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
(iii)	රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
(iv)	රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
(v)	රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
(vi)	රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

පළමුවන කොටස

ව්‍යාපාරය :

1. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම
2. දැව ගබඩාවක් පවත්වාගෙන යාම
3. ඇඟළුම් කම්හලක් පවත්වාගෙන යාම
4. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
5. නිවාඩු නිකේතනයක් පවත්වාගෙන යාම
6. වාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
7. කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
8. එළවළු ගබඩා කිරීමේ හෝ එළවළු තොග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
9. මස් පිණිස කුකුළන් හෝ කිකිළියන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම
10. බිත්තර සඳහා කිකිළියන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම
11. බැටළුවන් හෝ ඌරන් හෝ එළුවන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම
12. කිරි පට්ටියක් හෝ ගව ගාලක් පවත්වාගෙන යාම
13. සත්ව ආහාර නිෂ්පාදනය හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
14. පශු වෛද්‍ය ශිලන්හලක් පවත්වාගෙන යාම
15. නවාතැන් පොළක් පවත්වාගෙන යාම
16. රේස් ඔට්ටුපොලක් පවත්වාගෙන යාම
17. විසිතුරු මත්ස්‍යයන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
18. නාට්‍ය සංදර්ශනයක්, ක්‍රීඩා සංදර්ශනයක් හෝ සංගීත සංදර්ශනයක් පැවැත්වීම
19. රූපලාවන්‍ය ආයතනයක් පවත්වාගෙන යාම
20. ශබ්දවාහිනී යන්ත්‍ර කුළියට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
21. මල් වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම
22. විසිතුරු පැළ හෝ මල් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
23. කොමිස් ඒජන්ත ස්ථානයක් පවත්වාගෙන යාම
24. වෙන්දේසි කිරීමේ කටයුතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
25. බ්‍රෝකර් ආයතනයක් පවත්වාගෙන යාම
26. මුදල් ආයෝජන ස්ථානයක් පවත්වාගෙන යාම

27. ලොතරැයි අලෙවි නියෝජිත ස්ථානයක් පවත්වාගෙන යාම
28. අපනයන නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම
29. මෝටර් රථ වාහන වෙළෙඳාම් ආයතනයක් පවත්වාගෙන යාම
30. මැණික් වෙළෙඳ ස්ථානයක් පවත්වාගෙන යාම
31. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
32. රැකියා ඒජන්සි ආයතනයක් පවත්වාගෙන යාම
33. පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
34. උකස් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
35. කොන්ත්‍රාත් කටයුතු සිදුකරන ආයතනයක් පවත්වාගෙන යාම
36. රියදුරු හෝ සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම
37. භාණ්ඩ හෝ සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම
38. බැංකු හෝ මූල්‍ය ආයතනයක් පවත්වාගෙන යාම
39. ඒජන්තවරුන් මාර්ගයෙන් බඩු විකුණන ආයතනයක් පවත්වාගෙන යාම
40. පෞද්ගලික සායන හෝ සාත්තු නිවාසයක් පවත්වාගෙන යාම
41. මත්පැන් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
42. තොග භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
43. සම්ප්‍රේෂණ කුළුණක් පවත්වාගෙන යාම
44. විදුලි උත්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම
45. සම්බාහන ආයතනයක් පවත්වාගෙන යාම
46. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. විදුලි උපකරණ නිෂ්පාදනය කිරීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48. විදුලි කාර්මික වැඩපොලක් හෝ රූපවාහිනී/ගුවන් විදුලි යන්ත්‍ර නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49. තේ කුඩු නිෂ්පාදනය කිරීමේ/ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
50. ත්‍රී රෝද රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
51. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
52. ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ/ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. පරණ පුවත්පත් හෝ හිස් බෝතල් ගබඩා ස්ථානයක් පවත්වාගෙන යාම
55. කුෂන් වැඩපොලක් පවත්වාගෙන යාම
56. පරිගණක ආශ්‍රිත මුද්‍රණ කටයුතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
57. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. දුරකතන පණිවිඩ ලබාදෙන ස්ථානයක් පවත්වාගෙන යාම
59. විදුලි උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60. ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. රෙදිපිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62. පිඟන් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
63. පොත්,ලිපි ද්‍රව්‍ය ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64. වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. සිල්ලර කඩයක් පවත්වාගෙන යාම
66. පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
67. බීජ වර්ග හා පැළ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
68. ශීත ආහාර හා සිල්ලර බඩු අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙ යාම
69. ඇසුරුම් මාළු විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
70. යකඩ හා වානේ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
71. නිමි ඇඳුම් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
72. ඉංග්‍රීසි බෙහෙත් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
73. ලිහිසි තෙල් අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
74. සිංහල බෙහෙත් අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
75. සිමෙන්ති ගල් හෝ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
76. පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය හෝ ගබඩා කර තබා ගැනීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

සේවා සඳහා ගාස්තු අයකිරීම - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ වෙනත් පනත් හා නීති මගින් පැවරී ඇති බලතල අනුව සහ 1952 වසරේ අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ පැවරී ඇති බලතල අනුව පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු 2019 වර්ෂය සඳහා පනවා අය කර ගැනීමට තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 30 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අංකය	*ගාස්තු විස්තරය*	*2018 වසරේ අයකළ මුදල* *රු. ශත*
01	වරිපනම් නම මාරු කිරීමේ අයදුම්පත් ගාස්තු	100 0
02	පරිසර බලපත්‍ර අයදුම්පත් ගාස්තු	250 0
03	වීථිරේඛා සහතික	1,000 0
04	නොපවරා ගැනීමේ සහතික	1,000 0
05	අයිතිය පිළිබඳ සහතික	1,000 0
06	ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු	1,000 0
07		1,000 0
08	ක්‍රීඩාංගනය ලබා දීම පාසල් සඳහා	-
09	ක්‍රීඩා සමාජවලට	1,000 0
10	අන්තර් සමාජ ක්‍රීඩා තරග සඳහා	2,500 0
11	සංගීත සංදර්ශන	10,000 0
12	විනෝද වැඩසටහන් (කාර්නිවල්)	2,500 0
13	පා පැදි බලපත්‍ර ගාස්තුව	100 0
14	කසල බදු	-
15	ත්‍රී රෝද රථ ගාස්තු අය කිරීම	3,000 0
16	නවතා තැබීමේ ගාස්තු	1,000 0
17	ජල සම්බන්ධතා ලබා දීමේ ගාස්තු	1,000 0
18	මස් ප්‍රවාහන ගාස්තු	3,000 0
19	විදුලි නිර්දේශ කිරීමේ ගාස්තුව	1,000 0
20	පුස්තකාල සාමාජික ගාස්තු/සාමාජිකත්වය අළුත් කිරීම	80 0
21	පුටු කුලියට ලබා දීම (එක පුටුවක් සඳහා)	10 0
22	ආහාර පිණිස/උත්සව අවස්ථාවක් සඳහා සතුන් ඝාතනය කිරීම සඳහා අනුමත කිරීමේ ගාස්තු	500 0

අංකය	*ගාස්තු විස්තරය*	*2018 වසරේ අයකළ මුදල* *රු. ශත*
23	*දඩ මුදල් පුස්තකාල :* ප්‍රමාද කරන දිනකට එක් පොතකට රු. 1.00 බැගින් අස්ථානගත කරනු ලබන පොතක් සඳහා වර්තමාන මිල හා දෙපාර්තමේන්තු ගාස්තු 25%ක්.	

12-881/6

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්, දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව නුවරඑළිය ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, ගඟකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2019 වර්ෂය වෙනුවෙන් අයකිරීමට තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 30 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

ප්‍රචාරක දැන්වීම් ස්වභාවය	*වර්ග අඩියක් සඳහා වාර්ෂික ගාස්තුව*
කිසියම් බිත්තියක, බැම්මක පුවරුවක ප්‍රදර්ශනය කරන දැන්වීමක සෑම වර්ග අඩියකටම	150 0
කිසියම් පෞද්ගලික හෝ නිවසක හෝ ගොඩනැගිල්ලක බිත්තියක, වහලයක හෝ තාප්පයක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා සෑම වර්ග අඩියකටම	100 0
ප්‍රචාරක බැනර් සඳහා වර්ග අඩියකට	75 0
ලී රාමුවකට සවි කරන ලද කණ්ණාඩි හෝ ගස් ආදියේ ප්‍රදර්ශනය කරන දැන්වීම් සඳහා සෑම වර්ග අඩියකටම	75 0

12-881/7

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

ඉඩම් විකිණීම මත බදු අයකිරීම - 2019 වර්ෂය

නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවකු හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ සේවකයා හෝ ඔහුගේ අනුනියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුනියෝජිතයා විසින් හෝ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 09 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-881/8

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.XIII.01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 146 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිවිතිගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නිවිතිගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල 2015 වර්ෂයේ දී බලපැවැත් වූ තක්සේරු වටිනාකම 2019 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

(ආ) 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, ඉහත කී වාර්ෂික වටිනාකමෙන් සියයට අටක (8%) ක වරිපනමක් 2018 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ

(ඇ) ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු වලදී සමාන වාරික හතරකින් අය කිරීමටත්,

(ඈ) එකී පනතේ 134 (7) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව එකී වර්ෂයේ ජනවාරි මාසයේ 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවුවහොත් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 10%ක වට්ටමක් ද, එකී වරිපනම් බද්ද සමාන වාරික වලින් ගෙවන අවස්ථාවක නම් ඒ වරිපනම් බද්දේ වාරිකය අයවිය යුතු කාල සීමා කිරීම පලමුවන මාසය ඇතුළත ගෙවුවහොත් ඒ වාරිකයේ ප්‍රමාණයෙන් 5%ක වට්ටමක් ද ලබා දීමට නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12-786/1

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.XIII.02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, නිවිතිගල ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමකම 2018 වර්ෂයේ දී බලාත්මක වූ සත්‍යෝක්ෂණය 2019 වර්ෂයේ සත්‍යෝක්ෂණය ලෙස පිළිගැනීමට,

(ආ) 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී උපවගන්තියේ පළමු අතුරු විධානය යටතේ 1989.02.03 දිනැති අංක iv (අ) දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයකින් අක්කර බද්ද නියම කිරීමේ සහ අය කිරීමේ කාර්යය සඳහා පළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර් පහකට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩු සෑම ඉඩමක් මත රු. 50.00 අනුප්‍රමාණයට අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩිවන සෑම ඉඩමක් මත රු. 10.00 බැගින් වූ අක්කර බද්දක් 2019 වර්ෂයේ දී පනවා අයකිරීමට, සහ

(ඇ) 134 වැනි වගන්තියේ (7) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, වාර්ෂික අක්කර බද්ද ජනවාරි මාසයේ 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවුවහොත් එම වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් 10% වට්ටමක් ද, ඒ අක්කර බද්ද වාරික වලින් ගෙවන අවස්ථාවක නම් ඒ අක්කර බද්දේ වාරිකය අයවිය යුතු කාල සීමා කිරීම පළමුවන මාසය ඇතුළත ගෙවුවහොත් ඒ වාරිකයේ ප්‍රමාණයෙන් 5% වට්ටමක් ද, ලබා දීමට නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12-786/2

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.XIII.03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

149 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර නිවිතිගල ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුළ, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් 2019 වර්ෂයේ දී කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත, එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම II වන තීරයේ නිරූපිත යම් සීමාවන් ඇතුළත වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනු ප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

අන්තරාදයක ව්‍යාපාර :

I වැනි තීරුව		*II වැනි තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
බලපත්‍ර අනු. අංකය	*කර්මාන්තයේ බලපත්‍රයේ ස්වභාවය*	*රු. 750 ඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ගල්වලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	ධාන්‍ය, මිරිස්, තුනපහ, ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	යාන්ත්‍රික වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	යන්ත්‍රානුසාරයෙන් දැව ඉරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	සුරතල් මසුන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	ගෑස් සිලින්ඩර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	වාහන බැටරි විකිණීමේ හෝ පිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ඛනිජ තෙල් අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	හුණු පෝරණු පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ලියවන පට්ටලයක්/ලී ඉරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	යකඩ තලන කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	දුම් ගසා රබර් ෂීට් වේලීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	වී මෝල්ක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ෆොටෝ කොපි යන්ත්‍ර/ෆැක්ස් යන්ත්‍ර/දුරකතන ඇමතුම් කුළියට දීම	500 0	750 0	1,000 0
18.	මනාලියන් හැඩ ගැන්වීම හා කොණ්ඩා කැපීම	500 0	750 0	1,000 0
19.	වෑල්ඩින් වැඩපළක්	500 0	750 0	1,000 0
20.	ඇළුමිනියම් වැඩපළක්	500 0	750 0	1,000 0
21.	ඉලෙක්ට්‍රෝනික් උපකරණ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
22.	සිමෙන්ති ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අප්‍රසන්න ව්‍යාපාර :

01.	භෝජන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	නේවාසික පහසුකම් සහිත හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	නේවාසික පහසුකම් රහිත හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	අයිස් ක්‍රීම් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	කරවල විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	කුකුල් කොටුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I වැනි තීරුව		*II වැනි තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
බලපත්‍ර අනු. අංකය	*කර්මාන්තයේ බලපත්‍රයේ ස්වභාවය*	*රු. 750 ඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
09.	පලතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	දුම්කොළ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	මස් පිණිස සතුන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	අත් යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	මස් මාංශ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	සුරතල් සතුන් ඇති කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	පැකට් බඩු වර්ග සකස් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
අන්තරාදයක හා අප්‍රසන්න ව්‍යාපාර :				
01.	පරණ යකඩ, තඹ, පිත්තල බඩු මිලයට ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	කෘෂි නිෂ්පාදන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	පාපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	ක්‍රේප් රබර් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	වාහන පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	මැණික් කැපීම/ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	අත් යන්ත්‍ර මගින් පොල්තෙල් සිඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	මිරිස්, තුනපහ, ධාන්‍ය ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල්, එළවළු තෙල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ආයුර්වේද ඖෂධ තෙල් වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	කිරි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	අභ්‍යාසපොත් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	සත්ත්ව ආහාර නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	සෙල්ලම්බඩු, විසිතුරු බඩු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	වේවැල් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	දත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	බෙහෙත් බඩු/කුළු බඩු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	ජී. අයි. තහඩුවලින් උපකරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	මදුරු දැල් සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	අත්කම් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			ස්ථානයේ වාර්ෂික වටිනාකම	
බලපත්‍ර අනු. අංකය	*කර්මාන්තයේ බලපත්‍රයේ ස්වභාවය*	*රු. 750 ඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
25.	කොහු කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	යෝගට් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	බෑග්මළු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	බිම්මල් වගා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	යකඩ ග්‍රිල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	ඇඳුම් මැසීම හා රෙදිපිළි වෙළෙඳාම	500 0	750 0	1,000 0
32.	රබර් සීල්/නාම පුවරු සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	සිල්ලර වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	මිනී පෙට්ටි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	කොම්පෝස්ට් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-786/3

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.XIII.04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර නිවිතිගල ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වන තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ කර්මාන්ත බද්දක් 2019 වර්ෂයේ දී පනවා අයකිරීමට,

(ආ) 2018 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් වූ විට යථෝක්ත බද්ද 2019 අප්‍රේල් මස පළමුවන දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට, සහ

(ඇ) 2019 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යටෝක්ත බද්ද කර්මාන්තය ආරම්භ කර මාස තුනක් (03) ක් ඇතුළත කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

කර්මාන්ත බදු පැනවීමට අදාළ වන ව්‍යාපාර :

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			ස්ථානයේ වාර්ෂික වටිනාකම	
බලපත්‍ර අනු. අංකය	*කර්මාන්තයේ බලපත්‍රයේ ස්වභාවය*	*රු. 750 ඉක්මවන අවස්ථා*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථා*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	රසකැවිලි, බයිට් වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	මැටි භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	සිමෙන්ති බ්ලොක් ගල්/බීරළු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	සුරුට්ටු, බීඩි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	ගොඩනැගිලි ද්‍රව්‍ය නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	හඳුන්කුරු නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	ඉදල්, කොහු භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	පැණි හෝ හකුරු නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	අභ්‍යාස පොත් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	සත්ත්ව ආහාර නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	සෙල්ලම් බඩු, විසිතුරු බඩු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	වේවැල් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	දත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	බෙහෙත් බඩු/කුළු බඩු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ජී. අයි. තහඩුවලින් උපකරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	මදුරු දැල් සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	අත්කම් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	කොහු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	යෝගට් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	බෑග්මළු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	බිම්මල් වගා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	යකඩ ග්‍රිල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	ඇඳුම් මැසීම හා රෙදිපිළි වෙළෙඳාම	500 0	750 0	1,000 0
27.	රබර් සීල් නාම පුවරු සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	සිල්ලර වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	මිනී පෙට්ටි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	කොම්පෝස්ට් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.XIII.05 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර නිවිතිගල ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී මෙහි පහත පළමුවන උපලේඛනයේ සඳහන් යම් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙක් විසින්ම එම ව්‍යාපාර ස්ථානයේ වාර්ෂික වටිනාකම, මෙහි පහත සඳහන් දෙවන උපලේඛනයේ I වන තීරුවේ සඳහන් වාර්ෂික වටිනාකම ඉක්මවා යන විට එම උපලේඛනයේ II වන තීරුවේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ ව්‍යාපාර බද්දක් 2019 වර්ෂයේ දී පනවා අයකිරීමට,

(ආ) 2018 දෙසැම්බර් 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් වූ විට යථෝක්ත බද්ද 2019 අප්‍රේල් මස පළමුවන දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට, සහ

(ඇ) 2019 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බද්ද කර්මාන්තය ආරම්භ කර මාස තුනක් (03) ක් ඇතුළත කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

පළමුවන කොටස

1. සමුපකාර තොග වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
2. ආයුර්වේද හා බටහිර බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
3. රබර් මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
4. සුළු අපනයන බෝග මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
5. ස්වර්ණාභරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
6. ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
7. පාවහන් නිෂ්පාදනය/ විකිණීමේ/අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
8. රෙදිපිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
9. පොත්පත් ලිපිද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
10. විදුලි උපකරණ විකිණීමේ/අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
11. දෘෂ්ටි පරීක්ෂණ උපකරණ හා ඇස්කණ්නාඩි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
12. ශීතකරණ, මහන මැෂින්, රූපවාහිනී යන්ත්‍ර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
13. ලොතරැයි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම/ලොතරැයි නියෝජිතවරුන්
14. මෝටර් රථ හා අනෙකුත් අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
15. රටබීම විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
16. ගෘහ භාණ්ඩ/ කාර්යාල භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
17. නිමි ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
18. ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

19. මැටි/සම් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
20. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
21. දැව ගබඩාවක් පවත්වාගෙන යාම
22. ටයර් අලෙවිසැලක් පවත්වාගෙන යාම
23. බුලත්/පුවක්/සුරුට්ටු/බුලත් විට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
24. අමු තේදළු මිලට ගෙන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
25. සීඩී/වීසීඩී/ඩීවීඩී තැටි කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
26. ජංගම දුරකතන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
27. ශාරීරික අභ්‍යාස පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
28. යතුරුපැදි අලෙවිසැලක් පවත්වාගෙන යාම
29. පොල් මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
30. උත්සව ශාලාවක් පවත්වාගෙන යාම
31. තේ කොළ ගබඩාවක් පවත්වාගෙන යාම
32. පරිගණක පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
33. පූජා භාණ්ඩ අලෙවිසැලක් පවත්වාගෙන යාම
34. ගෘහස්ථ සූර්යය බල පද්ධති අලෙවිසැලක් පවත්වාගෙන යාම
35. රෙදි කැබලි එකතු කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
36. ජංගම අලෙවි රථ/සංචාරක වෙළෙඳාම
37. යන්ත්‍රසූත්‍ර කුලියට දීමේ ස්ථානයක්, උත්සව භාණ්ඩ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
38. බැංකු/මුල්‍ය ආයතනයක්/රක්ෂණ සමාගමක් පවත්වාගෙන යාම
39. පෞද්ගලික අධ්‍යාපන ආයතන පවත්වාගෙන යාම
40. හාර්ඩ්වෙයාර් එකක් පවත්වාගෙන යාම
41. ප්‍රසිද්ධ වෙන්දේසි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
42. ජ්‍යොතිෂ්‍ය කටයුතු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
43. උකස් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
44. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
45. නොතාරිස්/නීතිඥ/පුද්ගලික මිනින්දෝරු ආයතනයක් පවත්වාගෙන යාම
46. රියැදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
47. මිනී පෙට්ටි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48. කොම්පෝස්ට් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49. සැලසුම් ශිල්පී ආයතනයක් පවත්වාගෙන යාම
50. අමු තේ දළු මිළට ගෙන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
51. පොහොර කෘෂි රසායන ද්‍රව්‍ය විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
52. තේ/රබර්/ඇඟළුම් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම
53. රබර් සීල් සකස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
54. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම
55. දුරකථන සන්නිවේදන කුළුණු පවත්වාගෙන යාම
56. නියෝජිත තැපැල්හලක් පවත්වාගෙන යාම
57. කොන්ත්‍රාත්කරුවන්
58. විදේශ රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
59. කුඩා පරිමාණයේ විදුලි බලාගාර පවත්වාගෙන යාම
60. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
61. යන්ත්‍රනසාරයෙන් ලී ඉරන මෝලක් පවත්වාගෙන යාම
62. වාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
63. පොදු දුරකතන කුටීර පවත්වාගෙන යාම
64. ගඩොල් හා උළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. මැණික් මිලදී ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. වාහන කුළියට ලබා දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
67. මල් පැළ හෝ වෙනත් පැළ වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

දෙවන කොටස

I වැනි තීරුව	*II වැනි තීරුව*
බද්ද අදළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලන් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු වාර්ෂික බද්ද රු. ශත*
01. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
02. රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
03. රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
04. රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
05. රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
06. රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

12-786/5

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.XIII.06 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

(267 වන අධිකාරිය වන) විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, නිවිතිගල ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශයන්හි පවත්වන ලද (තත් ආඥාපනතේ විස්තර කර ඇති) විනෝද කටයුත්තකට ඇතුළු වීම සඳහා කරන ලද ගෙවීම්වලින් මෙහි නිරූපිත අනුප්‍රමාණ අනුව වූ බද්දක් මෙම යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දින සිට පනවා අය කළ යුතු යැයි නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

176 වැනි අධිකාරය වන ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ තුන්වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තුව -

ගෙවූ මුදල,

රු. 50 0 ට නොවැඩි වූ විට	10%
රු. 50 0 ට වැඩි එහෙත් රු. 100 0ට නොඅඩු වූ විට	10%
රු. 100 0 ට වැඩි එහෙත් රු. 150 0 ට නොඅඩු වූ විට	10%
රු. 200 0ට වැඩි එහෙත් රු. 250 0 නොඅඩු වූ විට	10%
රු. 250 0ට වැඩි වූ විට	10%

විනෝද බදු යටතේ බලපත්‍ර ගාස්තු අය කිරීම :	*රු. ශ.*
01. මුදල් අයකරන සංගීත සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව	1,000 0
02. මුදල් අය නොකරන සංගීත සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව	500 0
03. මුදල් අය කරන සර්කස් සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව	1,000 0
04. නාට්‍ය සංදර්ශනයන් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තුව	500 0

වැඩිවන සෑම දිනයක් සඳහාම රු. 50 බැගිනි.

12-786/6

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් - දෘෂ්‍ය පරිසර බදු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.XIII.07 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 හා 126 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දිනැති අංක 520/7 දරන පළාත් පාලන අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* IV(ඇ) කොටසේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කර ඇති අතුරු ව්‍යවස්ථාවල 39 වැනි ඡේදය යටතේ නිවිතිගල ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම් හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් මෙහි පහත සඳහන් පරිදි එක් එක් දැන්වීමකට ගාස්තුවක් 2019 ජනවාරි 01 වැනි දින සිට පනවා අය කිරීමට නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ප්‍රචාරක දැන්වීම් විස්තර

	රු. ශත
01. ස්ථිර ප්‍රචාරක දැන්වීම් සඳහා වර්ග අඩියකට (නිවිතිගල නගරය හැර)	40 0
02. තාවකාලික මාස 06ට අඩු බැනර් දැන්වීමක් සඳහා වර්ග අඩියකට	30 0
03. විශාල දැන්වීම් පුවරු ගුවන් පුවරු වර්ග අඩියකට	30 0
04. නිවිතිගල නගරය තුළ ස්ථිර ප්‍රචාරක දැන්වීම් (නාම පුවරු) සඳහා වර්ග අඩියකට	100 0
05. නිවිතිගල නගරය තුළ බැනර් දැන්වීමක් සඳහා	40 0

12-786/7

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වාහන ගාල් කිරීම වෙනුවෙන් බදු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.XIII.08 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

2019 ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිවිතිගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෑල, වටාපොත, කරවිට යන නගරවල කුළියට දීම හා ව්‍යාපාරික කටයුතු සඳහා නවතා තබන වාහනවලින් මෙහි පහත උපලේඛනය පරිදි වාර්ෂික බද්දක් පනවා අය කිරීමට තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

උපලේඛනය

	රු. ශත
01. ලොරියක් හෝ පෞද්ගලික බස් රථයක් හෝ මෝටර් රථයක් සඳහා	500 0
02. වෑන් රථයක් සඳහා	350 0
03. ත්‍රීරෝද රථයක් සඳහා	200 0
04. සංචාරක වෙළෙඳ රථයක් සඳහා	200 0

නිවිතිගල නගරය තුළ කුළියට දීම හා ව්‍යාපාරික කටයුතු සඳහා නවතා තබන වාහන වලින් මෙහි පහත උපලේඛනය පරිදි බද්දක් පනවා අය කිරීමට තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. නගරයේ කලින් වෙන් කරන ලද ස්ථානයක් සඳහා (මසකට)	3,000 0
02. නගරයේ පෙ.ව. 6.30 සිට 10.30 දක්වා කාර් සහ වෑන් රථයක් සඳහා (පැයකට)	50 0
03. නගරයේ පෙ.ව. 6.30 සිට 10.30 දක්වා ත්‍රී රෝද රථයක් සඳහා (පැයකට)	20 0
04. බස්නැවතුම්පලේ පෙ.ව. 6.30 සිට 10.30 දක්වා කාර් සහ වෑන් සඳහා (පැයකට)	50 0
05. බස්නැවතුම්පලේ පෙ.ව. 6.30 සිට 10.30 දක්වා ත්‍රීවීල් සඳහා (පැයකට)	20 0

12-786/8

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.XIII.09 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධාන වලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, නිවිතිගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව*
		රු. ශත
(i)	මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා -	
	(අ) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම්,	18 0
	(ආ) වෙළඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	40 0
(iii)	සෑම කරත්තයක් සඳහා	20 0
(iv)	සෑම අත් කරත්තයක් සඳහා	10 0
(v)	සෑම රික්ෂෝවක් සඳහා	7 50
(vi)	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
(vii)	සෑම ඇතෙකු සඳහා	50 0

2. විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය, සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12-786/9

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා පරීක්ෂණ හා සේවා ගාස්තු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.XIII.10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

2019.01.01 දින සිට නොපවරා ගැනීමේ/වීටී රේඛා සහතිකපත් සඳහා පරීක්ෂණ හා සේවා ගාස්තු පහත පරිදි අය කිරීමට තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

	රු. ශත
01. සහතික නිකුත් කිරීමේ ගාස්තුව	750 0
02. පරීක්ෂණ ගාස්තුව	500 0

12-786/10

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු ගාස්තු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.XIII.11 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 153 වගන්තියේ (1) වන උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර නිවිතිගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක -

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ

(ආ) එම ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ

(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 1 : 5 නම්,

එකී ඉඩම් සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2019 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට 2%ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර නිවිතිගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු යැයි නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12-786/11

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සහතික හා වෙනත් ආදායම් ගාස්තු අය කිරීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.XIII.12 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තිය යටතේ කලවාන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, කලවාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සඳහාම එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. වී. එස්. චාමින්ද ඉන්ද්‍රප්‍රිය,
සභාපති,
කලවාන ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 08 වැනි දින,
කලවාන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*බලය දෙනු ලබන කාර්ය*	*I වැනි තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	දුම්ගෙවල්	500 0	750 0	1,000 0
02.	ඇඳුම් මැසීම	500 0	750 0	1,000 0
03.	බයිසිකල් අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
04.	කම්හල්	500 0	750 0	1,000 0
05.	වී මෝල	500 0	750 0	1,000 0

I වැනි තීරුව		*II වැනි තීරුව*		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*බලය දෙනු ලබන කාර්ය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
06.	මෝටර් රථ අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
07.	ඔරලෝසු හා විදුලි උපකරණ අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
08.	කොසු ඉදල් නිෂ්පාදන අලෙවිය	500 0	750 0	1,000 0
09.	ටයර් ටියුබ් වොල්කනයිස්	500 0	750 0	1,000 0
10.	පොල්තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	ස්වර්ණාභරණ අලෙවිය	500 0	750 0	1,000 0
12.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	සුළු අපනයන භෝග එකතු කිරීම	500 0	750 0	1,000 0
14.	ජංගම දුරකථන අලෙවිය හා අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
15.	ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ හා අළුත්වැඩියාව හා විකිණීම	500 0	750 0	1,000 0
16.	ඇස්කණ්නාඩි රාමු විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	සුවඳ විලවුන්, හඳුන්කුරු, හිස තෙල් වර්ග සඳහා අමුද්‍රව්‍ය නිෂ්පාදනය	500 0	750 0	1,000 0
18.	රන් ආලේපනය කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	මෝටර් සයිකල් අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
20.	පරිගණක අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
21.	ලී මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	සුරතල් මසුන් අලෙවිය	500 0	750 0	1,000 0
23.	බෝතල් පත්තර එකතු කිරීම	500 0	750 0	1,000 0
24.	සුරතල් මසුන් ටැංකි නිෂ්පාදනය හා මසුන් සමග අලෙවිය	500 0	750 0	1,000 0
25.	කළු ගල් කැඩීම	500 0	750 0	1,000 0

12-997/5

කලවාන ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

කලවාන ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 5.08 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. වී. එස්. චාමින්ද ඉන්ද්‍රප්‍රිය,
සභාපති,
කලවාන ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 08 වැනි දින,
කලවාන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	රු. ශත
මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක් මෝටර් බයිසිකලයක්, කරත්තයක්. ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා කාර්තුව	25 0
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා,	
(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළෙඳ කාර්යයක් නොවන කාර්යක් සඳහා යොදවන්නේ නම්	04 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත්කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයෙකු, පෝනියෙකු, කොටළුවෙකු සඳහා	15 0
සෑම ඇතෙක් සඳහා	50 0

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන වීල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ "වෙළෙඳ කාර්යය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් *නැනහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු ලිබිත *නැනහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-997/6

කලවාන ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

කලවාන ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 5.08 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව කලවාන ප්‍රාදේශීය සභා සීමා තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක් (2%) වන බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 හා (1) (අ) ඡේදය යටතේ වන "සමානුපාතය" වශයෙන් එම ඉඩමේ ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 1:5 විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. වී. එස්. චාමින්ද ඉන්ද්‍රප්‍රිය,
සභාපති,
කලවාන ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 08 වැනි දින,
කලවාන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-997/7

කලවාන ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව විනෝද බදු හා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ බලපත්‍ර ගාස්තු අය කිරීම

කලවාන ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 5.08 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (1) වැනි උපවගන්තිය ප්‍රකාරව, 2019 වර්ෂය සඳහා විනෝද බදු හා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ගාස්තු වශයෙන් සෑම චිත්‍රපට දර්ශනයක්, මැජික් දර්ශනයක්, සර්කස් දර්ශනයක් හා සෑම සංගීත සංදර්ශනයක් සඳහා ම මුද්‍රණය කරන ලද ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් ගාස්තුවෙන් සියයට දහයක් (10%) කලවාන ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුය.

මීට අමතරව ප්‍රසිද්ධ ප්‍රදර්ශන ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ,

01. චිත්‍රපට සංදර්ශන (තාවකාලික), සර්කස් සංදර්ශන, මැජික් සංදර්ශන, නාට්‍ය දර්ශන සඳහා දිනකට රු. 500ක් හා වැඩිවන සෑම දිනකට ම රු. 50.00 බැගින් ද,

02. සංගීත සංදර්ශනයක එක් දිනකට රු. 5,000 බැගින් ද, කලවාන ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ය.

කේ. වී. එස්. චාමින්ද ඉන්ද්‍රප්‍රිය,
සභාපති,
කලවාන ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 08 වැනි දින,
කලවාන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-997/8

කලවාන ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව වෙනත් ආදායම් පැනවීම

කලවාන ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 5.08 යටතේ 2019 වර්ෂයේ ජනවාරි 01 වැනි දින සිට ඉදිරියට පහත විෂයයන් සඳහා අය කළ යුතු ගාස්තු උපලේඛනයේ සඳහන් පරිදි අය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. වී. එස්. චාමින්ද ඉන්ද්‍රප්‍රිය,
සභාපති,
කලවාන ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 08 වැනි දින,
කලවාන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*විෂයය*	*ගාස්තුව රු. ශත*
01	පුස්තකාල සාමාජික ගාස්තු	50 0
02	පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු	10 0
03	ප්‍රමාද දඩ දිනකට	1 0

අනු. අංකය	විෂයය	ගාස්තුව රු. ශත
04	විද්‍යුත් පුස්තකාලයේ සාමාජික අයදුම්පත් ගාස්තු	10 0
05	විද්‍යුත් පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අයකරනු ලබන මුදල	150 0
06	අන්තර්ජාලය පරිහරණය කිරීමට පැයක් සඳහා ගාස්තුව	40 0
07	ගොඩනැගිලි අයදුම්පත් සඳහා ගාස්තුව	1,500 0
08	වීථිරේඛා සහතිකපත් සඳහා ගාස්තුව	1,000 0
09	අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා පෝරම ගාස්තුව	1,000 0
10	*ආදාහනාගාර ගාස්තුව :*	
	(1) බල ප්‍රදේශය තුළ	7,500 0
	(2) බල ප්‍රදේශයෙන් පිටත	8,500 0
11	ක්‍රීඩා පිටිය වෙන් කිරීම සඳහා	1,500 0
12	*පිඹුරුපත් අනුමත කර ගැනීම සඳහා :*	
	(1) වර්ග මීටර් 150-300 අතර බිම් කට්ටි ප්‍රමාණයකට	250 0
	(2) වර්ග මීටර් 301-600 අතර බිම් කට්ටි ප්‍රමාණයකට	200 0
	(3) වර්ග මීටර් 601-900 අතර බිම් කට්ටි ප්‍රමාණයකට	150 0
	(4) වර්ග මීටර් 900ට වැඩි බිම් කට්ටි ප්‍රමාණයකට	100 0

12-997/9

කලවාන ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව වෙළෙඳ දැන්වීම් සඳහා බැනර්, කටවුට්, පුවරු සවිකිරීම

බැනර් :

	කාලය	බල ප්‍රදේශයේ ව්‍යාපාරික දැන්වීම් සඳහා රු. ශත	බල ප්‍රදේශයෙන් පිටත ව්‍යාපාරික දැන්වීම් සඳහා රු. ශත
01. *(අ)*	මාස එකක් හෝ එකකට අඩු කාලයක් සඳහා වර්ග අඩියකට	25 0	50 0
(ආ)	මාස එකේ සිට මාස තුනක් දක්වා වර්ග අඩියකට	35 0	70 0
(ඇ)	මාස තුනකට වැඩි කාලයක් සඳහා වර්ග අඩියකට	50 0	100 0

කටවුට් :

	කාලය	බල ප්‍රදේශයේ ව්‍යාපාරික දැන්වීම් සඳහා රු. ශත	බල ප්‍රදේශයෙන් පිටත ව්‍යාපාරික දැන්වීම් සඳහා රු. ශත
01. *(අ)*	මාස එකක් හෝ එකකට අඩු කාලයක් සඳහා - වර්ග අඩියකට	35 0	70 0
(ආ)	මාස එකේ සිට මාස තුනක් දක්වා - වර්ග අඩියකට	40 0	80 0
(ඇ)	මාස තුනකට වැඩි කාලයක් සඳහා - වර්ග අඩියකට	50 0	100 0

ප්‍රචාරක දැන්වීම් පුවරු :

කාලය	*බල ප්‍රදේශයේ ව්‍යාපාරික දැන්වීම් සඳහා රු. ශත*	*බල ප්‍රදේශයෙන් පිටත ව්‍යාපාරික දැන්වීම් සඳහා රු. ශත*
03. *(ආ)* ස්ථිර	100 0	200 0

කේ. වී. එස්. චාමින්ද ඉන්ද්‍රජිත්‍රය,
සභාපති,
කලවාන ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 08 වැනි දින,
කලවාන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-997/10

කලවාන ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව සියයට එක (1%) බද්ද පැනවීම

කලවාන ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 5.08 යටතේ 2019 වර්ෂයේ ජනවාරි 1 වැනි දින සිට ඉදිරියට පහත සඳහන් පරිදි ගාස්තු අය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ කලවාන ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති ආපනශාලා හෝටල් හෝ නවාතැන් පොළ සඳහා ඔවුන්ගේ පෙර වර්ෂයේ ආදායමින් සියයට එකක් (1%) නොඉක්මවන බද්දක් අය කරනු ලැබේ.

කේ. වී. එස්. චාමින්ද ඉන්ද්‍රජිත්‍රය,
සභාපති,
කලවාන ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 08 වැනි දින,
කලවාන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-997/11

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

දැන්වීම් පුවරු ගාස්තු - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වැනි වගන්තිය සමඟ කියවිය යුතු 126 වැනි වගන්තියේ (vii) (ඊ) හා (xxx) යන උපවගන්ති යටතේ ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා පළාත් පාලන නිවාස ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් අංක 520/7 හා 1988.08.23 දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් 62/A, 63/A, 64/A පිටුවල) පළ කරන ලද්ද වූ ප්‍රචාරක දැන්වීම් සම්බන්ධයෙන් චාවකච්චේරි ප්‍රාදේශීය සභාව බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු විසින් යම් විදියක් මත හෝ විදියේ නෙරා සිටින ආකාරයකින් වන ප්‍රචාරක දැන්වීම් පුවරු හෝ වෙනත් තාවකාලික ව්‍යුහ හෝ යම් ආකාරයකින් වන කුමන හෝ අලංකාරයේ පිහිටීමක් හෝ පිහිටුවීමට කටයුතු කිරීමේ කටයුත්ත සඳහා වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව වෙතින් අනුමැතිය ලබාගත යුතුය. මෙම කරුණු සම්බන්ධයෙන් පහත දැක්වෙන උපලේඛනයට අනුව ප්‍රචාරක දැන්වීම් පුවරුවලට ගාස්තු අයකර ගැනීමට අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව මෙයින් නිවේදනය කරමි. මෙලෙසින් සිටුවන ස්ථිර ප්‍රචාරක දැන්වීම් සෑම වසරක් පාසාම මාර්තු මස 31 වැනි දිනට පෙර නියමිත ගාස්තුව ගෙවා අළුත් කිරීම කළ යුතු බවත් දන්වමි.

1. එක් වසරකට බිත්තියක් මතින් ප්‍රදර්ශන රු. 30.00 කෙරෙන ස්ථිර ප්‍රචාරක දැන්වීමකට - වර්ග අඩියක් සඳහා. (දැන්වීමක් නාම පුවරුවක දෙපැත්තෙහිම ප්‍රදර්ශනය කර ඇත්නම්, දෙපැත්තටම ගාස්තු අය කෙරේ.)

2. එක් වසරකට නාම පුද්ගලික ඉඩමක් තළ පුවරුවක් මතින් ප්‍රදර්ශන රු. 80.00 කෙරෙන ස්ථිර ප්‍රචාරක දැන්වීමකට - වර්ග අඩියක් සඳහා. (දැන්වීමක් නාම පුවරුවක දෙපැත්තෙහිම ප්‍රදර්ශනය කර ඇත්නම්, දෙපැත්තටම ගාස්තු අය කෙරේ.)

3. එක් වසරකට නාම පුවරුවක් මතින් ප්‍රදර්ශන රු. 100.00 කෙරෙන ස්ථිර ප්‍රචාරක දැන්වීමකට - වර්ග අඩියක් සඳහා. (දැන්වීමක් නාම පුවරුවක දෙපැත්තෙහිම ප්‍රදර්ශනය කර ඇත්නම්, දෙපැත්තටම ගාස්තු අය කෙරේ.)

4. ඒ වසරකට පුවරුවක හෝ උපකාරයක සමගින් ප්‍රදර්ශනය කෙරෙන රු. 120.00 විදුලිපහන් ධාරාව සමගින් වූ දැන්වීමකට වර්ග අඩියක් සඳහා

5. එක් වසරකට බැනරයකින් ප්‍රදර්ශනය කෙරෙන තාවකාලික දැන්වීමකට -වර්ග අඩියක් සඳහා රු. 50.00

6. කඩේ නාමය ඇතුල් කළ එක නාම පුවරුවක් ගැර අනික් පුවරුවලට - වර්ග අඩියක් රු. 40.00

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරි ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

12-992/1

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

ඉඩම් වෙන්දේසි බද්ද -2019

චාවකච්චේරි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා තිබෙන යම් ඉඩමක්, වෙන්දේසිකරුවෙකු, හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනුයෝජිතයෙකු හෝ විසින් වෙන්දේසියෙන් හෝ වෙනත් අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක, එවැනි විකිණීමෙන් ලත් මුදලින්, ප්‍රාදේශීය සභා පනතේ 154 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ ගෙවිය යුතු සියයට එකකට සමාන බදු මුදල, විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ ඔහුගේ අනුයෝජිතයා හෝ විසින් ගෙවිය යුතුයි යන්නෙන්, අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව මෙයින් දන්වමි.

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරි ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

12-992/2

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

ආකෘති පත්‍ර ගාස්තු, සහතිකපත් ගාස්තු - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ආකෘති පත්‍ර ගාස්තු/සහතික පත් ගාස්තු යනාදිය පහත දැක්වෙන පරිදි අයකර ගැනීමට අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව පහත දැක්වෙන ගාස්තු අය කිරීම කරනු ලැබේ.

ආකෘති පත්‍ර ගාස්තු :	*රු. ශත*
1. ගොඩනැගිලි අයදුම්පතක් සඳහා	300 0
2. දේපළ නාමය මාරු කිරීමේ අයදුම්පතක් සඳහා	100 0
3. පාරිසරික අයදුම්පතක් සඳහා	100 0
4. පුස්තකාල සාමාජික අයදුම්පතක් සඳහා	10 0
5 වෛද්‍ය පරීක්ෂණ අයදුම්පතක් සඳහා	10 0

සහතිකපත් ගාස්තු :

1. දේපළෙහි හිමිකම් සහතිකයක් සඳහා 2. වීථිරේඛා සහතිකයක් සඳහා 3. නොපරවා ගැනීමේ සහතිකයක් සඳහා	600 0
4. අනුකූලතා සහතිකයක් සඳහා	500 0

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරි ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

12-992/3

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

පොදු දැක්ම ශාලාව කුලියට දීම සඳහා වන ගාස්තුව - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ චාවකච්චේරි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති ප්‍රාදේශීය සභාවට අයත් පොදු දැක්ම ශාලාවෙහි කුලී ගාස්තුව පහත දක්වා ඇති පරිදි අයකර ගැනීමට අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව මෙයින් දන්වමි.

සම්පූර්ණ එක් දවසක් සඳහා කුලී ගාස්තුව - 500.00

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරි ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

12-992/4

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

ජාතික පරිසරික පනත යටතේවන දැන්වීම - 2019

මධ්‍යම පාරිසරික අධිකාරිය, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 28 වැනි වගන්තියට අනුව හා 1988 අංක 56 දරන සංශෝධිත පනතේ විධිවිධාන ප්‍රකාරව මධ්‍යම පාරිසරික සභාපතිවරයා විසින් එකී පනත යටතේ අංක 1159/22 හා 2002.11.22 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* IV වැනි කොටසින් පළ කරන ලද්ද වූ එකී ගාස්තුවලට හා එකී රෙගුලාසිවලට අනුව 2003 වසරේ ජනවාරි මස 1 වෙනිදා සිට පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති බලතල, රාජකාරි හෝ කර්තව්‍ය ප්‍රාදේශීය සභාවෙහි සභාපතිවරයාට පවරාදීම මත චාවකච්චේරි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙම පනත ක්‍රියාත්මකවන අතර පහත උපලේඛනයෙහි දැක්වෙන කර්මාන්තය සඳහා මධ්‍යම පාරිසරික අධිකාරිය විසින්, නියම කර ඇති ආකාරයේ ආකෘතිපත්‍ර, ගාස්තු එකක් සඳහා පරීක්ෂණ ගාස්තු හා බලපත්‍ර ගාස්තු

යනාදිය පනවා අය කළ යුතුයි යන්නෙන් අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව මෙයින් දන්වමි. ප්‍රාදේශීය සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍රයක ගාස්තුව වශයෙන් රුපියල් 4,000.00 මුදල හා බදු මුදල අයකරනු ලැබේ. එමෙන්ම පරිසර ආරක්ෂණ බලපත්‍රය එක් වරක් (වසර තුනකට වරක්) අළුත් කරන විට, පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව වශනේ රුපියල් 4,000.00 මුදල හා බදු මුදල අයකරනු ලැබේ. පාරිසරික පරීක්ෂණ ගාස්තු, යොදවන ලද ප්‍රාග්ධනයට අනුව පහත දැක්වෙන පරිද්දෙන් අය කරනු ලැබේ.

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරිය ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

උපලේඛනය

පාරිසරික පරීක්ෂණ ගාස්තු, යොදවන ලද ප්‍රාග්ධනයට අනුව පහත දැක්වෙන පරිද්දෙන් අය කරනු ලැබේ.

යොදවන ලද ප්‍රාග්ධනය පරීක්ෂණ ගාස්තුව	*රු. ශත*
රු. 250,000 ට වඩා අඩු නම්	3,000 0
රු. 251,000 ත් රු. 500,000 ත් අතර නම්	3,750 0
රු. 501,000 ත් රු. 1,000,000 ත් අතර නම්	5,000 0
රු. 1,000,000 ට වඩා වැඩි නම්	10,000 0

ප්‍රාදේශීය සභා පනතේ 149, 150, 152 (1) යන වගන්ති යටතේ පනවා, අයකර ගන්නා බලපත්‍ර ගාස්තු වලට කිසිදු ආකාරයකින් අගතියක් සිදු නොවේ.

උපලේඛනය

කොටස "ඇ"

1. සියළුම වාහන ඉන්ධන පිරවුම් හල්
2. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත.
3. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් යොදවන තෙල් සිදීමේ කර්මාන්ත
4. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් යොදවන මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
5. වියළි ක්‍රියාවලි සහිත වී මෝල
6. මාසික නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 1000 කට අඩුවන ඇඹරුම් හල්
7. දුම්කොළ වේලීමේ කර්මාන්ත
8. සල්ෆර් දුම්ගැසීම සහිත එක් ක්‍රියාවලියක දී නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි ධාරිතාවක් සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
9. කෑමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත
10. ක්ෂණික තේ කර්මාන්ත ශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා
11. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
12. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
13. දිනකට මෙට්‍රික් ටොන් 20 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත හුණු පෝරණු
14. සේවකයින් 25 ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
15. සියළුම බෙලිකටු ඇඹරීමේ කර්මාන්ත
16. උළු සහ ගඩොල් කර්මාන්ත
17. පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදුකරන ලබන කැණීම් කටයුතු සඳහා එක් වරකට එක්බෝර වලක්
18. දිනකට ඝණමීටර් 50 ට අඩු දැව ඉරීමේ ධාරිතාවයකින් ඇති ලී මෝල් හෝ බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ දැව පදම් කිරීමේ කර්මාන්ත
19. බහු කාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයින් 5 ට වැඩි 25 ට අඩු ගණනක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත
20. නේවාසික කාමර 05 ක් හෝ ඊට වැඩි සහ 20 ට අඩු හෝටල් ආගන්තුක නිවාස සහ තානායම්
21. වාහන අළුත්වැඩියා කිරීමේ/නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ.

22. ශීතකරණ හා වායු සමීකරණ උපකරණ හා පද්ධති අළුත්වැඩියා කිරීම, නඩත්තුකිරීමේ පහසුකම් (ගරාජ ඇතුලුව) ජංගම වායු සමීකරණ හා ප්‍රවාහන ශීතකරණ යන්ත්‍රවල ශීතකාරක ප්‍රතිචක්‍රියකරණය සහ ප්‍රතිග්‍රහණය කරන යනාදිය සිදු කරන ස්ථාන.
23. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලූ පර්යන්ත
24. සේවකයින් 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියළුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ ස්ථාන.
25. ඊයම් උණු කිරීම සිදු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අතුරු මුද්‍රණාල කිරීමේ යන්ත්‍ර

12-992/5

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

වාසනා ලොතරැයිය දිනුම් ඇදීම සඳහා වන ගාස්තුව - 2019

1987 අංක 37 දරන විනෝද බදු සංශෝධන පනත යටතේ චාවකච්චේරි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාසනා ලොතරැයිය දිනුම් ඇදීමේ කටයුතු සිදුකරන්නන් විසින් බලපත්‍ර ගාස්තුව වශයෙන් රුපියල් 1,000 ක මුදලක් ගෙවිය යුතුය. සභාව විසින් ප්‍රජා සංවර්ධන ආයතන සඳහා බදු මුදලින් නිදහස් කර ඇත්නම් බලපත්‍ර ගාස්තු වශයෙන් රුපියල් 1,000.00 ක මුදල පමණක් අයකර ගැනීමට හා බදු මුදලින් නිදහස් නොකර ඇත්නම් බලපත්‍ර ගාස්තුව සමගින් කුවිතාන්සිවල වටිනාකමින් 5% ක මුදල ගාස්තුව වශයෙන් අයකර ගැනීමට අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව මෙයින් දන්වමි.

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරිය ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

12-992/6

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

ගලි බවුසර් සේවා ගාස්තු - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තිය යටතේ චාවකච්චේරි ප්‍රාදේශීය සභාව මගින් ගලි බවුසරයෙන් සේවා සැපයීමට අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව පහත දැක්වෙන ගාස්තු අය කිරීම කරනු ලැබේ.

	රු. ශත
සභාවෙහි බලසීමාව තුළ පළමුවෙනි ලෝඩ් එක සඳහා	6,000.00
ඊළඟ සෑම ලෝඩ් එකක් සඳහාම	5,000.00

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරිය ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

12-992/7

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වන අනුමැතිය හා ගාස්තු පැනවීම- 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21 වැනි හා 78 වැනි වගන්ති යටතේ සහ අංක 520/7 හා 1988.08.23 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළාත් පාලන ආමත්‍යවරයා විසින් පළ කරන ලද්ද වූ අතුරු ව්‍යවස්ථාවල 8 වැනි වගන්තියට අනුකූලව චාවකච්චේරි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අලුතින් ඉදි කිරීමට යෝජිත ගොඩනැගිලිවලට ප්‍රාදේශීය සභාවේ අනුමැතිය, පරීක්ෂක ගාස්තුව හා ඉදිකළ ගොඩනැගිලි සඳහා වන දඩ මුදල පහත දැක්වෙන උපලේඛන 01 න් හා 02 න් අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය මෙයින් දන්වමි.

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරිය ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

උපලේඛනය - 01

බිමෙහි විශාලත්වය	*නේවාසික පාවිච්චිය සඳහා රු. ශත*	*අනෙකුත් පාවිච්චිය සඳහා රු. ශත*
1. වර්ග අඩි 1-වර්ග අඩි 500 දක්වා	150 0	200 0
2. වර්ග අඩි 500 ඉක්මවීමෙන් පසු සෑම වර්ග අඩි 100 ක් සඳහාම	100 0	150 0
3. තාප්පයක්,		
• අඩි 1- අඩි 100 දක්වා	500 0	
• අඩි 100 ඉක්මවීමෙන් පසු සෑම අඩි 50 ක් සඳහාම	70 0	

උපලේඛනය - 02

ගොඩනැගිලි ඉල්ලුම්පත්‍රයකින් අනුමැතිය නොලබා, ගොඩනැගිල්ල ඉදි කිරීමේ කරුණ නිරාකරණය කිරීමට අනුමැතිය ලබාදීම සඳහා

ඉදි කිරීමේ අදියරය (වර්ග අඩියකට)	*නේවාසික පාවිච්චිය සඳහා රු. ශත*	*අනෙකුත් පාවිච්චිය සඳහා රු. ශත*
01. අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කොට ඇති විට	7 0	10 0
02. වහල මට්ටම දක්වා (වහලය රහිතව) ඉදිකොට ඇති විට	10 0	15 0
03. වහලය ඇතුළුව ඉදිකොට ඇති විට	15 0	20 0
04. සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	20 0	25 0
05. තාප්පයක් ඉදිකොට ඇති විට (අඩියකට)	10 0	20 0

12-992/8

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

රෝලර් (Roller) යන්ත්‍රයක් සඳහා කුලිය - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තිය යටතේ චාවකච්චේරි ප්‍රාදේශීය සභාව විසින් රොලර් යන්ත්‍රයෙන් සේවා සැපයීම සඳහා අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව පහත දැක්වෙන ගාස්තු අය කිරීම කරනු ලැබේ :

01 රෝලර් (Roller) - එක් පැයක් සඳහා රුපියල් 3000 කි. පැය 4 කට වඩා අඩුවෙන් එක් දවසකට වැඩ කිරීමට හැකි ය.
02 සාමාන්‍ය රෝලර් - එක් දවසකට රුපියල් 500.00

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරිය ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

12-992/9

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු මුදල අයකර ගැනීම - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තියට අනුකූලව චාවකච්චේරි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කයිතඩි, නාවට්කුලිය වලට පෙර වසරේ අය කිරීම් කළ පරිද්දෙන් දේපළ මත බදු මුදල සහ දඩ මුදල අයකර ගැනීමට අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව මෙයින් දන්වමි.

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරිය ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

12-992/10

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

පාපැදි ආරක්ෂාකාරී ස්ථානයක් සඳහා වන ගාස්තුව - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ චාවකච්චේරි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පාපැදි ආරක්ෂාකාරී ස්ථානයක් නඩත්තු කරන්නන් විසින් බලපත්‍ර ගාස්තුව වශයෙන් රුපියල් 500.00 ක මුදලක් ගෙවිය යුතුය. සභාව විසින් ප්‍රජා සංවර්ධන ආයතන සඳහා බදු මුදලින් නිදහස් කර ඇත්නම්, බලපත්‍ර ගාස්තු වශයෙන් රු. 500.00 ක මුදල පමණක් අයකර ගැනීමට හා බදු මුදලින් නිදහස් නොකර ඇත්නම්, බලපත්‍ර ගාස්තුව සමගින් කුවිතාන්සිවල වටිනාකමින් 5%ක මුදල ගාස්තුව වශයෙන් අයකර ගැනීමට අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව මෙයින් දන්වමි.

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරිය ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

12-992/11

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

කුකුළ් මස් විකිණීම සඳහා වන දැන්වීම - 2019

ගෝ ඝාතක ආඥාපනතේ 201 වැනි අධිකාරය සමග 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුකූලව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍ය ආරක්ෂා වන අරමුණින් හා එකී පනතේ 122(1) වැනි වගන්තිය සමග කියවිය යුතු 126 :* (ඒ) යන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1988.08.23

දිනැතිප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි කොටසින් පල කරන ලද්ද, වූ පළාත් පාලන ආයතන සඳහා වන අතුරු ව්‍යවස්ථාවල II වැනි පරිච්ඡේදයේ ප්‍රසිද්ධ වෙළෙඳ පොළ අතුරු ව්‍යවස්ථාවේ 33 වැනි වගන්තිය යටතේ පළාත් පාලන ආයතන වෙත පවරන ලද බලතල ප්‍රකාරව හා චාවකච්චේරි ප්‍රාදේශීය සභාව අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව චාවකච්චේරි ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පොදු වෙළෙඳ පොළවල් පිහිටා ඇති ස්ථානවල සිට කිලෝමීටර් එක (1km) ක වටරවුම තුළ කුකුළ් මස් විකිණීම හෝ පාරිභෝගිකයින්ට කුකුළන් සජීවව වෙන් වෙන්ව විකිණීම හෝ තහනම් කර ඇති බව මෙයින් දන්වමි.

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරි ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

12-992/12

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

නල ළිං ඉදි කිරීම සඳහා වන අනුමැතිය - 2019

යාපනය ජාතික ජල සැපයීම් හා ජලාපවහන මණ්ඩලයේ නල ළිං ඉදි කිරීමේ ක්‍රියාපරිපාටියට අනුව හා අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව චාවකච්චේරි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නල ළිං ඉදි කරනු ලබන්නේ නම් ප්‍රාදේශීය සභාවෙන් පූර්වාංග අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කළ යුතු යැයි මෙයින් දන්වමි.

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරි ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

12-992/13

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

නිර්මාණ ශිල්පීන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ නිර්මාණ ශිල්පීන් ලියාපදිංචි කිරීම සඳහා අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව පහත දැක්වෙන ගාස්තු අය කිරීම කරනු ලැබේ.

- නිර්මාණ ශිල්පී ලියාපදිංචි කිරීමේ ගාස්තුව 2,500 0
- අළුත් කිරීමේ ගාස්තුව 1,500 0

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරි ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

12-992/14

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

පාපැදි ලියාපදිංචි කිරීමේ ගාස්තුව - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148(4) වැනි වගන්තියට අනුකූලව, පාපැදියක් ලියාපදිංචි කිරීමේ ගාස්තුව වශයෙන් රුපියල් 25.00 ක් අයකර ගැනීමට අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව මෙයින් දන්වමි.

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරි ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

12-992/15

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (272 වැනි පරිච්ඡේදය) - 2019

චාවකච්චේරි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති කරන සුනඛයින් සඳහා වන ලියාපදිංචිය, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148(3) වැනි වගන්තියට අනුකූලව, එක් සුනඛයෙකුට 2019 වර්ෂයට ලියාපදිංචි කිරීමේ ගාස්තුව වශයෙන් රුපියල් 40.00 ක් පනවා අයකර ගැනීමට අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව මෙයින් දන්වමි.

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරි ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

12-992/16

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

එළවළු විකිණීම - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ 126(1ඔ) ඒ වැනි වගන්තිය යටතේ හා 1988.08.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි කොටසින් පළ කරන ලද්ද වූ ද, පළාත් පාලන ආයතන සඳහා වන අතුරු ව්‍යවස්ථාවල II වැනි පරිච්ඡේදයේ ප්‍රසිද්ධ වෙළෙඳ පොළ අතුරු ව්‍යවස්ථාවේ 33 වැනි වගන්තිය යටතේ පළාත් පාලන ආයතන වෙත පවරා දී ඇති බලතල අනුව චාවකච්චේරි ප්‍රාදේශීය සභාව අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව චාවකච්චේරි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පොදු වෙළඳ පොළ පිහිටා ඇති ස්ථානයේ සිට කිලෝමීටර් එක (1 km) ක වටරවුම තුළ ව්‍යාපාරික ස්ථාන, සංචාරක වෙළඳාම සහ පදික වෙළඳාම ආදියෙන් එළවළු විකිණීම හෝ ප්‍රදර්ශනයට තැබීම හෝ සම්පූර්ණයන්ම තහනම් කර ඇති බව මෙයින් දන්වමි.

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරි ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

12-992/17

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

බවුසරය මගින් ජලය සැපයීම සඳහා සේවා ගාස්තුව - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 114 වැනි හා 118 වැනි වගන්ති යටතේ චාවකච්චේරි ප්‍රාදේශීය සභාව මගින් පානීය ජලය සැපයීමේ සේවාව සඳහා අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව පහත දැක්වෙන ගාස්තු අය කිරීම කරනු ලැබේ.

බවුසරය ලිසින් වතුර සැපයීම :

- 3500 l - එක පැයකට- රු. 2,000.00
- 6000 l - එක පැයකට - රු. 3,000.00

වතුර ටැංකිය දීම පමණයි :

- 3500 l - එක පැයකට - රු. 1,000.00
- 1000 l - එක පැයකට - රු. 500.00

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරි ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

12-992/18

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

ගෝ ඝාතකාගාර පවත්වාගෙන යාම

ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ ගෝ ඝාතකාගාර විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම, යනාදිය සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුකූලව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍යය ආරක්ෂා වන අරමුණින්, 201 වැනි අධිකාරය හෝ ඝාතක ආඥාපනත සමග III වැනි වගන්තියට අනුව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 102 සහ 122 (1) යන වගන්ති සමග කියවිය යුතු 126(IX) (එ) යන උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා චාවකච්චේරි ප්‍රාදේශීය සභාවේ අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව ගෝ ඝාතකාගාරයේ ඝාතනය කරනු ලබන එක් හරකෙකු සඳහා රුපියල් 100.00 ක මුදල බැගින් ගාස්තු අයකරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරි ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

12-992/19

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

සුවිශේෂී වෘත්තීන් සඳහා ව්‍යාපාරික බලපත්‍ර ගාස්තු - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (1) වැනි වගන්තියට අනුකූලව පහත දැක්වෙන කර්මාන්ත වලට පහත සඳහන් පරිදි රුපියල් 3,000.00 මුදල හා බදු මුදල අයකරනු ලැබේ. අයකර ගැනීමට අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව මෙයින් දන්වමි.

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරි ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

සුවිශේෂී වෘත්තීවල ලැයිස්තුව :

(1) ඉඩම් මිනින්දෝරු
(2) නීතිඥ, නොතාරිස්
(3) වෙන්දේසිකරු
(4) තැරැව්කරු
(5) තැරැව් නියෝජිත
(6) මඟුල් තැරැව්කරු
(7) ගොඩනැගිලි කොන්ත්‍රාත්කරු
(8) මූල්‍ය ආයෝජකයින්
(9) රැකියා නියෝජිත
(10) ගමන් නියෝජිත
(11) කොමිස් අනුප්‍රාප්තික
(12) මුදල් ණයට දෙන්නන්
(13) මෝටර් රථ වාහන රියදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
(14) පරිගණක පුහුණුවීම් ආයතනයක් පවත්වාගෙන යාම
(15) විගණන ආයතනයක් පවත්වාගෙන යාම
(16) චාරිකා ගමන් බස් රථ සේවයක් පවත්වාගෙන යාම
(17) පර්සල් ආනයන, අපනයන සේවයක් පවත්වාගෙන යාම
(18) ගොඩනැගිලි නිර්මාණ කලාව හෝ නිර්මාණ ශිල්ප ආයතනයක් පවත්වාගනෙ යාම
(19) රක්ෂණ නියෝජිත
(20) දේශීය වාණිජමය බැංකු ආයතන
(21) දේශීය බැංකු ආයතන
(22) සමුපකාර බැංකු ආයතන
(23) විදේශීය බැංකු ආයතන
(24) පුද්ගලික පාසල්
(25) රන් උකස් ගන්නා ස්ථානය
(26) වෛද්‍ය සේවකයින් පුද්ගලික වෛද්‍ය නිවාස
(27) Co-op City පවත්වාගෙන යාම
(28) Food City පවත්වාගෙන යාම
(29) දර්ශන කාමර පවත්වාගෙන යාම
(30) දුරකථන සංනිවේදන කුළුණු බලපත්‍ර ගාස්තු
(31) මංගල ශාලා, හෝටල්, නවාතැන් නිවාස, ලැගුම් නිවාස
(32) සිසිල් බීම (වානික පාන) කර්මාන්ත ශාලා

12-992/20

චාවකච්චේරි ප්‍රාදේශීය සභාව - කොඩිකාමම්

ව්‍යාපාරික බලපත්‍ර ගාස්තු/බදු - 2019

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) වැනි ඡේදය සමඟ කියැවෙන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරු පළාතේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් පිළියෙල කරනු ලැබ අංක 2011/25 හා 2017.03.24 දිනැති අතිවිශෙෂ *ගැසට් පත්‍රය* මගින් පළ කරන ලද්දවූ ද සම්මත අතුරු ව්‍යවස්ථා, චාවකච්චේරි ප්‍රාදේශීය සභාව විසින් අංක 119 හා 2017.06.16 දිනැති තීරණය මගින් පිළිගත් බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123(2) වැනි වගන්තිය යටතේ අංක 2029 හා 2017.07.21 දිනැති *ගැසට් පත්‍රය* මගින් පළ කරනු ලැබීමට අනුව, උතුරු පළාත් සභාවේ සම්මත අතුරු ව්‍යවස්ථාවලට අනුව හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත දැක්වෙන ව්‍යාපාර හා කර්මාන්ත පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම යනාදිය සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුකූලව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ

පිරිසිදුභාවය හා සෞඛ්‍ය ආරක්ෂා වන අරමුණින්, එකී පනතේ 122(1) වැනි වගන්තිය සමග කියවිය යුතු 126 (ix) හා 126 (xxiii) යන වගන්තිවල උපවගන්ති යටතේ සහ 147, 148, 149, 150, 152 (1) හා 154 යන වගන්ති යටතේ ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා චාවකච්චේරි ප්‍රාදේශීය සභාවේ අංක 02/05.12.2018 දරන සභාවේ තීරණය අනුව පහත උපලේඛනයෙහි දැක්වෙන ව්‍යාපාරික හා කර්මාන්ත ආයතනවලින් 2019 වර්ෂයට බලපත්‍ර ගාස්තු හා බදු 2019 වසරේ ජනවාරි මස පළමු වැනිදා සිට මාස තුනක කාලය ඇතුළත චාවකච්චේරි ප්‍රාදේශීය සභාවේ කච්චායි, වරණි කයිතඩි, නාවට්කුලිය, සරසාලයි, සහ මිරුසුවිල් යන උප කාර්යාලවල හෝ ගෙවීම් කිරීමට හැකි වන අතර සෑම වසරකම මාර්තු මස 31 වැනිදට පෙර ගෙවිය යුතු වේ.

ක. වාමදෙවන්,
සභාපති,
චාවකච්චේරි ප්‍රාදේශීය සභාව,
කොඩිකාමම්.

ව්‍යාපාරික බලපත්‍ර ගාස්තු/බදු - 2019		
		රු. ශත
1	තේ කඩයක් පවත්වාගෙන යාම	500 0
2	තේ කඩයක් හා භෝජනාගාරයක් පවත්වාගෙන යාම	1,000 0
3	නේවාසික පහසුකම් සමගින් නවාතැන් නිවසක් පවත්වාගෙන යාම	1,000 0
4	සාමාන්‍ය භෝජනාගාරයක් පවත්වාගෙන යාම	750 0
5	බේකරියක් පවත්වාගෙන යාම - නිෂ්පාදන	1,000 0
6	බේකරියක් පවත්වාගෙන යාම - අළෙවිය	1,000 0
7	විවේකාගාරයක් පවත්වාගෙන යාම	1,000 0
8	කොණ්ඩා කපන ස්ථානයක් පවත්වාගෙන යාම	750 0
9	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0
10	බීඩි, සුරුට්ටු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	750 0
11	එළු මස් කඩයක් පවත්වාගෙන යාම	1,000 0
12	වෙනත් මාංශ වර්ග අළෙවි සැළක් පවත්වාගෙන යාම	1,000 0
13	මාළු අළෙවි සැලක් පවත්වාගෙන යාම	1,000 0
14	කුඩා තිර චිත්‍රපටි දර්ශන පෙන්වන ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
15	ගඩොල් හෝ උළු ගබඩා කිරීම	1,000 0
16	මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ අළෙවි කිරීම	1,000 0
17	ගොඩනැගිලි ද්‍රව්‍යයන් අළෙවි කිරීම හෝ තබා ගැනීම	1,000 0
18	යකඩ භාණ්ඩ අළෙවි කිරීම හෝ තබා ගැනීම	1,000 0
19	පරණ යකඩ භාණ්ඩ අළෙවි කිරීම හෝ තබා ගැනීම	1,000 0
20	සිමෙන්ති කොට්ට 25 කට වැඩියෙන් අළෙවි කිරීම හෝ තබා ගැනීම	1,000 0
21	ලී මඩුවක් පවත්වාගෙන යාම - ලී බඩු නිෂ්පාදනය	1,000 0

වාහපාරික බලපත්‍ර ගාස්තු/බදු - 2019		
		රු. ශත
22	ලී බඩු විකිණීම	1,000 0
23	තල් ලී මඩුවක් පවත්වාගෙන යාම හෝ අළෙවි කිරීම	1,000 0
24	දර මඩුවක් පවත්වාගෙන යාම	1,000 0
25	වඩු වැඩ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	1,000 0
26	ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ අළෙවි කිරීම	1,000 0
27	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීමේ මෝලක් පවත්වාගෙන යාම ලෑලි දුව නිෂ්පාදනය	1,000 0
28	ලෑලි දුව අළෙවි කිරීම	1,000 0
29	මිනිස් ශ්‍රමයෙන් ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම	1,000 0
30	යාන්ත්‍රික යකඩ කම්හලක් පවත්වාගෙන යාම	1,000 0
31	යකඩ කම්හලක් පවත්වාගෙන යාම	750 0
32	රසැති පාන වර්ග නිෂ්පාදන කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	750 0
33	අයිස් කැට නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	750 0
34	අයිස් කැට අළෙවි කිරීම	750 0
35	අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීම	750 0
36	අයිස් ක්‍රීම් හා සිසිල් බීම වර්ග අළෙවි කිරීම	750 0
37	රසකැවිලි (මිට්ටායි) නිෂ්පාදනය	500 0
38	පැණි ටොපි අළෙවි කිරීම	500 0
39	පළතුරු බීම වර්ග නිෂ්පාදනය කිරීම හා අළෙවි කිරීම	750 0
40	එළවළු කඩයක් පවත්වාගෙන යාම (අනුමත කළ)	500 0
41	පළතුරු විකිණීම	500 0
42	කිරි හළක් පවත්වාගෙන යාම	1,000 0
43	කිරි එකතු කිරීම හා විකිණීම	750 0
44	කොට්ට පොල් නිපදවීම හෝ තබා ගැනීම	1,000 0
45	ගැලුම් 50 කට වැඩියෙන් පොල්තෙල් තබා ගැනීම	1,000 0
46	පොල් එකතු කිරීම හා විකිණීම	1,000 0
47	යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය කිරීම	1,000 0

ව්‍යාපාරික බලපත්‍ර ගාස්තු/බදු - 2019		
		රු. ශත
48	පොල් කොහු නිෂ්පාදනය කිරීම හෝ එකතු කිරීම	1,000 0
49	කොසු හා ඉදල් නිෂ්පාදනය කිරීම	500 0
50	රන් ආභරණ නිපදවීම හෝ පළුදු බැලීම	1,000 0
51	රන් ආභරණ අළෙවි කිරීම	1,000 0
52	විදුලිබල වේගයෙන් ආලේප කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
53	තොග වෙළඳාම පිණිස හොණ්ඩර 10 ක් හෝ ඊට වඩා වැඩියෙන් පිටි, සීනි, පරිප්පු හාල්, ලුණු තබා ගැනීම	1,000 0
54	පෙට්ටි කඩයක් පවත්වාගෙන යාම	400.00
55	තේ කොළ ටොන් 10කට වැඩියෙන් තබා ගැනීම	1,000 0
56	සිල්ලර කඩයක් පවත්වාගෙන යාම	750 0
57	කුඩා සිල්ලර කඩයක් සඳහා	500 0
58	හාල් - නිෂ්පාදනය කිරීම	750 0
59	හාල් - අළෙවි කිරීම	750 0
60	පපඩම් නිෂ්පාදනය හා අළෙවිය	750 0
61	තල් හකුරු නිෂ්පාදනය හා අළෙවිය	750 0
62	කඩල අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	500 0
63	පළතුරු හෝ වෙනත් ආහාර වර්ග හා ටකරමේ අසුරන ලද ද්‍රව්‍යයන් තබා ගැනීම	1,000 0
64	සත්ත්ව ආහාර කඩයක් පවත්වාගෙන යාම	750 0
65	කුකුළන් සඳහා වන ආහාර නිෂ්පාදනය කිරීම හෝ අළෙවි කිරීම	750 0
66	කුකුළන් හා සතුන් සඳහා වන ආහාර නිෂ්පාදනය කිරීම	750 0
67	රා එකතු කිරීමේ හා අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
68	පිදුරු කඩයක් පවත්වාගෙන යාම	500 0
69	හිස් බෝතල් හා ගෝනි එකතු කිරීම	500 0
70	පරණ පුවත්පත් එකතු කිරීම හා අළෙවි කිරීම	500 0
71	අළුත් හෝ පරණ ටයර් 25 කට වැඩියෙන් තබා ගැනීම	500 0
72	පාපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400.00
73	යතුරුපැදි, පාපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	750 0
74	මෝටර් රථ වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0

වෘාපාරික බලපත්‍ර ගාස්තු/බදු - 2019		
		රු. ශත
75	වෑල්ඩිං ගරාජයක් පවත්වාගෙන යාම	1,000 0
76	ටිංකරිං වැඩපොළක් පවත්වාගෙන යාම	1,000 0
77	ලියවන පට්ටල යන්ත්‍ර වැඩපොළක් පවත්වාගෙන යාම	1,000 0
78	විසිරි තීන්ත ආලේපන ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
79	බැටරි නැවත ආරෝපණය කිරීමේ හෝ පළුදු බැලීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
80	මෝටර් රථ වාහනවලට බොඩි සවි කිරීමේ වැඩපොළක් පවත්වාගෙන යාම	750 0
81	මෙට්ට සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
82	ටයර් හා ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	750 0
83	ටයර් නැවත පිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
84	මෝටර් රථ වාහන සඳහා ටයර් හා ටියුබ් අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
85	මෝටර් රථ වාහන වල අමතර කොටස් අළෙවි කිරීම	1,000 0
86	පාපැදි අමතර කොටස් අලෙවි කිරීම	750 0
87	වායු සමීකරණ නිපදවීම, අළුත්වැඩියා කිරීම, එක්කාසු කිරීම	1,000 0
88	ශීතකරණ හා අධිශීතකරණ නිෂ්පාදන කිරීම් හා අලුත්වැඩියා කිරීම්	1,000 0
89	විදුලි උපකරණ, විදුලි පංකා, මෝටර් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	750 0
90	රූපවාහිනී යන්ත්‍ර හා ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	750 0
91	යතුරුලියන හා ද්විගුණ වේග යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	750 0
92	රූපවාහිනී හා ගුවන් විදුලි යන්ත්‍රවල අමතර කොටස් අලෙවි කිරීම	1,000 0
93	රූපවාහිනී හා ගුවන් විදුලි යන්ත්‍ර අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
94	විදුලි උපකරණ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
95	ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0
96	අලුත් පාපැදි අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
97	පෙට්‍රල්, ඩීසල් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
98	පුවත්පත් කඩයක් පවත්වාගෙන යාම හෝ බෙදා හැරීම	500 0
99	මිනිස් ශ්‍රමයෙන් ක්‍රියාන්විත මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	1,000 0

ව්‍යාපාරික බලපත්‍ර ගාස්තු/බදු - 2019		
		රු. ශත
100	විදුලිබල ශක්තියෙන් ක්‍රියාන්විත මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	1,000 0
101	පොදු ප්‍රචාරක සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
102	වෛද්‍ය විශෙෂඥ උපදෙස් සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
103	පුද්ගලික සත්ත්ව රෝහලක් පවත්වාගෙන යාම	1,000 0
104	පෞද්ගලික ආයුර්වේද රෝහලක් පවත්වාගෙන යාම	1,000 0
105	පුද්ගලික බටහිර රෝහලක් පවත්වාගෙන යාම	1,000 0
106	බටහිර පන්නයේ (ඉංග්‍රීසි) බෙහෙත් වර්ග තබා ගැනීම හා අළෙවි කිරීම	1,000 0
107	ආයුර්වේද බෙහෙත් වර්ග තබා ගැනීම හා අළෙවි කිරීම	1,000 0
108	රෙදි වියන අත්යන්ත්‍ර පවත්වාගෙන යාම	1,000 0
109	ඇඳුම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
110	රෙදිවලට සායම් දැමීමේ හෝ මුද්‍රණ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
111	මහන කඩයක් පවත්වාගෙන යාම	750 0
112	මසා නිමි ඇඳුම් අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
113	කෘෂිකර්ම රසායනික ද්‍රව්‍යයන් නිෂ්පාදනය කිරීම හෝ තබා ගැනීම	750 0
114	සම් භාණ්ඩ සපත්තු නිපදවීම	1,000 0
115	පාවහන් අළෙවි කිරීම	1,000 0
116	විසිතුරු භාණ්ඩ අළෙවි සැළක් පවත්වාගෙන යාම	750 0
117	සබන් නිපදවීම	750 0
118	ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය කිරීම	1,000 0
119	ප්ලාස්ටික් භාණ්ඩ අළෙවි කිරීම	1,000 0
120	P. V. C. නල නිෂ්පාදනය කිරීම හෝ තබා ගැනීම හෝ අළෙවි කිරීම	1,000 0
121	හුණු හා හුණු ගල් තබා ගැනීම	500 0
122	තීන්ත, වාර්නිෂ් පොලිෂ් අළෙවි කිරීම	1,000 0
123	කුකුළන් 50කට වැඩි වූ ගොවිපළක් පවත්වාගෙන යාම	1,000 0
124	වී, හාල් පිටි ඇඹරුම් හලක් පවත්වාගෙන යාම	1,000 0
125	මිරිස්, කෝපි ඇඹරුම් හළක් පවත්වාගෙන යාම	1,000 0
126	සෙක්කුවෙන් හෝ අත්යන්ත්‍රයෙන් පොල්තෙල් නිපදවීම හා අළෙවිය පවත්වාගෙන යාම	1,000 0
127	වීදුරු භාන්ඩ හෝ මැටි භාණ්ඩ නිපදවීම හෝ අළෙවි කිරීම	750 0

වාහපාරික බලපත්‍ර ගාස්තු/බදු - 2019		
		රු. ශත
128	වීදුරු නිපදවීම හෝ අළෙවි කිරීම පවත්වාගෙන යාම	1,000 0
129	රූප රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
130	ක්‍රීඩා භාණ්ඩ නිපදවීම හෝ අළෙවි කිරීම	1,000 0
131	ඇළුමිනියම් භාණ්ඩ නිපදවීම හෝ අළෙවි කිරීම	1,000 0
132	ඡායාරූප ගැනීමේ ස්ටුඩියෝවක් පවත්වාගෙන යාම	1,000 0
133	ගීත හා සංගීත හඬ තැටිගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
134	රූපවාහිනී චිත්‍රපට තැටි විකිණීම හා කුලියට දීම	500 0
135	ඡායාස්ටීක පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	750 0
136	විශේෂිත උත්සව සඳහා භාණ්ඩ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
137	අවමගුල් චාරිත්‍රයට අවශ්‍ය කරන භාණ්ඩ සැකසීමේ හෝ අළෙවි කිරීම	750 0
138	කපුරු නිෂ්පාදනය කිරීම	500 0
139	වාත්තු ලෝහ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	1,000 0
140	පාසල් පොත්, ලිපි ද්‍රව්‍ය එකතු කිරීම	1,000 0
141	ඉඩම් විකිනීමේ කාර්යාලයක් පවත්වාගෙන යාම	1,000 0
142	දුම්කොළ වැනි දෑ තබා ගැනීම	750 0
143	වාහපාරික අරමුණින් දුරකතන හා ෆැක්ස් සේවා	750 0
144	හාල් මෝලක්, කොට්ටා මෝලක් තබා ගැනීම	1,000 0
145	අධ්‍යාපනික මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
146	විවිධ සේවා සමුපකාර සමිති ශාඛා	1,000 0
147	පරිගණක පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
148	වාහන පිරිසිදු කිරීමේ (සර්විස්) ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
149	ශබ්ද විකාශන, ආලෝකකරණ කුලියට දීම	750 0
150	ග්‍රෝස් එකකට වැඩි වූ රසැති පාන වර්ග විකිණීම	500 0
151	ගිනි පෙට්ටි නිපදවීම	500 0
152	හාල් අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0
153	ශීතකළ මාළු හා මස් තබා ගැනීම	500 0

ව්‍යාපාරික බලපත්‍ර ගාස්තු/බදු - 2019		
		රු. ශත
154	මාළු හා මස් වේළීම හා විකිණීම	750 0
155	මෝටර් රථ වාහන නඩත්තු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	750 0
156	විදුලි උපකරන නිෂ්පාදනය කිරීම	1,000 0
157	ජල පොම්ප නිෂ්පාදනය හා අළුත්වැඩියාව	1,000 0
158	පෙට්‍රෝලියම් වායු විකිනීම	1,000 0
159	මිනීපෙට්ටි තැනීම හා අලෙවි කිරීම	1,000 0
160	දුරකතන සන්නිවේදන උපකරණ අලෙවිය	750 0
161	ඇස් කණ්නාඩි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
162	රෙදි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
163	විනෝද ගමන් සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
164	විදේශික නියෝජිතායතනයක් පවත්වාගෙන යාම	1,000 0
165	කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
166	රූපලාවන්‍ය ස්ථානයක් පවත්වාගෙන යාම, කේක් හා අයිසින් සෑදීම	1,000 0
167	ශබ්ද විකාශන කුලියට දීම	750 0
168	සංචාරක අයිස් ක්‍රීම් අලෙවිය හෝ අනෙකුක් සංචාරක අලෙවිය	750 0
169	බුලත් කඩයක්, බීඩි කඩයක් පවත්වාගෙන යාම	500 0
170	බේකරි නිෂ්පාදන අලෙවිය	500 0
171	මහන යන්ත්‍ර අළුත්වැඩියා කරන්නන්	500 0
172	පැළ වර්ග නිෂ්පාදනය	750 0
173	ගොවිපළ පවත්වාගෙන යාම	500 0
174	මික්සර් නිෂ්පාදනය	500 0
175	මික්සර් අලෙවිය	500 0
176	පොත් බැඳීම	500 0
177	පුද්ගලික සුඛෝපභෝගී බස් රථ සේවාව පවත්වාගෙන යාම	750 0
178	බස් රථ ආසන වෙන් කිරීම	500 0
179	කරවල කඩයක් පවත්වාගෙන යාම	750 0
180	පාපැදි හා යතුරු පැදි අලෙවිය	1,000 0
181	කෘෂිකර්ම උපකරණ අලෙවිය	1,000 0
182	බර වාහන අළුත්වැඩියා කිරීම	1,000 0

වාහපාරික බලපත්‍ර ගාස්තු/බදු - 2019		
		රු. ශත
183	වාසනා ලොතරැයිය සිට්ටු ඇදීමේ ගාස්තුව	500 0
184	NET CAFE පවත්වාගෙන යාම	750 0
185	ඇඳුම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
186	බර වාහන තබා ගැනීම හෝ කුලියට දීම	1,000 0
187	ආලෝකකරණ උපකරණ කුලියට දීම	750 0
188	වී හාල් මෝලක් පවත්වාගෙන යාම	1,000 0
189	Cable TV ඇමුණුම් කුලියට දීම	750 0
190	හෝටල් පවත්වාගෙන යාම	1,000 0
191	ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය	1,000 0
192	හරක් මස් කඩයක් පවත්වාගෙන යාම	1,000 0
193	කුකුල් මස් කඩයක් පවත්වාගෙන යාම	1,000 0
194	ග්‍රැවල් හෝ ගල් කඩන මෝලක් පවත්වාගෙන යාම	1,000 0
195	ගල් කඩන මෝලේ ගල් විකිණීම	1,000 0
196	සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය	1,000 0
197	මත්පැන් හා විදේශීය මත්පැන් අළෙවිය	1,000 0
198	භාණ්ඩ ගබඩා කිරීමේ ස්ථාන පවත්වාගෙන යාම	1,000 0
199	අවමංගල්‍ය සේවා භාරකරු	1,000 0
200	අධ්‍යාපනික ස්ථානයක්	1,000 0

12-992/21

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව

වෙළෙඳ බලපත්‍ර ගාස්තු අය කිරීම - 2019 වර්ෂය

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේ යෝජනා අංක 5 : 2 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. රසික දිනේෂ්,
සභාපති,
ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව.

2018 ක් වූ නොවැම්බර් මස
ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තිය (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ I වන තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් 2019 වර්ෂයේ දී කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම II වන තීරයේ නිරූපිත යම් සීමාවන් ඇතුළත වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

අනු. අංකය	*II වැනි තීරය* *ව්‍යාපාරයේ ස්වභාවය*	*I වැනි තීරය* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 දක්වා	*රු. 750 වැඩි එහෙත් රු. 1500 ට නොවැඩි*	*රු. 1,500 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	මාළු විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	මස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	කොණ්ඩා සැකසීමේ ස්ථානයක්, බාබර් සාප්පු හා සැලුන්හල් හා රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	පිහිණුම් තටාකයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	අයිස් නිෂ්පාදන කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	බත් කඩයක්, ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	තේ, කෝපි කඩයක් පවත්වාගෙන යාම (නාගරික)	500 0	750 0	1,000 0
11.	තේ, කෝපි කඩයක් පවත්වාගෙන යාම (ග්‍රාමීය)	500 0	750 0	1,000 0
12.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	නවාතැන් පොලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	සංචාරක වෙළෙඳුන් විසින් ආහාරපාන ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීම	500 0	750 0	1,000 0
	අප්‍රසන්න ව්‍යාපාර			
1.	කුකුල් ගොවිපලක්/ඌරු ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	රසකැවිලි නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	පළතුරු බීම නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	සබන් නිපදවීම	500 0	750 0	1,000 0
5.	සත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
6.	ආයුර්වේද බෙහෙත්ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	පෞද්ගලික බෙහෙත්ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	යෝගට්/මුදවපු කිරි නිෂ්පාදනය කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

1 වැනි තීරය		*11 තීරය* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
අනු. අංකය	*ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750 දක්වා*	*රු. 750 වැඩි එහෙත් රු. 1500 ට නොවැඩි*	*රු. 1,500 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
අන්තරායදායක ව්‍යාපාර				
1.	කළුගල් වලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	කළුගල් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර				
1.	සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	ගරාජයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-698/1

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව

ව්‍යාපාර බදු පැනවීම- 2019 වර්ෂය

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේ යෝජනා අංක 5 : 2 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. රසික දිනේෂ්,
සභාපති,
ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව.

2018 ක් වූ නොවැම්බර් මස
ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් බද්දට යටත් යම් තැනැත්තෙකු ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවට එකී ව්‍යාපාර බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 01 වැනි දිනට පෙර ගෙවිය යුතු බවටත් ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

පළමු කොටස :

උපලේඛනය

I වන තීරය		*II වන තීරය*
		ගෙවිය යුතු බද්ද රු. ශ.
	2017 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	
1.	රු. 6,000 නොඉක්මවූ අවස්ථාවක	කිසිවක් නැත
2.	රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
3.	රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
4.	රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
5.	රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
6.	රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

දෙවන කොටස :

01. රක්ෂණ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
02. මුදල් ණයට දෙන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
03. බැංකු සේවාවක් පවත්වාගෙන යාම.
04. උකස් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
05. කල්බදු ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
06. මුදල් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
07. විද්‍යුත් මූල්‍ය ගනුදෙනු පවත්වාගෙන යාම.
08. විදේශ රැකියා නියෝජිත ආයතන පවත්වාගෙන යාම.
09. රාජ්‍ය නොවන සංවිධානයක් පවත්වාගෙන යාම.
10. පලතුරු/ එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
11. කෘෂි රසායන ද්‍රව්‍ය විකිණීම.
12. වැලි රැස් කර වෙළෙඳාම.
13. ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළෙඳාම.
14. ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම.
15. සන්නිවේදන සේවා මධ්‍යස්ථානයක් (කොම්යුනිකේෂන්) පවත්වාගෙන යාම.
16. තොග ගබඩා පවත්වාගෙන යම.
17. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම.
18. පොල් ලී විකිණීම.
19. රියැදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම.
20. වාහන අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
21. සම්ප්‍රේෂණ කුළුණු
22. වයින් ස්ටෝර්ස් පවත්වාගෙන යාම.
23. ප්‍රවාහන පහසුකම් සැපයීම (කැබ් රථ/ජීප් රථ)

12-698/2

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව

කර්මාන්ත බදු පැනවීම - 2019 වර්ෂය

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේ යෝජනා අංක 5 : 2 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. රසික දිනේෂ්,
සභාපති,
ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව.

2018 ක් වූ නොවැම්බර් මස
ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර,

(අ) ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2018 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වන තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම එම උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

(ආ) 2018 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවැති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බද්ද 2019 අප්‍රේල් මස පළමුවන දිනයට ප්‍රථම කර්මාන්ත කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට; සහ

(ඇ) 2019 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බද්ද කර්මාන්තය ආරම්භ කර මාස 03ක් ඇතුළත කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

1 වැනි තීරය		*11 වැනි තීරය* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
අනු. අංකය	*කර්මාන්ත නාමලේඛනය*	*රු. 750 දක්වා*	*රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 ට නොවැඩි*	*රු. 1,500 ට වැඩි*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
1.	සිල්ලර වෙළෙඳුමක් පවත්වාගෙන යාම (නාගරික)	500 0	750 0	1,000 0
2.	සිල්ලර වෙළෙඳුමක් පවත්වාගෙන යාම (ග්‍රාමීය)	300 0	400 0	600 0
3.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	ඇළුමිනියම්/ ප්ලාස්ටික් බඩු වෙළෙඳාම	500 0	750 0	1,000 0
5.	තේ කුඩු පැකට් කර වෙළෙඳාම් කිරීම	500 0	750 0	1,000 0
6.	මෝටර් රථ/මෝටර් සයිකල්/ත්‍රීවිලර්/පාපැදි අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	වී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	පොල් තෙල් මෝලක්/ ධාන්‍ය, තුනපහ වර්ග ඇඹරුම් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	විදුලි උපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	පරිගණක අලෙවිය හා අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
11.	ජංගම දුරකථන අලෙවිය හා අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
12.	වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	දැව ඉරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	බීරළු හා කැටයම් වැඩපලවල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	ඉදල්/පාපිසි/බුරුසු හෝ කොහු ආශ්‍රිත ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	වායුසමීකරණ අලෙවිය හා අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
20.	රන්,රිදී ආලේප කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	විසිතුරු භාණ්ඩ, කැටයම් භාණ්ඩ නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
22.	කෙසෙල්/ පලා වර්ග/මැටි භාණ්ඩ/තැඹිලි/පොල් විකිණීම	500 0	750 0	1,000 0

1 වැනි තීරය		*11 වැනි තීරය පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
අනු. අංකය	*කර්මාන්ත නාමලේඛනය*	*රු. 750 දක්වා*	*රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 ට නොවැඩි*	*රු. 1,500 ට වැඩි*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
23.	උත්සව භාණ්ඩ කුලියට දීම	500 0	750 0	1,000 0
24.	රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	රෙදිපිළි වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	සී. ඩී./වී. සී. ඩී./ වීඩියෝ කැසට් ගීත පටිගත කිරීම හෝ විකිණීම හෝ පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	හාඩ්වෙයාර් එකක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	සුරතල් මසුන් ඇති කිරීම හා මාළු ටැංකි සෑදීම	500 0	750 0	1,000 0
30.	සිසිල් බීම හෝ බිස්කට් ඒජන්සියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	දන්වීම් පුවරු සෑදීමේ හා පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	වානේ ගෘහ භාණ්ඩ නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	මල්පැල/බෙහෙත් පැලෑටි/වෙනත් පැලෑටි/තවාන් කිරීම/ ප්‍රදර්ශනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	වීදුරු භාණ්ඩ හෝ පිඟන් භාණ්ඩ නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හා අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	සත්ත්ව ආහාර අලෙවි කරන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	ඔරලෝසු අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1 XIII. 07 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 හා 126 වැනි වගන්තියවලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන අති විශෙෂ ගැසට් පත්‍රයේ IV (අ) කොටසෙහි ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කර ඇති අතුරු ව්‍යවස්ථාවල 39 වැනි ඡේදය යටතේ නිවිතිගල ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම් හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් මෙහි පහත සඳහන් පරිදි එක් එක් දැන්වීමකට ගාස්තුවක් 2019 ජනවාරි 01 වැනි දින සිට පනවා අය කිරීමට නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

ප්‍රචාරක දැන්වීම් විස්තර

	රු. ශත
01. ස්ථිර ප්‍රචාරක දැන්වීම් සඳහා වර්ග අඩියකට (නිවිතිගල නගරය හැර)	40 0
02. තාවකාලික මාස 06ට අඩු බැනර් දැන්වීමක් සඳහා වර්ග අඩියකට	30 0
03. විශාල දැන්වීම් පුවරු/ගුවන් පුවරු වර්ග අඩියකට	30 0
04. නිවිතිගල නගරය තුළ ස්ථිර ප්‍රචාරක දැන්වීම් (නාමපුවරු) සඳහා වර්ග අඩියකට	100 0
05. නිවිතිගල නගරය තුළ බැනර් දැන්වීමක් සඳහා	40 0

12-886/7

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වාහන ගාල් කිරීම වෙනුවෙන් බදු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1 XIII. 08 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

2019 ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිවිතිගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෑල, වටාපොත, කරවිට නිවිතිගල යන නගරවල කුළියට දීම හා ව්‍යාපාරික කටයුතු සඳහා නවතා තබන වාහනවලින් මෙහි පහත උපලේඛනය පරිදි වාර්ෂික බද්දක් පනවා අය කිරීමට තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

උපලේඛනය

	රු. ශත
01. ලොරියක් හෝ පෞද්ගලික බස් රථයක් හෝ මෝටර් රථයක් සඳහා	500 0
02. වෑන් රථයක් සඳහා	350 0
03. ත්‍රිරෝද රථයක් සඳහා	200 0
04. සංචාරක වෙළෙඳ රථයක් සඳහා	200 0

නිවිතිගල නගරය තුළ කුළියට දීම හා ව්‍යාපාරික කටයුතු සඳහා නවතා තබන වාහන වලින් මෙහි පහත උපලේඛනය පරිදි බද්දක් පනවා අය කිරීමට තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. නගරයේ කලින් වෙන කරන ලද ස්ථානයක් සඳහා (මසකට)	රු. 3,000 0
02. නගරයේ පෙ. ව. 6.30 සිට 10.30 දක්වා කාර් සහ වෑන් සඳහා (පැයකට)	රු. 50 00
03. නගරයේ පෙ. ව. 6.30 සිට 10.30 දක්වා ත්‍රිවිල් සඳහා (පැයකට)	රු. 20 0
04. බස් නැවතුම් පොළේ පෙ. ව. 6.30 සිට 10.30 දක්වා කාර් සහ වෑන් සඳහා (පැයකට)	රු. 50 0
05. බස් නැවතුම් පොළේ පෙ. ව. 6.30 සිට 10.30 දක්වා ත්‍රීවිල් සඳහා (පැයකට)	රු. 20 0

12-886/8

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1 XIII. 09 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ, 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතර වන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, නිවිතිගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයට අදාළව පනවා අය කිරීමට නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

1 වැනි තීරුව	*11 වැනි තීරුව*
	රු. ශත
(i) මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
(ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
(අ) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම්,	18 0
(ආ) වෙළඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	40 0
(iii) සෑම කරත්තයක් සඳහා	20 0
(iv) සෑම අත් කරත්තයක් සඳහා	10 0
(v) සෑම රික්ෂෝවක් සඳහා	7 50
(vi) සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
(vii) සෑම ඇතෙකු සඳහා	50 0

2. විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය, සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12-886/9

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා පරීක්ෂණ හා සේවා ගාස්තු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1 XIII. 10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

2019.01.01 වැනි දින සිට නොපවරා ගැනීමේ/විටීරේඛා සහතිකපත් සඳහා පරීක්ෂණ හා සේවා ගාස්තු පහත පරිදි අය කිරීමට තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

	රු.ශත
01. සහතික නිකුත් කිරීමේ ගාස්තුව	750 0
02. පරීක්ෂණ ගාස්තුව	500 0

12-866/10

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු ගාස්තු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1 XIII. 11 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 153 වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර නිවිතිගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක -

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ
(ආ) එම ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ,
(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩැගිලිවලට ඇත්ත වශයෙන් ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 1. 5 නම් එකී ඉඩම් සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2019 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට 2% ක වාර්ෂික බද්ද පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර නිවිතිගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු යැයි නිවිතිගල ප්‍රාදේශීය සභාව යොජනා කරන්නීය.

12-886/11

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සහතික හා වෙනත් ආදායම් ගාස්තු අය කිරීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1 XIII. 12 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

උපලේඛන අංක 01

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පැවරී ඇති බලතල ප්‍රකාරව නිකුත් කරනු ලබන සහතික සඳහා මෙහි පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2019 වර්ෂයේ සිට පනවා අය කරනු ලබන බව මෙයින් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

		රු. ශත
01.	වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීමේ අයදුම්පත් ගාස්තුව	150 0
02.	ගොඩනැගිලි අයදුම්පත්‍රයක් සඳහා	250 0
03.	අනතුරුදායක ගස් ඉවත් කිරීමේ පෝරමයක් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් බලපත්‍ර ලබා ගත යුතුයි (කොස්, දෙල්, තල්) අනිකුත් සියලුම ගස්	475 0 200 0
04.	නැති වූ සහතිකවල පිටපත් ලබා ගැනීම සඳහා (1 පිටපතකට)	100 0
05.	කැළි කසළ හා වෙනත් ද්‍රව්‍ය සඳහා ට්‍රැක්ටරය කුළියට දීම	
	ලෝඩ් 01 ක් සඳහා	2,500 0
	ප්‍රවාහන දීමනාව (එක් කි. මී. සඳහා)	35 0 x 1 Km
	අවසාන බැහැරලීම සඳහා	1,025 0
	අයදුම්පත් ගාස්තුව	25 0
06.	ලේඛන සෙවීමේ හා ප්‍රතිඵල සහතික කිරීම් ගාස්තු	150 0
	ලේඛන සෙවීම හා පිටපත කිරීම - පළමු වසර	50 0
	අනෙකුත් සෑම වසරක් සඳහා	

07. අයකර ගත හැකි ගාස්තු (මාළු වෙළඳාම, රස කැවිලි වෙළඳාම, ආහාර වර්ග, විසිතුරු භාණ්ඩ, රෙදි, නිමි ඇඳුම් වෙළෙඳාම) :

	දිනකට	*මාස හයකට*
	රු. ශත	*රු. ශත*
ලොරි රථ	500 0	10,000 0
වෑන් රථ	500 0	10,000 0
ත්‍රී රෝද රථ	400 0	7,500 0
බයිසිකල්	300 0	5,000 0

නිවිතිගල නගරය තුළ වාහනයක් නොමැතිව සිදුකරනු ලබන පදික වෙළෙඳාම සඳහා මාසිකව පහත පරිදි ගාස්තු අයකරනු ලැබේ.

සංචාරක එළවළු/පළතුරු වෙළෙඳාම	200 0
සංචාරක රෙදි වෙළඳාම	500 0
විසිතුරු භාණ්ඩ	-
සංචාරක මල්පැළ/මල්පෝච්ච වෙළඳාම	-
සංචාරක විදුලි උපකරණ වෙළඳාම	500 0
සංචාරක ආයුධ වෙළෙඳාම	500 0
සංචාක කරවල/හාල්මැස්සො වෙළෙඳාම	500 0
සංචාරක ආහාර වෙළෙඳාම (රු. 100.00 දින 30)	3,000 0
08. බැකෝ ලෝඩරය සේවය ලබා දීම පැයකට	2,200 0
09. ජල බවුසරය සේවය ලබා දීම එක් වාරයක්	2,025 0
10. ගලි බවුසරයේ සේවය ලබා දීම	

	සභා සීමාව තුළ නිවෙස්/ආගමික ස්ථාන	ව්‍යාපාරික ස්ථාන	සභා සීමාවෙන් පිට
ලෝඩ් 01 සඳහා	2,500 0	3,000 0	3,500 0
ප්‍රවාහන	කිලෝ මීටර් 01 ක් සඳහා රු. 35.00		
අවසාන බැහැරලීම	1025 0	1025 0	1025 0
දිරි දීමනාවන්	1,000 0	1,000 0	1,000 0
අයදුම්පත් ගාස්තු	25 0	25 0	25 0

11. මාර්ග තලනයේ සේවය ලබා දීම

මාර්ග තලනය ටොන් 01 දිනකට (පැය 08)	5,400 0
මාර්ග තලනය ටොන් 08 :	
ඉන්ධන හා ක්‍රියාකරු සමගව යන්ත්‍ර පැය 01 ක් සඳහා	1,500 0
කි. මී. 05 ක් දක්වා ප්‍රවාහනය	3,000 0
කි. මී. 5න් පසුව වැඩිවන සෑම කි. මී. 01 ක් සඳහා ම රු. 140 බැගින් අය කරනු ලැබේ.	

විශේෂිතයි

රෝලර් යන්ත්‍රය ප්‍රවාහනය කිරීම සභාව මගින් සිදුවන්නේ නම් කි. මී. 05 දක්වා ගාස්තුව රු. 3,000 කි. වැඩිවන සෑම කි. මී. 01 ක් සඳහාම රු. 140 බැගින් අය කරනු ලැබේ.

12. නිවිතිගල බස් නැවතුම්පොළ භූමිය හා නිවිතිගල සතිපොළ භූමිය කුලියට ලබා දීම -

01. විවිධ රැස්වීම් පැවැත්වීම සඳහා කුලියට ලබාදීම (දිනකට)	5,000 0
02. වෙළෙදාම කිරීම සඳහා ලබා දීම (දිනකට)	5,000 0
03. සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා ලබාදීම (දිනකට)	10,000 0
04. වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම සඳහා ලබා දීම (දිනකට)	10,000 0
05. විවිධ සංදර්ශන පැවැත්වීම සඳහා	10,000 0
06. රජයේ ආයතන සඳහා (දිනකට)	5,000 0
මුදලින් අඩක්	
07. නොම්ලේ පවත්වන අධ්‍යාපනික සම්මන්ත්‍රණ හා සමාජ සුභ සාධනික කටයුතු සඳහා ගාස්තු අය නොකෙරේ.	

තවද, ගාස්තු අය කරන ඉහත සඳහන් රැස්වීම්, ප්‍රදර්ශන, සංදර්ශන ආදිය සඳහා විදුලිය ලබා ගන්නේ නම් සඳහන් කළා වූ මුදලට අමතරව දිනකට රු. 1,000 බැගින් අය කරනු ලැබේ.

12-886/12

නිවිතිගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ක්‍රීඩා භූමි බදු දීමේදී ගාස්තු අය කිරීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1 XIII. 13 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

යෝජනාව

නිවිතිගල ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩා භූමිය මෙහි පහත උපලේඛනයේ සඳහන් වූ කාර්යයන් සඳහා යොදා ගැනීමට අවසර දීමේ දී මෙහි සඳහන් ගාස්තු ප්‍රමාණයන් 2013 වර්ෂයේ සිට බලපැවැත්වෙන වටිනාකම 2019 වර්ෂයේත් පනවා අයකිරීමට තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01.	රාජ්‍ය ආයතන/රාජ්‍ය උත්සව	ගාස්තු අයකිරීමෙන් නිදහස්
02.	සංගීත සංදර්ශන	රු. 10,000 00
03.	අනෙකුත් ක්‍රීඩා උත්සව, ක්‍රිකට් තරගාවලිය සඳහා	රු. 1,000 00

12-886/13

හබරාදූව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු නියම කිරීම

අතුරු ව්‍යවස්ථා යටතේ 2019 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර 1 මත ගාස්තු නියම කිරීම හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් 2018.10.23 වැනි දින පවත්වනු ලැබූ රැස්වීම් තීරණ අංක 2018/452 යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. යම් අතුරු ව්‍යවස්ථාවක නියමය යටතේ බලපත්‍ර ලබාගත යුතු යම් කර්මාන්තයක් හෝ වෙළෙඳාමක් පවත්වාගෙන යනු ලබන ස්ථානය වෙනුවෙන් 2019 වර්ෂය සඳහා හබරාදූව ප්‍රාදේශීය සභාවෙන් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම වෙනුවෙන් ඒ යෝජනාවේ සඳහන් ආකාරයේ බලපත්‍ර ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදානගමගේ,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 31 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2019 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු නියම කිරීමේ සභා යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍ර ලබාගත යුතු යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් සම්බන්ධයෙන් ම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය හෝ ව්‍යාපාරය වෙනුවෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූපී සටහනෙහි නිරූපිත ප්‍රමාණයේ බලපත්‍ර ගාස්තුවක් නියම කර අයකර ගැනීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර අතරින් ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපන ශාලාවක් හෝ නවාතැන්පොළක් වන විට, එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන් පොළෙන් පසු ගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එක (1%) කට සමාන මුදල් ප්‍රමාණය හෝ ඉහත කී උපලේඛනයේ II වන තීරුවේ නිරූපිත ප්‍රමාණය යන මුදල් ප්‍රමාණ දෙකෙන් වැඩි මුදලට සමාන ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් නියම කර අයකිරීමටත් මෙම බලපත්‍රය එකී වර්ෂයේ ජූනි මස 30 ට පෙර ලබා ගත යුතු බවටත්, හබරාදූව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

අනු.අංකය	*I වැනි තීරුව* කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	*II වැනි තීරුව* ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථා	*රු. 750 වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථා*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	මස් විකිණීම	500 0	750 0	1,000 0
2.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
3.	සිසිල් බීම කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
4.	කොන්ඩා සැකසීමේ ස්ථාන/බාබර් සාප්පු /සැලුන් හා රූපලාවන්‍ය මධ්‍යස්ථාන	500 0	750 0	1,000 0
5.	බේකරි	500 0	750 0	1,000 0
6.	කිරි පට්ටි හා කිරි වෙළඳාම	500 0	750 0	1,000 0
7.	පිහිනුම් තටාක	500 0	750 0	1,000 0
8.	අයිස් කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
9.	බත් කඩ/ආපන ශාලා/ආහාර විකිණීම	500 0	750 0	1,000 0
10.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	නවාතැන් පොළක්/ලැගුම් නිවාස (ගෙස්ට් හවුස්)	500 0	750 0	1,000 0
12.	ලොන්ඩරි	500 0	750 0	1,000 0
13.	අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන	500 0	750 0	1,000 0
14.	ආහාර පාන වෙළඳාම	500 0	750 0	1,000 0
15.	පොදු වෙළඳපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	ඉදිකිරීම් ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන	500 0	750 0	1,000 0
17.	තේ/කෝපි කඩ/මිල්ක් බාර්	300 0	500 0	1,000 0
18.	ගව ගාල්	500 0	750 0	1,000 0
19.	ඝාතක මඩු	500 0	750 0	1,000 0
20.	සංචාරක වෙළඳම	300 0	500 0	1,000 0

12-685/1

හබරාදූව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා කර්මාන්ත (වෙළඳාම්) බද්ද නියම කිරීම

හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් 2018.10.23 වැනි දින පවත්වනු ලැබූ රැස්වීම් තීරණ අංක 2018/453 යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. 2019 වර්ෂය සඳහා නියම කරන ලද කර්මාන්ත (වෙළඳාම) බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර හබරාදූව ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදානගමගේ,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 31 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2019 වර්ෂය සඳහා කර්මාන්ත (වෙළඳාම) බද්ද නියම කිරීමේ සභා යෝජනාව

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලය යටතේ හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන ඉහත කී පනතේ 152 වන වගන්තිය යටතේ ව්‍යාපාර බද්දක් ගෙවීමට යටත් වන යම් ව්‍යාපාරයක් නොවන්නා වූ සහ කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ යම් කර්මාන්තයක් (වෙළඳාමක්) කරගෙන යනු ලබන අවස්ථාවක, ඒ එක් එක් කර්මාන්තය (වෙළඳාම) පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක, ඒ උපලේඛනයේ 11 වැනි තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක කර්මාන්ත (වෙළඳාම) බද්දක් 2019 වර්ෂය සඳහා නියම කර අයකර ගත යුතු බව සහ ඒ කර්මාන්ත (වෙළඳාම) බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, හබරාදූව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය''.

උපලේඛනය

1 වන තීරුව *11 වැනි තීරුව*

අනු. අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව*	*වාර්ෂික වටිනාකම රු. 750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව*
		රු.	*රු.*	*රු.*
1.	සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	සුපිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	තොග වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	රෙදිපිළි හෝ නිමි ඇඳුම්/ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	පාවහන් අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	තෑගි භාණ්ඩ හෝ සාප්පු බඩු වෙළඳාම	500 0	750 0	1,000 0
7.	විදුලි උපකරණ වෙළඳාම	500 0	750 0	1,000 0
8.	යකඩ භාණ්ඩ හෝ ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළඳාම	500 0	750 0	1,000 0
9.	වාහන අමතර කොටස් වෙළඳාම	500 0	750 0	1,000 0
10.	පා පැදි/යතුරුපැදි අලෙවිකිරීම	500 0	750 0	1,000 0
11.	ඉඩම් හෝ වෙනත් දේපළ වෙළඳාම	500 0	750 0	1,000 0
12.	වාහන හෝ යන්ත්‍ර උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	පාපැදි /යතුරු පැදි අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
14.	ලී බඩු/කාර්යාල උපකරණ අවේසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	රටබීම විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	සන්නිවේදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	භාණ්ඩ එක්රැස් කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
18.	ජායරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ජායාරූප වර්ණ රසායනාගාරයක්	500 0	750 0	1,000 0
20.	තීන්ත/සායම් ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
21.	පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	පෞද්ගලික රෝහලක් පවත්වාගෙනයාම	500 0	750 0	1,000 0
23.	බටහිර ඖෂධ අලෙවිසැලක් (ෆාමසි) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	පරිගණක හෝ පරිගණක උපාංග වෙළඳාම	500 0	750 0	1,000 0
26.	අපනයන බෝග නිෂ්පාදන එකතු කිරීම හා වෙළඳාම	500 0	750 0	1,000 0
27.	කුලුබඩු එකතු කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
28.	බැංකු හෝ මූල්‍ය ආයතන	500 0	750 0	1,000 0
29.	රක්ෂණ ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	කුලීරථ සේවා පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	ස්වර්ණාභරණ අලෙවිය	500 0	750 0	1,000 0
32.	උත්සව භාණ්ඩ කුලියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	ලොතරැයි නියෝජිත ආයතන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	රේස් හා ඔට්ටු ඇල්ලීමේ ආයතන	500 0	750 0	1,000 0
35.	රැකියා නියෝජිත ආයතන	500 0	750 0	1,000 0
36.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	ලිපි ද්‍රව්‍ය/පොත් අලෙවි සැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	සංස්කෘතික/ක්‍රීඩා උපකරණ විකිණීම	500 0	750 0	1,000 0

1 වන තීරුව	*11 වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව*	*වාර්ෂික වටිනාකම රු. 750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව*
		රු.	*රු.*	*රු.*
39.	ඉරෑ දැව හෝ සකස්කළ දැව වෙළඳාම	500 0	750 0	1,000 0
40.	ජංගම දුරකථන අලෙවිය හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
41.	කුෂන් වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	එළවළු /පළතුරු වෙළඳාම	500 0	750 0	1,000 0
43.	පොරාණික භාණ්ඩ එක්රැස් කිරීම හා අලෙවි කිරීම	500 0	750 0	1,000 0
44.	කළුගල්වළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	යන්ත්‍රානුසාරයෙන් කළුගල් ඇඹිරීම	500 0	750 0	1,000 0
46.	ලීමෝල්ක් පවත්වාගෙනයාම	500 0	750 0	1,000 0
47.	වීමෝල්ක් පවත්වාගෙනයාම	500 0	750 0	1,000 0
48.	ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙනයාම /ගෑස් වෙළඳාම	500 0	750 0	1,000 0
49.	අම්ලකර වායුවෙන් පෑස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
50.	යතුරු පැදි, ත්‍රීරෝද රථ, වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	කුකුළු ගොවිපොලක් (මස්/බිත්තර) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	ළමා උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
53.	කොප්පරා මඩුවක්/කොහුමෝල්ක්/පොල්තෙල් මෝල්ක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54.	ආයුර්වේද සම්භාහන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	ඉහතින් සඳහන් කාණ්ඩයන්ට අයත් නොවන වෙනත් ව්‍යාපාර (බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන විටකදී) පවත්වාගෙනයාම	500 0	750 0	1,000 0

12-685/2

හබරාදුව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද නියම කිරීම

හබරාදුව ප්‍රාදේශීය සභාව විසින් 2018.10.23 දින පවත්වනු ලැබූ රැස්වීම් තීරණ අංක 2018/454 යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. 2019 වර්ෂය සඳහා නියම කරන ලද ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර හබරාදුව ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදානගමගේ,
සභාපති,
හබරාදුව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් 31 වැනි දින,
හබරාදුව ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද නියම කිරීමේ සභා යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලය යටතේ හබරාදුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන, ඉහත කී පනතේ 150 යන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට යටත් වන යම් කර්මාන්තයක් (වෙළඳාමක්) නොවන්නා වූ සහ යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බල පත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන අවස්ථාවක, ඒ ව්‍යාපාරයෙන් පෙර වර්ෂයේ දී ලැබූ ආදායම පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක ඒ උපලේඛනයේ ෂෂ තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක ඒ උපලේඛනයේ II තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා නියම කර අයකර ගතයුතු බව සහ ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් හබරාදුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

1 වන තීරුව	*11 වන තීරුව*
බද්ද අදාළ වර්ෂයට පෙර වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම	
1. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
2. රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
3. රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
4. රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
5. රු. 75,000 ඉක්මවන එහෙත් රු. 150,000 නොඉක්මවන අවස්ථාවක	1,300.00
6. රු. 150,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

12-685/3

හබරාදුව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වරිපනම් නියම කිරීම

ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව ප්‍රකාශයට පත් කළ දියුණු කළ ප්‍රදේශ තුළ පිහිටි එක් එක් දේපළ මත වරිපනම් නියම කිරීමට, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, හබරාදුව ප්‍රාදේශීය සභාව විසින් 2018.10.23 වැනි දින තීරණ 2018/455 යටතේ මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ වරිපනම් නියම කිරීමේ කාර්යය සඳහා ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියෙන් නියමයන් සම්පූර්ණ කර ඇති බව වැඩිදුරටත් දන්වමි.

02. ඉහත කී වර්ෂයට අදාළ සම්පූර්ණ වරිපනම් මුදල 2019 ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් ඒ මුදලින් සියයට දහය (10%) ක වට්ටමක් ද, කිසියම් කාර්තුවකට අදාළ වරිපනම් මුදල ඒ කාර්තුවේ පළමුවන මාසය අවසන් වීමට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් ඒ කාර්තුවේ මුදලින් සියයට පහ (5%) ක වට්ටමක් ද, ගෙවනු ලබන බවත්, ඒ ආකාරයෙන් යම් වට්ටමක් ලබා ගැනීමට හැකි වන්නේ අදාළ කාලයට පෙර පැවති හිඟ වරිපනම් වේ නම්, ඒ හිඟය ද ගෙවා අවසන් කළහොත් පමණක් බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදනගමගේ,
සභාපති,
හබරාදුව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් 31 වැනි දින,
හබරාදුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2019 වර්ෂය සඳහා වරිපනම් නියම කිරීමට තීරණය කරන සභා යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, ගාලු දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව, හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් දියුණු කළ ප්‍රදේශ බවට ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශවල පිහිටා ඇති නිශ්චල දේපලවල සහ ඒ ඒ පන්තියට හෝ වර්ගයට අයත් නිශ්චල දේපළවල 2018 වර්ෂය තුළ බල පැවැත්වූ වාර්ෂික වටිනාකම්, 2019 වර්ෂය සඳහා එකී පනතේ 146 වන වගන්තියේ නියමය පරිදි සම්මත කිරීමටත්,

ඉහත කී 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල යටතේ එකී නිශ්චල දේපළ අතරින් කුඹුරු ඉඩම් හැර සෙසු සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, හා ගෙපත්වල වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) ක වරිපනමක් 2019 වර්ෂය සඳහා නියම කිරීමටත්, සහ

එකී වරිපනම්, එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දින වලින් අවසන්වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවන ලෙසට එකී 134 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ විධානය කිරීමටත් එකී වාර්ෂික බද්ද ජනවාරි මාසයේ 31 දිනට ප්‍රථම ප්‍රාදේශීය සභාවට ගෙවන විට දී බද්දේ ප්‍රමාණයෙන් 10% වට්ටමක් ද, කාර්තු ලෙස ගෙවන විට දී වාරිකය අයවිය යුතු කාලසීමාවේ පළමු මාසය ඇතුළත ගෙව්වහොත් ඒ වාරිකයේ ප්‍රමාණයෙන් 5% වට්ටමක් ද ලබා දිය යුතු බවට එකී පනතේ 134 (7) වගන්තිය යටතේ විධානය කිරීමටත්, හබරාදූව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-685/4

හබරාදූව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම නියම කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (3) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් 2018.10.23 වැනි දින තීරණ අංක 2018/456 යටතේ මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙ බද්ද නියම කිරීමේ කාර්යය සඳහා ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියෙන් නියමයන් සම්පූර්ණ කර ඇති බව වැඩිදුරටත් දන්වමි.

02. ඉහත කී වර්ෂයට අදාල සම්පූර්ණ අක්කර බදු මුදල 2019 ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් ඒ මුදලින් සියයට දහය (10%) ක වට්ටමක් ද, කිසියම් කාර්තුවකට අදළ අක්කර බදු මුදල ඒ කාර්තුවේ පළමුවන මාසය අවසන් වීමට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් ඒ කාර්තුවේ මුදලින් සියයට පහ (5%) ක වට්ටමක් ද, ගෙවනු ලබන බවත්, ඒ ආකාරයෙන් යම් වට්ටමක් ලබා ගැනීමට හැකි වන්නේ අදළ කාලයට පෙර පැවති හිඟ අක්කර බදු වේ නම්, ඒ හිගය ද ගෙවා අවසන් කළහොත් පමණක් බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදානගමගේ,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් 31 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

2019 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම සභා යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වගන්තිය යටතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අක්කර බද්ද අයකිරීම සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ එක් එක් ඉඩම මත පහත උපලේඛනයේ සඳහන් පරිදි අක්කර බද්දක් 2019 වර්ෂය සඳහා නියමකර අයකිරීමටත් වර්ෂයට නියමිත බදු මුදල එම වර්ෂයේ ජනවාරි 31 දිනට ප්‍රථම ගෙවන විට දී එකී බදු මුදලින් 10% ක වට්ටමක් ද, කාර්තු පදනමින් ගෙවන විට දී නියමිත කාර්තුවේ පළමු මාසය තුළ දී බදු මුදල් ගෙවනු ලබන විටක දී බදු මුදලින් 5% ක වට්ටමක් ද ලබා දිය යුතු බවටත් එකී පනත් 134 (7) වගන්තිය පරිදි හබරාදූව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

ඉඩමේ ප්‍රමාණය	බදු ප්‍රමාණය වර්ෂයකට (එක් එක් හෙක්ටයාරයකට)
1. හෙක්ටයාර් 5 කට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩුවන අවස්ථාවක	රු. 50 00
2. හෙක්ටයාර් 5ක් හෝ ඊට වැඩි වන අවස්ථාවක	රු. 10. 0

12-685/5

හබරාදූව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

267 වන අධිකාරය වූ 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වනවගන්තියෙන් පැවරී ඇති බලතල අනුව හබරාදූව ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුළත පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුල්වීම පිණිස කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) සියයට දහයක (10%) බද්දක් 2019 වර්ෂය තුල දී නියමකර අය කළ යුතු බවට පහත සඳහන් යෝජනා සම්මතය 2018.10.23 වැනි දින තීරණ අංක 2018/457 යටතේ සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදානගමගේ,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් 31 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

2019 වර්ෂය සඳහා විනෝද බදු පැනවීමේ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සඳහා කියවිය යුතු 148 වගන්තිය යටතේ හබරාදූව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයේ වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් නියම කර අය කළ යුතු බවට හබරාදූව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-685/6

හබරාදූව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සඳහා කියවිය යුතු 148 වගන්තිය යටතේ හබරාදූව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයේ වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් 2019 වර්ෂය සඳහා නියම කර අය කළයුතු බවට පහත සඳහන් යෝජනා සම්මතය 2018.10.23 දින තීරණ අංක 2018/458 යටතේ සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදානගමගේ,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් 31 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

2019 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීමේ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සඳහා කියවිය යුතු 148 වගන්තිය යටතේ හබරාදූව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයේ වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් 2019 වර්ෂය සඳහා නියම කර අය කළ යුතු බවට හබරාදූව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

01.	(i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	රු. 25 00
	(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා	
			රු. ශ.
	(අ)	වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18.0
	(ආ)	වෙළඳ කාර්යය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම්	4 0
	(iii)	සෑම කරත්තයක් සඳහා	20 0
	(iv)	සෑම අත්කරත්තයක් සඳහා	10 0
	(v)	සෑම රික්ෂෝවක් සඳහා	7 50
	(vi)	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
	(vii)	සෑම ඇතෙකු සඳහා	50 0

02. විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, විල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථාන වල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් වේ.

03. මෙම උපලේඛනයේ ''වෙළඳ කාර්යය'' යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-685/7

හබරාදූව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා බැනර් හා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු නියම කිරීම

මෙම ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගෙන ඇති හා ඒ බව 1999/03/05 දිනැති අංක 1070 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) කොටසේ පළකරන ලද්දවූ සම්මත අතුරු ව්‍යවස්ථාවල 39 අතුරු ව්‍යවස්ථාවල සඳහන් ප්‍රචාරක දැන්වීම්/ දෘශ්‍ය පරිසර සඳහා බලපත්‍ර ලබා ගැනීමට පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයේ ගාස්තුවක් 2019 වර්ෂයට නියම කර අය කළ යුතු බවට පහත සඳහන් යෝජනා සම්මතය 2018.10.23 වැනි දින තීරණ අංක 2018/459 යටතේ සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදානගමගේ,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් 31 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

2019 වර්ෂය සඳහා බැනර් හා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු නියම කිරීමේ සභා යෝජනාව

මෙම ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගෙන ඇති හා ඒ බව 1999.03.05 දිනැති අංක 1070 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) කොටසේ පළකරන ලද්දවූ සම්මත අතුරු ව්‍යවස්ථාවල 39 අතුරු ව්‍යවස්ථාවල සඳහන් ප්‍රචාරක දැන්වීම් දෘශ්‍ය පරිසර සඳහා බලපත්‍ර ලබාගැනීමට පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයේ ගාස්තුවක් 2019 වර්ෂයට නියම කර අයකළයුතු බවට හබරාදූව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

	දැන්වීම් වර්ගය	මාසයක් හෝ ඉන් කොටසක් සඳහා ගාස්තුව රු. ශ.	ලිත් වර්ෂයක් සඳහා ගාස්තුව රු. ශ.
1.	බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම	30 0	100 0
2.	ලැල්ලක් හෝ ආධාරකයක් හෝ බැනරයක් හෝ කටවුට් මගින් ප්‍රදර්ශනය කරනු ලබන හෝ ගමන් කරන වාහනයකට සම්බන්ධ කර ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකට ම	30 0	100 0
3.	බිත්තියක හෝ පුවරුවක හෝ ලැල්ලක් හෝ ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරන ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකට ම	30 0	500 0

12-685/8

හබරාදූව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා 1980 අංක 47 දරන පාරිසරික පනත යටතේ ගාස්තු පැනවීම

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනතේ අංක 23 වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව වන සම්පත් හා පාරිසරික අමාත්‍යාංශය මගින් පවරා ඇති බලතල ප්‍රකාරව හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයේ දැක්වෙන ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධයෙන් අංක 1533/16 සහ 2008.01.25 දිනැති හා 1534/18 දරන 2008.02.01 දිනැති සංශෝධිත ගැසට් නිවේදන යටතේ සංශෝධිත පනවන ලද රෙගුලාසිවලට අනුකූලව එකී ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නන් විසින් අදළ වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි ඉදිරියට උපරිම වර්ෂ තුනකට රු. 4,000.00 ක බලපත්‍ර ගාස්තුවක් මෙම ප්‍රාදේශීය සභාව වෙත ගෙවා අදළ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගතයුතු බවට පහත සඳහන් යෝජනා සම්මතය 2018.10.23 වැනි දින තීරණ අංක 2018/460 යටතේ සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදනගමගේ,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් 31 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2019 වර්ෂය සඳහා 1980 අංක 47 දරන පාරිසරික පහත යටතේ ගාස්තු පැනවීමේ සභා යෝජනාව

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනතේ අංක 23 වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව වන සම්පත් හා පාරිසරික අමාත්‍යාංශය මගින් පවරා ඇති බලතල ප්‍රකාරව හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයේ දැක්වෙන ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධයෙන් අංක 1533/16 සහ 2008.01.25 දිනැති හා 1534/18 දරන 2008.02.01 දිනැති සංශෝධිත ගැසට් නිවේදන යටතේ සංශෝධිත පනවන ලද රෙගුලාසිවලට අනුකූලව එකී ව්‍යාපාර පවත්වාගෙන යුන ලබන්නන් විසින් අදළ වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි ඉදිරියට උපරිම වර්ෂ තුනකට රු. 4,000.00 ක බලපත්‍ර ගාස්තුවක් මෙම ප්‍රාදේශීය සභාව වෙත ගෙවා අදළ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු බවට හබරාදූව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ක්‍රියාකාරකම්

01. සියලුම වාහන ඉන්ධන පිරවුම්හල් (ද්‍රව පෙට්‍රෝලියම් හා ද්‍රවීකෘත පෙට්‍රොලියම් වායු)
02. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
03. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන පොල්තෙල් සිදීමේ කර්මාන්ත
04. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
05. වියලි ක්‍රියාවලී සහිත වී මෝල්
06. මාසික නිෂ්පාදන ධාරිතාව කිලෝ ග්‍රෑම් 1000 කට අඩුවන ඇඹරුම්හල්
07. දුම්කොළ චේලීමේ කර්මාන්ත
08. සල්ෆර් දුම්ගැසීම සහිත එක් ක්‍රියාවලියක දී නිෂ්පාදන ධාරිතාව කිලෝ ග්‍රෑම් 500 හෝ එයට වැඩි ධාරිතාවක් සහිත ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත
09. කෑමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත
10. ක්ෂණික තේ කර්මාන්ත ශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා
11. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
12. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
13. දිනකට මෙට්‍රික් ටොන් 20 ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත හුණු පෝරණු
14. ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවකයන් 25 ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත පිඟන් මැටි භාන්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
15. සියලු බෙලිකටු ඇඹරීමේ කර්මාන්ත
16. උළු සහ ගඩෝල කර්මාන්ත
17. එක් වරකට එක් බෝර වලක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර් 600 ක නිෂ්පාදන ධාරිතාවයකට අඩු මිනිස් ශ්‍රමය හා පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදුකරනු ලබන කැනීම්
18. දිනකට ඝන මීටර් 50 ටඅඩු දැව ඉරුම් ධාරිතාවයක් ඇති ලී මෝල් හෝ බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ පදම් කිරීමේ කර්මාන්ත
19. බහු කාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයින් 5 ට වැඩි 25 ට අඩු ගණනක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත
20. නේවාසික කාමර 05ක් හෝ ඊට වැඩි සහ 20 ට අඩු හෝටල් ආගන්තුක නිවාස සහ තානායම්
21. වාහනවල වායු සම්කරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ නඩත්තු කිරීමේ හා සවිකිරීමේ කටයුතු හෝ විසිරී පින්තාරු කටයුතු සිදුකරන පින්තාරු කටයුතු සිදුකරන ගරාජ හැර අනිකුත් වාහන අලුත්වැඩියා කිරීමේ/නඩත්තු කිරීමේ කටයුතු සිදුකරන ගරාජ.
22. ශීතකරණ හා වායු සම්කරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සවිකිරීම සිදුකරන ස්ථාන
23. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලු පර්යන්ත.
24. සේවකයින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියලුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අලුත්වැඩියා කිරීමේ ස්ථාන
25. ඊයම් උණුකිරීම සිදු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර.

12-685/9

හබරාදූව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සේවා ගාස්තු නියම කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් හබරාදූව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කරනු ලබන පොදු උපයෝගී සේවා, සුභසාධන සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය කරන සේවා සැපයීම වෙනුවෙන් 2019 වර්ෂය තුල දී අය කරනු ලබනන ගාස්තු නියම කිරීම පිළිබඳ පහත සඳහන් යෝජනා සම්මතය 2018.10.23 වැනි දින තීරණ අංක 2018/461 යටතේ සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදානගමගේ,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් 31 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

2019 වර්ෂය සඳහා සේවා ගාස්තු නියම කිරීමේ සභා යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත් හබරාදූව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කරනු ලබන පහත සඳහන් පොදු උපයෝගී සේවා, සුභසාධන සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය කරන සේවා සැපයීමේ දී 2019 වර්ෂය ඇතුළත ප්‍රාදේශීය සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු යයි හබරාදූව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

	සේවාව	ගාස්තුව රු.
(i)	ඔප්පු සාරාංශයක් ලියාපදිංචි කිරීම ඔප්පු සාරාංශ අයදුම් පතක්	300.00
(ii)	අතිරේක තක්සේරු දැන්වීමක් නිකුත් කිරීම	100 0
(iii)	නොපවරා ගැනීමේ සහතිකයක සහ අයිතිය පිළිබඳ සහතිකයක් වීටි රේඛා සහතිකයක් සහ ගොඩනැගිලි සීමා සහතිකයක්	500 0
(iv)	ව්‍යාපාරික ස්ථානයක කසළ බැහැර කිරීම එක් කසළ උරයක් සඳහා (සෙ. මී. 60 X 90 කළු පැහැති පොලිතින් මල්ලක් සඳහා)	100 0
(v)	ක්‍රීඩාංගණය වෙන් කිරීම	
	(අ) පාසල් හැර අනෙකුත් අවුරුදු උත්සව හා ක්‍රීඩා තරග සඳහා	2,000 0
	දිනකට වැඩිවන සෑම දිනක් සඳහා ම අයකිරීම	1,000 0 බැගින්
	(ආ) සංගීත ප්‍රසංග හා වෙළඳ ප්‍රචාරන හා සැණකෙළි, සර්කස් හා වෙනත් විනෝද කටයුතු සඳහා දිනකට	3,000 0
	වැඩි වන සෑම දිනක් සඳහා ම අය කිරීම	2,000 0 බැගින්
	(ඇ) රැස්වීම් සහ පොදු කටයුතු සඳහා දිනකට	2,000 0
	වැඩි වන සෑම දිනයක් සඳහා ම අය කිරීම	1,000 0 බැගින්
	(ඈ) ඉහත සෑම අවස්ථාවකදී ම ක්‍රීඩාංගණයට සිදු විය හැකි අලාභ අයකර ගැනීමට ක්‍රීඩාංගනය වෙන්කරවා ගන්නා අවස්ථාවේ දී ගෙවිය යුතු ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදල	
	* පාසැල් හැර අනෙකුත් අවුරුදු උත්සව හා ක්‍රීඩා තරග සඳහා	5,000 0
	* සංගීත ප්‍රසංග හා වෙළඳ ප්‍රචාරන හා සැණකෙළි, සර්කස් හා වෙනත් විනෝද කටයුතු සඳහා	25,000 0
	* රැස්වීම් හා පොදු කටයුතු සඳහා	5,000 0
	(ඉ) ඉහත (අ) සහ (ආ) හි සඳහන් යම් අවස්ථාවක දී ක්‍රීඩා භූමිය වෙන්කර ගන්නා දිනට පෙර දිනයේ සවස් කාලය, පූර්ව සූදානම් වීම සඳහා අවශ්‍ය වන්නේ නම් ඒ අවස්ථාවට දිනකට අදාළ ගාස්තුවෙන් අඩක් ගෙවා වෙන්කර ගත යුතු ය. එසේ වුව ද එසේ අවශ්‍ය වන දිනයේ වෙනත් තැනැත්තෙකු විසින් ක්‍රීඩා භූමිය වෙන්කර ගෙන නොමැති විට පමණක් මෙම පහසුකම සැපයීම කරනු ඇත.	
(vi)	සිරිමාවෝ බණ්ඩාරනායක රැස්වීම් ශාලාව වෙන් කිරීම (දිනකට)	5,000 0
	(අ) ශබ්ද විකාශන යන්ත්‍ර පහසුකම් සහිතව	
	(ආ) ශබ්ද විකාශන යන්ත්‍ර පහසුකම් රහිතව	5,000 0
	(ඇ) ඉහත කුමන හෝ අවස්ථාවක දී ශාලාවට සිදුවිය හැකි අලාභ අයකර ගැනීමට ශාලාව වෙන් කරවා ගන්නා අවස්ථාවේ දීන ගෙවිය යුතු ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදල (රාජ්‍ය ආයතන මුදල් අය නොකරන කටයුතු සඳහා නොමිලේ සපයන අතර රු. 1,000ක් විදුලිය, ජලය සඳහා අයකෙරේ.)	3,000 0
	(ඈ) ඉහත (අ) සහ (ආ) හි සඳහන් යම් අවස්ථාවක දී ශාලාව න වෙන්කර ගන්නා දිනයට පෙර දිනයේ සවස් කාලය පූර්ව සූදානම් වීම සඳහා අවශ්‍ය වන්නේ නම් ඒ අවස්ථාවට දිනකට අදාල ගාස්තුවේ අඩක් ගෙවා වෙන්කර ගත යුතු ය. එසේ වුව ද එසේ අවශ්‍ය වන දිනයේ වෙනත් තැනැත්තෙකු විසින් ශාලාව වෙන්කර ගෙන නොමැති විට පමණක් මෙම සැපයීම කරනු ඇත.	

ඉහත ගාස්තු වලට (ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පතු හැර) අමතරව රජයේ අනුමත බදු මුදල් අය කරනු ලැබේ.

		රු.
(vii)	පුස්තකාල සාමාජික අයදුම්පතක්	220 0
	සාමාජිකත්වය අලුත් කිරීම	110 0
(viii)	මෘත දේහයක් භූමදානය කිරීම සඳහා	500 0
(ix)	මෘත දේහයක් (දරුවලින්) ආදහනය කිරීම (මෘත දේහයේ භාරකරු විසින් චිතකය තනා ගත යුතුය)	650 0
(x)	මෘත දේහය අදහනය කිරීමේ ආදහනාගාර ගාස්තු	
	(අ) වයස අවුරුදු 12 ට අඩු තැනැත්තෙකුගේ (බල ප්‍රදේශය තුළ)	5,000 0
	(ආ) වයස 12 ට අඩු තැනැත්තෙකුගේ (බල ප්‍රදේශය පිටත)	6,500 0
	(ඇ) වැඩිහිටි තැනැත්තෙකුගේ (බල ප්‍රදේශය තුළ)	5,000 0
	(ඈ) වැඩිහිටි තැනැත්තෙකුගේ (බල ප්‍රදේශය පිටත)	6,500 0
	(ඉ) ප. ව. 7.00 විශේෂ ආදහන සඳහා (බල ප්‍රදේශය තුළ)	6,000 0
	(ඊ) ප. ව. 7.00 විශේෂ ආදහන සඳහා (බල ප්‍රදේශය පිටත)	7,000 0
(xi)	(අ) සුසාන භූමියේ 2' x 2' ප්‍රමාණයේ භූමියේ ඉඩකඩක් තුළ භූමදානයට (වල බැඳීම නොහොත් කොත බැඳීම රහිතව) භෂ්මාවශේෂ	250 0
	1. ප්‍රදේශය තුළ සිදුවන හදිසි ආපද තත්තවයක දී හා ආගමික කටයුත්තක දී ජල බවුසරය නොමිලේ ලබා දීමට ද අනෙකුත් අවස්ථාවලදී ජල බවුසරය ලබා දීමේ දී අයකරන ගාස්තු	
	ගමන් කරන දුර කි. මී. 1ක් සඳහා (යාමට හා ඒමට)	125.00
	ජලය රහිත බවුසරය සඳහා	500 0
	2. ගලි බවුසරය කුලියට දීමේදී ගාස්තු අය කිරීම	
	ගමන් කරන දුර කි. මී. 1ක් සඳහා (යාමට සහ ඒමට)	125.00
	නේවාසික (බල ප්‍රදේශය තුළ)	2,500 0
	නේවාසික (බල ප්‍රදේශයෙන් පිටත)	3,500 0
	වාණිජ (බල ප්‍රදේශය තුළ)	5,000 0
	වාණිජ (බල ප්‍රදේශයෙන් පිටත)	6,000 0
	පරීක්ෂණ ගාස්තු	300 0
	අයදුම් පත්‍ර ගාස්තු	100 0

අප ද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානය සඳහා ගෙවිය යුතු ගාස්තුව සේවා ලාභියා විසින් දැරිය යුතු ය.

3.	ගල් රෝල කුලියට දීමේ දී පැය අට (8)ක් සඳහා (දිස්ත්‍රික් මිල ගණන් කමිටු තීරණය අනුව)	4,000 0
4.	ලේඛනයක සහතික කළ පිටපතක් නිකුත් කිරීමේ දී එක් සහතික පිටපතක් සඳහා	100 0
	සහතික නොකරන පිටපත් සඳහා ඡායා පිටපත් ගාස්තු ලෙස (A 4 ප්‍රමාණයේ)	4 0
5.	අහංගම උප කාර්යාලය සතු ශ්‍රවනාගාරය ප්ලාස්ටික් පුටු 100ක් සමග බදු දීමේ දී දිනකට රු. 2,000 ක ගාස්තුවක් ද පුටු රහිතව ලබා දීමේ දී දිනකට රු. 1,000 0	
6.	කොස්, දෙල් හා පොල් ගස් ඉවත් කිරීමේදී (අනතුරුදායක වන අවස්ථාවක දී)එක් ගසක් සඳහා නිකුත් කරන එක් අයදුම්පත්‍රයක් සඳහා රු. 500 ක ගාස්තුවක් ද අනෙකුත් සියලුම වර්ගයේ ගස් සඳහා නිකුත් කරන අයදුම්පත්‍ර සඳහා එක් ගසකට	300 0
7.	ඉඩම්වල පස් ඉවත් කිරීමේ දී (කියුබ් 35 ට අඩු) නිර්දේශ ලබා දීම සඳහා ස්ථානීය පරීක්ෂණ ගාස්තුව ලෙස	500 0
8.	සනාථ කරන ලිපියක් නිකුත් කිරීමේ දී	500 0
9.	ප්‍රචාරණ වැඩසටහනක් සඳහා සහා භූමියේ හෝ සහා භූමියක් නොවන පොදු ස්ථානයක පැවැත්වීමේදී වර්ග අඩියකට	

බිම් බදු :

		රු.
	දිනකට වර්ග අඩියක් සඳහා	10 0
	දින දෙකකට වර්ග අඩියක් සඳහා	09 00
	දින තුනක් හෝ ඊට වැඩිවන විට	08 00
10.	සභාව සතු වතුර ටැංකිය ලබා දීමේදී	100 0
11.	සභාව සතු පුටු ලබා දීමේදී එක් පුටුවක් සඳහා	5. 00
12.	ජේ. සී. බී. යන්ත්‍රය ලබා දීමේදී පැයකට (පැය 01)	2,500 0

අවම පැය 04 ක මූලික ගාස්තුවක් අයකරනු ලැබේ. ඊට වැඩිවන සෑම පැයකට ම අයකරනු ලැබේ.

13.	ට්‍රැක්ටරයක් ලබා දීමේ දී පැය 08කට	5,000 0

14. මාර්ග පළුදු කිරීමේදී වර්ග මීටරයක් සඳහා කොන්ක්‍රීට් පාරක් නම් රු. 3,100ක් ද, පස් පාරක් නම් හෝ මාර්ග උරහිස නම් රු. 750.00 ක් ද, තාර පාරක් නම් රු. 2,800ක් හා කාපට් මාර්ගයකින් රු. 4,800.00

ගොඩනැගිලි සැලසුම් සඳහා කාලය දීර්ඝ කිරීමේ ගාස්තු වසරකට නේවාසික කටයුත්තක දී රු. 500 හා වාණිජ අවස්ථාවක දී රු. 1,000.00

12-685/10

හබරාදූව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සති පොළවල් සඳහා බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 119 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් ආකාරයට හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සති පොළවල් වලින් 2019 වර්ෂය සඳහා බදු අයකර ගැනීමට සුදුසු බවට පහත සඳහන් යෝජනා සම්මතය 2018.10.23 වැනි දින තීරණ අංක 2018/462 යටතේ සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදානගමගේ,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 31 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2019 වර්ෂය සඳහා සති පොළවල් සඳහා බදු අය කිරීමේ සභා යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 119 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් ආකාරයට හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සති පොළවල් වලින් 2019 වර්ෂය සඳහා බදු අයකර ගැනීමට සුදුසු බවට හබරාදූව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

		රු. ශත
01.	වර්ග අඩි 01 සිට 05 දක්වා	30 0
02.	වර්ග අඩි 06 සිට 10 දක්වා	40 0
03.	වර්ග අඩි 11 සිට 15 දක්වා	50 0
04.	වර්ග අඩි 16 සිට 20 දක්වා	60 0
	(ඊට වැඩිවන සෑම ස්ථානයකින් ම වර්ග අඩියකට රු. 5.00 බැගින්)	

	රු. ශත
05. අයිස්ක්‍රීම් වෙළඳ ප්‍රචාරක දැන්වීම් අලෙවි නියෝජිත රථයක් සඳහා	50 0
06. ජංගම වෙළඳ ප්‍රචාරක දැන්වීම් අලෙවි නියෝජිත රථයක් සඳහා (පොළ භූමිය තුළ හෝ ඉන් පිටත ඕනෑම දිනක)	500 0
07. ජංගම රසකැවිලි වෙළඳුම සඳහා	40 0
08. සංචාරක තොග වෙළඳුන් සඳහා (තොග සහ සිල්ලර)	150 0
09. රෙදි අලෙවි කරන සංචාරක වෑන් රථ සහ ඇළුමිනියම් බඩු, පිඟන් බඩු හෝ ප්ලාස්ටික් බඩු, රෙදි පිළි තොග වශයෙන් හෝ	
(1) වර්ග අඩි 301 සිට 400 දක්වා	300 0
(2) වර්ග අඩි 401 සිට 500 දක්වා	400 0
(3) ඊට වැඩි වන සෑම අවස්ථාවක දීම	500 0
10. අයිස්ක්‍රීම් වෑන් රථයකින්	200 0
11. අයිස්ක්‍රීම් බයිසිකලයකින්	100 0
12. ජංගම වෙළඳුම් කඩල, රසකැවිලි සඳහා	30 0
13. පෞද්ගලික රථගාල් සඳහා	250 0
14. පා පැදි සහ යතුරු පැදි ආරක්ෂා කරන ස්ථාන සඳහා	200 0

12-685/11

හබරාදූව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සභාව සතු පොදු ක්‍රීඩාංගන බදුදීම

ප්‍රාදේශීය සභාව සතු පොදු ක්‍රීඩාංගනවලින් පහත උපලේඛනයේ සඳහන් පරිදි 2019 වර්ෂයට බිම් බදු අයකිරීමට සුදුසු බවට පහත සඳහන් යෝජනා සම්මතය 2018.10.23 වැනි දින තීරණ අංක 2018/463 යටතේ සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදානගමගේ,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 31 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2019 වර්ෂය සඳහා සභාව සතු පොදු ක්‍රීඩාංගන බදු දීමේ සභා යෝජනාව

ප්‍රාදේශීය සභාව සතු පොදු ක්‍රීඩාංගන වලින් පහත උපලේඛනයේ සඳහන් පරිදි 2019 වර්ෂයට බිම් බදු අයකිරීමට සුදුසු බවට හබරාදූව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

		රු. ශ.
01. වෙළඳ නොවන කටයුත්තක් සඳහා එක් දිනකට		500 0
02. වෙළඳ කටයුත්තක් සඳහා එක් දිනකට :		
(i)	වර්ග අඩි 01 සිට 100 දක්වා	250 0
(ii)	වර්ග අඩි 101 සිට 250 දක්වා	500 0
(iii)	වර්ග අඩි 251සිට 500 දක්වා	750 0
(iv)	වර්ග අඩි 501 සිට 1,000 දක්වා	1,000 0
(v)	සම්පූර්ණ ක්‍රීඩාංගනය සඳහා	2,000 0

12-685/12

හබරාදූව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත පැනවීම

ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ (176 වැනි අධිකාරය) 3 වැනි වගන්තිය ප්‍රකාරව බලපත්‍ර ගාස්තු රු. 500 ක් ද, දර්ශන පැවැත්වෙන සෑම දිනක් සඳහා ම රු. 25 බැගින් වූ බලපත්‍ර ගාස්තුවක් ද 2019 වර්ෂයට අයකළ යුතු බවට පහත සඳහන් යෝජනා සම්මතය 2018.10.23 දින තීරණ අංක 2018/464 යටතේ සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදනගමගේ,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 31 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2019 වර්ෂය සඳහා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත පැනවීමේ සභා යෝජනාව

ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ (176 වැනි අධිකාරය) 3 වැනි වගන්තිය ප්‍රකාරව බලපත්‍ර ගාස්තු රු. 500 ක් ද, දර්ශන පැවැත්වෙන සෑම දිනක් සඳහා ම රු. 25 බැගින් වූ බලපත්‍ර ගාස්තුවක් ද 2019 වර්ෂයට අයකළ යුතු බවට හබරාදූව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-685/13

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු පැනවීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව විසින් 2018 ඔක්තෝබර් මස 30 වැනි දින පැවති මහ සභාවේදී 2019 වර්ෂය සඳහා වරිපනම් බදු පනවා අය කිරීමට යෝජනා සම්මත කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බදු 2019 වර්ෂයේ ජනවාරි මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාල වරිපනම් බදු ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට පෙරතුව ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද දෙනු ලැබේ.

එච්. ඒ. ආනන්ද ජයවිලාල්,
සභාපති,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 30 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව,
තිත්තපජ්ජල, වැරැල්ලගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල පිහිටි ගෙයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් සහ ගෙපතක් මත 2018 වර්ෂයේ දී පැවති වාර්ෂික වටිනාකම 2019 වර්ෂය සඳහා ද පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ පළමුවන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත දක්වා ඇති I,II සහ III යන උපලේඛනවල සඳහන් මාර්ගයන් හා පාරවල් දෙපස ඇති දේපල මත පිළිවෙලින් වූ වාර්ෂික වටිනාකම මත 10%ක් 6%ක් සහ 4% ක් ලෙස වරිපනම් බද්දක් පනවා අයකිරීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134(6) උපවගන්තියෙන් පනවා ඇති විධිවිධාන ප්‍රකාරව 2019 වර්ෂයේ -

වර්ෂය	*කාර්තුව*	*කාර්තුවට අයත් කාලය*
2019	I වැනි කාර්තුව	ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා
2019	II වැනි කාර්තුව	අප්‍රේල් 01 සිට ජුනි 30 දක්වා
2019	III වැනි කාර්තුව	ජූලි 01 සිට සැප්තැම්බර් 30 දක්වා
2019	IV වැනි කාර්තුව	ඔක්තෝබර් 01 සිට දෙසැම්බර් 31 දක්වා

වගුවේ ඇතුළත් දිනවලින් අවසන් වන කාර්තු හතර (4) තුළ දී වාරික හතරකින් (4) ගෙවීමට විධානය කිරීමට හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

I වැනි උපලේඛනය- වාර්ෂික වටිනාකමෙන් 10% බැගින් :

1. කටුගස්තොට පාර
2. විගුහුම්පල
3. කුරුණෑගල පාර
4. නුවර පාර

II වැනි උපලේඛනය - වාර්ෂික වටිනාකමෙන් 6% බැගින් :

1. බරිගම පාර
2. බෝලගල පාර
3. කුලුගම්මන පාර
4. වතුවල එඬරුතැන්න පාර
5. ගොහාගොඩ පාර
6. ගන්නෝරුව පාර
7. රණවන පාර
8. නුගවෙල විද්‍යාල පාර

III වැනි උපලේඛනය- වාර්ෂික වටිනාකමෙන් 4% බැගින් :

01. බෝගහකන්ද පාර
02. කැටපිඬැල්ල පාර
03. පල්ලේගම පාර
04. ග්‍රාම සංවර්ධන පාර
05. ජනරජ මාවත
06. ජයන්ති පාර
07. මඩපත පාර/ රෑනකෙටුගල පාර
08. සියඹලාඅත්ත පාර

09. හමංගොඩ පාර
10. පිටියේගෙදර පාර
11. සෙනරත්ගම සුසානභූමි පාර
12. ඉනිගල කොණ්ඩදෙනිය පාර
13. ඉනිගල පාසල පාර
14. පෙරිහිල්වත්ත පාර
15. ගලේ පන්සල පාර
16. බටුඅඹේ කොළනිය පාර
17. මාලගම්මන පාර
18. මීගස්දෙනිය පාර
19. උග්ගල්ල පාර
20. උගුරැස්සපිටිය
21. උගුරැස්සපිටිය කොණ්ඩදෙනිය පාර
22. උගුරැස්සපිටිය වෑංග පාර
23. උල්ලඳුපිටිය පාර
24. වැලියද්ද පාර
25. විජේසිරි මාවත
26. සිරිවර්ධනාරාම පාර
27. සෙනරත්ගම උඩුවාවල පාර
28. හීනාගම කොණ්ඩදෙනිය පාර
29. පූජාපිටිය පාර
30. දොරණෑගම පාර
31. රජපිහිල්ල පාර (මැදවල)
32. හැදෙනිය පාර
33. බුලත්ගොල්ල පාර
34. සුමනතිස්ස පාර
35. කොටුවේවත්ත පාර
36. ඔයතැන්න පාර
37. රජපිහිල්ල පාර (රණවන)
38. රාජසන්තක පාර
39. උඩුවාවල යටිවාවල පාර
40. උඩුවාවල සෙනරත්ගම පාර
41. සමගි මාවත
42. හපුගොඩ පාර
43. හපුගොඩ පාසල් පාර
44. අලදෙනිය පේරාදෙණිය පාර
45. අලදෙනිය බලවත්ගොඩ පාර
46. මැදවල පාර.

12-782/1

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

බලපත්‍ර මත ගාස්තු පැනවීම - 2019 වර්ෂය

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාල අතුරු ව්‍යවස්ථා යටතේ විස්තර කර ඇති කාර්යය අතරින් කිසිවක් සඳහා යම් පරිශ්‍රයක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2019 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව 2018 ඔක්තෝබර් මස 30 වැනි දින පැවති මහාසභාවේ දී 2019 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පනවා අය කිරීමට තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා 2019 වර්ෂයේදී හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ සභාපති හෝ ලේකම් විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මතම බලපත්‍ර ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා බලපත්‍ර මත පනවන ලද බලපත්‍ර ගාස්තු එම වර්ෂයේ මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ආනන්ද ජයවිලාල්,
සභාපති,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 30 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව,
තිත්තපජ්ජල, වැරැල්ලගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පනත යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති යම් සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත I, II, III හා IV යන උපලේඛනවල I වැනි තීරුවේ සඳහන් එක් එක් කාර්යය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමටත්,

එකී උපලේඛනවල සඳහන් යම් ස්ථානයක්, හෝටලයක, ආපනශාලාවක නවාතැන්පලක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නේ එනම් 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා එම හෝටලය, ආපනශාලාව හෝ නවාතැන්පල ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, අනුමත කර හෝ පිළිගත්තා වූ ද අවස්ථාවක එසේ අය කරනු ලබන බලපත්‍ර ගාස්තුව ඊට පෙරාතුව වූ අවුරුද්දේ එකී ව්‍යාපාරයේ ඉපැයූ ආදායමෙන් 1% ක ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

1 වැනි උපලේඛනය

අප්‍රසන්න ව්‍යාපාර

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තය හෝ ව්‍යාපාරය*	*වාර්ෂික වටිනාකම*		
		රු. 750ට අඩු	*රු. 751 - රු.1,500*	*රු.1,500 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	සිල්ලර බඩු කඩයක් පවත්වාගෙන යාම (ගම්බද)	500 0	750 0	1,000 0
2.	සිල්ලර බඩු කඩයක් පවත්වාගෙන යාම (නාගරික)	500 0	750 0	1,000 0
3.	තේ කඩයක් පවත්වාගෙන යාම (ගම්බද)	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	II වැනි තීරුව		
අනු. අංකය	කර්මාන්තය හෝ ව්‍යාපාරය	වාර්ෂික වටිනාකම		
		0 සිට රු. 750 රු. ශත	රු. 751 - රු.1,500 රු. ශත	රු.1,500 ට වැඩි රු. ශත
4.	තේ කඩයක් පවත්වාගෙන යාම (නාගරික)	500 0	750 0	1,000 0
5.	හෝටලයක්, භෝජනාගාරයක් පවත්වාගෙන යාම(සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි නොවූ)	500 0	750 0	1,000 0
6.	නේවාසික හෝටලයක් පවත්වාගෙන යාම (හෝම්ස්ටේ)	500 0	750 0	1,000 0
7.	ආගන්තුක ලැගුම්හලක්/ තානායමක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	බියර් අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	දේශීය, විදේශීය සංචාරකයින් සඳහා හෝටලයක් පවත්වාගෙන යාම (සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි)	500 0	750 0	1,000 0
10.	රටබීම අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	උත්සව සඳහා ආහාර සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	මත්පැන් අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	රා තැබෑරුමක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	රස කැවිලි නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම (සුලු පරිමාණ)	500 0	750 0	1,000 0
15.	රස කැවිලි නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම (මහා පරිමාණ)	500 0	750 0	1,000 0
16.	බිස්කට් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	රසකැවිලි අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	සිසිල්බීම/පළතුරු බීම තොග ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	සිසිල් බීම නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	පළතුරු බීම නිෂ්පාදනය කිරීමේ ගෘහ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	අයිස් පැකට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	යෝගට්, මුදවාපු කිරි නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	අයස් පැකට්/යෝගට් මුදවාපු කිරි අලෙවි කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙනයාම	500 0	750 0	1,000 0
25.	අයිස් පැකට්/යෝගට්, මුදවාපු කිරි බෙදහැරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	බාබර් සාප්පුවක් පවත්වාගන යාම	500 0	750 0	1,000 0
28.	ටේලර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	එළවළු සිල්ලරට විකිණීමේ අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	එළවළු තොග වශයෙන් විකුණන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	එළවළු අපනයනය සඳහා සැකසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	එළවළු තෙල් නිෂ්කරණය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගන යාම	500 0	750 0	1,000 0
33.	පළතුරු සිල්ලරට විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙනයාම	500 0	750 0	1,000 0
34.	පළතුරු තොග වශයෙන් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	තේ කුඩු ඇසුරුම් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	තේ කුඩු තොග ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	තේ කුඩු තොග වශයෙන් හෝ සිල්ලරට විකිණීමේ හෝ බෙදහැරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	තේ දළු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	තෙලින් බදින කල හෝ තෙල් බෙදු සැකසූ උත්තේජක ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ බෙදහැරීමේ ව්‍යාපාරයක් පවත්වගෙන යාම	500 0	750 0	1,000 0
40.	මෙකී ආහාර නිපදවීමේ ගෘහ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	එළවළු මස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	එළුමස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	කුකුළු මස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	ශීත කළ එළගව මස්/එළුමස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තය හෝ ව්‍යාපාරය	I වැනි තීරුව	II වැනි තීරුව	
		වාර්ෂික වටිනාකම		
		0 සිට රු. 750 රු. ශත	රු. 751 - රු.1,500 රු. ශත	රු.1,500 ට වැඩි රු. ශත
45.	එළගව ඝාතනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	මාළු විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම (තොග)	500 0	750 0	1,000 0
47.	මාළු විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම (සිල්ලර)	500 0	750 0	1,000 0
48.	මාලු තට්ටුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	සංචාරක ලෙස මාළු විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම (පාපැදිය/ යතුරුපැදිය/ත්‍රී රෝදරථය/ ඔලුවේ තබාගෙන ආදි මාධ්‍ය)	500 0	750 0	1,000 0
50.	සංචාරක මාළු විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම (ලොරි රථ/ වෑන් රථ මගින්)	500 0	750 0	1,000 0
51.	දුරු/ මිරිස් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	ධාන්‍ය ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
53.	ව්‍යාංජන රසකාරක ඇසුරුම් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54.	බීඩි/සුරුට්ටු සිගරට් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	පක්ෂීන් 50 ට වැඩි කුකුල් ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	ඌරන් 50 ට වැඩි ඌරු ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
57.	සතුන් 50 ට වැඩි එළගවයින්, එළුවන් ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
58.	පශු වෛද්‍ය ගිලන්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
59.	සබන් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
60.	සබන් තොග ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
61.	සබන් තොග හා සිල්ලරට අලෙවි කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
62.	රබර් මුද්‍රා නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
63.	පාරිභෝගික ද්‍රව්‍ය තොග ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	පොහොර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	දත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	දත් විකලංග සායනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
67.	දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
68.	බිම් මල් වගා කිරීමේ සහ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙනයාම	500 0	750 0	1,000 0
69.	සම් භාණ්ඩ ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
70.	සම් භාණ්ඩ නිෂ්පාදනය කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
71.	විකිණිම සඳහා නරක් වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනිම	500 0	750 0	1,000 0
72.	කරවල, ලුණු මාලු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
73.	පොල්කටු අඟුරු හෝ දූව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර ලබා ගැනීම	500 0	750 0	1,000 0
74.	දුම්කොළ සකස් කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
75.	සත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
76.	පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200 ට වැඩි ප්‍රමාණය් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
77.	සත්ව ඇටකටු ඇඹරීමේ හෝ තබා ගැනීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
78.	දේශීය ඖෂධ නිෂ්පාදන කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
80.	ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
81.	පොල්ලෙලි පෙගවීමේ හෝ පල් කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
82.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
83.	දත් බුරුසු නිෂ්පාදන කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තය හෝ ව්‍යාපාරය	I වැනි තීරුව	II වැනි තීරුව	
		වාර්ෂික වටිනාකම		
		රු. 750 රු. ශත	රු. 751 - රු.1,500 රු. ශත	රු.1,500 ට වැඩි රු. ශත
84.	රා එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
85.	විනාකිරි නිපදවීමේ හෝ ගබඩා කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
86.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
87.	සෝඩා නිෂ්පාදන කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
88.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
89.	ඉටිපන්දම් නිපදවීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
90.	කපුරු නිපදවීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
91.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
92.	රෙදි සෝදන නිල් නිපදවීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
93.	ලාකඩ නිපදවීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
94.	පාසල් රටහුණු නිපදවීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
95.	ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
96.	ධාන්‍ය හෝ මංශ භෝග කිලෝග්‍රෑම් 250 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
97.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
98.	සිසිල් බීම නිෂ්පාදනය කිරීමේ හෝ සිසිල් බීම බෝතල් 1000 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
99.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

2 වැනි උපලේඛනය

අන්තරාදයක ව්‍යාපාර හා කර්මාන්ත

01.	රටුම් කියත් භාවිතයෙන් යාන්ත්‍රික ලෙස දැව ඉරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	පටි කියත් භාවිතයෙන් යාන්ත්‍රික ලෙස දැව ඉරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	ජංගම ලී ඉරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	අතින් ලී ඉරන ලී පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	කුලියට ලී ඉරීමේ යන්ත්‍රසූත්‍ර සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	පොල් ලී පැලීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	යාන්ත්‍රික නොවන වඩු කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	යාන්ත්‍රික වඩු කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	වඩු කර්මාන්තය සඳහා යන්ත්‍ර සූත්‍ර සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ යාන්ත්‍රික වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තය හෝ ව්‍යාපාරය	I වැනි තීරුව	II වැනි තීරුව	
		වාර්ෂික වටිනාකම		
		රු. 750 අඩු රු. ශත	රු. 751 - රු.1,500 රු. ශත	රු.1,500 ට වැඩි රු. ශත
12.	ගෘහ භාණ්ඩ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	තේ/තක්කාලි/පළතුරු ආදිය ඇසිරීමේ පෙට්ටි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	ලී/දැව විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	පොල් ලී විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	ආනයනික ලී දැව විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ආනයනික ලී දැව තොග ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	දර පැලීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	දර විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	උළු තොග ලෙස ගබඩා කිරීමේ/විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	ඇස්බැස්ටෝස් ෂීට් තොග ලෙස ගබඩා කිරීමේ සහ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	නාම පුවරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	බෙලෙක් පිත්තල/තඹ/ඇලුමිනියම් වාස්තු කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	වේවැල් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් ෂීට් නිපදවීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	තඹ,ඇළුමිනියම් භාණ්ඩ නිෂ්පාදන වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	පිත්තල භාණ්ඩ නිෂ්පාදන වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	රන්, රිදී භාණ්ඩ පාට දැමීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	රන් රිදී භාණ්ඩ නිෂ්පාදන වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	පාවිච්චි කරන ලද පත්තර,බෝතල්,කඩදාසි ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	පාවිච්චි කරන ලද ඇඳුම් ගබඩා කිරීමේ සහ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	සිමෙන්ති පෙර සම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	සිමෙන්ත ගඩොල් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම			
36.	විදුලි උපකරණ අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	තඹ, ඇළුමිනියම් භාණ්ඩ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	බටහිර ඖෂධ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	දේශීය ඖෂධ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	පින්තූර රාමු කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	වීදුරු කැපීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	රෙදි මුද්‍රණය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	සුවඳ විලවුන් නිපදවීමේ හෝ ගබඩා කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	ඇඟලුම් නිෂ්පාදන වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	වී ඇඹරුම් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

III *වැනි උපලේඛනය*

අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර හෝ කර්මාන්ත

අනු. අංකය	*කර්මාන්තය හෝ ව්‍යාපාරය*	*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
		වාර්ෂික වටිනාකම		
		රු. 750ට අඩු	*රු. 751 - රු.1,500*	*රු.1,500 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	යන්ත්‍රානුසාරයෙන් කළුගල්/කබොක් ගල්/හුණුගල් කැනීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	යන්ත්‍ර භාවිතයෙන් නොකර කළුගල්/කබොක් ගල්/හුණුගල් බොරළු/පස් වැලි ආදිය කැනීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	කළුගල් ඇඹරීමේ (මෙටල් ක්‍රෂර්) ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	අතින් කළුගල් කුඩු කිරීමේ (මෙටල්) ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	කළුගල්/කබොක් ගල්/හුණුගල්/බොරළු/පස්/වැලි තොග ලෙස ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	හුණුගල් පුලුස්සා හුණු නිපදවීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	හුණු හලා සැකසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	හුණු දියර ගසා සකස් කොට ඇසුරුම් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	හුණු ගබඩාවක් හෝ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	හුණු තොග හෝ සිල්ලරට විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	කොන්ක්‍රීට් පෙර සම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ගල් තාර පූර්ව මිශ්‍රණය (ප්‍රීමික්ස්) සැකසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදන වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති ගඩොල් නිෂ්පාදන කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000
15.	මෝටර් රථ අලුත්වැඩියා (මිකැනික්) වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	මෝටර් රථ අලුත්වැඩියා විදුලි වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	මෝටර් රථ විසිරී තීන්ත පින්තාරු වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	මෝටර්රථ අලුත්වැඩියා (ඩීසල් පොම්ප) වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	මෝටර් රථ අලුත්වැඩියා (වායු සම්කරණ) වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	ලොරි බොඩි ගැසීම හා අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	ත්‍රිරෝද රථ අළුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	යතුරුපැදි අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	පාපැදි අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	මෝටර් රථ සේවා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	ත්‍රිරෝද රථ සේවා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	යතුරු පැදි සේවා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	ශීතකරණ අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	ලියවන පට්ටලයක් (ලේත් වැඩපලක්) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	තරාදි අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	යකඩ කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	ෆයිබර් ග්ලාස් නිෂ්පාදන වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	වාහන කුෂන් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තය හෝ ව්‍යාපාරය	I වැනි තීරුව	II වැනි තීරුව	
		වාර්ෂික වටිනාකම		
		රු. 750 අඩු රු. ශත	රු. 751 - රු.1,500 රු. ශත	රු.1,500 ට වැඩි රු. ශත
36.	ගිනිකෙළි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	ගිණිකෙළ භාණ්ඩ ගබඩා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	ගිනිකෙළි භාණ්ඩ අලෙවි කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	ගිනි පෙට්ටි නිෂ්පාදනය කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	ගිනිපෙට්ටි ගබඩා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	ගිනි පෙට්ටි නිෂ්පාදනය කිරීමේ හෝ දුසින් 1000ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	රබර් කැවුනු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	ලොන්ඩ්‍රියක් සහ ඩ්‍රයික්ලීන් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	කොසු, ඉදල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	තේ කුඩු නිෂ්පාදය කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	අවමංගල්‍ය උත්සව සඳහා භාණ්ඩ සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	අබලි ද්‍රව්‍ය (පරණ යකඩ/ බෝතල්) එකතු කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
50.	බැටරි අලෙවි කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	බැටරි වලට විද්‍යුත් ආරෝපණය කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	පිත්තල භාණ්ඩ ඔප දැමීමේ/ පොලිස් කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
53.	පිත්තල භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54.	පිත්තල භාණ්ඩ අලෙවි කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	ගොඩනැගිලි ද්‍රව්‍ය තොග ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
57.	යකඩ කම්බි නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
58.	ගිනි නිවීමේ උපකරණ/සේවා සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
59.	ගෑස් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
60.	ලිහිසි තෙල්/එන්ජින් ඔයිල්/බ්‍රේක් ඔයිල්/මෝටර් රථවලට භාවිතා කරන අනෙකුත් තෙල් ගබඩාකර අලෙවි කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
61.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
62.	පොහොර හුණු පිටි යෙහෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
63.	කොහු හෝ වෙන් කෙදි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබාගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	පෙට්‍රල් ඩීසල් කෙරසින් වැනි බනිජ තෙල් වර්ගයක් ගබඩා කොට අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
67.	ගෑස් පුරවන ලද හෝ ගැස් නැති ටැංකි ගඩබා කිරීමේ හෝ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
68.	ආයුර්වේද ඖෂධ/දේශීය ඖෂධ/බටහිර ඖෂධ නිෂ්පාදනය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
69.	කිරි ශීත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
70.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	II වැනි තීරුව		
අනු. අංකය	කර්මාන්තය හා ව්‍යාපාරය	වාර්ෂික වටිනාකම		
		රු. 750ට අඩු රු. ශත	රු. 751 - රු.1,500 රු. ශත	රු.1,500 ට වැඩි රු. ශත
71.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
72.	රෝගීන්ට උපස්ථාන කරන අපරදිග වෛද්‍ය ක්‍රමයේ ආරෝග්‍ය ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
73.	රෝගීන්ට උපස්ථාන කරන පෙරදිග වෛද්‍ය ක්‍රමයේ ආරෝග්‍ය ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
74.	පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

4 වැනි උපලේඛනය

කර්මාන්ත බදු

1.	ඇස් කණ්නාඩි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	වාහන අමතර කොටස් හා වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	රෙක්සින් වර්ග, ෆෝමිකා වර්ග, කෘතිම සම් වර්ග අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	කුෂන් මෙට්ට, කාපට් අලෙවි කිරීමේ ස්ථානක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	ඇඳ මෙට්ට ගබඩාකර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	වැසිකිළි හා නානකාමර කට්ටල අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	පිගන් ගඩොල් (සෙරමික් ටයිල්) අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	ජලනල හා ජලනල උපාංග අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	කැබලි රෙදි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	රෙදිපිළි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	නිමිඇදුම් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ළදරුවන් හා ළමුන් සඳහා වූ ඇදුම් හා ක්‍රීඩා භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	මුල් ඇදුම් සකස් කිරීමේ ස්ථානක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	පරිගණක හෝ පරිගණක අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ජංගම දුරකතන හෝ ජංගම දුරකතන අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	වීඩියෝ සීඩිපට අලෙවි කිරීමේ හෝ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	දේශීය හා විදේශීය දුරකතන පහසුකම් ෆැක්ස් සේවාවන් , ඡායාපිටපත් සේවාවන් හා පරිගණක මුද්‍රිත පිටපත් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	අන්තර් ජාල පහසුකම් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	සාප්පු බඩු/තෑගි භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	ලිපිද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	පොත් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	පුවත්පත් හා සඟරා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	අට පිරිකර හා පූජා භාණ්ඩ අලෙවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	මහන මැෂින් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	සංගීත භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තය හා ව්‍යාපාරය	I වැනි තීරුව	II වැනි තීරුව	
		වාර්ෂික වටිනාකම		
		රු. 750 ට අඩු රු. ශත	රු. 751 - රු.1,500 රු. ශත	රු.1,500 ට වැඩි රු. ශත
26.	ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	මැටිභාණ්ඩ විකිණීමේ හා බෙදා හැරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	ප්ලාස්ටික්, පොලිතීන් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	පාවහන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	නිවාස සඳහා සිවිලිම් බිම් ඇතිරුම් හා බිත්ති අලංකරණ කෘත්‍රිම ලී වර්ග අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	පරිගණක ආශ්‍රිතව ඡායාරූප හා වීඩියෝ සංස්කරණය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	වාහන අලංකරණය නවීකරණය හා ස්ටිකර් සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	සිනමාහලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	ආනයන/අපනයන ව්‍යාපාරිකයින්	500 0	750 0	1,000 0
36.	කායවර්ධන මධ්‍යස්ථාන	500 0	750 0	1,000 0
37.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	සිමෙන්ති කිලෝග්‍රෑම් 1000 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම	500 0	750 0	1,000 0
39.	පොල්තෙල් ගඩබා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	මංගල උත්සව සඳහා භාණ්ඩ සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	කුරුඳු කරදමුංගු, එනසාල් ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-782/2

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

ඇතැම් වෙළෙඳ ව්‍යාපාර සම්බන්ධයෙන් වූ බදු - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව 2018 ඔක්තෝබර් මස 30 වැනි දින පැවති මහ සභාවේ දී 2019 වර්ෂය සඳහා ඇතැම් වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් සම්බන්ධයෙන් බද්දක් පනවා අය කිරීමට යෝජනා සම්මත කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා බලපත්‍ර මත පනවන ලද බලපත්‍ර ගාස්තු එම වර්ෂයේ මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ආනන්ද ජයවිලාල්,
සභාපති,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 30 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව,
තිත්තපජ්ජල, වැරැල්ලගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ සඳහන් පරිදි එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු

ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් හෝ කිසියම් ව්‍යාපාරයක් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකු විසින් ම එකී ව්‍යාපාරයේ ඊට පෙර හෝ වර්ෂයේ ලැබීම්වලින් මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිතය අනුව යම් අනුප්‍රමාණයකට අනුව වූ ව්‍යාපාර හා වෘත්තීය බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර වෙනුවෙන් වෘත්තීය බද්ද 2019 වර්ෂයේ මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවිය යුතු බවත් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

අනු. අංකය	*I වැනි තීරුව* *වර්ෂය සඳහා ව්‍යාපාරයේ ආදායම*	*II වැනි තීරුව* *අය කිරීමට තීරණය කළ බද්ද*
		රු. ශත
(1)	රු.6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
(2)	රු. 6,001 සිට රු. 12,000 දක්වා	90 0
(3)	රු.12,001 සිට රු. 18,000 දක්වා	180 0
(4)	රු.18,001 සිට රු. 75,000 දක්වා	360 0
(5)	රු. 75,001 සිට රු.150,000 දක්වා	1,200 0
(6)	රු.150,000 ට වැඩි	3,000 0

V *වැනි උපලේඛනය*

ඇතැම් වෙළඳ ව්‍යාපාර සම්බන්ධයෙන් වූ බදු

01. කොමිස් නියෝජිත.
02. වෙන්දේසිකරුවන්.
03. බ්‍රෝකර්වරුන්.
04. කොන්ත්‍රාත්කරුවන්.
05. උකස් බඩු ගන්නන්.
06. පෞද්ගලික අධ්‍යාපන ආයතන.
07. පෞද්ගලික පාසල්
08. ගණන් පරීක්ෂක හා ගණකාධිකාරී ආයතන.
09. ගෘහ නිර්මාණ ශිල්පී ආයතන.
10. රක්ෂණ නියෝජිතයින්.
11. ප්‍රවාහන නියෝජිතයන්
12. කුළී රථ හිමියන්.
13. මෝටර් රථ වාහන වෙළෙඳුන්.
14. රියැදුරු පුහුණු කරවන්නන්.
15. දෘෂ්ටි පරීක්ෂකයන්.
16. නීති කාර්යාල පැවැත්වීම
17. නොතාරිස් කාර්යාල පැවැත්වීම
18. රේස් ඔට්ටු භාරගන්නන්.
19. බැංකු.
20. රැකියා ඒජන්සි පවත්වාගෙන යාම (මෙරට/විදේශ).
21. දුරකතන ඒජන්සි පවත්වාගෙන යාම.
22. ලොතරැයි අලෙවි නියෝජිතයෝ.
23. නියෝජිත තැපැල් කාර්යාල.
24. මූල්‍ය ආයතන.
25. පෙර පාසල්

26. අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් හෝ අලෙවි ප්‍රවර්ධනකරු
27. දුරකතන සම්ප්‍රේෂණ කුළුණු
28. මුදල් ආයෝජකයින්
29. ජංගම ඡායාරූප හා වීඩියෝ ශිල්පීන්
30. පෞද්ගලික බස් රථ සේවාවන්
31. භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන්
32. පෞද්ගලික ආරක්ෂක සේවාවන්
33. රථවාහන දුම් පරීක්ෂා කිරීමේ ආයතන
34. ගුවන් ගමන් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ නියෝජිත ආයතන
35. පිරිසිදු කිරීමේ සේවා සැපයීමේ ආයතන

12-782/3

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් සහ දෘෂ්‍ය පරිසර ප්‍රදර්ශන ගාස්තු - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව 2018 ඔක්තෝබර් මස 30 වැනි දින පැවති මහා සභාවේ දී 2019 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සහ දෘශ්‍ය පරිසර ප්‍රදර්ශන බලපත්‍ර ගාස්තු පනවා අය කිරීමට යෝජනා සම්මත කළ බවත්,

පනවන ලද මෙම ගාස්තුව, දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දින 07කට කලින් ප්‍රාදේශීය සභාවට ගාස්තු ගෙවා ගාස්තු හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ සභාපති/ලේකම් වෙතින් බලපත්‍රයක් ලබාගතයුතු බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ආනන්ද ජයවිලාල්,
සභාපති,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 30 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව,
තිත්තපජ්ජල, වැරැල්ලගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තිය යටතේ 2016.02.23 වැනි දින අංක 1955/7 යටතේ ''පළාත් සභා නිවේදනය - මධ්‍යම පළාත් සභාව'' යන හිසින් යුතුව මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව 2017.02.21 වැනි දින මධ්‍යම පළාත් සභාව විසින් ස්ථිර කරන ලදුයි 2017.05.05 වැනි දින 2017 - 42 අංක ඇති ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ඉහත කී අංක 1955/7 *ගැසට් පත්‍රයේ* පිටු අංක 35 A සිට 38 A දක්වා වූ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ප්‍රකාශයට පත් කරන බැවින් ද එකී අතුරු ව්‍යවස්ථාවේ විධාන යටතේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යම් වීදියකට, ඇළකට, පාරකට, දොළකට, වැවකට හෝ අහසේ පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනය පරිදි ප්‍රදර්ශන බලපත්‍ර ගාස්තුවක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට සැලැස්වීම එම ගාස්තුව ගෙවිය යුතු යම් තැනැත්තෙක් යම් ආයතනයක් එම ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට දින 07 කට කලින් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවට ගාස්තු ගෙවා බලපත්‍රයක් ලබාගත යුතු බවට හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

අනු. අංක	පුවරුවේ ස්වභාවය	වර්ග මීටර් ප්‍රමාණය	ගාස්තුව රුපියල්		
			මාස 3 ට අඩු	මාස 3 හෝ 06 අතර	වසරක්
01.	කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1ට අඩු	250	350	500
		1ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
02.	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3 ටඅඩු	250	350	500
		3 ට වැඩි	3ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
03.	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1ට වැඩි	1ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
04.	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
05.	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1ට අඩු	250	350	500
		1ට වැඩි	1ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
06.	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1ට අඩු	250	350	500
		1 ට වැඩි	1ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
07.	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	750	850	1,000
		1 ට වැඩි	1ට වැඩිවන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500 බැගින්		

12- 782/4

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

ප්‍රසිද්ධ රැඟදැක්වීම් ගාස්තු - 2019

ප්‍රසිද්ධ රැඟුම් ආඥා පනත යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ පවත්වාගෙන යන සෑම චිත්‍රපට සංදර්ශනයක්, නාට්‍යයක්, සර්කස් සංදර්ශනයක්, චිත්‍රපටයක් සඳහා බලපත්‍ර ගාස්තුවක් 2019 වර්ෂයේ ජනවාරි 01 වැනි දින සිට අය කිරීමට 2018 ඔක්තෝබර් මස 30 වැනි දින පැවති මහා සභාවේ දී යෝජනා සම්මත කළ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ආනන්ද ජයවිලාල්,
සභාපති,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 30 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව,
තිත්තපජ්ජල, වැරැල්ලගම.

යෝජනාව

ප්‍රසිද්ධ රැගුම් ආඥාපනත යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ පවත්වාගෙන යන සෑම චිත්‍රපට සංදර්ශනයක්, නාට්‍යයක් සර්කස් සංදර්ශනයක්, චිත්‍රපටයක් සඳහා පහත උපලේඛනයේ සඳහන් පරිදි බලපත්‍ර ගාස්තුවක් 2019 වර්ෂයේ ජනවාරි 01 වැනිදින සිට අය කිරීමට හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

	කාලය	*ගාස්තුව* *රු.*
1.	දිනකට	250 0
2.	සතියකට	500 0
3.	සතියකට වැඩි මාසයකට අඩු	750 0
4.	මාසකට වැඩි වසරකට අඩු	1,000 0

12-782/5

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

ජල ගාස්තු - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව 2018 ඔක්තෝබර් මස 30 වැනි දින පැවති මහා සභාවේ දී 2019 වර්ෂය සඳහා ජල ගාස්තු පනවා අය කිරීමට යෝජනා සම්මත කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ආනන්ද ජයවිලාල්,
සභාපති,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 30 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව,
තිත්තපජ්ජල, වැරැල්ලගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් සේවාවන් සම්බන්ධයෙන් එයට අනුරූපිත තීරුවේ සඳහන් ගාස්තු පනවා අය කිරීමට හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

		ගාස්තුව රු. ශත
1.	ඒකකයක් සඳහා අය කිරීම	25 0
2.	ස්ථාවර ගාස්තු	150 0
3.	ඇප තැන්පත් මුදල	3,000 0

12-782/6

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

වෙනත් ගාස්තු - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව 2018 ඔක්තෝබර් මස 30 වැනි දින පැවති මහා සභාවේ දී 2019 වර්ෂය සඳහා වෙනත් ගාස්තු පනවා අය කිරීමට යෝජනා සම්මත කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ආනන්ද ජයවිලාල්,
ලේකම්,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 30 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව,
තිත්තපජ්ජල, වැරැල්ලගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් සේවාවන් සම්බන්ධයෙන් එයට අනුරූපිත තීරුවේ සඳහන් ගාස්තු පනවා අය කිරීට හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

ආදාහනාගාර ගාස්තු :	ගාස්තුව රු.
1. හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ	6,500 0
2. හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිටත සම්බන්ධ ගාස්තු ආදාහනයක් සිදු කිරීම සඳහා ගාස්තු	7,000 0
ගොඩනැගිලි හා දේපළ සම්බන්ධ ගාස්තු :	
1. ඉඩම් අනුබෙදුම් අයදුම් පත්‍ර ගාස්තු	500 0
2. ගොඩනැගිලි සීමා හා නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම් ගාස්තු	500 0
3. ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු	500 0
4. අනුකූලතා සහතික ගාස්තු	3,000 0
4. අනු පිටපත් ලබාදීමේ ගාස්තු	100 0
5. වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ පෝරම ගාස්තු	125 0
6. ලිපි නිකුත් කිරීමේ ගාස්තු	100 0
7. අනතුරුදායක ගස් ඉවත් කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	500 0
පාරිසරික කටයුතු සම්බන්ධ ගාස්තු :	
1. පරිසර බලපත්‍ර ගාස්තු (මුද්දර බදු රහිතව)	4,000 0
2. පරිසර බලපත්‍ර අයදුම්පත්‍ර ගාස්තු	100 0
3. පරිසර බලපත්‍ර අළුත් කිරීමෙ අයදුම් පත්‍ර ගාස්තු	100 0
4. පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තු අවමය රු. 3,000.00 සිට උපරිමය රු. 10,000.00 දක්වා (යොදවන මුදල අනුව)	
ජල සේවා සම්බන්ධ ගාස්තු :	
1. හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජල බවුසරයක් ප්‍රවාහනය කර ලබා දීම හා ආපසු රැගෙන ඒම සඳහා	2,500 0
2. හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත කි. මී. 5 ක් ඇතුළත රු. 500 ක අමතර ප්‍රවාහන ගාස්තුවක් සහ වැඩිවන කි. මී. 1 ක් සඳහා රු. 60 බැගින් අය කරනු ලැබේ.	

	ගාස්තුව (රු.)
බැකෝ යන්ත්‍රය කුලියට දීම :	
1. බැකෝ යන්ත්‍ර කුළියට දීම සඳහා ගාස්තු (පැයකට)	2,500 0
ලියාපදිංචි කිරීමේ ගාස්තු :	
1. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු	2,000 0
2. සැලසුම් ශිල්පීන් ලියාපදිංචි කිරීමේ ගාස්තු	3,000 0
පුස්තකාල කටයුතු සම්බන්ධ ගාස්තු :	
වෙනත් පොදු කටයුතු :	
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ	
1. පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු	15 0
2. පුස්තකාල දඩ (දිනකට 1 පොතකට)	5 0
3. *පුස්තකාල ඇප තැන්පතු :*	
(i) අවුරුදු 12 ට වැඩි	100 0
(ii) අවුරුදු 12 ට අඩු	75 0
4. සාමාජික කාඩ් අනුපිටපත් නිකුත් කිරීමේ ගාස්තු (එක් කාඩ්පතකට)	5 0
5. සාමාජික කාඩ් අළුත් කිරීමේ ගාස්තු :	
(i) අවුරුදු 12 ට වැඩි	50 0
(ii) අවුරුදු 12 ට අඩු	40 0
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත :	
1. පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු	15 0
2. පුස්තකාල දඩ (දිනකට එක් පොතක් සඳහා)	5 0
3. *පුස්තකාල ඇප තැන්පත් :*	
(i) අවුරුදු 12 ට වැඩි	200 0
(ii) අවුරුදු 12 ට අඩු	100 0
4. සාමාජික කාඩ් අනු පිටපත් නිකුත් කිරීමේ ගාස්තු (එක් කාඩ්පතක් සඳහා)	5 0
5. *සාමාජික කාඩ් අළුත් කිරීමේ ගාස්තු :*	100 0
(i) අවුරුදු 12 ට වැඩි	80 0
(ii) අවුරුදු 12 ට අඩු	

පුස්තකාල හා ඒ - නැණ පියස ගාස්තු :

කඩදාසියේ ප්‍රමාණය	*තනිපිට රු. ශත*	*දෙපිට රු. ශත*
A5	3 0	4 0
B5	4 0	5 0
A4	5 0	6 0
B4	8 0	9 0
F4	6 0	7 0
A3	11 0	13 0
Legal	7 0	8 0
A 4 colour	6 0	7 0

(ඒ - නැණ පියස පමණි)

e නැණ පියස - පරිගණක පාඨමාලා ගාස්තු :

	රු. ශත
1. 1 වසර සිට 5 වසර දක්වා ළමා පරිගණක පාඨමාලා ගාස්තු (කාලය මාස 03 යි)	1,500 0
2. 6 වසර සිට 11 වසර දක්වා පරිගණක මූලික පදනම් පාඨමාලා ගාස්තු (කාලය මාස 04 යි)	2,500 0
3. සහතිකපත් පාඨමාලා ගාස්තු	5,000 0

ළමා උද්‍යාන ගාස්තු :

	රු. ශත
1. ළමයින් සඳහා	10
2. වැඩිහිටියන් සඳහා	20

12-782/7

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

ඉඩම් විකිණීම මත බදු අය කිරීම - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව 2018 ඔක්තෝබර් මස 30 වැනි දින පැවැති මහ සභාවේ දී 2019 වර්ෂය සඳහා හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත යම් ඉඩමක් වෙන්දේසිකරුවකු, තැරැව්කරුවෙකු, ඔහුගේ සේවකයා හෝ අනුනියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් 1% කට සමාන බද්දක් විකුණුම්කරු හෝ ඒ වෙන්දේසිකරු ඔහුගේ සේවකයා හෝ අනුනියෝජිතයා විසින් මෙම සභාවට ගෙවිය යුතු යැයි යෝජනා සම්මත කළ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ආනන්ද ජයවිලාල්,
සභාපති,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 30 වැනි දින,
තිත්තපජ්ජල, වැරැල්ලගම,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වැනි වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව 2018 ඔක්තෝබර් මස 30 දිනැතිව 2019 වර්ෂය සඳහා හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත යම් ඉඩමක් වෙන්දේසිකරුවකු, තැරැව්කරුවෙකු ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් 1% කට සමාන බද්දක් විකුණුම්කරු හෝ ඒ වෙන්දේසිකරු ඔහුගේ සේවකයා හෝ අනුනියෝජිතයා විසින් මෙම සභාවට ගෙවිය යුතු බව හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-782/8

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

සංවර්ධන නොකළ ඉඩම් මත බදු අයකිරීම - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව 2018 ඔක්තෝබර් මස 30 වැනි දින පැවති මහා සභාවේ දී 2019 වර්ෂය සඳහා හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි සංවර්ධනය නොකළ ඉඩම් මත බද්දක් පනවා අය කළ යුතු යැයි යෝජනා සම්මත කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ආනන්ද ජයවිලාල්,
සභාපති,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 30 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව,
තිත්තපජ්ජල, වැරැල්ලගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1) වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව 2018 ඔක්තෝබර් මස 30 දිනැතිව 2019 වර්ෂය සඳහා හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යය සඳහා නිත්‍ය හෝ විධිමත් ලෙස වගා කිරීමේ කාර්යය සඳහා යෝග්‍ය වන හෝ මෙම සභාවේ මතය අනුව සාධාරණ යැයි සැළකෙන වියදමකින් එවැනි යම් කාර්යයක් සඳහා ඒ ඉඩම සංවර්ධනය කළ හැකි අවස්ථාවක,

(අ) එම ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති වූ, හෝ

(ආ) සැබවින්ම ගොඩනැගිලිවලින් ආවරණය වූ එම ඉඩමේ බිම් ප්‍රමාණය එම ඉඩමේ මුළු බිම් ප්‍රමාණයට නියමිත සමානුපාතයට වඩා අඩු සමානුපාතයක් ප්‍රාදේශීය සභා යෝජනා සම්මතයක් මගින් දරන්නාවූ, හෝ

(ඇ) එම ඉඩමේ නිත්‍ය හෝ විධිමත් ලෙස වගා කිරීමකට යටත් කර නොමැත්තා වූ හෝ

සංවර්ධනය නොකළ ඉඩමේ/කොටසේ ''ප්‍රාග්ධන බිම් අගය මත 0.5%ක බද්දක් පනවා වර්ෂය සඳහා අයකළ යුතු බව හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-782/9

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

1893 අංක 9 දරන ගෝඝාතක ආඥාපනත හා ඊට සංශෝධන පනත යටතේ එහි අංක 7(1) පරිදි එළ හරක් මස් විකිණීමේ ව්‍යාපාර පවත්වාගෙන යාමට පහත වගුවේ විස්තර කෙරෙන පුද්ගලයින් විසින් එකි වගුවේ විස්තර වන ස්ථානයන්ට බලපත්‍ර ඉල්ලුම් කොට ඇත.

02. එකී ස්ථානයන්ට එබඳු බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමට කැමති වූ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත පදිංචි තැනැත්තන් විසින් එසේ විරුද්ධත්වයට තිබෙන කරුණු පිළිබඳ ලිඛිත ප්‍රකාශයක් පිටපත් දෙකකින් (02) යුක්තව මෙම නිවේදනය ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ දින සිට දින 30 ක් ඇතුළත පහත සඳහන් නිසි බලධාරියා වූ සභාපති, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව, තිත්තපජ්ජල, වැරැල්ලගම වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''විරෝධකරු'' ලෙස සඳහන් කළ යුතු ය.

එච්. ඒ. ආනන්ද ජයවිලාල්,
සභාපති,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 30 වැනි දින,
තිත්තපජ්ජල, වැරැල්ලගම.
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

එළහරක් මස් විකිණීමේ ව්‍යාපාර පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කොට ඇති ස්ථාන

අනු. අංකය	*එළගවමස් වෙළෙඳසැල පවත්වාගෙන යාමට ඉල්ලුම් කළ තැනැත්තාගේ නම හා ලිපිනය හා* ජා. හැ. අංකය	*ස්ථානය, අයිතිකරුගේ නම හා ලිපිනය*	*එළගවමස් වෙළෙඳ සැල පවත්වාගෙන යාමට අදහස් කරන ස්ථානයේ ලිපිනය*	*ග්‍රාම නිලධාරී වසම හා අංකය*
1.	ඒ. එච්. එම්. ඉල්ලියාස් මයා අංක 65, උග්ගල්ල පාර, උගුරැස්සපිටිය, කටුගස්තොට. ජා. හැ. අ. 650653130 V	එම්. ඒ. නසාර්දීන් මයා උගුරැස්සපිටිය, කටුගස්තොට.	අංක 27/සී, උගුරැස්සපිටිය, කටුගස්තොට.	උගුරැස්සපිටිය, 426
2.	එම්. ජේ. එම්. ෆාරුක් මයා අංක 96, කුරුඳුගොල්ල, වැරැල්ලගම. ජා. හැ. අ. 731682712 V	ඒ. ජේ. එම්. ෆාරුක් මයා අංක 96, කුරුඳුගොල්ල, අලදෙනිය, වැරැල්ලගම.	ජම්බුගහ ළඟ කඩේ, කුරුඳුගොල්ල මංසන්ධිය, මුරුතලාව, අලදෙනිය පාර, අලදෙනිය, වැරැල්ලගම.	කුරුඳුගොල්ල, 474
3.	ඒ. එම්. ෆාරුක් මයා අංක 186, ඉනිගල පාර, ඉනිගල, කටුගස්තොට. ජා. හැ. අ. 430862120 V	ඒ. එම්. ෆාරුක් මයා අංක 186, ඉනිගල පාර, ඉනිගල, කටුගස්තොට.	අංක 186/1, ඉනිගල පාර, ඉනිගල, කටුගස්තොට	ඉනිගල 416

12-782/10